# තුන්වැනි කොටස

# තුන්වැනි කොටස

## මුදල් මණ්ඩලය විසින් 2014 වර්ෂයේදී උපයෝගී කරගනු ලැබූ ප්‍රධාන පරිපාලන විධිවිධාන මෙහෙයුම් උපදෙස්, චක්‍රලේඛ, නියෝග සහ නිවේදන


| | | යොමු අංකය | පිටුව |
|---|---|---|---|
| **බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව** | | | |
| 1 | ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය මෙහෙයුම් උපදෙස් | | 1 |
| 2 | 1988 අංක 30 දරන (සංශෝධිත) බැංකු පනතේ 86 වගන්තිය යටතේ ද්‍රවශීල වත්කම් නිර්වචනය | 02/17/550/0016/001 | 2 |
| 3 | බාසල් II ප්‍රාග්ධන ප්‍රමාණාත්මක රාමුව යටතේ මෙහෙයුම් අවදානම මත ගණනය කළ බර තැබූ වටිනාකම පිළිබඳ ප්‍රමිතිගත ප්‍රවේශය ක්‍රියාත්මක කිරීම | 02/17/600/0029/001 | 2 |
| 4 | 2014 අංක 1 දරන බැංකු පනත යටතේ කරනු ලබන විධානයන් බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකුවල නිශ්චල දේපල තක්සේරු කිරීම සඳහා වන නියාමන රාමුව | | 10 |
| 5 | නිශ්චල දේපල තක්සේරු කිරීම සම්බන්ධයෙන් බැංකු පනත යටතේ පනවා ඇති අවශ්‍යතාවන්ට අනුකූලතාවය දැක්වීම | 02/17/600/0003/002 | 13 |
| 6 | 2014 අංක 2 දරන බැංකු පනත් විධානයන් ණය පහසුකම් සලසාදීමේ උපරිම සීමාව සම්බන්ධයෙන් 2007 අංක 7 දරන බැංකු පනත් විධානයන් සංශෝධනය | | 13 |
| 7 | 2014 අංක 3 දරන බැංකු පනත් විධානයන් ණය පහසුකම් සලසාදීමේ උපරිම සීමාව සම්බන්ධයෙන් 2007 අංක 8 දරන බැංකු පනත් විධානයන් සංශෝධනය | | 14 |
| 8 | බැංකු පනතේ 2014 අංක 4 දරන විධානය බලපත්‍රලාභී බැංකු සඳහා වන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ පද්ධතිය පිළිබඳ විධානයන් සංශෝධනය කිරීම | | 14 |
| 9 | ආයෝජන අරමුදල් ගිණුම | 02/17/800/0014/02 | 26 |
| 10 | ආයෝජන අරමුදල් ගිණුම | 02/17/800/0014/02 | 26 |
| 11 | අපනයනකරුවන්ට ලබාදුන් ණය පහසුකම් ආපසු අයකර ගැනීම | 02/17/600/002/001 | 27 |
| 12 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය අති විශෙෂ | 1891/11 | 27 |
| 13 | බැංකු පනතේ 2014 අංක 1 දරන විධානය බලපත්‍රලාභී වාජිණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල වාර්ෂික බලපත්‍ර ගාස්තු | | 28 |
| 14 | බැංකුවල අවම ප්‍රාග්ධන අවශ්‍යතාව ඉහළ නැංවීම | 02/17/402/0073/002 | 28 |
| 15 | බැංකුවල අවම ප්‍රාග්ධන අවශ්‍යතාව ඉහළ නැංවීම | 02/17/402/0073/002 | 28 |
| 16 | මූල්‍ය අංශයේ ඒකාබද්ධවීමට පහසුකම් සැලසීම සඳහා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත් ප්‍රතිපාදනයන්ට සිදුකළ සංශෝධන ප්‍රකාරව හඳුන්වා දෙන ලද මාර්ගෝපදේශ | | 29 |
| **ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව** | | | |
| 17 | ස්වයංක්‍රීය ගණක යන්ත්‍රවලින් මුදල් ආපසු ගැනීම් | 12/02/001/0036/002 | 31 |
| 18 | ශ්‍රී ලංකා මහ බැංකුව සමග මුදල් ගනුදෙනු සඳහා මාර්ගෝපදේශ | 12/02/008/0007/001 | 32 |
| **දේශීය කටයුතු දෙපාර්තමේන්තුව** | | | |
| 19 | මෝටර් වාහන ආනයනය සඳහා වන ණයවර ලිපි මත ආන්තික තැන්පතු අවශ්‍යතාව | 35/01/005/0010/18 | 33 |
| 20 | ශ්‍රී ලංකා මහ බැංකුවේ විවට වෙළෙඳ කටයුතු සඳහා වන මෙහෙයුම් උපදෙස් | 35/01/005/0006/33 | 33 |
| 21 | ශ්‍රී ලංකා මහ බැංකුවේ විවට වෙළෙඳ කටයුතු සඳහා වන මෙහෙයුම් උපදෙස් | 35/01/005/0006/34 | 34 |

| | | යොමු අංකය | පිටුව |
|---|---|---|---|
| | **විනිමය පාලන දෙපාර්තමේන්තුව** | | |
| 22 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශේෂ) | 1854/3 | 35 |
| 23 | විදේශ සංචාරක කාඩ්පත් (FTCs) | 06/04/01/2014 | 35 |
| 24 | විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම (SFIDA) | 06/04/02/2014 | 36 |
| 25 | ශිෂ්‍ය වීසා බලපත්‍රය ලබා ගැනීමට පෙර මුදල් ප්‍රේෂණය කිරීම | 06/04/03/2014 | 36 |
| 26 | නේවාසික විදේශ ව්‍යවහාර මුදල් (RFC) ගිණුම් | 06/04/04/2014 | 37 |
| 27 | නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් (RNNFC) ගිණුම් | 06/04/05/2014 | 37 |
| 28 | අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවකයින් සඳහා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (FCAISPE) | 06/04/06/2014 | 38 |
| 29 | විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම (FEEA) | 06/04/07/2014 | 38 |
| 30 | අනේවාසික සැපයුම්කරුවන් විසින් නේවාසික ආනයනකරුවන් සඳහා වූ ණය පහසුකම් | 06/04/09/2014 | 41 |
| 31 | ණයවර ලිපි (LCs) | 06/04/10/2014 | 41 |
| 32 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශේෂ) | 1864/38 | 42 |
| 33 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශේෂ) | 1864/39 | 43 |
| 34 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශේෂ) | 1864/40 | 44 |
| 35 | ප්‍රතිමුඛ ප්‍රේෂණ ගිණුම සඳහා සංශෝධනයන් | 06/04/11/2014 | 46 |
| 36 | විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් (FEEA) හිමියන් සඳහා වූ ණය පහසුකම් | 06/04/12/2014 | 46 |
| 37 | චීන රෙන්මින්බිවලින් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම | 06/04/13/2014 | 47 |
| 38 | එතෙර ගමන් සඳහා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීම | 06/04/15/2014 | 47 |
| 39 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශේෂ) | 1895/15 | 48 |
| | **මූල්‍ය බුද්ධි ඒකකය** | | |
| 40 | ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සහ මැඩපැවැත්වීම වාර්තා කරන ආයතයන්හි වගකීම් | 01/14 | 48 |
| 41 | ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සහ මැඩපැවැත්වීම වාර්තා කරන ආයතයන්හි වගකීම් | 02/14 | 49 |
| 42 | ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සහ මැඩපැවැත්වීම රක්ෂණ සමාගම් හි වගකීම් | 03/14 | 50 |
| 43 | ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සහ මැඩපැවැත්වීම කොටස් තැරැව්කාර ආයතනයන්හි වගකීම් | 04/14 | 52 |
| 44 | විදේශ ආමුඛ ප්‍රේෂණ වාර්තා කිරීම | 05/14 | 54 |
| | **ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව** | | |
| 45 | ලංකාසෙට්ල් පද්ධතියේ සහභාගිකරුවකු ලෙස පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් පත් කිරීම | RTGS/01/2014 | 54 |
| 46 | 2014 පෙබරවාරි මස 23 දින සජීවී පරීක්ෂණයක් පැවැත්වීම සඳහා ලංකාසෙට්ල් පද්ධතිය විවෘත කිරීම | RTGS/02/2014 | 55 |
| 47 | 2014 අංක 01 දරන පොදු විධිවිධාන - ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් සිදු කරන ගනුදෙනු සඳහා අය කළ හැකි ගාස්තු | | 55 |
| 48 | 2014 මාර්තු මස 14 වැනි සිකුරාදා දින ලංකාසෙට්ල් පද්ධතියෙහි සජීවී මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කිරීම | RTGS/03/2014 | 56 |
| 49 | ලංකාසෙට්ල් පද්ධතියෙහි සහභාගිකරුවකු ලෙස කාගිල්ස් බැන්ක් ලිමිටඩ් පත් කිරීම | RTGS/04/2014 | 56 |
| 50 | 2014 අංක 02 දරන පොදු විධිවිධාන - විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු | | 57 |

| | | යොමු අංකය | පිටුව |
|---|---|---|---|
| 51 | 2014 ඔක්තෝබර් මස 06 වන දින රජයේ බැංකු නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම | RTGS/05/2014 | 59 |
| 52 | අමානා බැන්ක් ලිමිටඩ් හි නම වෙනස් කිරීම | RTGS/06/2014 | 60 |
| 53 | 2014 නොවැම්බර් මස 07 වැනි සිකුරාදා දින ලංකාසෙට්ල් පද්ධතියෙහි සජීවී මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කිරීම | RTGS/07/2014 | 60 |
| **ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව** | | | |
| 54 | ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් සංශෝධනය | RDD/SEPI/2009/07/ (A-02) | 60 |
| 55 | නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය සඳහා අදාළ මූල්‍ය පරිමාණය, පොලී අනුපාතික සහ රජයේ පොලී සහනාධාර අනුපාතිකය සංශෝධනය කිරීම | | 61 |
| 56 | රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා මහ බැංකුව | RDD/CGSPA/14/01 | 63 |
| 57 | මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම | RDD/CSDDLS/2013/01/ (A-01) | 69 |
| 58 | රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් අංක: RDD/CGSPA/14/1 සංශෝධනය කිරීම | RDD/CGSPA/14/1 (A-01) | 70 |
| 59 | සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය - පොලී අනුපාතිකය සංශෝධනය කිරීම | RDD/PR/2010/03 (A-03) | 70 |
| 60 | මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම | RDD/CSDDLS/2013/01 (A-02) | 70 |
| 61 | රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් අංක: RDD/CGSPA/14/1 සංශෝධනය කිරීම | RDD/CGSPA/14/1 (A-02) | 71 |
| **බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව** | | | |
| 62 | 2014 අංක 1 දරන කල්බදු මූල්‍යකරණ (ලියාපදිංචි කිරීම සහ වාර්ෂික බලපත්‍ර ගාස්තු) රෙගුලාසි | | 72 |
| 63 | 2014 අංක 1 දරන මුදල් සමාගම් (පොලී අනුපාත) විධානය | | 73 |

**චක්‍රලේඛ අංක : 01/2014**

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව
2014 ජනවාරි 07

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ
සියලුම සාමාජික ආයතනයන්හි ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි,

## ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය
## මෙහෙයුම් උපදෙස්

අප විසින් පහත සඳහන් කරුණු ඔබ වෙත දැනුම් දෙමු:

1. 2013.12.30 දිනැති 2013 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසිවලට අනුකූලව, 2013.11.22 දින සිට බලපැවැත්වෙන පරිදි "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය", "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය" ලෙස සහ "තැන්පතු රක්ෂණ අරමුදල", "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල" ලෙස නැවත නම් කරන ලදී. එම රෙගුලාසියේ පිටපතක් අමුණා ඇත.

2. තවදුරටත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නව "පොදු ලෙජර් ගිණුම් පද්ධතිය" ක්‍රියාත්මක කිරීමත් සමග, 2014.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදලේ ගිණුම් අංකය වන "4681", "54523" ලෙස වෙනස් කරන ලදී.

3. ඒ අනුව, වහාම බලපැවැත්වෙන පරිදි සෑම සාමාජික ආයතනයක් විසින්ම පහත සඳහන් උපදෙස් පිළිපැදිය යුතු වේ.

   (i) 2010.09.28 දිනැති, සංශෝධිත 2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසියේ අංක 6 දරන රෙගුලාසිය යටතේ සුදුසුකම් ලත් තැන්පතු මත වාරිකය, **"ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල - ගිණුම් අංක 54523"** යන්න සඳහන් කරමින් හෝ එකී ගිණුමේ බැරට චෙක්පතක් නිකුත් කිරීමෙන් තත්කාලීන දළ නිෂ්කාශන පද්ධතිය (RTGS) හරහා "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල" වෙත ගෙවිය යුතුය.

   (ii) ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයට අදාළ සන්නිවේදන වලදී "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය", "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය" ලෙසට ද "තැන්පතු රක්ෂණ අරමුදල", "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල" ලෙසට ද නැවත නම් කිරීමට අවශ්‍ය සංශෝධනයන් කළ යුතුය.

   (iii) ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ පෙර විද්‍යුත් තැපැල වන "sldis@cbsl.lk", "sldilss@cbsl.lk" ලෙසට සංශෝධනය වන අතර විද්‍යුත් තැපැල් ලිපි හුවමාරු කිරීමේදී "dbsd@cbsl.lk" යන්නට පිටපතක් සමග "sldilss@cbsl.lk" යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතුය.

මෙයට - විශ්වාසී,
ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මිය
**බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 1843/8 - 2013 දෙසැම්බර් මස 30 වැනි සඳුදා

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

**I වැනි කොටස : (I) වැනි ජේදය – සාමාන්‍ය**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්**

මුදල් නීති පනත

(422 වැනි අධිකාරය වූ) මුදල් නීති පනතේ 32ඉ වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් පනවනු ලබන ලද රෙගුලාසි.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
**සභාපති**
මුදල් මණ්ඩලය

**2013 ක් වූ දෙසැම්බර් මස 23 වැනි දින,**
**කොළඹ,**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ දී ය.**

## ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි 2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි සංශෝධනය

**1. හැඳින්වීම**

1.1 මෙම රෙගුලාසි, ''2013 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි'' යනුවෙන් හැඳින්විය යුතුය.

**2. මූලික රෙගුලාසි සංශෝධනය**

2.1 2010 සැප්තැම්බර් මස 28 දිනැති අංක 1673/11 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි පහත පරිදි සංශෝධනය වේ.

2.2 3.1 රෙගුලාසිය, එහි ''මෙම යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය.'' යන වචන වෙනුවට ''මෙම යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය (මෙහි මින් මතු ''යෝජනා ක්‍රමය'' වශයෙන් හඳුන්වනු ලබයි).'' යන වචන ආදේශ කරනු ලැබේ.

2.3 7.1 රෙගුලාසිය, එහි ''යෝජනා ක්‍රමය සඳහා ''තැන්පතු රක්ෂණ අරමුදල'' නමින් හැඳින්වෙන අරමුදලක් පවත්වා ගත යුතුය.'' යන වචන වෙනුවට ''යෝජනා ක්‍රමය සඳහා ''ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල'' නමින් හැඳින්වෙන අරමුදලක් පවත්වා ගත යුතුය.'' යන වචන ආදේශ කරනු ලැබේ.

2.4 9.7 රෙගුලාසිය, එහි ''තැන්පතු රක්ෂණ අරමුදල'' යන වචන වෙනුවට සහ මෙම රෙගුලාසිවල එම වචන ඇති සෑම තැනකම ''ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල'' යන වචන ආදේශ කරනු ලැබේ.

2.5 10.5 රෙගුලාසිය, එහි ''ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය'' යන වචන වෙනුවට සහ මෙම රෙගුලාසිවල එම වචන ඇති සෑම තැනකම ''ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය'' යන වචන ආදේශ කරනු ලැබේ.

**3. බලාත්මක වන දිනය** 3.1 මෙම සංශෝධනයන් 2013 නොවැම්බර් මස 22 වැනි දින සිට බලාත්මක විය යුතුය.

**යොමුව : 02/17/550/0016/001** 2014 පෙබරවාරි 17

බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි,

## 1988 අංක 30 දරන (සංශෝධිත) බැංකු පනතේ 86 වගන්තිය යටතේ ද්‍රවශීල වත්කම් නිර්වචනය

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 21 (1) වගන්තිය අනුව සහ 86 වගන්තියෙහි (උ) ඡේදයෙහි "ද්‍රවශීල වත්කම්" නිර්වචනය අනුව, මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන නිත්‍ය තැන්පතු පහසුකම් ශේෂය ද්‍රවශීල වත්කම් ලෙස තීරණය කර ඇත.

2. බලපත්‍රලාභී වාණිජ බැංකු නිත්‍ය තැන්පතු පහසුකමෙහි සුදුසුකම්ලත් වටිනාකම දේශීය බැංකු ඒකකයට අදාළ ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතිකය වාර්තා කරනු ලබන මාසික අන්තර්ජාලගත ප්‍රකාශනයෙහි (BSD-MF-04-LD) අයිතම අංක 4.1.2.3.0.0 යටතේ වාර්තා කළ යුතුය.

මෙයට - විශ්වාසී,<br>
ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මිය<br>
**බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ**

**යොමුව : 02/17/600/0029/001** 2014 මාර්තු 31

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල

ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි,

## බාසල් II ප්‍රාග්ධන ප්‍රමාණාත්මක රාමුව යටතේ මෙහෙයුම් අවදානම මත ගණනය කළ බර තැබූ වටිනාකම පිළිබඳ ප්‍රමිතිගත ප්‍රවේශය ක්‍රියාත්මක කිරීම

ඉහත කරුණ සම්බන්ධයෙන් අපගේ පූර්ව ලිපි හා සාකච්ඡා මගින් සඳහන් කළ පරිදි, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා, සංශෝධිත මාර්ගෝපදේශ හා මෙහෙයුම් අවදානම මත ගණනය කළ ප්‍රාග්ධන ප්‍රමාණය වාර්තා කිරීමේ ආකෘතිය මේ සමග අමුණා ඇත.

ඒ අනුව, 2014 ජූලි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි;

(අ) 2007 අංක 9 සහ 10 ලෙස බැංකු පනත යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට පිළිවෙලින් නිකුත් කළ විධානයන්හි I උපලේඛනයේ දක්වා ඇති මෙහෙයුම් අවශ්‍යතා සඳහා අවදානම මත බර තැබූ වටිනාකම ගණනය කිරීමට අදාළ V කොටසේ 6.8 මාර්ගෝපදේශය සඳහා මෙහි I උපලේඛනයේ ඇතුලත් මාර්ගෝපදේශ ප්‍රතිස්ථාපනය කෙරේ; තවද

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා 2007 අංක 9 සහ 10 ලෙසට පිළිවෙලින් බැංකු පනත යටතේ නිකුත් කළ මාර්ගෝපදේශ ප්‍රකාරව එහි II උපලේඛනයේ දක්වා ඇති මෙහෙයුම් අවශ්‍යතා සඳහා අවදානම මත බර තැබූ වටිනාකම ගණනය කිරීමට අදාළ ප්‍රවර්තන ආකෘතිය, මෙම II උපලේඛනයේ දැක්වෙන නව ආකෘතිය මගින් ප්‍රතිස්ථාපනය කෙරේ.

මෙයට - විශ්වාසී,
ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මිය
**බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ**

I වන උපලේඛනය

## මෙහෙයුම් අවදානම සඳහා අවදානම් මත බර තැබූ වටිනාකම ගණනය කිරීමට අදාළ සංශෝධිත මාර්ගෝපදේශන

6.8 **V වන කොටස - මෙහෙයුම් අවදානම සඳහා අවදානම් මත බර තැබූ වටිනාකම ගණනය කිරීම**

6.8.1 **විශ්ලේෂණය**

6.8.1.1 **මෙහෙයුම් අවදානම අර්ථ දැක්වීම**

නිෂ්ප්‍රමාණ හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලි, පුද්ගලයන් සහ පද්ධති හෝ බාහිර සිදුවීම් හි ප්‍රතිඵලයන් නිසා අලාභයක් සිදුවීමේ අවදානම මෙහෙයුම් අවදානම ලෙස අර්ථ දැක්වේ. මෙම අර්ථ දැක්වීමේදී නීතිමය අවදානම ඇතුලත් වන නමුදු උපාය මාර්ගික හා කීර්තිනාම අවදානම බැහැර කෙරේ. අධීක්ෂණ පියවර මෙන්ම පෞද්ගලික එකඟතාවයන්හි ප්‍රතිඵලයන් නිසා ඇති වන දඩ මුදල්වලට යටත්වීම්, දඬුවම් හෝ දාණ්ඩනික වන්දි යනාදිය නීතිමය අවදානම යන්නට ඇතුලත් වන අතර එය මෙම කරුණුවලට පමණක් සීමා නොවේ.

6.8.1.2 **මිනුම් ක්‍රමවේදයන්**

වැඩිවන සංකීර්ණත්වය හා අවදානම් සංවේදීතාව ධාරණය කර ගැනීම සඳහා, බාසල් II රාමුව මගින් මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන අයකිරීම් ගණනය සඳහා ක්‍රමවේද 3 ක් ඉදිරිපත් කර ඇත. එනම්, (i) මූලික දර්ශක ප්‍රවේශය; (ii) ප්‍රමිතිගත ප්‍රවේශය සහ (iii) උසස් මිනුම් ප්‍රවේශය. මෙහෙයුම් හානි ආවරණය සඳහා අවශ්‍ය ප්‍රාග්ධන ප්‍රමාණය නිර්ණය කිරීමේදී මූලික දර්ශක ප්‍රවේශය හා සසඳන කල්හි අනෙකුත් ප්‍රවේශයන් ඉතා උසස් ක්‍රමවේදයන් සේ සැලකිය හැක. එමනිසා මූලික දර්ශක ප්‍රවේශයෙන් අනෙකුත් උසස් ක්‍රමවේදයන්ට සංක්‍රමණය වීම බැංකු අධීක්ෂකගේ අනුමැතිය සහිතව, සුදුසුකම්ලත් නිර්ණායක වලට අනුකූල වීමට යටත්ව, සිදුවිය යුතුය.

6.8.2 **මෙහෙයුම් අවදානම ගණනය කිරීමේ ක්‍රමවේද**

6.8.2.1 බැංකුවකට තම මෙහෙයුම් අවදානම මත බර තැබූ වටිනාකම ගණනය කිරීම සඳහා පහත ක්‍රමවේදයන්ගෙන් එකක් භාවිතා කළ හැක.

(අ) අයිතම 6.8.3 ට අනුකූලව මූලික දර්ශක ප්‍රවේශය; හෝ

(ආ) අයිතම 6.8.4 ට අනුකූලව ප්‍රමිතිගත ප්‍රවේශය; හෝ

(ඇ) අයිතම 6.8.5 ට අනුකූලව විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය.

6.8.2.2 ප්‍රමිතිගත ප්‍රවේශය හෝ විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය භාවිතා කිරීමට අවසර ලබාදී ඇති බැංකු ආයතන ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂගේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව සරල ක්‍රමවේදයන් භාවිතා නොකළ යුතුය.

6.8.2.3 බැංකුවක් සරල ක්‍රමවේදයකට මාරු වූ විටෙක එම බැංකුවට බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂගේ අනුමැතියෙන් තොරව උසස් ක්‍රමවේදයක් භාවිතා කළ නොහැක. බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් අදාළ උසස් ක්‍රමවේදයට සංක්‍රමණය වීමට පෙර, වෙනත් කොන්දේසි සමඟ අනුකූලවීමේ අවශ්‍යතාවයට යටත්ව, එවැනි අනුමැතියක් ප්‍රදානය කරනු ලබයි.

6.8.2.4 ප්‍රමිතිගත ප්‍රවේශයට හෝ විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශයට අනුගත වී ඇති බැංකුවක්, නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා සඳහා අනුකූල වන බවට බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ සෑහීමකට පත් නොවන විටෙකදී, එම බැංකුවට සරල ක්‍රමවේදයක් අනුගමනය කරන ලෙස බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ ඉල්ලා සිටිනු ඇත.

6.8.3 **මූලික දර්ශක ප්‍රවේශය**

6.8.3.1 බැංකුවක් සිය මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන අවශ්‍යතාවය පහත පරිදි ගණනය කරනු ඇත.

$$K_{BIA} = [\sum(GI_{1\ldots n} \times \alpha)]/n$$

මෙහිදී,

(අ) $K_{BIA}$ = මූලික දර්ශක ප්‍රවේශය යටතේ මෙහෙයුම් අවදානම සඳහා ප්‍රාග්ධන අයකිරීම.

(ආ) GI = එනම්, අයිතම 6.8.3.2 සිට 6.8.3.4 හි දක්වා ඇති අන්දමට පසුගිය වසර 3 ක් පුරාවට පැවති ධනාත්මක වාර්ෂික දළ ආදායම.

(ඇ) n = පසුගිය වසර 3 තුළ වාර්ෂික දළ ආදායම, ධනාත්මක වූ වසර ගණන.

(ඇ) $\alpha$ = 15%, බැංකු අධීක්ෂණය සඳහා වූ බාසල් කමිටුව විසින් තීරණය කරන ලද,

6.8.3.2 පහත සඳහන් ගැලපීම් ද සැලකිල්ලට ගනිමින් ශුද්ධ පොලී ආදායමේ සහ පොලී නොවන ආදායමේ එකතුව ලෙසට බැංකුවක් සිය දළ ආදායම ගණනය කළ යුතුය.

(අ) ඕනෑම වෙන්කිරීම්/හානිකරණ වල දළ අගයන් (නොගෙවූ පොලී ඇතුලත්ව);

(ආ) දළ මෙහෙයුම් වියදම්, බාහිර පාර්ශවයන්ගෙන් ලබාගත් සේවාවන් වෙනුවෙන් සේවා සපයන්නන් සඳහා ගෙවූ ගාස්තු ඇතුලත්ව, බැංකුව බාහිර පාර්ශවයන්ට ලබාදුන් සේවාවන් සඳහා ලැබුණු ගාස්තු ද දළ ආදායමට ඇතුලත් වේ.

මේ සඳහා අයත් නොවන්නේ,

(අ) බැංකු පොත්වල සඳහන් වන සුරැකුම්පත් විකිණීමෙන් ලැබෙන උපලබ්ධි වූ ලාභ/අලාභ. බැංකු පොත්වල සඳහන් වන සුරැකුම්පත් යනු, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39 ට අනුකූලව කල්පිරෙන තෙක් දරා සිටින හෝ විකිණීම සඳහා පවතින යනුවෙන් වර්ගීකරණය කරන ලද සුරැකුම්පත් වේ.

(ආ) බැංකුවේ සාමාන්‍ය කටයුතුවලින් ව්‍යුත්පන්න නොවූ සහ නිරතුරුව හෝ නිතිපතා අපේක්ෂා කළ නොහැකි ඕනෑම ආදායමක් හෝ වියදමක්, එනම්, ස්ථාවර වත්කම් විකිණීම්, රක්ෂණ අයකිරීම් මගින් උපයාගත් ආදායම් යනාදියයි.

6.8.3.3 ඕනෑම වර්ෂයක වාර්ෂික දළ ආදායම/ප්‍රාග්ධන අයකිරීම ඍණාත්මක අගයක් හෝ ශුන්‍ය වුවහොත්, එය සාමාන්‍ය ප්‍රාග්ධන අයකිරීම ගණනය කිරීමේ දී ලවය හා හරය යන දෙකෙන්ම ඉවත් කළ යුතුය.

6.8.3.4 බැංකුවක් ඉතා ආසන්නතම වර්ෂයට තම වාර්ෂික දළ ආදායම, පසුගිය මූල්‍ය කාර්තු 4 හි දළ ආදායමේ සමස්තයක් ලෙස ගණනය කළ යුතු අතර ඉතා ආසන්නතම වර්ෂයට කලින් වූ වසර 2 ට අදාළ දළ ආදායම ගණනය කිරීමේදී ද ඉහත ක්‍රමයම අනුගමනය කළ යුතුය. 2014 ජූනි මස අවසානයට, බැංකුවක් සිය මෙහෙයුම් අවදානම මත බර තැබූ වටිනාකම ගණනය කිරීමේදී, පසුගිය වසර 3 ක් සඳහා වාර්ෂික දළ ආදායම ගණනයට අදාළ වූ නිදර්ශනයක් 20 වන වගුවෙහි දැක්වේ.

**වගුව 20**

**වාර්ෂික දළ ආදායම ගණනය කිරීම සඳහා පැහැදිලි කිරීම**

| | 3 වන වර්ෂය | 2 වන වර්ෂය | 1 වන වර්ෂය |
|---|---|---|---|
| මූල්‍ය කාර්තුව සඳහා දළ ආදායම | ජූනි 14($GI_{3a}$) | ජූනි 13($GI_{2a}$) | ජූනි 12($GI_{1a}$) |
| | මාර්තු 14($GI_{3b}$) | මාර්තු 13($GI_{2b}$) | මාර්තු 12($GI_{2b}$) |
| | දෙසැ. 13($GI_{3c}$) | දෙසැ. 12($GI_{2c}$) | දෙසැ. 11($GI_{1c}$) |
| | සැප්. 13($GI_{3d}$) | සැප්. 12($GI_{2d}$) | සැප්. 11($GI_{1d}$) |
| මුළු එකතුව | $GI_3 = GI_{3a} + GI_{3b}$<br>$+ GI_{3c} + GI_{3d}$ | $GI_2 = GI_{2a} + GI_{2b}$<br>$GI_{2C} + GI_{1d}$ | $GI_1 = GI_{1a} + GI_{1b}$<br>$GI_{1C} + GI_{1d}$ |

එහිදී, GI = දළ ආදායම

**6.8.4 ප්‍රමිතිගත ප්‍රවේශය**

6.8.4.1 අයිතම 6.8.4.4 දක්වා ඇති සුදුසුකම්ලත් අයිතමවලට අනුකූල වීමට යටත්ව, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතිය සහිතව ඕනෑම බැංකුවකට මෙහෙයුම් අවදානම සඳහා ප්‍රාග්ධන අයකිරීම ගණනය කිරීම සඳහා ප්‍රමිතිගත ප්‍රවේශය යොදාගත හැක.

6.8.4.2 ප්‍රමිතගත ප්‍රවේශය අනුගමනය කරන බැංකුවක් ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු, ආයතනික මූල්‍ය, වෙළෙඳාම් හා විකුණුම්, ගෙවීම් හා පියවීම්, නියෝජිත සේවා, වත්කම් කළමනාකරණය, පාරිභෝගික තැරැව්කරණය, පාරිභෝගික බැංකුකරණය හා වාණිජ බැංකුකරණය යනුවෙන් ව්‍යාපාර අංශ 8 ක් යටතේ වර්ගීකරණය කළ යුතුය. මෙම ව්‍යාපාර අංශවල නිර්වචන වගුව 21 හි සවිස්තරව දක්වා ඇත.

**වගුව 21**

**ව්‍යාපාර අංශ අනුරූපණය**

| | 1 වන මට්ටම | 2 වන මට්ටම | ක්‍රියාකාරී කණ්ඩායම් |
|---|---|---|---|
| 1 | ආයතනික මූල්‍ය | ව්‍යාපාර මූල්‍ය | ඒකාබද්ධ කිරීම් හා අත්පත්කර ගැනීම්, ප්‍රාරක්ෂණය, පෞද්ගලීකරණය, සුරක්ෂිතකරණය, පර්යේෂණ, ණය (රාජ්‍ය, ඉහළ ප්‍රතිලාභ), හිමිකම්, සම්මේලයන්, මූලික මහජන නිකුතුව, ද්විතීයික පෞද්ගලික ස්ථාපනයන්. |
| | | ආයතනික මූල්‍ය | |
| | | වෙළෙඳ බැංකුකරණය | |
| | | උපදේශක සේවා | |
| 2 | වෙළෙඳාම් හා විකුණුම් | විකුණුම් | ස්ථාවර ආදායම්, හිමිකම්, විදේශ විනිමය, ණය නිෂ්පාදන, අරමුදල්කරණය, ස්වයං තත්ත්ව සුරැකුම්පත්, ණයදීම් සහ ප්‍රතිමිලදීගැනීම්, තැරැව්කරණය, ප්‍රාථමික තැරැව්කරණය සහ සුළු ආයෝජකයන් සඳහා රාජ්‍ය බැඳුම්කර විකිණීම. |
| | | වෙළෙඳපොල සැකසුම් | |
| | | හිමිකාරත්වය | |
| | | භාණ්ඩාගාර | |

| | | | |
|---|---|---|---|
| 3 | ගෙවීම් හා පියවීම් | බාහිර සේවාදායකයන් | ගෙවීම් හා රැස්කිරීම්, අන්තර් බැංකු අරමුදල් හුවමාරු (තත්කාලීන දළ පියවුම් පද්ධතිය, විද්‍යුත් අරමුදල් හුවමාරුව යනාදිය), උපලබ්ධිවීම් හා පියවීම්. |
| 4 | නියෝජිත කටයුතු | රැකවරණ | එස්ක්රෝ, සුරකුම්පත් ණය (පාරිභෝගිකයන්), ආයතනික ක්‍රියාවන්, තැන්පතු සේවා. |
| | | ආයතනික නියෝජිතයන් | නිකුත්කරන්නන් සහ ගෙවීම් නියෝජිතයන් |
| | | ආයතනික විශ්වාසය | ණයකර භාරකරු |
| 5 | වත්කම් කළමනාකරණය | අභිමත අරමුදල් කළමනාකරණය | සංචිත, විභජන, සිල්ලර, ආයතනික, සංවෘත, විවෘත, පෞද්ගලික හිමිකම්. |
| | | අභිමත නොවන අරමුදල් කළමනාකාරිත්වය | සංචිත, විභජන, සිල්ලර, ආයතනික, සංවෘත, විවෘත. |
| 6 | ප්‍රාථමික තැරැව්කරණය | ප්‍රාථමික තැරැව්කරණය | ක්‍රියාත්මක කිරීම් හා පූර්ණ සේවා |
| 7 | පාරිභෝගික බැංකුකරණය | පාරිභෝගික බැංකුකරණය | පාරිභෝගික ණය හා තැන්පතු, බැංකු සේවා, අරමුදල් හා බූදල්. |
| | | පෞද්ගලික බැංකුකරණය | පෞද්ගලික ණය (පුද්ගලික ණය) සහ පුද්ගලික (ආයතනික) තැන්පතු, බැංකු සේවා, අරමුදල් හා බූදල්, ආයෝජන උපදෙස්. |
| | | කාඩ්පත් සේවා | වෙළෙඳ/වාණිජ/ ආයතනික කාඩ්පත්, පුද්ගලික ලේබල සහ සිල්ලර. |
| 8 | වාණිජ බැංකුකරණය | වාණිජ බැංකුකරණය | ව්‍යාපෘති ණය ද ඇතුලත්ව ණයදීම්, ආයතනික ණය, ආනයන හා අපනයන ණය ඇතුලත්ව, වෙළෙඳ මූල්‍ය ණයවර ලිපිය, විනිමය බිල්පත්, ලීසිං, සාධ්‍යකරණය සහ ඇපවීම්.<br>තැන්පතු හා අනෙකුත් ආපසු ගෙවිය හැකි අරමුදල්. |

6.8.4.3 බැංකුවක් සිය මෙහයුම් අවදානම් ප්‍රාග්ධන අවශ්‍යතාවය, සෑම වර්ෂයක් සඳහා සෑම ව්‍යාපාරික අංශයකම මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධනයෙහි සරල එකතුවෙහි, වර්ෂ තුනක සාමාන්‍ය අගය ලෙස ගණනය කිරීම පහත පරිදි සිදුකළ යුතුය.

$$K_{TSA} = \{\sum_{years\ 1\text{-}3} \max[\sum(GI_{1\text{-}8} \times \beta_{1\text{-}8}), 0]\}/3$$

එනම්,

(අ) $K_{TSA}$ = ප්‍රමිතිගත ප්‍රවේශය යටතේ මෙහෙයුම් අවදානම සඳහා ප්‍රාග්ධන අයකිරීම.

(ආ) $GI_{1\text{-}8}$ = ඉහත වගුව 21 හි දැක්වෙන අන්දමට සියලුම ව්‍යාපාරික අංශ 8 ම සඳහා මූලික දර්ශක ප්‍රවේශය යටතේ අයිතම 6.8.3.2 සහ 6.8.3.4 ට අදාළව ගණනය කරන ලද, දෙන ලද වර්ෂයකට අදාළ වාර්ෂික දළ ආදායම.

(ඇ) $\beta_{1\text{-}8}$ = සියලුම ව්‍යාපාර අංශ සඳහා දළ ආදායමේ ප්‍රමාණයට අනුව අවශ්‍ය වන ප්‍රාග්ධන මට්ටමට අදාළව බැංකු සුපරීක්ෂණය සඳහා ඇති බාසල් කමිටුව විසින් පිහිටුවා ඇති ස්ථාවර β අගය (වගුව 22).

වගුව 22

සෑම ව්‍යාපාර අංශයකටම අදාළ β අගයන්

| අංකය | ව්‍යාපාර අංශ | β අගයන් |
|---|---|---|
| 1 | ආයතනික මූල්‍ය ($\beta_1$) | 18% |
| 2 | වෙළෙඳාම් හා විකුණුම් ($\beta_2$) | 18% |
| 3 | ගෙවීම් හා පියවීම් ($\beta_3$) | 18% |
| 4 | නියෝජිත කටයුතු ($\beta_4$) | 15% |
| 5 | වත්කම් කළමනාකරණය ($\beta_5$) | 12% |
| 6 | ප්‍රාථමික තැරැව්කරණය ($\beta_6$) | 12% |
| 7 | පාරිභෝගික බැංකුකරණය ($\beta_7$) | 12% |
| 8 | වාණිජ බැංකුකරණය ($\beta_8$) | 15% |

(ඇ) දෙන ලද ඕනෑම වර්ෂයක, යම් ව්‍යාපාර අංශයක සෘණාත්මක ප්‍රාග්ධන අයකිරීම (සෘණ දළ ආදායමකින් ජනිත වූ) අනෙකුත් ව්‍යාපාර අංශයක ධනාත්මක ප්‍රාග්ධන අයකිරීමට එරෙහිව හිලව් කළ හැක. කෙසේ නමුත්, දෙන ලද වර්ෂයක් තුළ සෑම ව්‍යාපාර

අංශයකම සමස්ත මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන අයකිරීම ඍණ අගයක් වනවිට, අදාළ වර්ෂය සඳහා බැංකුවේ මෙම මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන අයකිරීම ශුන්‍ය යැයි සලකනු ලැබේ. (එම වසරට අදාළ ලවයෙහි අගය ශුන්‍ය වේ).

(ඉ) සෑම ව්‍යාපාර අංශයක් තුළම දළ ආදායම ව්‍යාපාර මෙහෙයුම් පරිමාණයට ප්‍රතියුක්තයක් ලෙස ක්‍රියාකරන සහ එනයින් සෑම ව්‍යාපාර අංශයකම මෙහෙයුම් අවදානම නිරාවරණ ප්‍රමාණයේ පරිමාණයක් ලෙස සැලකෙන, පුළුල් දර්ශකයක් ලෙස ගැනේ.

(ඊ) සෑම බීටා අගයක්ම දෙන ලද ව්‍යාපාර අංශයක මෙහෙයුම් අවදානම් අලාභය හා එම ව්‍යාපාර අංශ සඳහා වූ සමස්ත දළ ආදායම අතර, ව්‍යාපාර වර්ගයට ආවේණික සම්බන්ධතාවයේ ප්‍රතියුක්තියක් ලෙස ක්‍රියා කරයි.

(උ) දළ ආදායම සමස්ත ව්‍යාපාර ආයතනයටම නොව, සෑම ව්‍යාපාර අංශයකටම ගණනය කළ යුතුය. එනම්, වාණිජ බැංකුකරණයේ නිර්ණායකය වන්නේ වාණිජ බැංකුකරණ ව්‍යාපාර අංශයෙන් ජනිත වූ දළ ආදායමයි. කෙසේ නමුත්, ව්‍යාපාර අංශ 8 හිම දළ ආදායමේ එකතුව බැංකුවේ දළ ආදායමට සමාන විය යුතුය.

**6.8.4.4 සුදුසුකම්ලත් නිර්ණායක**

6.8.4.4.1 අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය බැංකුවෙහි මෙහෙයුම් අවදානම් කළමනාකරණය අධීක්ෂණය සඳහා ක්‍රියාකාරී ලෙස දායක විය යුතුය.

6.8.4.4.2 සංකල්පමය වශයෙන් ස්ථාවර හා පූර්ණ ලෙස ක්‍රියාකාරී සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට අදාළ වගකීම් සහිත, මෙහෙයුම් අවදානම් කළමනාකරණ පද්ධතියක් බැංකුව සතු විය යුතුය. බැංකුවක් තම මෙහෙයුම් අවදානම් කාර්යය:

(i) මෙහෙයුම් අවදානම හඳුනා ගැනීමට, තක්සේරු කිරීමට, උපදේශනයට, පාලනයට හා අවම කිරීමට උපාය මාර්ග වැඩි දියුණු කිරීම;

(ii) මෙහෙයුම් අවදානම් කළමනාකරණය හා පාලනය සලකා බලමින් බැංකු මට්ටමෙන් ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග සම්පාදනය කිරීම සහ

(iii) බැංකුවේ මෙහෙයුම් අවදානම් තක්සේරු ක්‍රමවේදය සහ මෙහෙයුම් අවදානම් වාර්තාකරණ පද්ධතියක් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

යන අංගයන්ගෙන් සමන්විත වන බවට සහතික විය යුතුය.

6.8.4.4.3 බැංකුවක් ප්‍රමිතිගත ප්‍රවේශය භාවිතා කිරීමේදී ප්‍රධාන ව්‍යාපාර අංශ සඳහා මෙන්ම පාලන හා විගණන අංශ සඳහා ද ප්‍රමාණවත් සම්පත් සහිත විය යුතුය.

6.8.4.4.4 බැංකුවක ව්‍යාපාර අංශ, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය කළමනාකරණයට අදාළ, සැලකිය යුතු මෙහෙයුම් අලාභ ද ඇතුලත්ව, අවදානම් නිරාවරණය පිළිබඳ වාර්තාකරණ පද්ධතියක් බැංකුව සතු විය යුතුය.

6.8.4.4.5 බැංකුවෙහි මෙහෙයුම් අවදානම් කළමනාකරණ පද්ධතිය මනාව ලේඛනගත කළ යුතුය. අනුකූල නොවන ගැටළු වලට අදාළ විසඳුම් ප්‍රතිපත්ති ද ඇතුලත් අභ්‍යන්තර ප්‍රතිපත්ති, පාලන හා ක්‍රියාවලි ගොනු සැලකිල්ලට ගනිමින් ලේඛනගත කරන ලද ලියකියවිලි සඳහා මෙහෙයුම් අවදානම් කළමනාකරණ පද්ධතිය අනුකූල වන බවට සහතික වීම සඳහා ක්‍රමවේදයක් එහි තිබිය යුතුය.

6.8.4.4.6 මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සහ තක්සේරු පද්ධතිය, අවම වශයෙන් වාර්ෂිකව, වලංගු බව තහවුරු කිරීමකට සහ යාවත්කාලීන හා ක්‍රමවත් ස්වාධීන සමාලෝචනයකට යටත් විය යුතුය. මෙම සමාලෝචන වලට ව්‍යාපාර ඒකකවල ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය යන දෙකම ඇතුලත් විය යුතුය.

6.8.4.4.7 බැංකුවක්, අයිතම අ, ආ, ඇ සහ ඉහත වගුව 21 ට අනුකූල වන සේ නිශ්චිත ප්‍රතිපත්ති වැඩි දියුණු කළ යුතු අතර, එහි වර්තමාන ව්‍යාපාර කටයුතු කාලෝචිත ව්‍යාපාර අංශවලට අනුරූපණය කිරීම සඳහා දූරදර්ශී ලේඛනගත ක්‍රියාවලියක් පවත්වාගත යුතුය.

(අ) අනුරූපණ ප්‍රතිපත්තිය වැඩි දියුණු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරණය වගකිව යුතු වන අතර, එය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත් විය යුතුය. මෙම අනුරූපණ ප්‍රතිපත්ති නව ව්‍යාපාර කටයුතු වලට සුදුසු ලෙස සමාලෝචනය කිරීම හා සංශෝධනය කිරීම සිදුකළ යුතුය.

(ආ) බැංකුවක් තම ව්‍යාපාර කටයුතු, සුදුසු ව්‍යාපාර අංශ වලට අනුරූපීකරණය කරන විට පහත සඳහන් මූලධර්ම වලට අනුකූල විය යුතුය.

(i) පහත අයිතම (ii) ට යටත්ව, බැංකුවක් සෑම ක්‍රියාකාරකමක්ම හෝ ව්‍යාපාරයක්ම අන්‍යොන්‍ය වශයෙන් බහිෂ්කාර හෝ බද්ධ දීර්ඝ විස්තරයක් ලෙස 1 වන මට්ටමේ ව්‍යාපාර අංශ 8 ට (වගුව 21) අනුරූප කළ යුතුය.

(ii) කිසියම් ව්‍යාපාර අංශයකට පහසුවෙන් අනුරූප කළ නොහැකි සහ ව්‍යාපාර අංශයකට උපයෝගී වන සහ සහාය වන, ඕනෑම බැංකු හෝ බැංකු නොවන ක්‍රියාකාරකමක් හෝ නිෂ්පාදනයක්, එයට අදාළ වන ව්‍යාපාර අංශයකට පැවරිය යුතුය. යම් ක්‍රියාකාරකමක් ව්‍යාපාර අංශ එකකට වැඩි ගණනකට සහාය දක්වන්නේ නම්, වාර්ෂික දළ ආදායම බෙදා වෙන් කිරීමට අරමුණුගත නිර්ණායකයක් භාවිතා කළ යුතුය.

(iii) කිසියම් ව්‍යාපාර අංශයකට පහසුවෙන් අනුරූප කළ නොහැකි ඕනෑම ක්‍රියාකාරකමක් ඉහළම බීටා අගය, එනම්, 18%, සහිත ව්‍යාපාර අංශයට ඇතුලත් කළ යුතුය.

(iv) බැංකුවක් ව්‍යාපාර අංශ අතර දළ ආදායම බෙදා වෙන් කිරීමේදී, බැංකුවේ සමස්ත දළ ආදායම (මූලික දර්ශක ප්‍රවේශය යටතේ වාර්තා කළ යුතු ආකාරයට) තවදුරටත් ව්‍යාපාර අංශ 8 හි සමස්ත දළ ආදායමට සමාන වන පරිදි, අභ්‍යන්තර මිල කිරීම් ක්‍රමවේදයන් භාවිතා කළ යුතුය.

(v) යම් ක්‍රියාකාරකමක් කිසියම් ව්‍යාපාර අංශයකට වරක් අනුරූප කළ විටෙක, එම ක්‍රියාකාරකම එම ව්‍යාපාර අංශයටම අඛණ්ඩව අනුරූපණය කළ යුතුය.

(vi) ව්‍යාපාර අංශයන්හි කටයුතු මෙහෙයුම් අවදානම සඳහා ප්‍රාග්ධන අවශ්‍යතාවන්ට අනුරූප කිරීමේදී නියාමන ප්‍රාග්ධනය ගණනය කිරීම සඳහා භාවිතා කරන අනෙකුත් අවදානම් කාණ්ඩ ව්‍යාපාරික අංශ අර්ථ නිරූපණයන් සමග අනුරූප විය යුතුය. එනම්, ණය හා වෙළෙඳපොළ අවදානම.

(vii) ඕනෑම නව කටයුතු හෝ භාණ්ඩ අනුරූප කිරීමට නිශ්චිත ක්‍රියාවලීන් ස්ථාපිත කර තිබිය යුතුය.

(viii) අනුරූප කිරීමේ ක්‍රියාවලිය බැංකුවේ අභ්‍යන්තර හෝ බාහිර විගණකයන්ගේ නිරන්තර ස්වාධීන පරීක්ෂාවන්ට යටත් විය යුතුය.

**(ඇ) අතිරේක ව්‍යාපාර අංශ අනුරූප කිරීම සඳහා මගපෙන්වීම:**

බැංකු ව්‍යාපාර අංශ අට සඳහා අනුරූප කිරීමේදී භාවිතා කරන ප්‍රවේශයන් ව්‍යාපාර අංශ අනුරූප කිරීමේ මූලධර්ම සමඟ එකඟ වන්නේ නම් පමණක් විවිධාකාර වලංගු ප්‍රවේශයන් අනුරූප කිරීමේ ක්‍රියාවලීන් සඳහා යොදාගත හැක. පහත දැක්වෙන්නේ බැංකුවලට ඔවුන්ගේ දළ ආදායම අනුරූප කිරීමට භාවිතා කළ හැකි ප්‍රවේශයකි.

(i) පාරිභෝගික බැංකු කටයුතුවල දළ ආදායම සමන්විත වන්නේ පාරිභෝගික ගනුදෙනුකරුවන්ට සහ පාරිභෝගික ගනුදෙනුකරුවන් ලෙස සළකන සුළු හා මධ්‍ය පරිමාණ ගනුදෙනුකරුවන්ගේ ණය සහ අත්තිකාරම් මත ශුද්ධ පොලී ආදායම සාම්ප්‍රදායික පාරිභෝගික කටයුතු සඳහා අදාළ ගාස්තු, පාරිභෝගික බැංකු කටයුතු පොත්වල දරා සිටින හුවමාරු ගිවිසුම් හා ව්‍යුත්පන්න ඉදිරි සුරැකුම්වලින් ලද ශුද්ධ ආදායම සහ මිලදීගත් පාරිභෝගික ලැබීම්හි ආදායම්වල එකතුවයි. පාරිභෝගික බැංකු කටයුතුවල ශුද්ධ පොලී ආදායම ගණනය කිරීම සඳහා, පාරිභෝගික ගනුදෙනුකරුවන්ගේ ණය සහ අත්තිකාරම් මත ඉපැයූ පොලියෙන්, බර තැබූ සාමාන්‍ය ණය අරමුදල් පිරිවැය අඩුකර ලබාගත හැක. (ඕනෑම මූලාශ්‍රයකින් පාරිභෝගික හෝ අනෙකුත් තැන්පතු)

(ii) එසේම, වාණිජ බැංකු කටයුතුවල දළ ආදායම සමන්විත වන්නේ ආයතනික ණය සහ අත්තිකාරම් මත ශුද්ධ පොලී ආදායම (සුළු හා මධ්‍ය පරිමාණ ආයතනික ලෙස සලකයි), අන්තර් බැංකු සහ ස්වෛරීත්ව ගනුදෙනුකරුවන් සහ මිලදීගත් ආයතනික ලැබීම් මත ආදායම්, බැඳීම්, ඇපකර, විනිමය බිල්පත්, බැංකු පොත්වල ඇති සුරැකුම්පත් වලින් ලද ශුද්ධ ආදායම් (උදා:- කූපන් හා ලාභාංශ මගින්) ඇතුළුව සාම්ප්‍රදායික වාණිජ බැංකු කටයුතු හා සම්බන්ධ ගාස්තු, සහ වාණිජ බැංකු කටයුතු පොත්වල දරා සිටින හුවමාරු ගිවිසුම් හා ව්‍යුත්පන්න ඉදිරි ගිවිසුම්වලින් ලද ලාභ/අලාභ වල එකතුවෙනි. නැවතත්, ශුද්ධ පොලී ආදායම ගණනය කිරීම ආයතනික, අන්තර් බැංකු සහ ස්වෛරී පාරිභෝගිකයන්ගේ ණය හා අත්තිකාරම්වලින් ඉපැයූ පොලිය මත පදනම්ව එම ණය සඳහා බර තැබූ සාමාන්‍ය අරමුදල් පිරිවැය අඩුකර ලබාගනී. (ඕනෑම මූලාශ්‍රයකින්)

(iii) වෙළෙඳ හා විකුණුම්වල දළ ආදායම සමන්විත වන්නේ විකිණීම සඳහා පවතින සුරැකුම්පත්වල ලාභ/අලාභ, ශුද්ධ අරමුදල් සම්පාදන පිරිවැය හා පූර්ණ තැරැව්කාර ගාස්තුවල එකතුවෙනි.

(iv) අනෙකුත් ව්‍යාපාරික අංශ පහ සඳහා, දළ ආදායම සඳහා එම එක් එක් ව්‍යාපාර අංශ උපයාගත් ශුද්ධ ගාස්තු/කොමිස් ආදියෙන් සමන්විත වේ. ගෙවීම් හා පියවීම්හි දළ ආදායම සමන්විත වන්නේ පූර්ණ ගනුදෙනු පාර්ශවකරුවන් සඳහා වූ ගෙවීම්/පියවීම් පහසුකම් ආවරණය කිරීම සඳහා වන ගාස්තුවලිනි. වත්කම් කළමනාකරණය යනු අන් අය වෙනුවෙන් වත්කම් කළමනාකරණය කිරීමයි.

**6.8.5. විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය [The Alternative Standardised Approach (ASA)]**

6.8.5.1 බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතියට යටත්ව බැංකු තම මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන අවශ්‍යතාවය ගණනය කිරීමට විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශ ක්‍රමය යොදාගත හැක. ප්‍රමිතිගත ප්‍රවේශය යටතේ ඇති අයිතම 6.8.4.2 හි දක්වා ඇති සියලු සුදුසුකම් නිර්ණායකයන් සමඟ අනුකූල නොවන්නේ නම්, බැංකු මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන අවශ්‍යතාවය ගණනය කිරීම සඳහා විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය භාවිතා නොකළ යුතුයි.

6.8.5.2 පාරිභෝගික බැංකු හා වාණිජ බැංකු යන ව්‍යාපාර අංශ හැර ප්‍රමිතිගත ප්‍රවේශය යටතේ සහ විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය යටතේ මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන අවශ්‍යතාවය/ක්‍රමවේදය සමාන වේ. දළ ආදායම සඳහා ප්‍රතිස්ථාපනය ලෙස යොදා ගන්නා ආවරණ දර්ශකය සඳහා ණය අත්තිකාරම් වල ප්‍රමාණය ස්ථාවර සාධකයෙන් 'ප' (0.035) ගුණකර ලබාගනී.

6.8.5.3 බැංකු විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය අනුගමනය කරන්නේ නම් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතිය නොමැතිව ප්‍රමිතිගත ප්‍රවේශය හෝ මූලික දර්ශක ප්‍රවේශය භාවිතා නොකළ යුතුය.

6.8.5.4 විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය යටතේ මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන අවශ්‍යතාවය පහත සඳහන් පරිදි බැංකුව ගණනය කළ යුතුය.

$$K_{ASA} = \{\sum_{years\ 1\text{-}3} \max\ [\sum(GI_{1\text{-}6} \times \beta_{1\text{-}6}), 0]\} /3 + (\beta_7 \times m \times LA_r) + (\beta_8 \times m \times LA_c)$$

එහිදී,

(අ) $K_{ASA}$ = විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය යටතේ මෙහෙයුම් අවදානම සඳහා ප්‍රාග්ධන ප්‍රමාණය.

(ආ) $GI_{1\text{-}6}$ = පාරිභෝගික බැංකු හා වාණිජ බැංකු යන ව්‍යාපාර අංශ හැර, වගුව 21 හි පෙන්වා ඇති එක් එක් ව්‍යාපාරික අංශ 8 සඳහා දෙන ලද යම් වර්ෂයක් තුළ මූලික දර්ශක ප්‍රවේශයෙහි අයිතම 6.8.3.2 ට අනුකූලව ගණනය කරන ලද වාර්ෂික දළ ආදායම.

(ඇ) $\beta_{1\text{-}8}$ = වගුව 22 හි දක්වා ඇති ස්ථාවර බීටා සාධකය.

(ඈ) m = 0.035

(ඉ) $LA_r$ = පාරිභෝගික බැංකු කටයුතු ව්‍යාපාර අංශයෙහි ඇති සියලුම ණය සහ අත්තිකාරම්වල හිඟහිටි ප්‍රමාණයේ එකතුව.

(ඊ) $LA_c$ = වාණිජ බැංකු කටයුතු ව්‍යාපාර අංශයෙහි ඇති සියලුම ණය සහ අත්තිකාරම්වල හිඟහිටි ප්‍රමාණයේ එකතුව.

6.8.5.5 විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය සඳහා සියලුම ණය සහ අත්තිකාරම්වල හිඟහිටි ප්‍රමාණයන් පහත පරිදි දැක්විය හැක.

(අ) පාරිභෝගික බැංකු කටයුතු අංශය සමන්විත වන්නේ ශේෂ පත්‍රය තුළ සියලුම පාරිභෝගික ණය, සුළු පාරිභෝගික ලෙස සළකන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව ණය, නේවාසික උකස්කර සහ මිලදීගත් පාරිභෝගික ලැබීම්, ණය කළඹවල හිඟහිටි ණය යනාදියයි.

(ආ) වාණිජ බැංකු කටයුතු අංශය සමන්විත වන්නේ ශේෂ පත්‍රය තුළ සියලුම ආයතනික, ස්වෛරීත්ව බැංකු, විශේෂිත ණය, ආයතනික ලෙස සලකන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව ණය සහ මිලදීගත් ආයතනික ලැබීම්වල එකතුව සහ කල්පිරෙන තෙක් දරා සිටින සහ විකිණීම සඳහා පවතින යන කාණ්ඩයන්හි ඇති සුරැකුම්පත්වල පොත් අගයන් හා අනෙකුත් ණය කළඹයන්ය.

6.8.5.6 $L_r$ සහ $L_c$ ගණනය කිරීම සඳහා, බැංකුවක් තම දළ වෙන්කිරීම්/හානිකර ගාස්තු නොසලකා අදාළ ව්‍යාපාර අංශවල වඩාත්ම මෑතකාලීන මූල්‍ය කාර්තු 12 හි තිබූ සියලුම ණය හා අත්තිකාරම්වල හිඟහිටි ප්‍රමාණයන්ගේ එකතුවල සරල සාමාන්‍යය සලකා බලයි.

**6.8.6 කොටස (WBRC 11.5.1.8.0.0) සම්පූර්ණ කිරීම සඳහා විශේෂිත උපදෙස්**

6.8.6.1 කොටස V (අ) මෙහෙයුම් අවදානම සඳහා අවදානම් මත බර තැබූ වටිනාකම ගණනය කිරීම.

6.8.6.1.1 දළ ආදායම/ණය සහ අත්තිකාරම්

(WBRC 11.5.1.7.0.0)

දළ ආදායම: මූලික දර්ශක ප්‍රවේශය යටතේ එක් එක් වර්ෂය සඳහා දළ ආදායමේ වටිනාකම (WBRC 11.5.1.1.0.0), ප්‍රමිතිගත ප්‍රවේශයෙහි ව්‍යාපාර අංශයන්හි (WBRC 11.5.1.2.1.0 සිට 11.5.1.2.8.0), සහ විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශයෙහි ව්‍යාපාර අංශයන්හි (WBRC 11.5.1.7.0.0) අගයන් කොටස් V(b) හට ලබාදෙන දත්ත මත පදනම්ව ස්වයංක්‍රීයව පහත පරිදි පෙන්නුම් කෙරේ.

දළ ආදායම = පොලී ආදායම (WBRC 11.5.2.3.0.0) - පොලී වියදම (WBRC 11.5.2.4.0.0) + පොලී නොවන ආදායම (WBRC 11.5.2.5.0.0) (+/-) බැංකු පොත්වල සුරැකුම්පත් විකිණීම මගින් උපලබ්ධි වූ ලාභ/අලාභ (WBRC 11.5.2.6.0.0) (+/-) අතිවිශේෂ/අසාමාන්‍ය ආදායම් අයිතම (WBRC 11.5.2.7.0.0)

මෙය පහත සඳහන් උදාහරණය මගින් විදහා දැක්වේ.

වගුව 23

**වාර්ෂික දළ ආදායම ගණනය කිරීමේ උදාහරණය**

| අයිතමය | වටිනාකම රු.'000 | වටිනාකම රු.'000 |
|---|---|---|
| පොලී ආදායම | 200,000 | 200,000 |
| අඩුකළා: පොලී වියදම | (100,000) | (100,000) |
| **ශුද්ධ පොලී ආදායම** | **100,000** | **100,000** |
| **පොලී නොවන ආදායම** | | |
| ගාස්තු හා කොමිස් ආදායම් | 50,000 | 50,000 |
| ලාභාංශ ආදායම | 30,000 | 30,000 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය | 40,000 | |
| වෙළෙඳාම් කටයුතු මගින් ලද ලාභය/අලාභය | 20,000 | 20,000 |
| බැංකු පොත්වල තිබූ සුරැකුම්පත් විකිණීම මගින් උපලබ්ධි වූ ලාභ/අලාභ | 50,000 | |
| වෙනත් | 10,000 | 10,000 |
| **පොලී නොවන ආදායම** | **200,000** | **110,000** |
| **මෙහෙයුම් ආදායම** | **300,000** | **210,000** |
| අඩුකළා: මෙහෙයුම් වියදම් | (100,000) | |
| අඩුකළා: දීමනා | (50,000) | |
| අඩුකළා: බදු | (30,000) | |
| **කාලච්ඡේදයට අදාළ ලාභය/(අලාභය)** | **120,000** | - |
| **මෙහෙයුම් අවදානම් ප්‍රාග්ධන අවශ්‍යතාවය සඳහා දළ ආදායම** | | **210,000** |

**ණය සහ අත්තිකාරම්:** පාරිභෝගික බැංකු කටයුතු (WBRC 11.5.1.3.2.1) සහ වාණිජ බැංකු කටයුතු (WBRC 11.5.1.3.2.2) සම්බන්ධයෙන් ණය හා අත්තිකාරම්වල වටිනාකම් අයිතම 6.8.5.6 ට අනුකූලව සම්පූර්ණ කළ යුතුය.

**6.8.6.1.2 ප්‍රාග්ධන අයකිරීම්**

(WBRC 11.5.1.8.0.0)

පහත සඳහන් පරිදි, මූලික දර්ශක ප්‍රවේශය, ප්‍රමිතිගත ප්‍රවේශය සහ විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය සම්බන්ධයෙන් එක් එක් වර්ෂය සඳහා ප්‍රාග්ධන අයකිරීම් වටිනාකම ගණනය කරනු ඇත.

(i) **මූලික දර්ශක ප්‍රවේශය:** එක් එක් වර්ෂයෙහි දළ ආදායම α (15%) මගින් ගුණ කිරීමෙන්ය.

(ii) **ප්‍රමිතිගත ප්‍රවේශය:** එක් එක් වර්ෂ සඳහා අදාළ ව්‍යාපාරික අංශවල දළ ආදායම්, එම ව්‍යාපාර අංශවලට පවරා ඇති β අගයන් වලින් ගණනය කිරීමෙන්ය.

(iii) **විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය:** එක් එක් වර්ෂ සඳහා අදාළ ව්‍යාපාරික අංශවල දළ ආදායම්, එම ව්‍යාපාර අංශවලට පවරා ඇති β අගයන් වලින් ගුණ කිරීමෙන්ය. පාරිභෝගික බැංකු කටයුතු ව්‍යාපාර අංශය හා වාණිජ බැංකු කටයුතු අංශයන් සම්බන්ධ ප්‍රාග්ධන අයකිරීම් ගණනය කර ඇත්තේ හිඟහිටි ණය සහ අත්තිකාරම්වල වාර්ෂික සාමාන්‍ය, ස්ථාවර සාධකය m එනම් 0.035 සමග අදාළ β අගයෙන් පිළිවෙලින් 12% සහ 15% මගින් ගුණ කිරීමෙන්ය.

**6.8.6.1.3 මෙහෙයුම් අවදානම සඳහා ප්‍රාග්ධන අයකිරීම්**

(WBRC 11.5.1.9.0.0)

පහත සඳහන් පරිදි, මූලික දර්ශක ප්‍රවේශය, ප්‍රමිතිගත ප්‍රවේශය සහ විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය සම්බන්ධයෙන් මෙහෙයුම් අවදානම සඳහා ප්‍රාග්ධන අයකිරීම් වටිනාකම ස්වයංක්‍රීයව පහත පරිදි පෙන්නුම් කෙරේ.

(i) අවුරුදු 3 ක් සඳහා වාර්තා කළ ප්‍රාග්ධන අයකිරීම්වල එකතුව වන, මූලික දර්ශක ප්‍රවේශය (WBRC 11.5.1.8.0.0) සහ (11.5.1.1.0.0), ප්‍රමිතිගත ප්‍රවේශයේ (WBRC 11.5.1.8.0.0 සහ 11.5.1.2.0.0) සහ විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශයේ (WBRC 11.5.1.8.0.0 සහ 11.5.1.3.0.0) හි එකතුව 3 න් (වසර ගණන) බෙදීමෙන් එක් එක් ප්‍රවේශයන් යටතේ මෙහෙයුම් අවදානම සඳහා පිළිවෙලින් ප්‍රාග්ධන අයකිරීම් ගණනය කරනු ලබයි.

(ii) මෙම වසර 3 දී සෘණ ප්‍රාග්ධන අයකිරීමක් වාර්තා වන්නේ නම්, වර්ෂයක/වර්ෂවල එය ශුන්‍ය වටිනාකමක් ලෙස සලකන අතර අනෙකුත් වර්ෂවල වාර්තා වූ ධනාත්මක ප්‍රාග්ධන අයකිරීම් හිලව් කිරීම සඳහා භාවිතා නොකළ යුතුය.

(iii) මූලික දර්ශක ප්‍රවේශය සම්බන්ධයෙන් ගත්කල, ඉහත (1) හි සඳහන් වසර ගණන අයිතම 6.8.3.3 ට අනුකූලව වෙනස් විය හැක.

**6.8.6.1.4 මෙහෙයුම් අවදානම සඳහා අවදානම් මත බර තැබූ වටිනාකම**

(WBRC 11.5.1.10.0.0)

මූලික දර්ශක ප්‍රවේශය සම්බන්ධයෙන් (WBRC 11.5.1.10.1.0) ප්‍රමිතිගත ප්‍රවේශය සම්බන්ධයෙන් (WBRC 11.5.1.10.2.0) සහ විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය සම්බන්ධයෙන් (WBRC 11.5.1.10.3.0) මෙහෙයුම් අවදානම් සඳහා අවදානම් මත බර තැබූ වටිනාකමේ අගය, මූලික දර්ශක ප්‍රවේශය යටතේ (WBRC 11.5.1.9.1.0) ප්‍රමිතිගත ප්‍රවේශය යටතේ (WBRC 11.5.9.9.2.0) සහ විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය යටතේ (WBRC 11.5.1.9.3.0) ඇති මෙහෙයුම් අවදානම් සහ ප්‍රාග්ධන අයකිරීම්හි අගයන්ගෙන් ස්වයංක්‍රීයව ගණනය කර වෙන වෙනම පෙන්නුම් කරයි.

**6.8.6.2 කොටස V (ආ) මෙහෙයුම් අවදානම යටතේ දළ ආදායම ගණනය කිරීම්**

අයිතම 6.8.3.4 සමඟ අනුකූල විය යුතුය.

6.8.6.2.2 (WBRC 11.5.2.1.0.0) අදාළ වන්නේ මූලික දර්ශක ප්‍රවේශය සඳහා පමණි. (WBRC 11.5.2.2.1.0) සිට (11.5.2.2.6.0) යටතේ ඇති ව්‍යාපාරික අංශ හය ප්‍රමිතිගත ප්‍රවේශය සහ විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය යන දෙකම සඳහා අදාළ වන අතර (WBRC 11.5.2.2.7.0) සහ (11.5.2.2.8.0) යටතේ ඇති ව්‍යාපාරික අංශ දෙක විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය සඳහා පමණක් අදාළ වේ.

**උපලේඛනය 2**

**කොටස V (අ) මෙහෙයුම් අවදානම සඳහා අවදානම් මත බර තැබූ වටිනාකම ගණනය කිරීම්**

| අංකනය | ව්‍යාපාර අංශ (11.5.1.4.0.0) | ප්‍රාග්ධන අයකිරීම් සාධකය (α සහ β) 11.5.1.5.0.0 | ස්ථාවර සාධකය 'm' 11.5.1.6.0.0 | දළ ආදායම/ණය සහ අත්තිකාරම් 11.5.1.7.0.0 | | | ප්‍රාග්ධන අයකිරීම් 11.5.1.8.0.0 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | පළමු වර්ෂය | දෙවන වර්ෂය | තෙවන වර්ෂය | පළමු වර්ෂය | දෙවන වර්ෂය | තෙවන වර්ෂය |
| 11.5.1.1.0.0 | මූලික දර්ශක ප්‍රවේශය (BIA) | 15% | | | | | **0** | **0** | **0** |
| | | | | | | | | | |
| 11.5.1.2.0.0 | ප්‍රමිතිගත ප්‍රවේශය (TSA) | | | **0** | **0** | **0** | **0** | **0** | **0** |
| 11.5.1.2.1.0 | ආයතනික මූල්‍ය ($\beta_1$) | 18% | | | | 0 | 0 | 0 | 0 |
| 11.5.1.2.2.0 | වෙළෙඳාම හා විකුණුම් ($\beta_2$) | 18% | | | | 0 | 0 | 0 | 0 |
| 11.5.1.2.3.0 | ගෙවීම් හා පියවීම් ($\beta_3$) | 18% | | | | 0 | 0 | 0 | 0 |
| 11.5.1.2.4.0 | නියෝජිත සේවා ($\beta_4$) | 15% | | | | 0 | 0 | 0 | 0 |
| 11.5.1.2.5.0 | වත්කම් කළමනාකරණය ($\beta_5$) | 12% | | | | 0 | 0 | 0 | 0 |
| 11.5.1.2.6.0 | පාරිභෝගික තැරැව්කරණය ($\beta_6$) | 12% | | | | 0 | 0 | 0 | 0 |
| 11.5.1.2.7.0 | පාරිභෝගික බැංකුකරණය ($\beta_7$) | 12% | | | | 0 | 0 | 0 | 0 |
| 11.5.1.2.8.0 | වාණිජ බැංකුකරණය ($\beta_8$) | 15% | | | | 0 | 0 | 0 | 0 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| 11.5.1.3.0.0 | විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය (ASA) | | | | | 0 | 0 | 0 | 0 |
| 11.5.1.3.1.0 | උප එකතුව | | | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 11.5.1.3.1.1 | ආයතනික මූල්‍ය ($\beta_1$) | 18% | | | | | 0 | 0 | 0 |
| 11.5.1.3.1.2 | වෙළෙඳාම හා විකුණුම් ($\beta_2$) | 18% | | | | | 0 | 0 | 0 |
| 11.5.1.3.1.3 | ගෙවීම් හා පියවීම් ($\beta_3$) | 18% | | | | | 0 | 0 | 0 |
| 11.5.1.3.1.4 | නියෝජිත සේවා ($\beta_4$) | 15% | | | | | 0 | 0 | 0 |
| 11.5.1.3.1.5 | වත්කම් කළමනාකරණය ($\beta_5$) | 12% | | | | | 0 | 0 | 0 |
| 11.5.1.3.1.6 | පාරිභෝගික තැරැව්කරණය ($\beta_6$) | 12% | | | | | 0 | 0 | 0 |
| 11.5.1.3.2.0 | උප එකතුව | | | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 11.5.1.3.2.1 | පාරිභෝගික බැංකුකරණය ($\beta_7$) | 12% | 0.035 | | | | 0 | 0 | 0 |
| 11.5.1.3.2.2 | වාණිජ බැංකුකරණය ($\beta_8$) | 15% | 0.035 | | | | 0 | 0 | 0 |
| | | | | | | | | | |
| 11.5.1.9.0.0 | මෙහෙයුම් අවදානම සඳහා ප්‍රාග්ධන ගාස්තුව | | | | | | | | |
| 11.5.1.9.1.0 | මූලික දර්ශක ප්‍රවේශය | | | | | | | | 0 |
| 11.5.1.9.2.0 | ප්‍රමිතිගත ප්‍රවේශය | | | | | | | | 0 |
| 11.5.1.9.3.0 | විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය | | | | | | | | 0 |
| 11.5.1.10.0.0 | මෙහෙයුම් වියදම් සඳහා අවදානම මත බර තැබූ වටිනාකම | | | | | | | | |
| 11.5.1.10.1.0 | මූලික දර්ශක ප්‍රවේශය (11.5.1.9.1.0*10) | | | | | | | | 0 |
| 11.5.1.10.2.0 | ප්‍රමිතිගත ප්‍රවේශය (11.5.1.9.2.0*10) | | | | | | | | 0 |
| 11.5.1.10.3.0 | විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය (11.5.1.9.3.0*10) | | | | | | | | 0 |

මූලික දර්ශක ප්‍රවේශය යටතේ මෙහෙයුම් අවදානම සඳහා ප්‍රාග්ධන අයකිරීම

$K_{BIA} = [\sum(GI_{1....n} \times \alpha)]/n$

ප්‍රමිතිගත ප්‍රවේශය යටතේ මෙහෙයුම් අවදානම සඳහා ප්‍රාග්ධන අයකිරීම

$K_{TSA} = \{\sum_{years1-3} \max[\sum(GI_{1-8}\, x\beta_{1-8}), 0]\}/3$

විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය යටතේ මෙහෙයුම් අවදානම සඳහා ප්‍රාග්ධන අයකිරීම

$K_{ASA} = \{\sum_{years1-3} \max[\sum(GI_{1-6} \times \beta_{1-6}), 0]\} /3 + (\beta_7 \times m \times LA_r) + (\beta_8 \times m \times LA_c)$

**කොටස V (ආ) මෙහෙයුම් අවදානම යටතේ දළ ආදායම ගණනය කිරීම්**

| අංකනය | ව්‍යාපාර අංශ (11.5.2.3.0.0) | පොලී ආදායම (11.5.2.4.0.0) | | | පොලී වියදම (11.5.2.5.0.0) | | | පොලී නොවන ආදායම (11.5.2.6.0.0) | | | බැංකු පොත්වල තිබූ සුරැකුම්පත් විකිණීම මගින් උපලබ්ධි වූ ලාභ/අලාභ (11.5.2.7.0.0) | | | අතිවිශේෂ/අසාමාන්‍ය ආදායම් අයිතම (11.5.2.8.0.0) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පළමු වර්ෂය | දෙවන වර්ෂය | තෙවන වර්ෂය | පළමු වර්ෂය | දෙවන වර්ෂය | තෙවන වර්ෂය | පළමු වර්ෂය | දෙවන වර්ෂය | තෙවන වර්ෂය | පළමු වර්ෂය | දෙවන වර්ෂය | තෙවන වර්ෂය | පළමු වර්ෂය | දෙවන වර්ෂය | තෙවන වර්ෂය |
| 11.5.2.1.0.0 | මූලික දර්ශක ප්‍රවේශය | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |
| 11.5.2.2.0.0 | ප්‍රමිතිගත ප්‍රවේශය/විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 11.5.2.2.1.0 | ආයතනික මූල්‍ය | | | | | | | | | | | | | | | |
| 11.5.2.2.2.0 | වෙළෙඳාම හා විකුණුම් | | | | | | | | | | | | | | | |
| 11.5.2.2.3.0 | ගෙවීම් හා පියවීම් | | | | | | | | | | | | | | | |
| 11.5.2.2.4.0 | නියෝජිත සේවා | | | | | | | | | | | | | | | |
| 11.5.2.2.5.0 | වත්කම් කළමනාකරණය | | | | | | | | | | | | | | | |
| 11.5.2.2.6.0 | පාරිභෝගික තැරැව්කරණය | | | | | | | | | | | | | | | |
| 11.5.2.2.7.0 | පාරිභෝගික බැංකුකරණය | | | | | | | | | | | | | | | |
| 11.5.2.2.8.0 | වාණිජ බැංකුකරණය | | | | | | | | | | | | | | | |

1988 අංක 30 දරන බැංකු (සංශෝධිත) පනතේ 46(1) හා 76(ඒ)(1) වගන්තීන් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධානයන්.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
**සභාපති**
මුදල් මණ්ඩලය
ශ්‍රී ලංකා මහ බැංකුව

**කොළඹ**
**2014 ජුනි 05 දින**

## 2014 අංක 1 දරන බැංකු පනත යටතේ කරනු ලබන විධානයන් බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකුවල නිශ්චල දේපල තක්සේරු කිරීම සඳහා වන නියාමන රාමුව

2006 අංක 46 දරන බැංකු පනතින් අවසන් වරට සංශෝධිත, 1988 අංක 30 දරන බැංකු පනතේ 46(1) හා 76(ඒ)(1) වගන්ති මගින් පවරන ලද බලතල ප්‍රකාරව, මුදල් මණ්ඩලය විසින් 2014 අංක 1 දරන, බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකුවල නිශ්චල දේපල තක්සේරුකරණය පිළිබඳ නියාමන රාමුව මත වූ විධානය මෙසේ නිකුත් කරනු ලබයි.

**1. බැංකු පනත යටතේ බලගැන්වීම**

1.1 බැංකු පනතේ 46(1) හා 76(ඒ)(1) වගන්ති ප්‍රකාරව, බැංකු පද්ධතියේ ශක්තිමත්භාවය සහතික කිරීම පිණිස, පිළිවෙලින් සියලුම හෝ කිසියම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හා විශේෂිත බැංකුවක් වෙත එකී බැංකු විසින් සිය ව්‍යාපාර ස්වරූපයන් මෙහෙයවිය යුතු ආකාරය සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමට මුදල් මණ්ඩලය වෙත බලතල පැවරී ඇත.

**2. නිශ්චල දේපල තක්සේරුකරණයට අදාළව ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම සහ ක්‍රියාවට නැංවීම**

2.1 සෑම බලපත්‍රලාභී වාණිජ සහ විශේෂිත බැංකුවක් විසින්ම සිය නිශ්චල දේපල තක්සේරු කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද, සුදුසු විචක්ෂණශීලී ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටීන් පවතින බවට සහතික විය යුතුය. ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත කරන ලද බැංකු සම්බන්ධයෙන් "අධ්‍යක්ෂ මණ්ඩලය" යනුවෙන් එම බැංකුව අධීක්ෂණය කරන ප්‍රධාන කාර්යාලය හෝ කලාපීය කාර්යාලය අදහස් වේ.

2.2 ඉහත කී විධාන අංක 2.1 ප්‍රකාරව, නිශ්චල දේපල තක්සේරුකරණය පිළිබඳව ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටීන් ස්ථාපිත කිරීමේදී, සෑම බලපත්‍රලාභී වාණිජ හා විශේෂිත බැංකුවක් විසින්ම පහත සඳහන් අවම අවශ්‍යතා සැළකිල්ලට ගතයුතු වන අතර, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය ද ඇතුළුව වෙනත් යම් නියාමන ආයතනයක් විසින් පනවනු ලැබූ සියලුම අවශ්‍යතාවයන්ට ද අනුකූල විය යුතුය.

(අ) ප්‍රතිපත්ති සෑදීම හා එය කාලීනව සමාලෝචනය කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට සහ වෙනත් යම් කමිටුවකට (උදා:- ණය කමිටුව) ඇති වගකීම.

(ආ) අභ්‍යන්තර සහ බාහිර තක්සේරුකරුවන්ගේ මඩුලු පත්කිරීම.

(ඇ) පහත සඳහන් විධාන අංක 5 ට යටත්ව, තක්සේරුකරුවන්ගේ මඩුල්ල පත්කිරීම සඳහා සුදුසුකම් ලත් තක්සේරුකරුවන් හඳුනා ගැනීම හා තෝරාගැනීමට අදාළ ක්‍රියාපටිපාටීන්.

(ඈ) තක්සේරුකරණ ආකෘතියක් මගින් ලබාගත් යම් නිශ්චල දේපලක් සම්බන්ධයෙන් වන වෙළෙඳ වටිනාකමෙහි ඇති සාධාරණභාවය සහ එකී තක්සේරුකරණයක් සඳහා යොදාගත් දත්තවල විශ්වසනීයත්වය හා නිවැරදිභාවය ඇගයීමට ලක්කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියාපටිපාටීන්.

(ඉ) පහත සඳහන් විධාන අංක 6 ට යටත්ව, අදාළ වන පරිදි සියලු ණය හා අත්තිකාරම්වලට එරෙහිව සුරැකුම් වශයෙන් තබා ඇති නිශ්චල දේපල සම්බන්ධයෙන් ලබාගත් හෝ ලබාගැනීමට නියමිත අභ්‍යන්තර හා බාහිර තක්සේරු වාර්තා වලට අදාළ සීමා (Threshold).

(ඊ) පහත සඳහන් විධාන අංක 7 ට යටත්ව, තක්සේරුකරණ කාලපරාසය.

(උ) අභ්‍යන්තර තක්සේරුකරණයට අදාළ තක්සේරු කිරීමේ නිර්ණායකයන්.

(ඌ) පහත සඳහන් විධාන අංක 8 ට යටත්ව, ස්වාධීනත්වය හා හෙළිදරව් කිරීම්.

(එ) ණයගැතියන් වෙත කරන නිවේදනය: සුරැකුම් වශයෙන් ලබාගත් නිශ්චල දේපලෙහි සම්පූර්ණ විස්තරයක් සමග නැවත තක්සේරු කිරීමේ ආකාරය සහ කාලපරාසය පිළිබඳව සම්පූර්ණ විස්තරයක්, ණය ගිවිසුමෙහි අන්තර්ගත විය යුතුය.

(ඒ) බාහිර තක්සේරුකරුවන්ට කරනු ලබන ගෙවීම් හා ගාස්තු ව්‍යුහය සම්බන්ධයෙන් වන ක්‍රියාපටිපාටිය.

**3. නිශ්චල දේපල**

3.1 මෙකී විධානයන්ගේ අවශ්‍යතාවය සඳහා, නිශ්චල දේපල යන්නෙන් අදහස් වන්නේ පහත සඳහන් අවශ්‍යතා සඳහා අත්පත් කරගන්නා ලද හෝ දරනු ලැබූ ඉඩම්, ඉඩම් සහ ගොඩනැගිලි හෝ ඒ සම්බන්ධයෙන් වන කුමන හෝ හිමිකමක් වේ.

(අ) අත්පත්කර ගන්නා දේපල ද ඇතුලත්ව කිසියම් බැංකුවක් විසින් ප්‍රදානය කරනු ලැබූ ණය පහසුකමකට එරෙහිව සුරැකුම් වශයෙන් ලබාගන්නා ඉඩම්, ඉඩම් හා ගොඩනැගිලි.

(ආ) කිසියම් බැංකුවක් විසින් සිය බැංකු ව්‍යාපාරය පවත්වාගෙන යාමේ අරමුණ සඳහා මිලට ගන්නා ලද හෝ අත්පත්කර ගන්නා ලද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව, (SLAS) (උදා:- එල්.කේ.ඒ.එස් 16: දේපල, පිරියත යන්ත්‍රෝපකරණ හා උපකරණ) අගය කරන ලද හා හෙළිදරව් කරන ලද ඉඩම්, ඉඩම් හා ගොඩනැගිලි.

(ඇ) බැංකුවක් තම ආයෝජන ලෙස මිලදීගත් හෝ අත්පත්කර ගන්නා ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව (SLAS) (උදා:- එල්.කේ.ඒ.එස් 40 : ආයෝජන දේපල) අගය කරන ලද සහ හෙළිදරව් කරන ලද ඉඩම්, ඉඩම් හා ගොඩනැගිලි.

**4. අරමුණු**

4.1 පහත දැක්වෙන අරමුණු සඳහා නිශ්චල දේපල තක්සේරු කිරීම කළ යුතු වේ.

(අ) 1988 අංක 30 දරන බැංකු පනත ප්‍රකාරව පනවා ඇති නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් මගින් නියම කර ඇති පරිදි මූල්‍ය තොරතුරු වාර්තාකරණය උදෙසා නිශ්චල දේපල තක්සේරු කිරීම සඳහා.

(ඇ) බැංකුවල නිශ්චල දේපල තක්සේරු කිරීමේ අවශ්‍යතාවයක් ඇතිව පවත්වාගෙන යන්නා වූ වෙනත් ව්‍යාපාරික අවශ්‍යතා සඳහා.

**5. තක්සේරුකරුවන්ගේ යෝග්‍යතාවය සඳහා වන නිර්ණායකයන්**

5.1 සෑම බැංකුවක්ම පහත සඳහන් දෑ තහවුරු කළ යුතුය:

(අ) තක්සේරුකරුවන්ගේ යෝග්‍යතාවය පිළිබඳ නිර්ණායකයන් පහත පරිදි වේ.

A. ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ සමායතන සාමාජිකයකු විය යුතු වන අතර ඔහු:

I. සම සාමාජිකයකු; හෝ

II. අදාළ සාමාජිකත්ව ශ්‍රේණියේ වසර 5 ක පළපුරුද්ද සහිත උපාධිධාරී සාමාජිකයකු; හෝ

III. ආශ්‍රිත සාමාජිකත්වයේ දස වසරක් සම්පූර්ණ කිරීම සඳහා යම් ආශ්‍රිත සාමාජිකයකු විසින් ගත කළ හැකිව තිබූ කාලයට සමාන වන පළපුරුද්දක් සහිතව උපාධිධාරී සාමාජිකත්වයට බැඳෙන අවස්ථාවේදී ආශ්‍රිත සාමාජිකයකුව සිටි උපාධිධාරී සාමාජිකයකු; හෝ

IV. අදාළ සාමාජිකත්ව ශ්‍රේණියේ දස වසරක පළපුරුද්ද සහිත ආශ්‍රිත සාමාජිකයකු.

B. එක්සත් රාජධානියේ වරලත් මිනින්දෝරුවන්ගේ රාජකීය ආයතනයේ (ආර්අයිසීඑස්) සම සාමාජිකයකු.

C. අදාළ සාමාජිකත්ව ශ්‍රේණියේ වසර තුනක පළපුරුද්ද සහිත වෙනත් ඕනෑම ආර්අයිසීඑස් සාමාජිකයකු.

(ආ) ඉහත විධාන අංක 5.1. (අ) අනුව සුදුසුකම් ලබන තක්සේරුකරුවන් අදාළ වෘත්තීයමය ආයතනය මගින් අනුමත කරන ලද/නිර්දේශිත අඛණ්ඩ වෘත්තීයමය සංවර්ධනයන් අත්පත්කර ගනී.

(ඇ) 2015 ජනවාරි පළමුවැනි දින සිට, නිශ්චල දේපල සම්බන්ධයෙන් අභ්‍යන්තර තක්සේරු කිරීම් සිදුකළ යුත්තේ ඉහත කී විධාන අංක 5.1. (අ) හා (ආ) හි නිර්ණායකයන්ට අනුව යෝග්‍යතාවය සපුරාලන තක්සේරුකරුවන් විසින්ය.

**6. අභ්‍යන්තර හා බාහිර තක්සේරු වාර්තා සඳහා වන සීමාව**

6.1 අක්‍රිය ණය හා අත්තිකාරම් හැර අදාළ වන පරිදි සියලුම ණය අත්තිකාරම් වලට එරෙහිව සුරැකුම් ලෙස ලබාගත් හෝ ලබාගැනීමට නියමිත නිශ්චල දේපල සම්බන්ධයෙන් බැංකු සිය ප්‍රතිපත්තීන්ට අනුකූලව වඩා උචිත අභ්‍යන්තර හා බාහිර තක්සේරුකරණ සීමාවන් ස්ථාපිත කළ යුතුය.

6.2 අක්‍රිය ණය සම්බන්ධයෙන් වන අභ්‍යන්තර තක්සේරු වාර්තාවලට අදාළ සීමාව, බැංකු පනත යටතේ නිකුත් කරන ලද 2008 අංක 3 හා 4 දරන ණය හා අත්තිකාරම් වර්ගීකරණය, ආදායම් හඳුනාගැනීම හා වෙන්කිරීම් වලට අදාළ විධානයන්ට අනුව සිදුවිය යුතු වේ. එනම්, හිඟහිටි ප්‍රාග්ධන ශේෂය මිලියන 5 ක් හෝ බැංකුවේ ප්‍රාග්ධන පදනමෙන් 0.1% යන අගයන් දෙකෙන් අඩු වටිනාකමට වඩා අඩු අගයක් ගන්නා ණය පහසුකම් වේ.

**7. තක්සේරු කිරීමේ වාර ගණන**

7.1 ඉහත කී විධාන අංක 2.2 (ඊ) හි දක්වන ලද තක්සේරු කිරීමෙහි වාර ගණන පහත පරිදි වේ.

(අ) අක්‍රිය ගණයට මාරු වී ඇති ණය හා අත්තිකාරම් වලට එරෙහිව සුරැකුම් ලෙස ලබාගෙන ඇති නිශ්චල දේපල තක්සේරු කිරීම බැංකු පනතේ 2008 අංක 3 හා 4 දරන ණය හා අත්තිකාරම් වර්ගීකරණය, ආදායම් හඳුනාගැනීම හා වෙන්කිරීම් වලට අදාළ විධානයන්හි දක්වා ඇති වාර ගණන අනුව සිදුකළ යුතුය. එනම්, නේවාසික නිවාස අවශ්‍යතාවය සඳහා ණයකරුවා පදිංචිව සිටින දේපලක් මත දෙනු ලැබූ ණය පහසුකම් සම්බන්ධයෙන් වනවිට, තක්සේරු වාර්තාව වසර 4 කට වඩා කල් නොවැඩි විය යුතු වන අතර අනෙකුත් සියලු ණය පහසුකම් සඳහා, තක්සේරු වාර්තාව වසර 3 කට වඩා කල් නොවැඩි විය යුතුය.

(ආ) **ඉහත කී විධාන අංක 3.1 (ආ) හා (ඇ) හි දැක්වෙන නිශ්චල දේපල ප්‍රත්‍යාගණනය කිරීම;**

A. එවැනි නිශ්චල දේපලවල සාධාරණ අගය කැපී පෙනෙන හා නිරන්තරයෙන් වෙනස්වීම්වලට ලක්වන බව පෙනී යන්නේ නම්, එකී පදනම මත වාර්ෂිකව; හෝ

B. අවම වශයෙන් වසර තුනකට වරක්වත් සිදුකළ යුතුය.

**8. ස්වාධීනත්වය හා හෙළිදරව් කිරීම**

8.1 සෑම බැංකුවක්ම සිය බාහිර තක්සේරුකරුවන්ගේ ස්වාධීනත්වය තහවුරු කළ යුතු අතර එය බැංකුවේ වාර්ෂික වාර්තාවේ හෝ විගණනය කළ මූල්‍ය ප්‍රකාශනවල පහත දැක්වෙන පරිදි හෙළිදරව් කළ යුතුය.

(අ) බාහිර තක්සේරුකරුවකු, බැංකු පනතේ 2007 අංක 11 හා 12 දරන බලපත්‍රලාභී වාණිජ හා විශේෂිත බැංකු සඳහා වන යහපාලන මූලධර්ම පිළිබඳ විධානයන්හි විධාන අංක 3(7)(1) අනුව බැංකුවේ සම්බන්ධිත පාර්ශවයක් නොවිය යුතුය. එවැනි සබඳතාවයකින් හටගත හැකි අයිතිවාසිකම්වල ගැටීම් ඇතිවීම වළක්වාලීම එහි මූලික අරමුණ වේ.

(ආ) 2013.02.11 දිනැති යොමු අංක 02/17/900/0001/004 දරන චක්‍රලේඛය සමග නිකුත් කරන ලද බලපත්‍රලාභී වාණිජ හා විශේෂිත බැංකුවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වන විශේෂිත ආකෘතියේ පරිච්ඡේද 1.3 අනුව සිදුකළ යුතු හෙළිදරව් කිරීම් යටතේ, බැංකුවේ වාර්ෂික වාර්තාවේ හෝ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල, තක්සේරුකරණ ප්‍රතිපත්තිය මිනුම හා නිශ්චල දේපල හඳුනාගැනීම යන කාරණාවලට අදාළ හෙළිදරව් කිරීම් සිදුකර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය/ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය තහවුරු කළ යුතුය.

යොමුව : 02/17/600/0003/002 2014 ජුනි 06

බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකුවල

ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි,

## නිශ්චල දේපල තක්සේරු කිරීම සම්බන්ධයෙන් බැංකු පනත යටතේ පනවා ඇති අවශ්‍යතාවන්ට අනුකූලතාවය දැක්වීම

පහත (i) හා (ii) ඡේදවල දක්වා ඇති පරිදි නිශ්චල දේපල වර්තමාන වෙළෙඳපොල වටිනාකම මත තක්සේරු කිරීම සහ තක්සේරුකරුවන් සඳහා වන යෝග්‍යතා නිර්ණායක ඇගයීම, 2014 ජුනි මස 05 දිනැති, 2014 අංක 1 දරන බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල නිශ්චල දේපල තක්සේරු කිරීම සඳහා වූ නියාමන රාමුවට අනුකූලව සිදුකිරීමේ අවශ්‍යතාවය මෙමඟින් දැනුම් දෙමු.

(i) බැංකු පනතේ 2007 අංක 9 හා 10 දරන ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතය පවත්වාගෙන යාම මත වූ විධානයන් හි පළමුවන උපලේඛනයෙ හි අයිතම 6.2.2.4.1 - “ප්‍රත්‍යාගණන සංචිත” සහ අයිතම 6.4.3.1.9 - “නේවාසික දේපල සුරකුම් ලෙස තබන ලද හිමිකම්පෑම්” අදාළ වන පරිදි.

(ii) බැංකු පනතේ 2008 අංක 3 හා 4 දරන ණය සහ අත්තිකාරම් වර්ගීකරණය, ආදායම් හඳුනාගැනීම හා වෙන්කිරීම් මත වූ විධානයන්හි, විධාන අංක 7 (1) (I)

(iii) “වත්මන් බාහිර වෘත්තීයමය තක්සේරු වාර්තාව” අදාළ පරිදි.

2. 1999 අප්‍රේල් 19 දිනැති, යොමු අංක BS/69/93 දරන “ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතය ගණනය කිරීම සඳහා ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට භාර ගන්නා වූ තක්සේරුකරුවන් තෝරා පත්කර ගැනීමේ නිර්ණායකයන්” ට අදාළ චක්‍රලේඛය මෙමඟින් අවලංගු කරනු ලැබේ.

මෙයට - විශ්වාසී
ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මිය
**බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ**

1988 අංක 30 දරන (සංශෝධිත) බැංකු පනතේ 46(1) වගන්තිය ප්‍රකාරව, මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධානයන්.

බී.ඩී. ඩබ්ලිව්.ඒ. සිල්වා
**ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති**
**ශ්‍රී ලංකා මහ බැංකුව.**

කොළඹ.
2014 ජුනි 26 දින.

## 2014 අංක 2 දරන බැංකු පනත් විධානයන්

## ණය පහසුකම් සලසාදීමේ උපරිම සීමාව සම්බන්ධයෙන් 2007 අංක 7 දරන බැංකු පනත් විධානයන් සංශෝධනය

2006 අංක 46 දරන බැංකු පනතින් අවසන් වරට සංශෝධිත, 1988 අංක 30 දරන බැංකු පනතේ අංක 46(1) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් මණ්ඩලය විසින් 2007 නොවැම්බර් 01 දින නිකුත් කළ, 2007 අංක 7 දරන බැංකු පනත් විධානයන් සංශෝධනය කරමින්, පහත සඳහන් විධානයන් නිකුත් කරනු ලබයි. මෙම විධානයන් බැංකු පනතේ 2014 අංක 2 දරන විධානයන් ලෙස හඳුන්වනු ලබයි.

1. 2007 නොවැම්බර් 01 දිනැති, 2007 අංක 7 දරන බැංකු පනත් විධානයන්හි, 5 වැනි විධානය වෙනුවට පහත දැක්වෙන නව විධානය ආදේශ විය යුතුය.

5. (1) ඉහත 2(i) සහ 2(ii) පරිච්ඡේදයන්හි සඳහන් ඕනෑම ආකාරයක ගනුදෙනුකරුවන්ට යම් නිශ්චිත දිනකදී බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ප්‍රාග්ධන පදනමින් 15% ක් ඉක්මවා ණය පහසුකම් ප්‍රදානය කර ඇති අවස්ථාවක, එම ගනුදෙනුකරුවන්ට සපයන ලද ණය පහසුකම්වල හිඟහිටි මුළු එකතුව ආසන්නතම පසුගිය මාසය අවසානයේ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් එහි සියලුම ගනුදෙනුකරුවන්ට ප්‍රදානය කළ ණය පහසුකම් ප්‍රමාණයේ එකතුවෙන් 55% ක් නොඉක්ම විය යුතුය.

(2) ඉහත 5(1) විධානයෙහි ගණනය කිරීම්වලදී පහත සඳහන් ණය පහසුකම් බැහැර කළ යුතුය.

(i) ශ්‍රී ලංකා රජය වෙත ප්‍රදානය කළ ණය පහසුකම්.

(ii) පහත දැක්වෙන විධානය 6 අනුව, මුදල් මණ්ඩලයේ අනුමැතිය සහිතව, විධානයන් 3 සහ 4 යටතේ දක්වා ඇති උපරිම ණය සීමාවන් ඉක්මවා ප්‍රදානය කළ ණය පහසුකම්.

(iii) පහත විධානය 7(iii) යටතේ ප්‍රදානය කළ ණය පහසුකම්.

2. 2007 නොවැම්බර් 01 දිනැති, 2007 අංක 7 දරන බැංකු පනතේ විධානයන්හි 7 (ii) විධානයට පසුව පහත නව විධානය ඇතුලත් කරනු ලැබේ.

(iii) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරනු ලැබූ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් මඟින් ප්‍රදානය කළ, සිය ප්‍රධාන කාර්යාලය සහ/හෝ එම බැංකුවේ ශ්‍රී ලංකාවෙන් පිටත මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබන ශාඛාවක් මඟින් රැස්කරන ලද මුදලින් මූල්‍යකරණය කරන ලද ණය පහසුකම්.

1988 අංක 30 දරන (සංශෝධිත) බැංකු පනතේ 76J(1) වගන්තිය ප්‍රකාරව, මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධානයන්.

බී.ඩී. ඩබ්ලිව්.ඒ. සිල්වා
**ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති**
**ශ්‍රී ලංකා මහ බැංකුව.**

කොළඹ.
2014 ජුනි 26 දින.

## 2014 අංක 3 දරන බැංකු පනත් විධානයන් ණය පහසුකම් සලසාදීමේ උපරිම සීමාව සම්බන්ධයෙන් 2007 අංක 8 දරන බැංකු පනත් විධානයන් සංශෝධනය

2006 අංක 46 දරන බැංකු පනතින් අවසන් වරට සංශෝධිත, 1988 අංක 30 දරන බැංකු පනතේ අංක 76J(1) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල් මණ්ඩලය විසින්, 2007 නොවැම්බර් 01 දින නිකුත් කළ, 2007 අංක 8 දරන බැංකු පනත් විධානයන් සංශෝධනය කරමින්, පහත සඳහන් විධානයන් නිකුත් කරනු ලබයි. මෙම විධානයන් බැංකු පනතේ 2014 අංක 3 දරන විධානයන් ලෙස හඳුන්වනු ලබයි.

1. 2007 නොවැම්බර් 01 දිනැති, 2007 අංක 8 දරන බැංකු පනත් විධානයන් හි, 5 වැනි විධානය වෙනුවට පහත දැක්වෙන නව විධානය ආදේශ විය යුතුය.

5. (1) ඉහත 2(i) සහ 2(ii) පරිච්ඡේදයන්හි සඳහන් ඕනෑම ආකාරයක ගනුදෙනුකරුවන්ට යම් නිශ්චිත දිනකදී බලපත්‍රලාභී විශේෂිත බැංකුවේ ප්‍රාග්ධන පදනමින් 15% ක් ඉක්මවා ණය පහසුකම් ප්‍රදානය කර ඇති අවස්ථාවක, එම ගනුදෙනුකරුවන්ට සපයන ලද ණය පහසුකම්වල හිඟහිටි ප්‍රමාණයේ මුළු එකතුව ආසන්නතම පසුගිය මාසය අවසානයේ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් එහි සියලුම ගනුදෙනුකරුවන්ට ප්‍රදානය කළ ණය පහසුකම්වල හිඟහිටි ප්‍රමාණයේ එකතුවෙන් 55% ක් නොඉක්ම විය යුතුය.

(2) ඉහත 5(1) විධානයෙහි ගණනය කිරීම්වල දී පහත සඳහන් ණය පහසුකම් බැහැර කළ යුතුය.

(i) ශ්‍රී ලංකා රජය වෙත ප්‍රදානය කළ ණය පහසුකම්.

(ii) පහත දැක්වෙන විධානය 6 අනුව, මුදල් මණ්ඩලයේ අනුමැතිය සහිතව, විධානයන් 3 සහ 4 යටතේ දක්වා ඇති උපරිම ණය සීමාවන් ඉක්මවා ප්‍රදානය කළ ණය පහසුකම්.

1988 අංක 30 දරන (සංශෝධිත) බැංකු පනතේ 46(1) හා 76 (ඒ)(1) වගන්ති යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධානයන්.

බී.ඩී. ඩබ්ලිව්.ඒ. සිල්වා
**ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

කොළඹ.
2014 ජුනි 26 දින.

## බැංකු පනතේ 2014 අංක 4 දරන විධානය
## බලපත්‍රලාභී බැංකු සඳහා වන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ පද්ධතිය පිළිබඳ විධානයන් සංශෝධනය කිරීම

2006 අංක 46 දරන බැංකු පනතින් අවසන් වරට සංශෝධිත, 1988 අංක 30 දරන බැංකු පනතේ අංක 46(1) හා 76 (ඒ)(1) වගන්ති යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව, තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා වන මූලික ආරක්ෂණ ප්‍රමිති ක්‍රියාත්මක කිරීම සඳහා, 2011 ඔක්තෝබර් 05 දිනැති 2011 අංක 7 දරන බලපත්‍රලාභී බැංකු සඳහා වන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ පද්ධතිය පිළිබඳව වන විධානයට අමුණා ඇති මාර්ගෝපදේශ සංශෝධනය කරමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පහත සඳහන් විධානය නිකුත් කරනු ලැබේ.

1. 2011 ඔක්තෝබර් 05 දිනැති 2011 අංක 7 දරන බලපත්‍රලාභී බැංකු සඳහා වන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ පද්ධතිය පිළිබඳව වන විධානයට අමුණා ඇති මාර්ගෝපදේශයන්හි 2.8 ඡේදයේ ''ඈ'' කොටසට පසුව පහත ඡේදය ඇතුලත් කළ යුතුය.

**''2.9 තොරතුරු ආරක්ෂණ කළමනාකරණය**

(අ) මේ සමග ඇති ඇමුණුම 4 ට අනුව 2015 ජුලි 01 දින සිට සියලුම බැංකු තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා වන මූලික ආරක්ෂණ ප්‍රමිති ක්‍රියාත්මක කළ යුතු වේ.

(ආ) මෙම මූලික ආරක්ෂණ ප්‍රමිති, බැංකු සඳහා පිළිගත හැකි අවම ආරක්ෂණ ප්‍රමිති ස්ථාපිත කරන අතර මෙමගින් එම බැංකුවල තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති ප්‍රමිතිකරණය කරයි. එසේ වුවද, අදාළ බැංකුවේ ප්‍රමාණය, ව්‍යාපාර කටයුතුවල ස්වභාවය හා සංකීර්ණත්වය මත නිසි ලෙස මෙම ප්‍රමිති ප්‍රතිග්‍රහණය කිරීම අවශ්‍ය වේ.

(ඇ) තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා වන මූලික ආරක්ෂණ ප්‍රමිතියට අනුකූල වන බවට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කළ යුතුය.''

ඇමුණුම 4

# තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා වන මූලික ආරක්ෂණ ප්‍රමිතිය
# සුරක්ෂණ මට්ටම I

වෙළුම 1.0

## කොටස I : හැඳින්වීම

පෙරවදන

ආදායම හා ගනුදෙනුකාර පදනම ඉහළ නංවා ගැනීම වැනි ව්‍යාපාරික අරමුණු මත පිහිටා බොහෝ ආයතන තම ගනුදෙනුකරුවන්ට ඉහළ සේවාවක් ලබාදීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මගින් බලගන්වනු ලැබූ මාර්ගගත සේවාවන් වෙත ආකර්ෂණය වී සිටී. මෙම සේවා මගින් බැංකු හා අනෙකුත් ආයතනවලට පොදු සන්නිවේදන හා තොරතුරු සැකසුම් යටිතල පහසුකම් භාවිතා කිරීම තුළින් සහසම්බන්ධ වීමට මගපාදා ඇත.

ආරක්ෂණය අතින් ගත්කල ශ්‍රී ලාංකික ආයතන පුළුල් පරාසයක් තුළ විහිදුනු හැකියාවන් සමූහයකින් යුක්ත වේ. කෙසේ වුවත්, දාමයක ශක්තිමත්භාවය එහි දුර්වලම සම්බන්ධකය මත රඳා පවතින්නාක් මෙන්, මූල්‍ය ක්ෂේත්‍රයේ තොරතුරු ආරක්ෂණයේ ශක්තිමත්භාවය එහි දුර්වලම සාමාජිකයා මත රඳා පවතින අතර එමගින් මූල්‍ය වංචාවන් සිදුවීම සඳහා අවකාශය සලසමින් අනෙකුත් සියලුම සාමාජිකයන්ට තර්ජනයක් ඇති කළ හැක.

අන්තර්ජාතික වශයෙන් පිළිගත් ISO 27000 ජාත්‍යන්තර තොරතුරු ආරක්ෂණ ප්‍රමිති මාලාව මත පදනම්ව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා පරිගණක හදිසි අවස්ථා සූදානම් කණ්ඩායම (Sri Lanka CERT/CC) හා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය එක්ව තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා වන මූලික ආරක්ෂණ ප්‍රමිතිය සකස් කිරීම සඳහා කටයුතු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙය ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කරනු ලබන අතර, ප්‍රමිතිය සඳහා පසුකාලීන සංශෝධන බැංකු පරිගණක ආරක්ෂණ අවස්ථා ප්‍රතිචාර කණ්ඩායම (Bank CSIRT) ආයතනය මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අවධානය සඳහා යොමු කරවනු ඇත.

1. මූලිකාංග

1.1 තොරතුරු ආරක්ෂණ කළමනාකරණය

තොරතුරු වත්කම්වල ඇති අනතුරුවලට භාජනයවීමේ හැකියාව හේතුවෙන් පැන නගින තර්ජනයන්ට මුහුණපෑමේ අවදානම් තත්ත්වයන් කළමනාකරණය කිරීම සඳහා ක්‍රමානුකූල හා යෝග්‍ය ආරක්ෂණ පාලනයන් යොදා ගනිමින් තොරතුරුවල රහස්‍යතාවය, සංගතතාවය හා අවශ්‍ය විටකදී භාවිතය සඳහා තොරතුරු පවත්වාගෙන යාම යන ගුණාංග ආරක්ෂා කිරීම.

1.2 තොරතුරු ආරක්ෂණ අවදානම් කළමනාකරණය

තොරතුරු ආරක්ෂණ අවදානම් කළමනාකරණය යනු තොරතුරු වත්කම් තර්ජනවලට නිරාවරණය වීමේ හැකියාව හා එමගින් ඇති වන්නා වූ බලපෑම නිර්ණය කිරීමේ ක්‍රමානුකූල ක්‍රියා පිළිවෙල වේ.

මෙම ප්‍රමිතිය මගින්, සලකනු ලබන ආයතනයේ තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතියට අයත් වන තොරතුරු වත්කම් සඳහා වන අවදානම් ප්‍රමාණනය ලබාදීම සඳහා ISO 27005 භාවිතා කරන බවට උපකල්පනය කෙරේ.

1.3 ආරක්ෂණ අනුකූලතා

අදාළ නියාමකයන් විසින් නියමිත නියාමන අවශ්‍යතාවයන් සහ ගෝලීයව පිළිගත් අන්තර්ජාතික යහ පරිචයන් ද ඇතුලත්ව, ශ්‍රී ලංකාවේ පවතින නීති පද්ධතියට අනුකූලව සෑම ආයතනයක් විසින්ම ඔවුන්ගේ ආරක්ෂණ අවශ්‍යතා පවත්වා ගැනීම අපේක්ෂා කෙරේ. මීට අමතරව, ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය හා ඉහළ කළමනාකාරිත්වය විසින්, සකස් කරන ලද ව්‍යාපාරික අරමුණු මගින් ද මෙම ආරක්ෂණ අවශ්‍යතාවයන් පාලනය කරනු ලැබේ. එවැනි අවශ්‍යතාවයන් සඳහා අනුකූල වන තත්ත්වයන් වැඩි කර ගැනීමේ අරමුණින්, මෙම ප්‍රමිතීන් මගින් දක්වා ඇති අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන මෙම මූලික ආරක්ෂණ ප්‍රමිතිය වැඩි දියුණු කළ යුතුය. මෙම ප්‍රමිතිය සඳහා වූ වැදගත් වෙනස්කම් මූලික ආරක්ෂණ ප්‍රතිපත්තියේ ප්‍රතිශෝධිත පිටපත් මගින් ප්‍රකාශයට පත්කෙරෙනු ඇත.

1.3.1 නෛතික අවශ්‍යතාවයන්

2007 අංක 24 දරන පරිගණක අපරාධ පනත, 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත, 2006 අංක 30 දරන ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත හා 2003 අංක 36 දරන බුද්ධිමය දේපල පනත යන පනත්වල ඕනෑම උල්ලංඝනය කිරීමක් අපරාධයක් ලෙස ගැනෙන අතර, එම නීති පනත්වලට අනුකූල වීම සඳහා සෑම ආයතනයක්ම කටයුතු කළ යුතුය.

1.3.2 නියාමන අවශ්‍යතාවයන්

ශ්‍රී ලංකා මහ බැංකුව හා අනෙකුත් නියාමන ආයතන විසින් පනවා ඇති දේශීය ක්ෂේත්‍රයට අදාළ රෙගුලාසි/විධාන සඳහා අනුකූලතාව දැක්විය යුතුය.

1.3.3 අන්තර්ජාතික ප්‍රමිතීන්

සුදුසුකම්ලත් මාර්ගගත/ඉලෙක්ට්‍රොනික බැංකු සේවා සපයන්නකු ලෙස පිළිගැනීමක් ලබාගැනීම සඳහා අදාළ ආයතන PCI - DSS වැනි ජාත්‍යන්තරව පිළිගත් ක්ෂේත්‍රයට සුවිශේෂී වූ ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.

1.3.4 තොරතුරු ආරක්ෂණ අරමුණු

ප්‍රධාන ව්‍යාපාරික අරමුණු සපුරා ගැනීම සඳහා ආධාර වන ආකාරයෙන්, තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති, ව්‍යවස්ථාපිත අවශ්‍යතා, අනෙකුත් අවශ්‍යතා සහ ව්‍යාපාරික ක්‍රියාවලිය සහිත රාමුවට අනුකූලව තොරතුරු ආරක්ෂණ අරමුණු හඳුනාගත යුතුය.

2. පද සහ නිර්වචන

සමස්ත ලේඛනය සඳහාම පහත දැක්වෙන පද සහ නිර්වචන අදාළ වේ.

2.1 වත්කම්

ආයතනයට වටිනාකමක් සහිත ඕනෑම දෙයක්.

[ISO/IEC 13335 - 1 : 2004]

2.2 මූලික ආරක්ෂණ ප්‍රමිතිය

තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා වන මූලික ආරක්ෂණ ප්‍රමිතිය.

2.3 පාලනය

ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටීන්, මාර්ගෝපදේශ, පරිචයන් හෝ ආයතනික ව්‍යුහය හරහා පරිපාලන, තාක්ෂණික, කළමනාකරණ හෝ නීතිමය ස්වභාවය සහිත අවදානම් කළමනාකරණය කිරීම.

2.4 වංචාව

මූල්‍ය හෝ පෞද්ගලික ප්‍රතිලාභ අපේක්ෂාවෙන් සිදුකරන වැරදි සහගත හෝ සාපරාධී ක්‍රියාවන්.

2.5 මාර්ගෝපදේශය

කුමක් කළ යුතු ද යන්න සහ ප්‍රතිපත්තිවල දක්වා ඇති අරමුණු ළඟාකර ගන්නා ආකාරය පැහැදිලි කරන සවිස්තරාත්මක සටහන.

[ISO/IEC 13335 - 1 : 2004]

2.6 IEC

ජාත්‍යන්තර විද්‍යුත් තාක්ෂණ කොමිසම.

2.7 ISO

ජාත්‍යන්තර ප්‍රමිති ආයතනය

2.8 තොරතුරු පද්ධතිය

ඕනෑම ආකාරයක තොරතුරු සැකසුම් පද්ධතියක්, සේවාවක් හෝ පහසුකමක් හෝ ඒවා භෞතිකව ස්ථානගත කර ඇති ස්ථාන.

2.9 තොරතුරු ආරක්ෂණය

තොරතුරුවල රහස්‍යභාවය, සංගතතාවය හා අවශ්‍ය විටක දී භාවිතා කිරීම සඳහා තොරතුරු පවත්වාගෙන යාම යන ගුණාංග සුරක්ෂිත කිරීම. නිරවද්‍යතාව, ගිණුම් කටයුතු සඳහා වගකීම, ප්‍රතික්ෂේප නොකිරීම හා විශ්වසනීයත්වය වැනි අනෙකුත් උප ලක්ෂණ ද මේ සඳහා ඇතුලත් විය හැක.

2.10 තොරතුරු ආරක්ෂණ සිද්ධිය

තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය කඩකිරීමක් හෝ ආරක්ෂණ ක්‍රමවේදයන් හි බිඳවැටීමක් හෝ ආරක්ෂාවට අදාළ වන පෙර නොදැන සිටි ආකාරයේ තත්ත්වයක් හේතුවෙන් පද්ධතිය, සේවාව හෝ ජාල තත්ත්වයෙහි ඇති වූ හඳුනාගත් සිදුවීමක්.

[ISO/IEC Technical Report 18044 : 2004]

2.11 තොරතුරු ආරක්ෂණ සිද්ධි

ව්‍යාපාර කටයුතුවලට බාධා ඇතිවීමේ හෝ තොරතුරු ආරක්ෂණයට තර්ජනයක් වීමේ සැලකිය යුතු සම්භාවිතාවයක් ඇති, අනවශ්‍ය හෝ බලාපොරොත්තු රහිත, තොරතුරු ආරක්ෂණ සිද්ධියක් හෝ සිද්ධීන් මාලාවක්.

[ISO/IEC Technical Report 18044 : 2004]

2.12 හානිකර කේතයන්

තොරතුරු පද්ධතිවලට අනපේක්ෂිත බලපෑම් ඇති කළ ක්‍රමලේඛයන්. හානිකර කේතයන්ට උදාහරණ ලෙස පරිගණක වෛරස, ජාල ආක්‍රමණ, ට්‍රෝජන් ආක්‍රමණ හා ඔත්තු මෘදුකාංග ආදිය දැක්විය හැකිය.

2.13 ආයතන

බැංකු CSIRT හි සාමාජික මූල්‍ය ආයතන.

2.14 බාහිරින් සේවාවන් ලබාගැනීම

බලපත්‍රලාභී බැංකුවක මෙහෙයුම් කටයුතු හා සම්බන්ධ යම් කටයුත්තක්, ක්‍රියාකාරකමක් හෝ ක්‍රියාවලියක් සපයනු ලබන තෙවැනි පාර්ශවයක සේවා සපයන්නකු හා බලපත්‍රලාභී බැංකුවක් අතර ඇති ගිවිසුමක්.

[2012 අංක 2 දරන බැංකු පනතේ විධානයන්]

2.15 ප්‍රතිපත්තිය

ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය/ඉහළ කළමනාකාරිත්වය මගින් විධිමත්ව ප්‍රකාශයට පත් කරන ලද සමස්ත අභිප්‍රායයන් සහ උපදෙස් මාලාව.

2.16 PCI - DSS

ගෙවීම් කාඩ්පත් ක්ෂේත්‍රයේ දත්ත ආරක්ෂණ ප්‍රමිතීන්.

2.17 අවදානම

සිද්ධියක් ඇතිවීමේ හැකියාව හා එහි බලපෑම්වල එකතුවක්.

[ISO/IEC Guide 72 : 2002]

2.18 අවදානම් විශ්ලේෂණය

අවදානම් ප්‍රභවයක් හඳුනා ගැනීමට හා අවදානමේ මට්ටම නිර්ණය කිරීම සඳහා ක්‍රමානුකූල ලෙස තොරතුරු භාවිතා කිරීම.
[ISO/IEC Guide 72 : 2002]

2.19 අවදානම් තක්සේරු කිරීම

අවදානම් විශ්ලේෂණය හා ඇගයීම සම්බන්ධ සමස්ත ක්‍රියාවලිය.

[ISO/IEC Guide 73 : 2002]

2.20 අවදානම් ඇගයීම

අවදානමේ ප්‍රමාණය තීරණය කිරීම සඳහා ඇස්තමේන්තුගත අවදානම දෙන ලද අවදානම් නිර්ණායක හා සැසඳීමේ ක්‍රියාවලියයි.
[ISO/IEC Guide 73 : 2002]

2.21 අවදානම් කළමනාකරණය

අවදානම් සම්බන්ධයෙන් ආයතනයකට මඟ පෙන්වන සහ එය පාලනය කෙරෙන ඒකාබද්ධ ක්‍රියාමාර්ගයන්ය.

[ISO/IEC Guide 73 : 2002]

2.22 අවදානම් සඳහා පිළියම් යෙදීම

අවදානම වෙනස් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග තෝරාගැනීම හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියයි.

[ISO/IEC Guide 73 : 2002]

2.23 සේවා සපයන්නා

ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් රටක පිහිටා ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක ප්‍රධාන කාර්යාලය, මව් ආයතනය, වෙනත් ශාඛාවක් හෝ අනුබද්ධිත ආයතනයක් හෝ වෙනත් ඕනෑම අනුබද්ධ නොවන ආයතනයක් මේ සඳහා ඇතුලත් වේ.
[2012 අංක 2 දරන බැංකු පනතේ විධානයන්]

2.24 තෙවැනි පාර්ශවය

මතභේදයට තුඩුදෙන කිසියම් කරුණක් සම්බන්ධයෙන් සැලකිලිමත් වීමේදී ඒ සඳහා මැදිහත් වන පාර්ශවකරුවන්ගෙන් ස්වාධීන ලෙස කටයුතු කරන බවට හඳුනාගත් යම් පුද්ගලයෙක් හෝ සංස්ථාපිත ආයතනයක්.

[ISO/IEC Guide 2 : 1996]

2.25 තර්ජනය

ආයතනයට හෝ පද්ධතියකට හානියක් හෝ අලාභයක් ඇති කරවන ආකාරයේ අනවශ්‍ය සිද්ධියක් සඳහා විය හැකි යම් හේතුවක්.
[ISO/IEC 13335 - 1 : 2004]

2.26 පහසුවෙන් අවදානමකට ගොදුරු විය හැකි බව

තර්ජනයක් හෝ තර්ජන කිහිපයක් හේතුවෙන් ඇති විය හැකි වත්කමක හෝ වත්කම් සමූහයක දුර්වලතාවයක්.
[ISO/IEC 13335 - 1 : 2004]

**3. මූලික ආරක්ෂණ ප්‍රමිතියේ අදාළතාව**

මෙම ලේඛනයේ අදාළත්වය හා සංරක්ෂණය මෙම කොටසින් අර්ථ දක්වනු ලබයි.

3.1 විෂය පථය

බැංකු CSIRT හි සාමාජික ආයතන තුළ භාවිතා වන සියලුම තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධති සඳහා මෙන්ම එම තොරතුරු හා තොරතුරු පද්ධති හසුරුවනු ලබන අභ්‍යන්තර හා තුන්වන පාර්ශවයේ පුද්ගලයන් යන දෙවර්ගයම සඳහා ද මෙම ප්‍රමිතිය අදාළ වේ.

3.2 ව්‍යුහය

ප්‍රමිතියේ පළමු කොටස මඟින් මෙම ලේඛනයේ අයිතිය හා කළමනාකරණය, එහි ව්‍යුහය, අදාළත්වයේ විෂය පථය හා නිර්දේශිත අවදානම් කළමනාකරණ ක්‍රමවේද පිළිබඳව විස්තර කරනු ලබන අතර, එහි දෙවන කොටස මඟින් ප්‍රමිතියේ වර්තමාන අනුවාදය තුළින් සලකා බැලිය යුතු ප්‍රධාන ආරක්ෂණ වසම් 14 ක් හඳුන්වා දෙනු ලබයි.

3.3 නඩත්තු කිරීම

හඳුන්වාදීමේ සිට සය (6) මසකින් පසුව මෙම ලේඛනය සමාලෝචනය කළ යුතු අතර වෙනස්කම් සිදුවන අවස්ථාවක දී එය ප්‍රමිතියේ දෙවැනි වෙළුම ලෙස ප්‍රකාශයට පත්කළ යුතුය. කිසිදු වෙනස්කමක් නොමැති නම් සමාලෝචිත දිනය සහිතව සමාලෝචිත තත්ත්වය එලෙසම පවත්වාගත යුතුය. බැංකු CSIRT ආයතනය විසින් මෙම කාර්යයේ වගකීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් සහිතව දරාගත යුතුය. පසුකාලීනව ප්‍රකාශයට පත්කරනු ලබන සියලුම වෙළුම් හා අනුකූල වීමෙන් තොරතුරු ආරක්ෂණ කළමනාකරණයේ වැඩි දියුණු කරන ලද තොරතුරු සපයා දෙනු ඇත.

3.4 ක්‍රියාවට නැංවීම

පළමුවැනි වෙළුම ක්‍රියාවට නැංවීමේ අපේක්ෂිත කාලය, ප්‍රමිතිය හඳුන්වාදීමේ සිට මාස 12 කි.

**4. අවදානම් කළමනාකරණය**

අවදානම් කළමනාකරණය, පිරිවැය ඵලදායීතාවය සහිත ඕනෑම තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතියක මූලිකම අංගයයි.

4.1 අවදානම තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා මූලිකාංගයක් ලෙස

දුර්වල සැලසුම්, නිෂ්පාදනය, ක්‍රියාවට නැංවීම, පරිහරණය, කළමනාකරණය හා වෙනත් නොයෙකුත් ක්‍රියා හේතුවෙන් වත්කම් අනතුරුවලට භාජනය වීමේ හැකියාවක් පවතින අතර, මෙම හැකියාව තර්ජනයක් ඇති කිරීමක් දක්වා ගමන් කළ හැක.

තර්ජනයක් ඇති වීමේ හැකියාව හා එමගින් ඇතිවන බලපෑමේ එකතුව අවදානම ලෙස හඳුන්වනු ලබන අතර, එය අවදානම් වැළැක්වීම සඳහා හදිසි හා අත්‍යවශ්‍ය පාලන ක්‍රමවේදයන් ඇති කිරීම සඳහා වන වැදගත් මිනුම් දණ්ඩක් වේ.

4.2 අවදානම් සඳහා පිළියම් යෙදීම හා ආරක්ෂණ පාලනය

මූලික ආරක්ෂණ ප්‍රමිතිය හා එහි පසුකාලීන වෙනස් කිරීම් සමග අනුගත වීම හඳුනාගත් අවදානම් අවම කිරීම සඳහා අවශ්‍ය ආරක්ෂණ පාලනයන් හඳුන්වා දෙනු ඇත.

4.3 අවදානම් කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ

අවදානම් කළමනාකරණය ISO 27005 : 2011 ට අනුකූලව සිදුකළ යුතුය.

4.4 සම්බන්ධිත ලේඛන හා කාර්යයන්

අදාළ ආයතන විසින් මාර්ගෝපදේශ, ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටීන් හා වැඩසටහන් ස්ථාපනය කිරීම මූලික ආරක්ෂණ ප්‍රමිතිය ක්‍රියාවට නැංවීමෙහිලා උපකාරී වනු ඇත.

## කොටස II : ආරක්ෂණ වසම්

1. **තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සංවිධානය කිරීම**

**අරමුණ:** ආයතනයේ තොරතුරු ආරක්ෂණ කළමනාකරණය පද්ධති වැඩි දියුණු කිරීම සඳහා, ආරක්ෂණ ක්‍රියාවලීන් විස්තර කරමින් හා අදාළ වගකීම් පවරමින් සහ අදාළ කාර්යයන් කරගෙන යාම සඳහා අවශ්‍ය සම්පත් හා බලතල පවත්වාගෙන යමින්, තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා ව්‍යුහගත සැලසුමක් හඳුන්වාදීම.

**විෂය පථය:** ආයතනයේ තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය තුළ තොරතුරු හා තොරතුරු වත්කම් පරිහරණය කරන සියලුම පුද්ගලයන් සඳහා මෙය අදාළ වේ.

1.1 තොරතුරු ආරක්ෂණය සඳහා කළමනාකාරිත්වයේ කැපවීම

1.2 කළමනාකාරිත්වය විසින් ආයතනයේ ව්‍යාපාරික උපායමාර්ගයන්ට හා අරමුණුවලට ගැලපෙන ආකාරයට ආයතනය සඳහා පැහැදිලි තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති විධානයන් ස්ථාපනය කළ යුතුය. එම ප්‍රතිපත්තීන් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ ඉහළ කළමනාකාරිත්වය විසින් හෝ අවශ්‍යතාවය පරිදි ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාලය විසින් අනුමත කළ යුතුය. වෙනස් වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ, ආරක්ෂණ, නෛතික, නියාමන හා විගණන අවශ්‍යතාවන් මත පදනම් වූ, ක්‍රමානුකූල ප්‍රතිපත්ති සමාලෝචනය හා සංශෝධනය මෙම කළමනාකරණ ක්‍රියාමාර්ගයන්ට ඇතුලත් වේ. මෙම කටයුතු සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය විසින් අවශ්‍ය සම්පත් ප්‍රමාණවත් පරිදි සැපයීම සහ ආරක්ෂණ භූමිකාවන් හා වගකීම් පැවරීම සිදුකළ යුතුය.

1.3 තොරතුරු ආරක්ෂණ අවදානම් තක්සේරු කිරීම

අවදානම් තක්සේරුව මගින් ආයතනික අරමුණු හා අවදානම් දරා ගැනීමේ ක්‍රමවේදයන්ට අදාළ වන පරිදි අවදානම් හඳුනා ගැනීම, ප්‍රමාණනය හා ප්‍රමුඛත්වය ලබාදීම සිදුකළ යුතුය. අවදානම් තක්සේරුකරණ ප්‍රතිඵල මගින් තොරතුරු ආරක්ෂණ අවදානම් කළමනාකරණය සඳහා සුදුසු කළමනාකරණ ක්‍රියාමාර්ගයන් හා ප්‍රමුඛත්වයන් හඳුන්වා දීම හා තීරණය කිරීම සිදුකළ යුතු අතර, මෙම අවදානම් මගින් ආරක්ෂා වීම සඳහා තෝරාගත් ක්‍රමවේදයන් ස්ථාපනය කළ යුතුය. තොරතුරු ආරක්ෂණ අවදානම් තක්සේරු කිරීම පැහැදිලිව දක්වන ලද විෂය පථයක් සහිත විය යුතු අතර ආරක්ෂණ අවශ්‍යතාවයන්ගේ වෙනස්කම් හඳුනා ගැනීම සඳහා එය කාලයෙන් කාලයට පැවැත්විය යුතුය.

1.4 තොරතුරු ආරක්ෂණ අවදානම් සඳහා පිළියම් යෙදීම

අවදානම් තක්සේරුවෙන් පසුව අවදානම් සඳහා පිළියම් යෙදීමේ තීරණ ගත යුතුය.

1.5 තොරතුරු ආරක්ෂණ සම්බන්ධීකරණය

ආයතනයේ විවිධ අංශයන් පිළිබඳ තාක්ෂණික ශිල්පීය දැනුම සහිත සහ ඔවුන්ට පවරන ලද අදාළ කාර්යභාරයන් හා වගකීම් සහිත බලයලත් නියෝජිතයන් විසින් තොරතුරු ආරක්ෂණය සම්බන්ධීකරණය කළ යුතුය. මෙම ක්‍රියාවලිය ආයතනයේ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියාවට නැංවිය යුතුය.

1.6 තොරතුරු ආරක්ෂණ වගකීම් පැවරීම

තොරතුරු ආරක්ෂණ වගකීම් පැවරීම තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුකූලව, පැහැදිලිව නිර්වචනය කොට පැවරිය යුතු වේ. මෙම වගකීම් තුළින් තොරතුරු ආරක්ෂණ වත්කම් හඳුනාගන්නා ආකාරය හා වගකීම් බෙදාහැරීම, අවශ්‍ය ආරක්ෂාවේ ප්‍රමාණය සහ අවශ්‍ය වන්නා වූ ලේඛන යනාදිය ප්‍රමාණවත් ලෙස පැහැදිලි කළ යුතුය.

රහස්‍යතාවයේ හා හෙළිදරව් නොකිරීමේ ගිවිසුම් තුළ තොරතුරු ආරක්ෂණය හා අනවසර පිවිසුම් වලින් ආරක්ෂාව ලබාගැනීම පිළිබඳ ආයතනයේ අවශ්‍යතාවයන්, නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි වගන්ති සහිතව සඳහන් කළ යුතු අතර මෙම ගිවිසුම් සේවකයන් බඳවා ගැනීමේදී හා බාහිර සේවා ලබාගැනීමේ දී අදාළ ක්‍රියාපටිපාටි තුළට ඇතුලත් කළ යුතුය.

1.7 බලධාරීන් සමග සන්නිවේදනය කිරීම

තොරතුරු ආරක්ෂණ සිද්ධීන් සහ ඒ හා සම්බන්ධිත සිදුවීම් වාර්තා කිරීමේ දී බාහිර අධිකාරීන් සමග සන්නිවේදනය කරනු ලබන්නේ කවරෙක් ද සහ කෙසේ ද යන්න විස්තර කෙරෙන ක්‍රියාපටිපාටීන් ආයතනය සතුවිය යුතුය.

1.8 විශේෂ උනන්දුවක් දක්වන කණ්ඩායම් සමග සන්නිවේදනය කිරීම

විශේෂ උනන්දුවක් දක්වන පාර්ශවයන්, තොරතුරු ආරක්ෂණ සංසද හා වෘත්තීය ආයතන සමග සුදුසු ආකාරයේ සම්බන්ධතා පවත්වාගත යුතුය.

1.9 තොරතුරු ආරක්ෂණය පිළිබඳ ස්වාධීන සමාලෝචනය

අදාළ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි හා පාලන අරමුණු සැලසුම්ගත කාලපරාසයන්හි දී සහ ආයතනය තුළ ඕනෑම ආකාරයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සම්බන්ධ සැලකිය යුතු වෙනසක දී, සමාලෝචනය කළ යුතුය.

2. තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය

**අරමුණ:** ව්‍යාපාරික, නෛතික හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව තොරතුරු ආරක්ෂණය සඳහා අවශ්‍ය කළමනාකාරිත්ව මාර්ගෝපදේශ සහ සහාය ලබාදීම.

2.1 තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති ලේඛනය

තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය මඟින් කළමනාකාරිත්වයේ කැපවීම පැහැදිලි කළ යුතු අතර, සමස්ත අරමුණු, විෂය පථය හා ආරක්ෂණයේ වැදගත්කම සහ නෛතික හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල වීමට ඇති කැපවීම යනාදිය විස්තර කරමින් තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා වන වැඩපිළිවෙල සකස් කළ යුතුය.

2.2 තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති ලේඛනය සමාලෝචනය

තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය සැලකිය යුතු කාලපරාසයන්හි දී සහ ආයතනය තුළ සිදුවන සැලකිය යුතු තොරතුරු සන්නිවේදන තාක්ෂණ වෙනස්වීමක දී සමාලෝචනය කළ යුතුය. සියලුම සමාලෝචන නිසි පරිදි ලේඛනගත කොට පවත්වාගත යුතුය.

2.3 තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති ලේඛනය පරිපාලනය හා ක්‍රියාවට නැංවීම

ප්‍රතිපත්තිය පරිපාලනය කිරීම, හඳුනාගත් ක්‍රියා පිළිවෙලවල් සහ ක්‍රමවේදයන් සමග එය ස්ථාපනය කිරීමට වගකීම් සහිත තොරතුරු ආරක්ෂණ නිලධාරියෙකු පත්කිරීම මඟින්, ආයතනයේ සුදුසු අංශයක් හෝ දෙපාර්තමේන්තුවක් වෙත පැවරිය යුතුය.

3. **තෙවැනි පාර්ශවයන්**

**අරමුණ:** තෙවැනි පාර්ශවයන් විසින් පරිශීලනය කරනු ලබන, සකසනු ලබන, සන්නිවේදනය හෝ කළමනාකරණය කරනු ලබන, ආයතනයේ තොරතුරු, තොරතුරු සැකසුම් පහසුකම් හා තොරතුරු වත්කම්වල ආරක්ෂාව පවත්වාගෙන යාම.

3.1 තෙවැනි පාර්ශවයන් හා සම්බන්ධ අවදානම් හඳුනා ගැනීම

තෙවැනි පාර්ශවයක සහභාගිත්වයෙන් සිදුවන ව්‍යාපාර ක්‍රියාවලීන් හේතුවෙන් ආයතනයේ තොරතුරු, තොරතුරු පද්ධති හා වත්කම්වලට ඇති විය හැකි අවදානම් හඳුනාගත යුතු අතර එවැනි තෙවැනි පාර්ශවයන්ට ප්‍රවේශයන් ලබා දීමට පෙර මනා පාලන ක්‍රම ස්ථාපනය කළ යුතුය.

3.2 ගනුදෙනුකරුවන් සමඟ කටයුතු කිරීමේදී ආරක්ෂණයට පිළියම් යෙදීම

ආයතනයේ තොරතුරු හා තොරතුරු වත්කම් සඳහා ගනුදෙනුකරුවන්ට ප්‍රවේශය ලබාදීමට පෙර, හඳුනාගත් සියලුම ආරක්ෂණ අවශ්‍යතා සපුරාලිය යුතු වේ.

3.3 තෙවැනි පාර්ශව ගිවිසුම්වලදී ආරක්ෂණය තහවුරු කිරීම

තෙවැනි පාර්ශවයන් හා සම්බන්ධ ගිවිසුම් මඟින් අදාළ සියලුම තොරතුරු ආරක්ෂණ අවශ්‍යතා ආවරණය කළයුතු අතර ආයතනය හා අදාළ තෙවැනි පාර්ශවය අතර කිසිදු ආකාරයක වැරදි අවබෝධයක් නොමැති බවට සහතික විය යුතුය.

3.4 සේවාවන් ලබාදීම

තෙවැනි පාර්ශව මඟින් අපේක්ෂිත සේවාවන් ලබාදීම, සේවා මට්ටමේ ගිවිසුමක් තුළින් ආවරණය කළ යුතු අතර, එම සේවා ගිවිසුම මඟින්, තොරතුරු ආරක්ෂණය තහවුරු කිරීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග, ලබා දීමට අපේක්ෂිත සේවාව, සේවාවේ අපේක්ෂිත තත්ත්වය, කාර්ය සාධනය ඇගයීමේ නිර්ණායක, ගැටළු නිරාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය, තෙවැනි පාර්ශවයට අදාළ වගකීම්, තෙවැනි පාර්ශවය විසින් උප කොන්ත්‍රාත්කරුවන් යොදා ගැනීම සහ ගිවිසුම් අත්හිටුවීමේ කොන්දේසි පැහැදිලිව විස්තර කළ යුතුය.

3.5 තෙවැනි පාර්ශවීය සේවාවන් අධීක්ෂණය සහ සමාලෝචනය

සේවා මට්ටමේ ගිවිසුම්වලට අනුකූලව තෙවැනි පාර්ශවයන් මඟින් සපයනු ලබන සේවාවන් සමීපව අධීක්ෂණය කළ යුතු අතර ආයතනයේ සුදුසු අභ්‍යන්තර අංශයක් හෝ දෙපාර්තමේන්තුවක් මඟින් සැලසුම්ගත කාලපරාසයන්හි දී ඒවා සමාලෝචනය කළ යුතුය. සේවා ගිවිසුම කල් ඉකුත් වීමෙන් පසුව ද ආයතනයේ තොරතුරු ආරක්ෂණ අවශ්‍යතාවයන් තෙවැනි පාර්ශවයන් විසින් පිළිපැදිය යුතුය.

4. **තොරතුරු වත්කම් කළමනාකරණය**

**අරමුණ:** ආයතනයේ තොරතුරු වත්කම්හි ආරක්ෂාව සුදුසු මට්ටමකට ළඟාකර ගැනීම හා පවත්වා ගැනීම.

4.1 තොරතුරු වත්කම් භාණ්ඩ ලේඛනය

සියලුම තොරතුරු වත්කම් පැහැදිලි ලෙස හඳුනාගත යුතු අතර, එම සියලු තොරතුරු වත්කම් වාර්තාගත කර පවත්වා ගත යුතුය. මෙම වත්කම් භාණ්ඩ ලේඛනයට ආපදාවකදී යථා තත්ත්වයට පැමිණීමට අවශ්‍ය සියලුම තොරතුරු ඇතුලත් විය යුතුය.

4.2 තොරතුරු වත්කම් වර්ගීකරණය

තොරතුරු පරිහරණයේදී එම තොරතුරුවල අවශ්‍යතාව, ප්‍රමුඛත්වය හා අපේක්ෂිත ආරක්ෂක තත්ත්වය දක්වමින් තොරතුරු වර්ගීකරණය කරනු ලබන වත්කම් අයිතිකරුට උපකාරී වීම සඳහා ආයතනයේ තොරතුරු වර්ගීකරණ මාර්ගෝපදේශ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය මඟින් ප්‍රකාශයට පත්කළ යුතුය. ආයතනයේ වර්ගීකරණ මාර්ගෝපදේශයට අනුකූලව තොරතුරු ලේබල් ගත කිරීම සඳහා අවශ්‍ය සුදුසු ක්‍රියාපටිපාටීන් සකස් කර ස්ථාපනය කළ යුතුය. (1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 77 වන කොටස පරිශීලනය කරන්න.)

4.3 පිළිගත හැකි ආකාරයේ තොරතුරු වත්කම් පරිශීලනය

තොරතුරු සහ වත්කම්හි පිළිගත හැකි ආකාරයේ භාවිතය සඳහා වූ පිළිගත් රීතීන් හඳුනාගෙන, ලේඛනගත කොට ක්‍රියාවට නැංවිය යුතු අතර කලින් කලට එම රීතීන් සමාලෝචනය කළ යුතුය. පිළිගත හැකි ආකාරයේ භාවිතය සඳහා සේවකයන්, කොන්ත්‍රාත්කරුවන් හා තෙවැනි පාර්ශවයන් විසින් මෙම රීතීන් පිළිපැදිය යුතුය.

5. **මානව සම්පත් ආරක්ෂණය**

**අරමුණ:** පහසුකම් සොරකම් කිරීම, වංචා කිරීම සහ අනවසරයෙන් භාවිතා කිරීමේ අවදානම අඩු කිරීම සඳහා සේවකයන්, කොන්ත්‍රාත්කරුවන්, සේවා සපයන්නන් සහ තෙවන පාර්ශවීය පරිශීලකයන් සිය කාර්යභාරයන් හා වගකීම් අවබෝධ කරගත් බවට සහතික කිරීම.

5.1 කාර්යභාරයන් හා වගකීම් නිර්වචනය කිරීම.

ආයතනයේ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය, සියලුම පරිශීලකයන්ගේ හෝ පරිශීලක කණ්ඩායම්හි කාර්යභාරයන් හා වගකීම් පැහැදිලිව නිර්වචනය කළ යුතුය.

5.2 ආරක්ෂණ පිරික්සීම

සෑම අයදුම්කරුවෙක් සඳහාම, විශේෂයෙන් සංවේදී රැකියා දරන සේවකයන්, කොන්ත්‍රාත්කරුවන්, සේවා සපයන්නන් හා තෙවන පාර්ශවීය පරිශීලකයන් සඳහා, පසුබිම් පරීක්ෂණ පැවැත්විය යුතුය.

5.3 සේවා නියුක්ති නියමයන් හා කොන්දේසි

වෘත්තියේ හෝ සේවා ගිවිසුමේ කොටසක් ලෙස, සියලුම සේවකයන්, කොන්ත්‍රාත්කරුවන්, සේවා සපයන්නන් හා තෙවන පාර්ශවීය පරිශීලකයන්, සේවා ගිවිසුමේ නියමයන් හා කොන්දේසි සඳහා එකඟ වීම හා ඒ සඳහා අත්සන් තැබීම සිදුකළ යුතුය. සියලුම ගිවිසුම්ගත ලියකියවිලිවල තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය සඳහන් කිරීම හා එය පිළිගැනීම ඇතුලත් කළ යුතුය.

5.4 කළමනාකාරිත්වයේ වගකීම්

සියලුම පරිශීලකයන්, ආයතනයේ ස්ථාපිත ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටිවලට අනුකූල වන පරිදි, ආරක්ෂණ ක්‍රියාමාර්ග යොදාගන්නා බවට කළමනාකාරිත්වය වගබලා ගත යුතුය. තොරතුරු පද්ධතිවලට ප්‍රවේශ වීමට අවසර ලබා දීමට පෙර ඔවුන්ට සිය කාර්යභාරය හා වගකීම් මනාව පැහැදිලි කළ යුතුය.

5.5 තොරතුරු ආරක්ෂණය පිළිබඳ දැනුවත් බව, අධ්‍යාපනය හා පුහුණුව

මෙම ප්‍රතිපත්ති සඳහා සිදුකරන විධිමත් යාවත්කාලීන කිරීම් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ යටිතල පහසුකම් වෙනස් කිරීම් සියලුම පරිශීලකයන් වෙත සන්නිවේදනය කළ යුතුය. අදාළ නිලධාරීන්ට සිය රාජකාරි කටයුතු ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය සුවිශේෂී තාක්ෂණික හා භාවිත පුහුණුවීම් විධිමත් ලෙස ලබාදිය යුතුය.

5.6 ආරක්ෂණ උල්ලංඝනය කිරීම හා දණ්ඩනයන්

තොරතුරු ආරක්ෂණ සිද්ධීන් හෝ උල්ලංඝනය කිරීම් විමර්ශනය කිරීම සඳහා ක්‍රමානුකූල සහ නිශ්චිත විනය ක්‍රියාපටිපාටීන් පැවතිය යුතුය.

5.7 විධිමත්ව සේවය අවසන් කිරීම

පරිශීලක ප්‍රවේශ හිමිකම් වෙනස්වීම් ද ඇතුලත්ව, ක්‍රමවත් සේවය අවසන් කිරීම හෝ රැකියාවේ වෙනස්වීම සම්බන්ධ වගකීම්, පැහැදිලිව අර්ථකථනය කර පැවරීම කළ යුතුය. සේවය අවසන් කිරීමෙන් අනතුරුව ද වලංගු වන වගකීම් හා කාර්යභාරයන්, අදාළ ගිවිසුම්වලට අන්තර්ගත කළ යුතුය.

5.8 තොරතුරු වත්කම් නැවත ලබාදීම

සියලුම පරිශීලකයන් සිය රැකියාව, කොන්ත්‍රාත්තුව හෝ සම්මුතිය අවසන් කිරීමකදී, තමා සතුව පවතින ආයතනයේ තොරතුරු වත්කම්, තාර්කික ප්‍රවේශ තොරතුරු ද ඇතුලත්ව, ආපසු භාරදීම/ප්‍රකාශයට පත්කිරීම සිදුකළ යුතුය.

5.9 ප්‍රවේශ හිමිකම් අහෝසි කිරීම

රැකියාවේ තත්ත්වය හෝ තෙවන පාර්ශවීය ගිවිසුමක් අවසන් කිරීමකදී හෝ වෙනස් කිරීමකදී, තොරතුරු, තොරතුරු පද්ධතීන් හා තොරතුරු සැකසුම් පහසුකම් සඳහා ඇති ප්‍රවේශ අවස්ථා වහාම ක්‍රියාත්මක වන පරිදි ඉවත් කළ යුතුය.

6. **මෙහෙයුම් ආරක්ෂණය**

**අරමුණ:** ආයතනයේ පරිශ්‍ර, තොරතුරු හා මෙහෙයුම් අනවසර ප්‍රවේශ, හානි සහ බාධා කිරීම් වලින් ආරක්ෂා කර ගැනීම.

6.1 තොරතුරු සැකසුම් ප්‍රදේශය

ස්වාභාවික හෝ මිනිසා විසින් නිර්මිත ව්‍යසන වලින්, අදාළ ප්‍රදේශ, එතැන් හා විතැන් යන දෙවර්ගයටම අයත් උපකරණ සහ තොරතුරු හා තොරතුරු සකස් කිරීමේ පහසුකම් අඩංගු ජාල කේබල, ආරක්ෂා කර ගැනීම සඳහා නිසි ආරක්ෂණ ක්‍රමවේද ක්‍රියාවට නැංවීම හා සුදුසු තත්ත්වයෙන් පවත්වාගෙන යාම සිදුකළ යුතුය.

6.2 උපකරණ නඩත්තුව

අඛණ්ඩ පැවැත්ම හා සම්පූර්ණත්වය සහතික කිරීම සඳහා උපකරණ නිසි ක්‍රියාත්මක තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතුය. ඉතා වැදගත් මෙහෙයුම් සඳහා යොදාගන්නා උපකරණ, විකුණුම්කරු සමග එළැඹුනු, වාර්ෂික නඩත්තු හා ආධාරක ගිවිසුම්වලින් ආවරණය විය යුතුය.

6.3 ලේඛනගත මෙහෙයුම් ක්‍රියාපටිපාටි

මෙහෙයුම් ක්‍රියාපටිපාටි ලේඛනගත කිරීම, නඩත්තු කිරීම සහ සියලුම පරිශීලකයන්ට අවශ්‍ය විටකදී පරිශීලනය සඳහා ලබාදීම සිදුකළ යුතුය. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික යටිතල පහසුකම් හෝ පද්ධති සම්බන්ධයෙන් සැලකිය යුතු වෙනස්වීමක් සිදුවුවහොත් එවැනි වෙනස්කම්/නවීකරණයන් පිළිබිඹු වන පරිදි අදාළ ලේඛන යාවත්කාලීන කළ යුතුය.

6.4 රාජකාරි කටයුතු බෙදා වෙන්කිරීම

ආයතනයේ තොරතුරු පද්ධති හා සම්බන්ධ අනවසර ප්‍රවේශයන්, වෙනස් කිරීම් හා අවභාවිතයන් අඩු කිරීම සඳහා නිශ්චිත රැකියා කාර්යභාරය වෙත නිසි අවධානය යොමු කරමින්, රාජකාරි සහ වගකීම් කාර්යභාරයන් බෙදා වෙන්කිරීම සිදුකළ යුතුය.

6.5 වෙනස් කිරීම් කළමනාකරණය

තොරතුරු පද්ධති හා තොරතුරු සැකසුම් පහසුකම් සඳහා සිදුකරන වෙනස්කම් ක්ෂේත්‍රයේ පිළිගත් නිසි පරිචයන්ට අනුගත වෙමින්, පාලිත ක්‍රමවේදයන් යටතේ සිදුකළ යුතුය. ආයතනයේ තොරතුරු පද්ධති වත්කම් සඳහා අනවසර ප්‍රවේශයන්, වෙනස් කිරීම් හා අවභාවිතයන් සිදුවීම අවම කිරීම සඳහා රාජකාරීන් හා වගකීම් කාර්යභාරයන් බෙදා වෙන්කළ යුතුය.

6.6 සංවර්ධන, පරීක්ෂණ හා මෙහෙයුම් පහසුකම් බෙදා වෙන්කිරීම

මෙහෙයුම් පද්ධති සඳහා අනවසර ප්‍රවේශයන්, අවභාවිතයන් හා වෙනස් කිරීම් අවම කිරීම සඳහා සංවර්ධන, පරීක්ෂණ හා නිෂ්පාදන මෙහෙයුම් කටයුතු බෙදා වෙන්කළ යුතුය.

6.7 ධාරිතා කළමනාකරණය

මෙහෙයුම් අඛණ්ඩතාවය සඳහා අවශ්‍ය කාර්ය සාධන තත්ත්වයන් පවත්වාගෙන යන බව තහවුරු කර ගැනීම සඳහා, අනාගත වර්ධනයන් සහ ධාරිතා අවශ්‍යතාවයන් අඩංගු වන ආකාරයට සම්පත් භාවිතය අධීක්ෂණය කිරීම, ගැලපෙන ලෙස වෙනස් කිරීම හා පුරෝකථනය කිරීම සිදුකළ යුතුය.

6.8 පද්ධති පිළිගැනීම

අභ්‍යන්තරව නිර්මාණය කරන ලද යෙදවුම්, යෙදවුම් මෘදුකාංග අත්පත්කර ගැනීම් හෝ මූලික වැඩි දියුණු කිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා පිළිගැනුම් සුදුසු නිර්ණායක පවත්වාගත යුතු අතර සජීවී මෙහෙයුම් වලට යොමුවීමට පෙර මනා පද්ධති පරීක්ෂණ ක්‍රියාත්මක කළ යුතුය.

6.9 හානිකර කේත සඳහා පාලන ක්‍රම

හානිකර කේතයන්ගෙන් ආරක්ෂා වීම සඳහා අනාවරණය කර ගැනීමේ, වළක්වාලීමේ සහ ප්‍රතිස්ථාපනය කිරීමේ ක්‍රමවේදයන්, මනා භාවිත පුහුණු වැඩසටහන් ද සහිතව, පවත්වාගත යුතුය.

6.10 තොරතුරු සඳහා අතිරේක ආධාරක

අවිනිශ්චිත අවස්ථාවලදී භාවිතා කළ හැකි තීරණාත්මක, සංවේදී හා අනෙකුත් අවශ්‍ය තොරතුරු පවතින බවට සහතික වීම සඳහා නිසි අතිරේක ආධාරක ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ යුතුය. තොරතුරු පද්ධතිවල හා පටිපාටිවල අතිරේක ආධාරක පිටපත් නිරන්තරයෙන් පරීක්ෂා කළ යුතුය.

6.11 තොරතුරු හැසිරවීමේ ක්‍රියාපටිපාටි

අවසර නොලත් හෙළිදරව් කිරීම්, ආයතනයේ තොරතුරු ගබඩා කිරීම සඳහා යොදාගත් මාධ්‍යයන් නවීකරණය කිරීම් සහ ඉවත් කිරීම්/සැකසුම් වැළැක්වීම සඳහා නිසි ක්‍රියාපටිපාටි පවත්වාගත යුතුය.

6.12 පද්ධතිවල රැස්කරගත් තොරතුරු ආරක්ෂණය

අනවසර ප්‍රවේශයන්ගෙන් ආරක්ෂා වන ලෙස පද්ධතිවල රැස්කරගත් තොරතුරු සුරක්ෂිතව ගබඩා කළ යුතුය.

6.13 තොරතුරු හුවමාරු ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි

රඳවා ගැනීම්, පිටපත් කිරීම්, නවීකරණය කිරීම්, අවභාවිතයන් හා විනාශ කිරීම්වලින් තොරතුරු ආරක්ෂා කර ගැනීම සඳහා සුදුසු ක්‍රියාපටිපාටි සැලසුම් කර පවත්වාගත යුතුය. තොරතුරු හුවමාරු කිරීම් කළමනාකරණයේ දී පැන නගින හඳුනාගත් අවදානම් තත්ත්වයන් කෙරෙහි දැඩි අවධානය යොමු කරමින්, ව්‍යාපාර තොරතුරු පද්ධතීන්හි අන්තර් සම්බන්ධතාවය ආශ්‍රිත තොරතුරු ආරක්ෂා කර ගැනීම පිණිස ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි සැලසුම් කර පවත්වාගත යුතුය.

6.14 විගණන වාර්තාකරණය

භාවිත ක්‍රියාකාරකම්, ව්‍යතිරේකයන් හා තොරතුරු ආරක්ෂක සිද්ධි වාර්තා කරනු ලබන විගණන වාර්තා, විගණන සහ නීතිමය අවශ්‍යතාවයන්ට අනුව, නිශ්චිත කාලපරිච්ඡේදයන් සඳහා නිසි සැළකිලිමත්භාවයකින් යුතුව පවත්වාගෙන යා යුතුය.

6.15 අධීක්ෂණ පද්ධති භාවිතය සහ වාර්තාගත තොරතුරු ආරක්ෂා කිරීම

පරිපාලක, ක්‍රියාකරු හා සාවද්‍ය වාර්තා සමාලෝචනය කිරීම සඳහා පද්ධති අධීක්ෂණය සිදුකළ යුතු අතර, තොරතුරු ආරක්ෂණ සිද්ධි (ඇත්නම්) වාර්තාගත කළ යුතුය. තොරතුරු පද්ධතියේ ගැටළු හඳුනා ගැනීමට හා ඒවාට පිළියම් යෙදූ බවට සහතික වීම සඳහා මෙම වාර්තාගත තොරතුරු භාවිතා කළ හැකිය.

6.16 කාල සමකාලිකකරණය

සියලුම තොරතුරු පද්ධතිවල පද්ධති කාල මුද්‍රා එකඟ වූ ප්‍රමිතිගත කාල ප්‍රභවයන් සමග සමකාලිකකරණය කළ යුතුය.

**7. සන්නිවේදන ආරක්ෂණය**

**අරමුණ:** අපේක්ෂිත ප්‍රතිග්‍රාහකයන්ට අන්තර්ගතය මුදාහරින අතරතුර, සූක්ෂ්ම ආකාරයෙන් සන්නිවේදන ජාලවලට ප්‍රවේශවීමෙන් ඇති වන අනවසර ප්‍රවේශයන් වැළැක්වීම. මෙමගින් තොරතුරු සහ තොරතුරු සැකසීමේ පහසුකම්වල සංකේත ආරක්ෂණය, සම්ප්‍රේෂණ ආරක්ෂණය, විමෝචන ආරක්ෂණය හා භෞතික ආරක්ෂණය මෙන්ම ආයතනයේ ක්‍රියාත්මක කරනු ලබන සම්ප්‍රේෂණ ක්‍රමවේදයන් ද ආවරණය විය යුතුය.

7.1 අධ්‍යක්ෂ මණ්ඩලය හෝ බලයලත් අධිකාරිය වෙතින් තීරණාත්මක යටිතල පහසුකම් මග හැරීම

ඉලෙක්ට්‍රොනික බැංකු පද්ධතිවල ආරක්ෂාව සඳහා ආරක්ෂණ පාලන යටිතල පහසුකම් සංවර්ධනය හා අඛණ්ඩව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ක්‍රමානුකූල සමාලෝචන පැවැත්විය යුතුය. මේ සඳහා බලය පැවරීමේ වරප්‍රසාද ස්ථාපිත කිරීම, නිසි සීමා

මායිම් පවත්වා ගැනීම සඳහා තාර්කික හා භෞතික ප්‍රවේශ පාලනයන් සහ අභ්‍යන්තර හා බාහිර යන දෙවර්ගයේම පරිශීලක ක්‍රියාකාරම් සීමා කිරීම්, ඇතුලත් විය යුතුය.

7.2 ජාල ආරක්ෂණ කළමනාකරණය

ජාල තොරතුරුවල ආරක්ෂාව හා ආධාරක යටිතල පහසුකම්වල ආරක්ෂාව සහතික කිරීම.

7.3 ජාල පාලක

ආයතනයේ ප්‍රවේශ පාලන ප්‍රතිපත්තියට අනුකූලව, ආයතනයේ ස්ථානීය හා පුළුල් ප්‍රදේශ ජාල වෙත පරිශීලකයන් සම්බන්ධ කිරීමට ඇති හැකියාව සීමා කළ යුතුය. ආයතනයේ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුකූලව එම සම්පත් වෙත ප්‍රවේශවීම සඳහා ජාල සේවා පරිශීලක සහ තොරතුරු පද්ධති කණ්ඩායම් වෙන් වෙන් වශයෙන් ජාල තුළ පවත්වා ගත යුතුය.

7.4 ජංගම ගණනය කිරීම් හා සන්නිවේදනයන්

ජංගම ගණනය කිරීම් හා සන්නිවේදන පහසුකම් භාවිතය තුළින් මතුවිය හැකි අවදානම් වලින් ආරක්ෂා වීම සඳහා නිසි ආරක්ෂණ ක්‍රමවේද, තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය මගින් ආවරණය විය යුතුය.

7.5 බාහිර සබඳතා සඳහා පරිශීලක සත්‍යාපනය

දුරස්ථ පරිශීලකයන්ගේ ප්‍රවේශ පාලනය කිරීම සඳහා නිසි වලංගු කිරීමේ ක්‍රමවේදයක් භාවිතා කළ යුතුය. දෝෂ විමර්ශන හා සැකසුම් ස්ථානයන් සඳහා වන භෞතික හා තාර්කික ප්‍රවේශයන් පාලනය කළ යුතුය.

7.6 ජාල තුළ ඇති උපකරණ හඳුනා ගැනීම

නිශ්චිත ස්ථාන හා උපකරණ මගින් සබඳතා වලංගු කිරීමේ ක්‍රමවේදයක් ලෙස ස්වයංක්‍රීය උපකරණ නිර්මාණය හා හඳුනා ගැනීම සැලකිය හැක.

7.7 ජාල සම්බන්ධතා පාලනය

ආයතනයේ ප්‍රවේශ පාලන ප්‍රතිපත්තියට අනුකූලව, ආයතනයේ සීමා මායිම් පුළුල් කරන හුවමාරු කරගත් ජාල සඳහා පරිශීලකයන්ට ජාල හා සම්බන්ධ වීමට ඇති හැකියාව පාලනය කළ යුතුය.

7.8 ජාල මාර්ගගත කිරීම් කෙටුම්පත් කිරීම

ජාල සබඳතා හා තොරතුරු ප්‍රවාහයන් ආයතනයේ ප්‍රවේශ පාලන ප්‍රතිපත්තිය උල්ලංඝනය නොකරන බවට සහතික වීම පිණිස ජාලයන් සඳහා චර්යා පාලනයන් පවත්වාගත යුතුය.

8. **භෞතික හා පාරිසරික ආරක්ෂණය**

**අරමුණ:** ආයතනික පරිශ්‍ර, තොරතුරු හා තොරතුරු පද්ධති වත්කම් සඳහා සිදුවිය හැකි අනවසර භෞතික ප්‍රවේශ, හානි හා මැදිහත්වීම් වැළැක්වීම.

8.1 භෞතික ආරක්ෂණ පරිමාපක

තොරතුරු පද්ධති හා තොරතුරු සැකසුම් පහසුකම් වලින් සමන්විත ප්‍රදේශ ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රමාණවත් ආරක්ෂණ පරිමාපක (පවුරු, කාඩ්පත් මගින් පාලිත ප්‍රවේශ ස්ථාන, මානව සහභාගිත්වය සහිත තොරතුරු සැකසුම් පහසුකම් වැනි සීමා බාධක) ස්ථාපනය කළ යුතුය.

8.2 භෞතික ප්‍රවේශ පාලනයන්

නිසි ප්‍රවේශ පාලන ක්‍රමවේද සහිත තොරතුරු සැකසුම් පහසුකම් වෙත ඇතුළුවීමට බලයලත් කාර්ය මණ්ඩලය සඳහා පමණක් අවසර දිය යුතුය. එවැනි ප්‍රදේශ තුළට ඇතුළු වන ආගන්තුකයන් පිළිබඳ වාර්තා කිරීමට ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර සෑම විටම අවසරලත් නිලධාරියකු විසින් ඔවුන් කැටුව යා යුතුය.

8.3 කාර්යාල, කාමර හා පහසුකම් ආරක්ෂා කිරීම

කාර්යාල, ප්‍රදේශ, කාමර හා පහසුකම් සඳහා භෞතික ආරක්ෂණය නිසි පරිදි සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය.

8.4 බාහිර හා පාරිසරික තර්ජන වලින් ආරක්ෂාවීම

ස්වාභාවික හා මිනිසා විසින් සිදුකරන ව්‍යසන මගින් විය හැකි හානි සඳහා වන භෞතික ආරක්ෂණයන් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය.

8.5 සුරක්ෂිත ප්‍රදේශවල සේවය කිරීම

භෞතික ආරක්ෂාව හා සුරක්ෂිත ප්‍රදේශවල සේවය කිරීම සඳහා අදාළ මාර්ගෝපදේශ සැලසුම් කර, ස්ථාපනය කළ යුතු අතර, අදාළ නිලධාරීන් සඳහා ඒවා නිතිපතා සපයා දිය යුතුය.

8.6 පොදු ප්‍රවේශ, බෙදාහැරීමේ හා රැස්කිරීමේ ප්‍රදේශ

අනවසර කාර්ය මණ්ඩලය පහසුකම් සඳහා ප්‍රවේශ වීමට ඉඩ ඇති බෙදාහැරීමේ හා රැස්කිරීමේ ස්ථාන වැනි ප්‍රවේශ ස්ථාන පාලනය කළ යුතු අතර හැකි සෑම විටම තොරතුරු සැකසුම් පහසුකම් වලින් ඒවා වෙන් කොට තැබිය යුතුය.

8.7 උපයෝගීතාවයන්

සහායක උපයෝගීතාවයන් හි බිඳවැටීම් නිසා ඇති විය හැකි විදුලිබලය හා වායු සමීකරණ පහසුකම් බිඳ වැටීම්, ගිණි සහ වෙනත් බාධාවන්ගෙන් සියලුම උපකරණ ආරක්ෂා කරගත යුතුය.

8.8 කේබල ආරක්ෂණය

දත්ත හා තොරතුරු සේවාවන් රැගෙන යන විදුලිබල හා විදුලි සංදේශ කේබල, බාධකවලින් හා හානිවලින් ආරක්ෂා කරගත යුතුය.

**9. ප්‍රවේශ පාලනය**

**අරමුණ:** ආයතනයේ ව්‍යාපාරික හා ආරක්ෂණ අවශ්‍යතාවයන් මත තොරතුරු, තොරතුරු පද්ධති පහසුකම් හා ව්‍යාපාර ක්‍රියාවලීන් සඳහා ප්‍රවේශ වීම.

9.1 ප්‍රවේශ පාලන ප්‍රතිපත්තිය

ව්‍යාපාරික හා ආරක්ෂණ අවශ්‍යතාවයන් මත පදනම්ව ප්‍රවේශ පාලන ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම, ලේඛනගත කිරීම සහ සමාලෝචනය කිරීම කළ යුතුය.

9.2 පරිශීලක ප්‍රවේශ කළමනාකරණය

අවසර නොලත් නිලධාරීන්ගේ ප්‍රවේශයන් ප්‍රතික්ෂේප කරමින්, අවසරලත් නිලධාරීන්ට ප්‍රවේශය සලසාදීම සඳහා විධිමත් ක්‍රියා පිළිවෙතක් පැවතිය යුතුය. කළමනාකාරිත්වය විසින් විධිමත් ක්‍රියාපටිපාටියක් භාවිතා කරමින්, පරිශීලක ප්‍රවේශ හිමිකම් ක්‍රමානුකූල කාලපරාසවලදී සමාලෝචනය කළ යුතුය.

9.3 පරිශීලකයන් හඳුනා ගැනීම හා සත්‍යාපනය

තොරතුරු පද්ධති සඳහා ප්‍රවේශ ප්‍රදානයේ දී හා අවලංගු කිරීමේ දී අනුගමනය කළ යුතු, පරිශීලකයන් බිහි කිරීමේ හා ඉවත් කිරීමේ විධිමත් ක්‍රියාපටිපාටියක් පැවතිය යුතුය.

9.4 මුරපද කළමනාකරණ පද්ධති

ආයතනයේ ආරක්ෂණ ප්‍රතිපත්ති තුළ, මුරපද ලබාදීම සහ මුරපද පාලනය කිරීම සම්බන්ධ නීති ස්ථානය කළ යුතුය. මුරපද තෝරාගැනීමේ දී හා භාවිතයේ දී යහ ආරක්ෂණ පරිචයන් අනුගමනය කිරීම පරිශීලකයන්ගෙන් අපේක්ෂා කෙරේ.

9.5 සැසිය කල් ඉකුත්වීම/සබඳතා කාලය සීමා කිරීම

නියමිත කාර්යභාරය අවසන්වීමත් සමග ක්‍රියාකාරී සැසි අවසන් කිරීම සිදුවිය යුතුය. භාවිතයට නොගන්නා උපකරණ අනවසර ප්‍රවේශයන්ගෙන් නිසි ලෙස ආරක්ෂා වන බවට පරිශීලකයන් සහතික විය යුතුය.

**10. අන්තර්ජාල හා විද්‍යුත් තැපැල ආරක්ෂණය**

**අරමුණ:** විද්‍යුත් තැපැල් හා අන්තර්ජාල පහසුකම් ඵලදායී ලෙස භාවිතා කරන බවට සහතික වීම සඳහා ආරක්ෂිත හා මනාව ගොඩනගන ලද පාදක ව්‍යුහයක් ස්ථාපනය කිරීම.

10.1 ඉලෙක්ට්‍රොනික පණිවිඩ හුවමාරුව හා අන්තර්ජාලය

ආයතනික විද්‍යුත් තැපැල් හා අන්තර්ජාල සබඳතා මූලික වශයෙන් කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි. අන්තර්ජාල බැංකුකරණ පහසුකම් සපයනු ලබන ගනුදෙනුකරුවන් හඳුනා ගැනීම සහ බලාත්මක කිරීම වලංගු කිරීම සඳහා නිසි ක්‍රියා පිළිවෙතක් පවත්වාගත යුතුය.

10.2 මාර්ගගත ගනුදෙනු

ගනුදෙනු වලංගු කිරීමේ ක්‍රමවේද සඳහා භාවිතා කරන පද්ධති සහ දත්ත මූල මගින් ප්‍රතික්ෂේප වීම් සිදු නොවන බවට සහතික වන ලෙස ආයතනය තුළ රාජකාරි කටයුතු මනා ලෙස බෙදා වෙන්කිරීම සිදුකර ඇති බව සහතික වීම සඳහා ක්‍රියාපටිපාටීන් පවත්වාගත යුතු අතර, අන්තර්ජාල බැංකු ගනුදෙනු සඳහා වගකීම් පැවරෙන ක්‍රමවේදයන් ස්ථාපනය කළ යුතුය. ආයතනය විසින් සවිස්තරාත්මක විගණන සාධක සහ ලොග් සටහන් පවත්වාගත යුතු අතර, ගනුදෙනුකරුවන්ගේ අන්තර්ජාල බැංකු දත්තවල රහස්‍යතාවය සහතික වීම සඳහා යෝග්‍ය සංකේත යෙදුම් තාක්ෂණ ක්‍රමවේද, නිශ්චිත රීති සමූහයන් හෝ වෙනත් ආරක්ෂණ පාලන ක්‍රම යොදාගත යුතුය.

10.3 ප්‍රසිද්ධ කර ඇති තොරතුරු

ආයතනය විවිධ මාධ්‍ය හරහා ඉලෙක්ට්‍රොනිකව මෙන්ම මුද්‍රිත ආකාරයෙන්, සිය ගනුදෙනුකරුවන්ට නිරවද්‍ය සහ මනා තත්ත්වයක පවතින තොරතුරු ලබාදෙන බවට සහතික විය යුතුය.

**11. තොරතුරු පද්ධතිවල පිළිගත හැකි භාවිතයන්**

**අරමුණ:** අනවසර පරිශීලක ප්‍රවේශ සහ තොරතුරු හා තොරතුරු සැකසීමේ පහසුකම් අන්සතුවීම හෝ වංචා කිරීම වැළැක්වීමට විධිමත් ක්‍රියාපටිපාටි ස්ථාපනය කිරීම.

11.1 තොරතුරු පද්ධති සඳහා අනුමැතිය ලබාදීමේ ක්‍රියාවලිය

තොරතුරු පද්ධති හා තොරතුරු සේවා සඳහා ප්‍රවේශ හිමිකම් ප්‍රදානය කිරීම හා අවලංගු කිරීම, නිසි පාලනයකට යටත්ව හා ආරක්ෂිත යාන්ත්‍රණයක් භාවිතා කරමින් හැසිරවිය යුතුය. විධිමත් ක්‍රියා පිළිවෙලක් භාවිතා කරමින් ක්‍රමානුකූල කාලපරාසයන් තුළදී කළමනාකාරිත්වය විසින් පරිශීලක ප්‍රවේශ හිමිකම් සමාලෝචනය කළ යුතුය.

11.2 මාධ්‍ය හැසිරවීම

ආයතනයේ එකඟ වූ ප්‍රතිපත්තීන්ට අනුකූලව අවසරලත් නිලධාරීන් විසින් ඉලෙක්ට්‍රොනික හා මුද්‍රිත මාධ්‍ය නිසි ලෙස භාවිතා කිරීම, කළමනාකරණය හා යෝග්‍ය ලෙස පවත්වා ගැනීම සහතික වීම සඳහා කළමනාකාරිත්වය විසින් සුරක්ෂිත පාදක ව්‍යුහයක් ස්ථාපනය කළ යුතු වේ.

11.3 පද්ධති උපයෝගීතාවයන් භාවිතා කිරීම

අපේක්ෂිත සේවාවන් ලබාදීම සහතික වීම සඳහා පද්ධති උපයෝගීතාවයන් භාවිතය අවසරලත් නිලධාරීන්ට සීමා කිරීම හා පාලනය කිරීම සිදුකළ යුතුය.

11.4 නිශ්චිත වැඩ අංශ හා නිශ්චිත පිරික්සීමේ ප්‍රතිපත්ති

ආයතනයේ තොරතුරු වර්ගීකරණ මාර්ගෝපදේශයන්ට අනුකූලව මුද්‍රිත හා ඉවත් කළ හැකි රැස්කර තබාගන්නා මාධ්‍ය සඳහා නිශ්චිත වැඩ අංශ ප්‍රතිපත්තියක් හා තොරතුරු සැකසුම් පහසුකම් සඳහා පැහැදිලි නිශ්චිත පිරික්සීමේ ප්‍රතිපත්තියක් යොදාගත යුතුය.

12. **තොරතුරු ආරක්ෂණ සිද්ධි කළමනාකරණය**

**අරමුණ:** විධිමත් සිද්ධි වාර්තාකරණය හා ඉහළට එසවීම සඳහා ක්‍රියාපටිපාටීන් පවත්වාගත යුතුය. මෙම ක්‍රියාපටිපාටීන්, අදාළ සියලුම පාර්ශවයන්ට දැන ගැනීමට සැලැස්විය යුතුය.

12.1 තොරතුරු ආරක්ෂණ සිද්ධි වාර්තාකරණය

තොරතුරු ආරක්ෂණ සිද්ධි හැකි ඉක්මණින් නිසි කළමනාකරණ මාර්ග ඔස්සේ වාර්තා කළ යුතුය. සිද්ධි සඳහා ප්‍රතිචාර සහ ගතයුතු ක්‍රියාමාර්ග ද දක්වමින් ඉහළට එසවීමේ ක්‍රියාපටිපාටියක් සමඟ විධිමත් වාර්තාකරණ ක්‍රියාපිළිවෙලක් ස්ථාපනය කළ යුතුය.

12.2 ආරක්ෂණ දුර්වලතා වාර්තාකරණය

තොරතුරු පද්ධති හා සේවා භාවිතා කරන සියලුම සේවකයන්, කොන්ත්‍රාත්කරුවන් හෝ තෙවන පාර්ශවීය පරිශීලකයන් තොරතුරු පද්ධති හෝ සේවා සැපයීමේ දී නිරීක්ෂණය කරන ලද හෝ අනුමාන කරන ලද, ආරක්ෂණ දුර්වලතා සටහන් කර ගැනීම සහ වාර්තා කළ යුතුය.

12.3 වගකීම් හා ක්‍රියාපටිපාටි

තොරතුරු ආරක්ෂණ සිද්ධිවලට ඉක්මන්, කාර්යක්ෂම හා ක්‍රමවත් ප්‍රතිචාර දැක්වීම සහතික වීම සඳහා කළමනාකරණ වගකීම් හා ක්‍රියාපටිපාටි ස්ථාපනය කළ යුතුය. සිද්ධි විශ්ලේෂණය හා හඳුනා ගැනීම, එහි අන්තර්ගතය හා එවැනි සිද්ධි අනාගතයේ දී නැවත ඇති වීම වැළැක්වීමට ගත යුතු ක්‍රියාමාර්ග සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම යන කරුණු මෙම ක්‍රියා පිළිවෙල මඟින් ආවරණය විය යුතුය.

12.4 තොරතුරු ආරක්ෂණ සිද්ධි මගින් දැනුම ලබාගැනීම

තොරතුරු ආරක්ෂණ සිද්ධි වර්ගයන්, ප්‍රමාණයන් හා පිරිවැය ගණනය කිරීමට හා අධීක්ෂණය කිරීමට හැකියාව ලබාදෙන යාන්ත්‍රණයක් පවත්වාගත යුතුය.

12.5 සාක්ෂි එක්රැස් කිරීම

තොරතුරු ආරක්ෂණ සිද්ධියකට පසුව කිසියම් පුද්ගලයෙකුට හෝ ආයතනයකට එරෙහිව ඉදිරියට කටයුතු කරගෙන යාමේ දී නීතිමය ක්‍රියාමාර්ග (සිවිල් හෝ අපරාධ) සම්බන්ධ වන්නේ නම්, අදාළ අධිකරණයේ දක්වා ඇති සාක්ෂි අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි සාක්ෂි එක්රැස් කිරීම, රඳවා තබා ගැනීම හා ඉදිරිපත් කිරීම කළ යුතුය.

13. **තොරතුරු පද්ධති අත්පත්කර ගැනීම, සංවර්ධනය හා පවත්වාගෙන යාම**

**අරමුණ:** තොරතුරු ආරක්ෂණ කළමනාකරණය තොරතුරු පද්ධතිවල වැදගත් කොටසක් බවට සහතික වීම.

13.1 තොරතුරු ආරක්ෂණ අවශ්‍යතා විශ්ලේෂණය කිරීම හා මෘදුකාංග හා දෘඩාංග සඳහා පිරිවිතරකරණය:

තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම හා සමස්ත ව්‍යාපාර අවශ්‍යතාවයන්ගේ කොටසක් ලෙස තොරතුරු ආරක්ෂණ අවශ්‍යතා හඳුනා ගැනීම, සාධාරණීකරණය කිරීම, එකඟ සහතික වීම සහ ලේඛනගත කිරීම සිදු කළ යුතුය.

13.2 යෙදවුම්හි නිරවද්‍ය සැකසුම

තොරතුරු දෝෂ, හානි, අනවසර වෙනස් කිරීම් හා අවභාවිතයන් වැළැක්වීම සඳහා දත්ත යෙදවුම්, සැකසුම් හා නිමැවුම් යන සියලු අදියර වල දී සුදුසු පාලන ක්‍රම ස්ථාපනය කළ යුතුය.

13.3 පණිවුඩවල නිරවද්‍යතාවය

යෙදවුම්හි පණිවුඩ නිරවද්‍යතාවය වලංගු කිරීම හා ආරක්ෂා කිරීම සහතික කෙරෙන අවශ්‍යතාවයන් හඳුනා ගැනීම සහ ස්ථාපනය කිරීම සිදුකළ යුතුය.

13.4 මෙහෙයුම් මෘදුකාංග පාලනය

හානි අවම කිරීම සඳහා, නිෂ්පාදන පරිසරයන් තුළ දී මෙහෙයුම් මෘදුකාංග පාලනය කිරීමේ විධිමත් ක්‍රියාපටිපාටි පවත්වාගත යුතු වේ. අනවසර ලෙස පිටපත් කර මෘදුකාංග භාවිතය තහනම් කළ යුතු අතර ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපල හා අදාළ වන පනත් හා නීති හා අනුකූලවීම සිදුවිය යුතුය.

13.5 පද්ධති පරීක්ෂණ දත්ත ආරක්ෂා කිරීම

නිෂ්පාදන දත්ත මූල වලට සිදුවිය හැකි අනවසර ප්‍රවේශයන් වැළැක්වීම සඳහා වෙනමම පරීක්ෂණ පරිසරයක් තුළ පද්ධති පරීක්ෂණ සිදු කළ යුතු අතර මෙම පරීක්ෂණ ප්‍රතිඵල හා පරීක්ෂණ පිටපත්, පාලන/විගණන කටයුතු සඳහා යොදා ගැනීමට තබාගත යුතු වේ.

13.6 ප්‍රභව කේත ක්‍රමලේඛයන් සඳහා ප්‍රවේශ පාලනය

ප්‍රභව කේත සඳහා ප්‍රවේශවීම සීමා කළ යුතුය. ඉතා වැදගත් මෙහෙයුම් සඳහා යොදාගන්නා, බාහිරින් මිල දී ගත් මෘදුකාංගයන්හි ප්‍රභව කේත, අදාළ ආයතනයේ ප්‍රතිපත්ති මත පදනම්ව, ගිවිසුමකට යටත් වූ තෙවන පාර්ශවයක් (එස්ක්‍රෝ නියෝජිතයකු) යටතේ තැබිය යුතුය.

13.7 වෙනස් කිරීම් පාලන ක්‍රියාපටිපාටි

තොරතුරු පද්ධති සඳහා වෙනස් කිරීම් සිදු කිරීම පාලනය සඳහා විධිමත් වෙනස්කම් පාලන ක්‍රියාපටිපාටි පවත්වාගත යුතුය.

13.8 මෙහෙයුම් පද්ධති වෙනස් කිරීම්වලින් පසු යෙදවුම් සඳහා සිදුකළ යුතු තාක්ෂණික සමාලෝචන

වෙනස් කළ පරිගණකගත කරන ලද පරිසරය, ආයතනයේ අභ්‍යන්තර පාලනයන් සමඟ එකඟ වන බව සහතික කිරීම සඳහා යෙදවුම් පාලනය සහ නිරවද්‍යතාව විශ්ලේෂණය සම්බන්ධ සමාලෝචන පැවැත්විය යුතුය.

13.9 මෘදුකාංග පැකේජ වෙනස් කිරීම් සීමා කිරීම

මෘදුකාංග පැකේජ සංශෝධනය කිරීම් අධෛර්යමත් කළ යුතු අතර, ඒවා සංශෝධන වලින් තොරව භාවිතා කළ යුතුය. සංශෝධන අවශ්‍ය වන්නේ නම්, සේවා සපයන්නාගේ තාක්ෂණික සහය ද සහිතව, ගොඩනගා ඇති පාලන ක්‍රමයන් හි සහ ක්‍රියාවලීන් හි අවදානම් ඇගයීම සිදුකළ යුතුය.

13.10 තොරතුරු රහස් හෙළිකිරීම

සෑම අවස්ථාවකදීම තොරතුරු රහස් හෙළිකිරීමට ඇති හැකියාවන් වළක්වාගත යුතුය.

13.11 බාහිර පාර්ශවයන්ගෙන් සේවා ලබාගනිමින් මෘදුකාංග සංවර්ධනය කිරීම

බාහිර පාර්ශවයන්ගෙන් සේවා ලබාගනිමින් මෘදුකාංග සංවර්ධනය කිරීමේ දී, බුද්ධිමය දේපල හිමිකම් සැළකිල්ලට ගනිමින්, බලපත්‍ර ලබාගැනීමේ සැලසුම් ස්ථාපනය කළ යුතුය. ආයතනය විසින් බාහිර පාර්ශවයන්ගෙන් සේවා ලබාගනිමින් මෘදුකාංග සංවර්ධනය කිරීම අධීක්ෂණය හා සුපරීක්ෂණය සිදුකළ යුතුය.

13.12 තාක්ෂණික වශයෙන් හානි සිදුවීම කළමනාකරණය

තොරතුරු පද්ධති භාවිතයේ දී ඇති වන තාක්ෂණික හානි සිදුවීම් සම්බන්ධව කාලීන තොරතුරු ලබාගත යුතුය. එවැනි හානි සිදුවීම් සඳහා ආයතනයේ නිරාවරණයන් ඇගයීම සහ ඊට අදාළ අවදානම් කළමනාකරණය කිරීමට ප්‍රමාණවත් පියවර ගත යුතුය.

13.13 තාක්ෂණික වශයෙන් හානි සිදුවීම පාලනය

දෘඩාංග හා මෘදුකාංග අපේක්ෂිත ආකාරයෙන් ක්‍රියාත්මක වන බව සහතික වීම සඳහා කාර්යක්ෂම හා ක්‍රමවත් ක්‍රියාමාර්ග හරහා තාක්ෂණික වශයෙන් හානි සිදුවීම් පාලන ක්‍රම ස්ථාපනය කළ යුතුය.

**14. ව්‍යාපාර අඛණ්ඩත්වය කළමනාකරණය**

**අරමුණ:** ව්‍යාපාර කටයුතු සඳහා වන බාධාවීම් නිෂ්ඵල කිරීම සහ වැදගත් ව්‍යාපාර ක්‍රියාවලීන්, තොරතුරු පද්ධති හා පහසුකම්වල ප්‍රධාන බිඳවැටීම් මඟින් හෝ ව්‍යසන තත්ත්වයන්ගේ බලපෑම් වලින් ආරක්ෂා කර ගැනීම සඳහා පිළිගත හැකි කාලපරාසයක් තුළ ඒවා යථා පරිදි ක්‍රියාත්මක කරවිය හැකි බව සහතික කිරීම.

14.1 ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම (Business Continuity Plan - BCP) සඳහා සූදානම්වීම හා අනුමැතිය ලබාගැනීම

සියලුම සැලසුම් සංගත, තොරතුරු ආරක්ෂණ අවශ්‍යතා සපුරාලමින් සහ පරීක්ෂා කිරීම් හා නඩත්තු කිරීම් සඳහා වන ප්‍රමුඛතා හඳුනා ගනිමින්, ඒවා එකිනෙක ගැලපෙන බව සහතික වීම සඳහා, ආයතනික වශයෙන් ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් තනි ව්‍යුහගත රාමුවක් තුළ පවත්වා ගත යුතුයි. ආයතනයේ ව්‍යාපාර මෙහෙයුම් මනාව සැළකිල්ලට ගනිමින් සිදුකරන ව්‍යාපාර බලපෑම් විශ්ලේෂණය (Business Impact Analysis) මත පදනම් වූ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමක් සකස් කළ යුතුය. ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම, ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් හෝ අදාළ අවස්ථාවට ගැලපෙන පරිදි ප්‍රධාන/ප්‍රාදේශීය කාර්යාලය විසින් අනුමත කළ යුතුය.

14.2 ව්‍යාපාර අඛණ්ඩතාවය හා අවදානම් තක්සේරුකරණය

ව්‍යාපාර ක්‍රියාවලි හා පහසුකම් සඳහා බාධා කිරීම් ඇති කළ හැකි සිද්ධි, එවැනි බාධාවීම් ඇතිවීමේ සම්භාවිතාවය සහ ඒ නිසා වන ප්‍රතිඵල හා තොරතුරු ආරක්ෂණය මත ඒ මඟින් ඇති කරවන බලපෑම් සමග හඳුනා ගැනීම සිදුකළ යුතුය.

14.3 ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ ක්‍රියාවලිය තුළට තොරතුරු ආරක්ෂණය ඇතුලත් කිරීම

ආයතනයේ ව්‍යාපාර අඛණ්ඩතාව සඳහා ඉවහල් වන තොරතුරු ආරක්ෂණ අවශ්‍යතාවයන් නිසි ලෙස ආවරණය කරන, සම්පූර්ණ ආයතනයේම ව්‍යාපාර අඛණ්ඩතාවය පවත්වා ගනු ලබන, නිසි ලෙස කළමනාකරණය වූ ක්‍රියාවලියක් පවත්වාගත යුතුය.

14.4 තොරතුරු ආරක්ෂණය ද ඇතුලත්ව ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම

ව්‍යාපාර මෙහෙයුම් ප්‍රතිස්ථාපනය කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම, ලේඛනගත කිරීම, පවත්වාගෙන යාම හා ක්‍රමානුකූලව සමාලෝචනය කිරීම සිදුකළ යුතුය.

14.5 ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම පරීක්ෂා කිරීම, නඩත්තු කිරීම හා ප්‍රතිශෝධනය කිරීම

ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම යාවත්කාලීන සහ කාර්යක්ෂම බව සහතික වීම සඳහා, ක්‍රමානුකූලව පරීක්ෂා කිරීම හා යාවත්කාලීන කිරීම සිදුකළ යුතුය. මෙම පරීක්ෂා කිරීම් මඟින් ප්‍රතිස්ථාපනය කිරීම්, මෙහෙයුම් හා වෙනත් අදාළ කණ්ඩායම්වල සියලුම සාමාජිකයන්, අදාළ සැලැස්ම මෙන්ම ව්‍යාපාර අඛණ්ඩතාවය හා තොරතුරු ආරක්ෂණය සම්බන්ධයෙන් තමන්ගේ භූමිකාව පිළිබඳව දැනුවත් බව තහවුරු කළ යුතුය.

යොමුව: 02/17/800/0014/02 2014 ජූලි 31

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල

ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

## ආයෝජන අරමුදල් ගිණුම

උක්ත මාතෘකාව සම්බන්ධයෙන් 2011 අප්‍රේල් 29 හා 2013 අප්‍රේල් 24 දින දරන මාර්ගෝපදේශයන් හා බැඳෙන අතර, ආයෝජන අරමුදල් ගිණුමෙහි මෙහෙයුම් 2014 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි අත්හිටුවන බව මෙයින් දන්වමු.

2. **ඒ අනුව, ආයෝජන අරමුදල් ගිණුමෙහි මෙහෙයුම් පිළිබඳ මාර්ගෝපදේශයන් සම්බන්ධයෙන් පහත සඳහන් පැහැදිලි කිරීම් අදාළ වේ.**

**(i) මාර්ගෝපදේශය 2 - ආයෝජන අරමුදල් ගිණුමට බැර කිරීම්**

(අ) මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා ගණනය කළ ලාභයෙන් 8% කට සමාන මුදල් ප්‍රමාණයක් ආයෝජන අරමුදල් ගිණුමට මාරු කිරීමේ අවශ්‍යතාවය 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වේ. ඒ අනුව, එකතු කළ අගය මත අවසාන බදු ගෙවීම 2014 ජනවාරි 20 දින කළ යුතුය.

(ආ) දේශීය ආදායම් පනතේ 113 වගන්තියෙහි දක්වා ඇති දිනවලදී ආදායම් බදු සඳහා ගණනය කළ ලාභයෙන් 5% කට සමාන මුදල් ප්‍රමාණයක් 2013/2014 තක්සේරු වර්ෂය තුළදී ආයෝජන අරමුදල් ගිණුමට මාරු කිරීමේ අවශ්‍යතාවය 2013 මාර්තු 31 දිනෙන් අවසන් වේ. 2013/2014 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද මත අවසාන බදු ගෙවීම 2014 සැප්තැම්බර් 30 දින විය යුතුය.

**(ii) මාර්ගෝපදේශය 4.3 - ශ්‍රී ලංකා මහ බැංකුව වෙත හෙළිදරව් කිරීම සහ වාර්තාකරණය**

(අ) මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවන් සහ ආයෝජන අරමුදල් ගිණුමේ භාවිතය පිළිබඳ වාර්තාවක් සැපයීමේ අවශ්‍යතාවය 2014 සැප්තැම්බර් 30 දින දක්වා අදාළ වේ.

**(iii) මාර්ගෝපදේශය 4.4 - බදු අය කිරීම**

(අ) පෙර කාලපරිච්ඡේදවල බදු ගෙවීමේ කටයුතු අවසන් කිරීම නිසා 2014 ජූලි 01 දිනෙන් පසුව පැන නගින ගැලපීම්, 2014 සැප්තැම්බර් 30 දින දක්වා ආයෝජන අරමුදල් ගිණුමට ගැලපීම් කළ හැකිය.

(ආ) ආයෝජන අරමුදල් ගිණුමෙන් ලබාදුන් ණය හා අත්තිකාරම්වලින් ඉපැයූ පොලී ආදායම, 2014 ජූලි 01 දිනෙන් පසුව ආදායම් බදුවලින් නිදහස් නොවනු ඇත.

3. **වෙනත්**

**(i) ණය ආපසු ගෙවීමෙන් හා දිගුකාලීන රජයේ සුරැකුම්පත් කල්පිරීමෙන් ලැබෙන මුදලින් පියවාගත් ප්‍රාග්ධන අරමුදල්.**

(අ) 2014 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ණය ආපසු ගෙවීමෙන් හා දිගුකාලීන රජයේ සුරැකුම්පත් කල්පිරීමෙන් ලැබෙන මුදලින් පියවාගත් ප්‍රාග්ධන අරමුදල් සඳහා, ආයෝජන අරමුදල් ගිණුමෙහි මෙහෙයුම් පිළිබඳ මාර්ගෝපදේශ අදාළ නොවේ.

(ආ) ඒ අනුව, ඉහත ඡේදයේ 3 (i) (අ) සඳහන් මූලාශ්‍රවලින් පියවාගෙන ඇති ප්‍රාග්ධන අරමුදල්වලට සමාන වටිනාකමක් බැංකු විසින් ආයෝජන අරමුදල් ගිණුමෙන් අඩුකර ගත හැක.

**(ii) ආයෝජන අරමුදල් ගිණුමෙහි මෙහෙයුම් අත්හිටුවීම**

(අ) ආයෝජන අරමුදල් ගිණුමෙහි මෙහෙයුම් 2014 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි අත්හිටුවනු ඇත. ඒ අනුව බැංකු විසින් හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය හරහා ආයෝජන අරමුදල් ගිණුමෙහි ඉතිරි ශේෂය රඳවාගත් ඉපැයීම්වලට මාරු කළ යුතුය.

මෙයට - විශ්වාසී
ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මිය
**බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ**

යොමුව : 02/17/800/0014/02 2014 සැප්තැම්බර් 26

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල

ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

## ආයෝජන අරමුදල් ගිණුම

උක්ත මාතෘකාව සම්බන්ධයෙන් 2014 ජූලි 31 දින දරන චක්‍රලේඛය හා බැඳෙන අතර එම චක්‍රලේඛයෙහි (2) (iii) (ආ) ඡේදය මෙමගින් අවලංගු කරනු ලබන බව දන්වා සිටිමු.

මෙයට - විශ්වාසී
ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මිය
**බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ**

යොමුව : 02/17/600/002/001 2014 ඔක්තෝබර් 16

බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත

මහත්මයාණෙනි/මහත්මියනි,

## අපනයනකරුවන්ට ලබා දුන් ණය පහසුකම් ආපසු අයකර ගැනීම

අපනයන මත ඉපැයුම් ඉහළ යාමත් සමග රටෙහි බාහිර අංශයේ ස්ථාවරත්වය වර්ධනය වීම සහ ගෙවුම් ශේෂයේ වැඩි දියුණු වීමත් සමග සිදුවූ විදේශ සංචිත ශක්තිමත් වීම සලකා බැලීමෙන් අනතුරුව, 2001 ජනවාරි 22, 2001 ජනවාරි 29, 2001 පෙබරවාරි 16 සහ 2001 මාර්තු 30 දිනැති, අපනයනකරුවන්ට ලබාදුන් ණය පහසුකම් ආපසු අයකර ගැනීම මත වූ චක්‍රලේඛයන්, 2014 ඔක්තෝබර් 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කොට ඇත.

ඒ අනුව, උක්ත කරුණ සම්බන්ධයෙන් අනුකූලතාවය දැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඔබ වෙත දැනුම් දෙමු.

මෙයට - විශ්වාසී<br>
ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මිය<br>
**බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 1891/11 - 2014 දෙසැම්බර් මස 02 වැනි අඟහරුවාදා - 2014.12.02

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

**I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන**

මුදල් නීති පනත

(422 වැනි අධිකාරය වූ) මුදල් නීති පනතේ 32ඉ වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් පනවනු ලබන ලද රෙගුලාසි.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්,<br>
**සභාපති,**<br>
**මුදල් මණ්ඩලය.**

**2014 ක් වූ නොවැම්බර් මස 28 වැනි දින,**<br>
**කොළඹ දීය.**

## ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි

## 2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි සංශෝධනය

| | | |
|---|---|---|
| 1. හැඳින්වීම | 1.1 | මෙම රෙගුලාසි, 2014 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි යනුවෙන් හැඳින්විය යුතුය. |
| 2. මූලික රෙගුලාසි සංශෝධනය | 2.1 | 2010 සැප්තැම්බර් මස 28 දිනැති අංක 1673/11 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි පහත පරිදි සංශෝධනය වේ:- |
| | 2.2 | 9 වැනි රෙගුලාසිය, එහි 9.6 ඡේදය ඉවත් කිරීමෙන් පසු සහ ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් සංශෝධනය කෙරේ:<br>"9.6 ඉහත දක්වන ලද ආකාරයන් අනුව ගණනය කරන ලද මුළු රක්ෂිත තැන්පතු ප්‍රමාණය මත එක් තැන්පතුකරුවෙකුට ගෙවිය යුතු හානිපූර්ණ මුදල් ප්‍රමාණය රුපියල් 300,000 ක් වූ හෝ සුදුසුකම් සහිත විදේශ විනිමය තැන්පතු සම්බන්ධයෙන් වන විට රුපියල් 300,000 කට සමාන ප්‍රමාණයක් වූ උපරිමයකට යටත් වේ." |
| 3. බලාත්මක වන දිනය | 3.1 | මෙම සංශෝධනය 2015 ජනවාරි මස 01 වැනි දින සිට බලාත්මක විය යුතුය. |

සී.ජේ.පී. සිරිවර්ධන<br>
**සහකාර අධිපති**

සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනතේ 8 සහ 76 ඇ(6) වගන්ති ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධානය.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්<br>
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**<br>
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

2014 දෙසැම්බර් 18 දින<br>
කොළඹ දී ය.

## බැංකු පනතේ 2014 අංක 1 දරන විධානය
## බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල වාර්ෂික බලපත්‍ර ගාස්තු

**2015 සහ 2016 වර්ෂ සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තු**

1. බැංකු පනතේ 8(1) සහ 76 ඇ(6) වගන්ති ප්‍රකාරව, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 2015 සහ 2016 වර්ෂ සඳහා මුළු වත්කම් ප්‍රමාණය පදනම් කොටගෙන පහත සඳහන් පරිදි බලපත්‍ර ගාස්තු ගෙවිය යුතු බව මුදල් මණ්ඩලය විසින් තීරණය කර ඇත.

| පෙර වර්ෂයේ අවසානයට පැවති මුළු වත්කම් | බලපත්‍ර ගාස්තුව |
|---|---|
| රුපියල් බිලියන 750 ට වැඩි | රුපියල් මිලියන 30 |
| රුපියල් බිලියන 500 සිට රුපියල් බිලියන 750 දක්වා | රුපියල් මිලියන 25 |
| රුපියල් බිලියන 200 සිට රුපියල් බිලියන 500 දක්වා | රුපියල් මිලියන 22 |
| රුපියල් බිලියන 125 සිට රුපියල් බිලියන 200 දක්වා | රුපියල් මිලියන 16.5 |
| රුපියල් බිලියන 75 සිට රුපියල් බිලියන 125 දක්වා | රුපියල් මිලියන 11 |
| රුපියල් බිලියන 25 සිට රුපියල් බිලියන 75 දක්වා | රුපියල් මිලියන 5.5 |
| රුපියල් බිලියන 25 ට අඩු | රුපියල් මිලියන 2.2 |

**බලපත්‍ර ගාස්තු ගෙවීම**

2. සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක්ම සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්ම බලපත්‍ර ගාස්තුව අදාළ වර්ෂයේ ජනවාරි 31 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවිය යුතුය.

3. බලපත්‍ර ගාස්තුව ලිත් වර්ෂ පදනම මත ගෙවිය යුතුය.

යොමුව : **02/17/402/0073/002** 2014 දෙසැම්බර් 23

බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි,

## බැංකුවල අවම ප්‍රාග්ධන අවශ්‍යතාව ඉහළ නැංවීම

උක්ත මාතෘකාව සම්බන්ධයෙන් අපගේ 2010 ජූලි 29 දිනැති අංක **02/17/402/0073/002** දරන චක්‍රලේඛය හා බැඳෙන අතර, 2014 ජනවාරි 17 දිනැති මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ ප්‍රධාන සැලැස්මෙන් නිවේදනය කළ සහ බැංකු පනතේ 19(3) වගන්තිය අනුව, ශක්තිමත් හා ගතික බැංකු අංශයක් ඇති කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලද හෝ සංස්ථාගත කරන ලද සියලු බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රාග්ධන අවශ්‍යතාවය 2016 ජනවාරි 01 දින සිට රුපියල් බිලියන 10 දක්වා ඉහළ නැංවීමට අවශ්‍ය බව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කර ඇති බව දැනුම් දෙමු.

2. මෙම අරමුණ සඳහා ප්‍රාග්ධනය යනුවෙන් 2007 දෙසැම්බර් 26 දිනැති ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය පවත්වා ගැනීම පිළිබඳ 2007 අංක 9 දරන බැංකු පනත් විධානයෙහි පළමු උපලේඛනය ලෙස යා කර ඇති මාර්ගෝපදේශයන්හි අයිතම අංක 6.2.2.2 යටතේ අර්ථ නිරූපිත මූලික ප්‍රාග්ධනය යන්න අදහස් වේ.

3. ඉහත අවශ්‍යතාවයන්ට අනුකූලවීම සඳහා සියලුම බැංකු විසින් කාලානුරූපීව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.

මෙයට - විශ්වාසී

ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මිය

**බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ**

යොමුව : **02/17/402/0073/002** 2014 දෙසැම්බර් 23

බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි,

## බැංකුවල අවම ප්‍රාග්ධන අවශ්‍යතාව ඉහළ නැංවීම

උක්ත මාතෘකාව සම්බන්ධයෙන් අපගේ 2010 ජූලි 29 දිනැති අංක 02/17/402/0073/002 දරන චක්‍රලේඛය හා බැඳෙන අතර, 2014 ජනවාරි 17 දිනැති මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ ප්‍රධාන සැලැස්මෙන් නිවේදනය කළ සහ බැංකු පනතේ 76(උ) වගන්තිය අනුව, ශක්තිමත් හා ගතික බැංකු අංශයක් ඇති කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලද හෝ සංස්ථාගත කරන ලද සියලුම බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ප්‍රාග්ධන අවශ්‍යතාවය 2016 ජනවාරි 01 දින සිට රුපියල් බිලියන 5 දක්වා ඉහළ නැංවීමට අවශ්‍ය බව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තීරණය කර ඇති බව දැනුම් දෙමු.

2. මෙම අරමුණ සඳහා ප්‍රාග්ධනය යනුවෙන් 2007 දෙසැම්බර් 26 දිනැති ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය පවත්වා ගැනීම පිළිබඳ 2007 අංක 10 දරන බැංකු පනත් විධානයෙහි පළමු උපලේඛනය ලෙස යා කර ඇති මාර්ගෝපදේශයන්හි අයිතම අංක 6.2.2.2 යටතේ අර්ථ නිරූපිත මූලික ප්‍රාග්ධනය යන්න අදහස් වේ.

3. ඉහත අවශ්‍යතාවයන්ට අනුකූලවීම සඳහා සියලුම බැංකු විසින් කාලානුරූපීව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.

මෙයට - විශ්වාසී

ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මිය

**බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ**

සී. ජේ. පී. සිරිවර්ධන
සහකාර අධිපති
2014 ඔක්තෝබර් 10

බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු,
බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම්වල
සභාපතිවරුන් හා ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි,

## මූල්‍ය අංශයේ ඒකාබද්ධවීමට පහසුකම් සැලසීම සඳහා 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත් ප්‍රතිපාදනයන්ට සිදුකළ සංශෝධන ප්‍රකාරව හඳුන්වා දෙන ලද මාර්ගෝපදේශ

ඔබගේ තොරතුරු හා සුදුසු පියවර ගැනීමේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා ඉහත සඳහන් මාර්ගෝපදේශ මේ සමග අමුණා එවමු. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයෙහි 2014 ඔක්තෝබර් 09 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඒ සම්බන්ධයෙන් පහත පරිදි දන්වා ඇති බව අපි ඔබ වෙත දැනුම් දෙන්නෙමු.

1. මූල්‍ය ආයතන ඒකාබද්ධවීම සම්බන්ධයෙන් දේශීය ආදායම් පනත හා එකතු කළ අගය මත බදු පනතට සිදුකළ සංශෝධනවලට අනුකූලව කල්බදු මූල්‍ය පනත යටතේ ලියාපදිංචි කර ඇති කල්බදු සමාගම් සඳහා 2014 අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බදු සහන ලබාදෙනු ඇත.
2. අත්පත්කර ගැනීම/ඒකාබද්ධවීම හේතුවෙන් සිදුවන කොටස් හුවමාරුවීම් ගැසට් පත්‍රයේ පළකළ නියෝගයක් මගින් මුද්දර බදුවලින් නිදහස් කෙරෙනු ඇත.
3. ශ්‍රී ලංකා මහ බැංකුව මාර්ගෝපදේශ ප්‍රකාරව, නිර්ණය කරන ලද අත්පත්කර ගැනීමේ/ඒකාබද්ධ කිරීමේ සම්පූර්ණ පිරිවැය, අත්පත්කර ගැනීමේ/ඒකාබද්ධ කිරීමේ වර්ෂයේ තක්සේරු කරන ලද ආදායමෙන් 1/3 ක උපරිමයකට යටත්ව සුදුසුකම් ලබන ගෙවීම් ලෙස අඩුකර ගැනීමට අවසර දෙනු ලැබේ. ඉතිරි වන ඕනෑම ප්‍රමාණයක් එකී සීමාවටම යටත්ව ඉදිරියට ගෙන ගොස් පසු වර්ෂවල තක්සේරු කළ හැකි ආදායමෙන් හිලව්කර ගැනීමට හැකි වනු ඇත. එසේ වුවද, අත්පත්කර ගන්නා මූල්‍ය ආයතනයේ තක්සේරු කළ හැකි ආදායම රුපියල් මිලියන 300 කට වඩා අඩු වන්නේ නම්, සුදුසුකම් ලැබීමේ දීමනාව, තක්සේරු කළ හැකි ආදායම දක්වා අඩු කරගත හැකි අතර, ශේෂය ඉදිරියට ගෙන ගොස් අනාගතයේදී තක්සේරු කළ හැකි ආදායමෙන් හිලව් කර ගැනීමට හැකි වනු ඇත.

මෙයට - විශ්වාසී
**මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ ඒකකයේ ප්‍රධානී**

2014 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් සංශෝධිත, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 වගන්තිය සහ 2014 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනතින් සංශෝධිත, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 22 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
**මුදල් මණ්ඩලයේ සභාපති**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

2014 ඔක්තෝබර් 10 දින.
කොළඹ දී ය.

## මූල්‍ය ආයතන අත්පත්කර ගැනීමේ/ඒකාබද්ධ කිරීමේ පිරිවැය නිර්ණය කිරීමටත් සහ අන්තර්ග්‍රහණය නොකළ යෙදවුම් සඳහා එකතු කළ අගය මත (බදු) හිමිකම්පෑම සඳහා වන මාර්ගෝපදේශ

1. පූර්විකාව

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 5 වගන්තියේ විධිවිධානයන්හි අඩංගු අයුරින්, මූල්‍ය පද්ධති ස්ථායීතාවය ආරක්ෂා කිරීමට පැවරී ඇති සිය බලය යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය ආයතනවල ඔරොත්තුදීමේ හැකියාව බලගැන්වීමේ අරමුණින් එම ආයතන ස්ථාවර හා කාර්යක්ෂම කිරීමේ පියවර අනුගමනය කරමින් සිටී. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් එකතුවීම හෝ අත්පත්කර ගැනීම හෝ අන්තර්ග්‍රහණය කිරීම යන ක්‍රියාමාර්ග තුළින් ඒකාබද්ධවීමේ සිය ප්‍රධාන සැලසුම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත්කරන ලදී.

2. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සහ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතට හඳුන්වාදුන් සංශෝධන ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව පහත දැක්වෙන මාර්ගෝපදේශ නිකුත් කරනු ලබයි.

   I වැනි කොටස : 2014 අංක 08 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් සංශෝධිත, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34 වගන්තිය ප්‍රකාරව අත්පත්කර ගැනීමේ/ඒකාබද්ධ කිරීමේ පිරිවැය නිර්ණය කිරීම.

   II වැනි කොටස : 2014 අංක 07 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනතින් සංශෝධිත, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 22 වගන්තිය ප්‍රකාරව ඕනෑම බැංකු හෝ මූල්‍ය ආයතනයක අන්තර්ග්‍රහණය නොකරන ලද යෙදවුම් බැරකම් මත හිමිකම්පෑම.

3. මෙහි මින් අනතුරුව "මූල්‍ය ආයතන" ලෙස පොදුවේ සඳහන් කරනු ලබන, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍ර ලබා තිබෙන බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍ර

ලබා තිබෙන බලපත්‍රලාභී මූල්‍ය සමාගම් හා 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත යටතේ ලියාපදිංචි කල්බදු සමාගම් සඳහා මෙම මාර්ගෝපදේශයන් අදාළ වේ.

4. 2007 අංක 07 දරන සමාගම් පනතේ 245 වගන්තියේ (ඈ), (ඉ), (ඊ) හා (උ) ඡේදයන්හි විධිවිධානයන්ට යටත්ව, මූල්‍ය ආයතන අත්පත්කර ගැනීමේ/ඒකාබද්ධ කිරීමේදී "අත්පත්කර ගැනීමේ හෝ ඒකාබද්ධ කිරීමේ පිරිවැය" නිර්ණය කිරීමේ මාර්ගෝපදේශ අදාළ වනු ඇත.

5. අත්පත්කර ගැනීම්/ඒකාබද්ධ කිරීම් සඳහා වන පිරිවැය, සුදුසුකම් ලබන ගෙවීමක් ලෙස සැළකීමට අදාළ රෙගුලාසිවලට අමතරව අත්පත්කර ගැනීම්/ඒකාබද්ධ කිරීම් හේතුවෙන් ඇති වන බදු ගැලපුම්වලට අදාළ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම සඳහා වන රෙගුලාසි, දේශීය ආදායම් පනතෙහි 212 වගන්තියේ ප්‍රතිපාදන යටතේ දේශීය ආදායම් පනත, එකතු කළ අගය මත බදු පනත සහ ආර්ථික සේවා ගාස්තු යන පනත්හි අදාළ සංශෝධනයන්ට යටත්ව නිකුත් කරනු ඇත.

6. මෙම මාර්ගෝපදේශ අනුව නිර්ණය කරනු ලබන සියලුම අත්පත්කර ගැනීමේ පිරිවැය හෝ ඒකාබද්ධ කිරීමේ පිරිවැය, සුදුසුකම් ලබන ගෙවීම් ලෙස ආදායම් බදු කාර්යයේදී අඩු කිරීම් ලෙස සලකනු ලැබීමට හා ඉහත සඳහන් කළ දේශීය ආදායම් පනතේ 212 වගන්තිය, උක්ත 5 අයිතමය යටතේ එයට සිදුකරන ලද සංශෝධන වලට ද අනුව වෙනත් බදු කාර්යයන් සඳහා (ගැසට් පත්‍රයේ පළකරන ලද) සලකා බලනු ලැබීමට යටත් වනු ඇත.

7. මෙම මාර්ගෝපදේශ 2014 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙනු ඇත.

## I වැනි කොටස

8. මෙම මාර්ගෝපදේශ ප්‍රකාරව සහ දේශීය ආදායම් පනතේ 34 (2)(බ) වගන්තියට අනුව අත්පත්කර ගැනීමේ පිරිවැය හෝ ඒකාබදධ කිරීමේ පිරිවැය නිර්ණය කිරීම පිළිබඳ විකල්ප ක්‍රමවේදයන් පහත සඳහන් පරිදි වේ.

(i) අඛණ්ඩ පැවැත්ම සඳහා ව්‍යාපාර අත්පත්කර ගැනීමේ පිරිවැය/කොටස් අත්පත්කර ගැනීමේ පිරිවැය

(ii) ඒකාබද්ධවීමේ පිරිවැය

8.1 දේශීය ආදායම් පනතේ 25 වගන්තිය යටතේ හෝ එම පනතේ වෙනත් ඕනෑම ප්‍රතිපාදනයක් යටතේ අඩුකළ හැකි වියදම් ලෙස සැළකිය හැකි වියදම් හෝ නාමික බදු බැරකම්, රඳවා ගැනීමේ බදු, ප්‍රතිගෙවීම් හෝ අවශෝෂණය කර නොගන්නා ලද ශේෂ ලෙස පවත්නා එකතු කළ අගය මත බදු සම්බන්ධ වෙනත් ඕනෑම බැරකමක්, ඉදිරියට ගෙන එන ලද ආර්ථික සේවා ගාස්තු, අත්පත්කර ගන්නා ලද සමාගමෙහි අඛණ්ඩව ඉදිරියට ගෙන ඒමට අවසර ලැබූ අලාභ සඳහා වන වෙනත් ඕනෑම ප්‍රතිෂ්ඨාවක් මෙම පිරිවැයට අන්තර්ගත නොවේ.

8.2 අත්පත්කර ගැනීම/ඒකාබද්ධවීම හෝ එකතුවීමට පූර්වයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග බදු තත්ත්වය පිළිබඳව අවසානාත්මක එකඟතාවයකට පත්ව අත්පත්කර ගන්නා සමාගම විසින් බදු ගෙවා ඇති විට එය අත්පත්කර ගැනීමේ පිරිවැයක් ලෙස සැළකිය යුතුය. බදු ගෙවා නොමැති නම් අත්පත්කර ගැනීමේ පිරිවැය ඊට අනුකූලව ගැලපිය යුතුය.

9. අඛණ්ඩ පැවැත්ම සඳහා අත්පත්කර ගැනීමේ පිරිවැය හෝ කොටස් අත්පත්කර ගැනීමේ පිරිවැය.

පහත දැක්වෙන පිරිවැය අත්පත්කර ගැනීමේ පිරිවැය ලෙස සලකනු ලැබේ.

(i) ගෙවන ලද ගැනුම් ප්‍රතිෂ්ඨාව, අත්පත්කර ගන්නා දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව අදාළ ලැබිය යුතු/ගෙවිය යුතු මුළු ගණන් ඇතුලත් කළ පසුව ලබාගන්නා ලද වටිනාකම බදු කාර්යය සඳහා ගලපන ලද ඉදිරියට ගෙන එනු ලැබූ අලාභ සහ අත්පත්කර ගැනීම් වෙනුවෙන් අදාළ බදු ද ඇතුලත්ව දරන ලද වියදම්;

(ii) ගෙවන ලද නීති සහ තක්සේරු ගාස්තු ඇතුලත්ව සියලු වෘත්තීය හා උපදේශන ගාස්තු;

(iii) ගෙවන ලද ලිපිලේඛන ගාස්තු ;

(iv) මෝටර් වාහන හුවමාරුව සහ මොටර් වාහනවල පරම හිමිකාරත්වය යළි පවරාදීම සඳහා අදාළ බල අධිකාරීන්ට ගෙවන ලද ගාස්තු ;

(v) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව සහ පළාත් සභා සඳහා අදාළ මූල්‍ය නීති යටතේ දේපල හුවමාරුව හෝ පවරාදීම සම්බන්ධව ගෙවන ලද මුද්දර ගාස්තු, අත්පත්කර ගනු ලැබීමට භාජනය වූ ආයෝජන කළඹෙහි ඇති කොටස්, බදුකර අයිතීන් පැවරීම හෝ අත්පත්කර ගැනීම සම්පූර්ණ කර ගැනීමේදී බලපෑමට ලක්වන වෙනත් ඕනෑම මූල්‍ය උපකරණ සහ වෙනත් දෑ;

(vi) තොරතුරු පද්ධති සඳහා දරන ලද වියදම්;

(vii) අත්පත්කර ගැනීමට භාජනය වූ ආයතනයෙහි කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධන පිරිවැය ඇතුලත්ව මානව සම්පත සම්බන්ධ වියදම්;

(viii) සන්නාම/අලෙවිකරණ/ප්‍රචාරණය සම්බන්ධ වියදම්;

(ix) අත්පත්කර ගන්නා අවස්ථාවේදී අත්පත්කර ගැනීමට භාජනය වූ ආයතනයෙහි ප්‍රාග්ධනය ඉහළ නංවා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය සහිතව දරන ලද ඕනෑම වැය බරක් සහ මූල්‍ය ආයතන අත්පත්කර ගැනීමේදී විශේෂයෙන් වැය කිරීමට සිදුවූ ප්‍රාග්ධන හා අයභාර ස්වභාවයේ ඕනෑම වියදමක්;

(x) එකතු කළ අගය මත බදු පනතේ 16(5) වගන්තිය යටතේ ඉල්ලා සිටීමට අනුකූලව (අත්පත්කර ගැනීමෙන් පසුව අත්පත්කර ගැනීමට භාජනය වූ ආයතනයේ බදු ගෙවිය යුතු වන කාර්යයම තවදුරටත් පවත්වාගෙන යනු ලබන්නේ නම්, අත්පත්කරගත් ආයතනයෙහි වැට් නිර්ලේඛනගත කිරීම) අත්පත් කර ගැනීම, වැට් බැරකමකින් තොරව සිදුකළ හැකිය. නමුත් කිසියම් වැට් ගෙවීමක් ගෙවිය යුතුව පවතින විට, නිෂ්පාදන බදුවලට එරෙහිව එබඳු වැට් සඳහා හිමිකම්පෑම් කළ නොහැකිය.

**10. ඒකාබද්ධවීමේ පිරිවැය**

පහත දැක්වෙන පිරිවැය ඒකාබද්ධවීමේ පිරිවැය ලෙස සලකනු ලැබේ.

(i) අදාළ බදු ගෙවීම් ඇතුලත්ව දරන ලද වියදම්, තිබේ නම්;

(ii) ගෙවන ලද නීති සහ තක්සේරු ගාස්තු ඇතුලත්ව සියලු වෘත්තීය හා උපදේශන ගාස්තු;

(iii) ගෙවන ලද ලිපිලේඛන ගාස්තු;

(iv) මෝටර් වාහන හුවමාරුව සහ මෝටර් වාහනවල පරම හිමිකාරත්වය යළි පවරාදීම සඳහා අදාළ බල අධිකාරීන්ට ගෙවන ලද ගාස්තු;

(v) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව සහ පළාත් සභා සඳහා අදාළ මූල්‍ය නීති යටතේ ඒකාබද්ධවීම බලසහිත වීම උදෙසා මුද්දර ගාස්තු ගෙවන ලද්දේ නම්, ගෙවන ලද මුද්දර ගාස්තු.

(vi) එකතු කල අගය මත බදු පනතේ 16(5) වගන්තිය යටතේ ඉල්ලා සිටීමට අනුකූලව (ඒකාබද්ධවීමට පූර්වයෙහි පැවති ඒකාබද්ධ වන්නා වූ ආයතනයන්හි එකතු කළ අගය මත බදු නිර්ලේඛනගත කිරීම) ඒකාබද්ධවීම, එකතු කළ අගය මත බදු බැරකමකින් තොරව සිදුකළ හැකිය. නමුත් කිසියම් එකතු කළ අගය මත බදු ගෙවීමක් ගෙවිය යුතුව පවතින විට, නිෂ්පාදන බදුවලට එරෙහිව එබඳු එකතු කළ අගය මත බදු සඳහා හිමිකම්පෑම් කළ නොහැකිය.

(vii) තොරතුරු පද්ධති සඳහා දරන ලද වියදම්;

(viii) ඒකාබද්ධ වූ ආයතනයෙහි කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධන පිරිවැය ඇතුලත්ව මානව සම්පත සම්බන්ධ වියදම්;

(ix) සන්නාම/අලෙවිකරණ/ප්‍රචාරණය සම්බන්ධ වියදම්;

(x) ඒකාබද්ධ කරන අවස්ථාවේදී ඒකාබද්ධ කරන ආයතනයෙහි ප්‍රාග්ධනය ඉහළ නංවා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය සහිතව දරන ලද ඕනෑම වැය බරක්.

## II වැනි කොටස

11. අඛණ්ඩ පැවැත්ම සඳහා ව්‍යාපාර අත්පත්කර ගැනීම හෝ කොටස් අත්පත් කර ගැනීම.

11.1 යෙදවුම් බද්ද ඇතුලත්ව අන්තර්ග්‍රහණය නොකරන ලද යෙදවුම් බැරකම්; (ශේෂ පත්‍රයේ දැක්වෙන පරිදි)

(i) අත්පත්කර ගැනීම සිදුනොවුවහොත්, නීත්‍යානුකූල හිමිකම්පෑමේ අවකාශ තිබෙන එකතු කළ අගය මත බදු, ප්‍රතිගෙවීම් හිමිකම් නොපෑ බදු ඉන්වොයිසි හා රේගු ප්‍රකාශ. එනම්, කාලසීමාවකට සීමා නොවී එකතු කළ අගය මත බදු පනතේ ප්‍රතිපාදනයන්ට යටත්වන පරිදි;

(ii) සැපයුම්කරුවන් හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් අත්පත්කර ගැනීමට භාජනය වූ ආයතනයේ නාමයෙන්ම අත්පත්කර ගන්නා දිනට පසුව නිකුත් කරනු ලබන බදු ඉන්වොයිස් හෝ රේගු ප්‍රකාශ, අන්තර්ග්‍රහණය නොකළ යෙදවුම් බැරකම් ලෙසට සළකනු ඇත.

11.2 ඉහත 11.1 හි සඳහන් බදු ඉන්වොසියි සහ රේගු ප්‍රකාශ, එකී බදු ඉන්වොයිසියෙහි කුමක් සඳහන්ව තිබුණ ද, රේගු ප්‍රකාශයෙහි අත්පත්කර ගැනීමට භාජනය වූ ආයතනයේ නම සහ එකතු කළ අගය මත බදු ලියාපදිංචි අංකය තවදුරටත් සඳහන්ව තිබුණ ද එම සියල්ල අත්පත්කර ගනු ලැබූ ආයතනයේ නාමයෙන් නිකුත් කළ ලෙසට සැළකිය යුතුය.

11.3 එකතු කළ අගය මත බදු පනතේ 22 වගන්තියෙහි අරමුණ සඳහා අත්පත්කර ගනු ලැබීමට භාජනය වූ සමාගමෙහි පෙරකී අන්තර්ග්‍රහණය නොකරන ලද යෙදවුම් බදු අත්පත්කර ගනු ලැබූ ආයතනයෙහි අන්තර්ග්‍රහණය නොකරන ලද යෙදවුම් එකතු කළ අගය මත බදු ලෙසට සැළකිය යුතුය.

**12. ඒකාබද්ධවීම්**

12.1 ඕනෑම යෙදවුම් බදු ඇතුලත්ව අන්තර්ග්‍රහණය නොකරන ලද (ශේෂ පත්‍රයේ පිළිබිඹු වන්නා වූ); යෙදවුම් බැරකම්

(i) ඒකාබද්ධවීම සිදු නොවුවත්, එකතු කළ අගය මත බදු ප්‍රකාශනයෙහි සඳහන් නොවූ නීත්‍යානුකූල හිමිකම්පෑමේ අවකාශ තිබෙන බදු ඉන්වොයිසි හා රේගු ප්‍රකාශ. (එනම්, කාලසීමාවකට යටත් නොවන පරිදි);

(ii) සැපයුම්කරුවන් හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් ඒකාබද්ධ වූ ආයතනයේ නාමයෙන්ම ඒකාබද්ධ වන දිනට පසුව නිකුත් කරනු ලබන බදු ඉන්වොයිසි හෝ රේගු ප්‍රකාශ, අන්තර්ග්‍රහණය නොකළ යෙදවුම් බැරකම් කොටසක් ලෙසට සළකනු ඇත.

12.2 ඉහත 12.1 හි අන්තර්ග්‍රහණය නොකළ යෙදවුම් බැරකම් දැක්වෙන බදු ඉන්වොයිසි සහ රේගු ප්‍රකාශ, එකී බදු ඉන්වොයිසියෙහි කුමක් සඳහන්ව තිබුණ ද, රේගු ප්‍රකාශයෙහි ඒකාබද්ධ වන ආයතනයේ නම සහ ලියාපදිංචි අංකය තවදුරටත් සඳහන්ව ඇත්නම්, එම සියල්ල ඒකාබද්ධ වූ ආයතනයේ නාමයෙන් නිකුත් කළ ලෙසට සැළකිය යුතුය.

12.3 එකතු කළ අගය මත බදු පනතේ 22 වගන්තියෙහි දක්වා ඇති රීති ක්‍රියාත්මක කිරීමේ අරමුණ සඳහා ඒකාබද්ධ වන ආයතනයන්හි පෙර කී අන්තර්ග්‍රහණය නොකරන ලද යෙදවුම් බදු ඒකාබද්ධ වූ ආයතනයේ අන්තර්ග්‍රහණය නොකරන ලද යෙදවුම් බදු ලෙසට සැළකිය යුතුය.

**12/02/001/0036/002**

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව
2014 මැයි 12

වෙත: සියළුම වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්

මහත්මයාණෙනි/මහත්මියනි,

## ස්වයංක්‍රීය ගණක යන්ත්‍රවලින් මුදල් ආපසු ගැනීම්

2017 මාර්තු 12 වැනි දින නිකුත් කරන ලද 2007-1 අංක දරණ “ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ මුදල් ගනුදෙනු පිළිබඳ මාර්ගෝපදේශ” සහ 2012 ජුනි 11 වැනි දින නිකුත් කරන ලද “මුදල් ගනුදෙනු හා ක්‍රියාකාරිත්වය පිළිබඳ පද්ධතිය වැඩිදියුණු කිරීම” යන චක්‍රලේඛණ හා බැඳේ.

මෙම ස්වයංක්‍රීය ගණක යන්ත්‍රවලින් මුදල් ආපසු ලබා ගැනීමේ දී සමහර බැංකු ශාඛාවල රු.5,000/- නෝට්ටු පමණක් නිකුත් කිරීම නිසා මහජනයා දැඩි අපහසුතාවයට පත්වන බවට පැමිණිලි කිහිපයක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලැබී ඇත. මෙමගින් මහජනතාවගේ එදිනෙදා මුදල් ගනුදෙනු සිදුකර ගැනීම සඳහා අවශ්‍ය අඩු වටිනාකමින් යුත් නෝට්ටු ඔවුන් අතට පත්වීම වැළැක්වේ.

මහජනතාවට සිදුවන මෙම අපහසුතාවය වැළැක්වීම සඳහා ස්වයංක්‍රීය ගණක යන්ත්‍රවලින් රු.5000/- නෝට්ටු පමණක් නොව රු.100/-, රු.500/- සහ රු.1000/- ආදී විවිධ වටිනාකමින් යුත් නෝට්ටු ලබා ගැනීමට හැකිවන පරිදි මහජනතාවට පහසුකම් සලසා දෙන ලෙසට බැංකුවලට උපදෙස් ලබා දී ඇත. තවද ස්වයංක්‍රීය ගණක යන්ත්‍රවලට මුදල් ඇතුළත් කිරීමට CIT ආයතනයන් යොදවා ඇති බැංකුවලට ද එම ආයතන ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉහත සඳහන් උපදෙස්වලට අනුකූලව ක්‍රියා කරන බවට සහතික වන ලෙස දැනුම් දී සිටිමු.

මෙයට - විශ්වාසී
අධිකාරී/ව්‍යවහාර මුදල්

**සම්බන්ධ අංකය: 12/02/008/0007/001** 2014 ජූලි 21
**චක්‍රලේඛ අංක: 02/2014**

මහත්මයාණෙනි/මහත්මියනි,

## ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ මුදල් ගනුදෙනු සඳහා මාර්ගෝපදේශ

2007 මාර්තු 15 වැනි දින දී නිකුත් කරන ලද අංක 2007-1 දරණ ඉහත මාතෘකාවට අදාළ චක්‍රලේඛණයේ "මහ බැංකුවේ මුදල් තැන්පතු භාර ගැනීම" යන මැයෙන් යුත් 1.5 අනු කොටස හා බැඳේ. ඔබගේ දැන ගැනීමේ පහසුව සඳහා එහි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

1. ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ දී බැංකු නිලධාරීන්/නියෝජිතයින් (CIT ආයතන) විසින් මුදල් නෝට්ටු මිටි නැවත සකස් කිරීම සහ මුළු මුදල් එකතුව අදාළ බැංකුව විසින් නිකුත් කරන ලද ගෙවීම් පත්‍රිකාවත් ඇප පත්‍රයත් සමඟ සත්‍යාපනය කිරීම සාමාන්‍ය ක්‍රියාවලිය වේ. යම් හෙයකින් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ මුදල් තැන්පත් කරන විටදී ඇප පත්‍රිකාවේ දැක්වෙන මුදල් ප්‍රමාණය සහ සැබෑ මුදල් තැන්පතු ප්‍රමාණය අතර වෙනසක් සිදු වුවහොත්, එම වෙනස නිවැරදි කිරීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් අදාළ බැංකුවට අවසර දෙනු ලබයි.
   කෙසේ වෙතත් මෙම ක්‍රියාවලිය හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මෙහෙයුම් කටයුතුවල අනිසි ප්‍රමාදයක් සිදුවන අතර මාර්ගස්ථ මුදල් සම්බන්ධව අවදානම් වැඩිවීමට ද හේතු වේ. එබැවින්, මෙම ක්‍රියාවලිය අත්හිටුවීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කර ඇත.

2. ඒ අනුව, 2014 අගෝස්තු මස 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ මුදල් නෝට්ටු පෙට්ටි තැන්පත් කිරීමේ දී පහත උපදෙස් පිළිපදින ලෙසට සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවලට මෙයින් දන්වා සිටිමු.

2.1 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් තැන්පතු භාර ගැනීම

2.1.1 බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් නිකුත් කරන ලද ඇප පත්‍රිකාව අදාළ දින දී අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ මුදල් තැන්පතුවලට සම්බන්ධ නිශ්චිත ලියවිල්ල ලෙස සලකනු ලබයි. එම නිසා, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තු පරිශ්‍රය තුළ දී පෙට්ටිවල ඇති මුදල් නෝට්ටු මිටි වෙනස් කිරීමට හෝ නැවත සකස් කිරීමට හෝ අවසර ලබා නොදෙනු ඇත.

2.1.2 මුදල් පෙට්ටියේ ඇති මුදල් නෝට්ටු මිටිවල විස්තර සහ මුළු වටිනාකම නිරවද්‍ය ලෙස සටහන් කරන ලද ලේබලයක් එම මුදල් පෙට්ටිය මතුපිට ඇලවීම සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කළ යුතුය. එම ලියවිල්ලේම (ලේබලයෙහි) පිටපතක් අදාළ පෙට්ටියේ ඇතුළත ඇති මුදල් නෝට්ටු මිටි මත ද තැබිය යුතුය. ලේබලයෙහි අනුපිටපතක් 1 වන ඇමුණුමෙහි ඇතුළත් වේ.

2.1.3 මුදල් තැන්පතුව භාර ගන්නා මොහොතේදීම ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් බැංකු නිලධාරීන්/නියෝජිතයන් ඉදිරිපිටදීම මුදල් පෙට්ටිය විවෘත කර ඇප පත්‍රිකාවේ සඳහන් පරිදි මුදල් නෝට්ටුවල මුළු වටිනාකම සහ අදාළ නෝට්ටු වර්ග එපරිද්දෙන්ම පෙට්ටිය මතුපිට ඇති ලේබලයේ සහ පෙට්ටිය ඇතුළත ඇති ලේබලයේ ද සඳහන් වන්නේ දැයි සත්‍යාපනය කිරීම සිදු කරයි.

2.1.4 කිසියම් අවස්ථාවක ඇප පත්‍රිකාව සමඟ ලේබල්වල (පෙට්ටිය ඇතුළත සහ පිටත) සඳහන් ප්‍රමාණයන්හි අඩුවක් ඇත්නම් ඇප පත්‍රිකාවේ සඳහන් වටිනාකම සහ නෝට්ටු වර්ග නිශ්චිත වටිනාකම් ලෙස සලකනු ලබයි. එම නිසා, බැංකු නිලධාරීන්ගේ/නියෝජිතයන්ගේ බලයලත් අත්සන් සහිත ඇප පත්‍රිකාව සමඟ සමාන වන පරිදි මුදල් පෙට්ටිය මත ඇලවීමට සහ පෙට්ටිය තුළට දැමීමට නව ලේබල් දෙකක් පිළියෙල කිරීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවට අවසර දෙනු ඇත.

2.1.5. බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ඇප පත්‍රිකාවට අනුකූල වන ලෙස තැන්පත් කළ වටිනාකම සහ මුදල් මිටි ගණන සඳහන් පත්‍රිකාවක් අදාළ බැංකුවට ලබා දෙනු ඇත.

2.2 මුදල් තැන්පතු සත්‍යාපනය

2.2.1. පෙට්ටි තුළ ඇති මුදල් සත්‍යාපනය කරන විටදී (එදිනම හෝ පසුව) අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ බැංකු නිලධාරීන්/නියෝජිතයන් විසින් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉදිරිපිට දී එම පෙට්ටි විවෘත කළ යුතුය.

2.2.2. "ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සිදුවන මුදල් තැන්පතුවල විෂමතා" යන මැයෙන් යුත් 2007 පෙබරවාරි 21 දින දී නිකුත් කරන ලද 2012-1 අංක දරණ චක්‍රලේඛයට අනුව, මුදල් පෙට්ටිවල ඇති මුදල් නෝට්ටුවල ඇතිවන හිඟයන්ට අදාළ දඩ අය කරනු ලබන අතර මුදල් නෝට්ටුවල ඇතිවන අතිරික්තයන් නැවත භාර දෙනු නොලබයි.

2.2.3. ඉහත සඳහන් 2.1 අනුව මුදල් පෙට්ටි භාර ගන්නා මොහොතේ දී සේවා නිසි මුදල් නෝට්ටු පිරිසැකසුම් කිරීම වෙනුවෙන් අදාළ සේවා ගාස්තු අය කරනු ඇත. කෙසේ වෙතත්, මුදල් මිටිවල වර්ගයේ වෙනසක් සිදුවුවහොත් ඊට අදාළ සේවා ගාස්තු තැන්පතු සත්‍යාපනය කරන අවස්ථාවේදීම අය කරනු ලබයි.

මේ සම්බන්ධව ඕනෑම පැහැදිලි කිරීමක් සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ පහත නිලධාරීන් සම්බන්ධ කර ගත හැක.

නියෝජ්‍ය අධිකාරී : 0112477028 හෝ 0112477362
ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී : 0112477372

මීට විශ්වාසී
අධිකාරී/ව්‍යවහාර මුදල්

ඇමුණුම 1

**ඇප තැන්පතු**

පෙට්ටි අංකයඃ දිනයඃ
බැංකුවඃ

| නෝට්ටු වර්ගය | සේවා නිසි (මිටි) | සේවා අනිසි (මිටි) | පළුදු වූ (මිටි) | නොතේරූ (මිටි) | එකතුව (වටිනාකම) |
|---|---|---|---|---|---|
| 5000/- | | | | | |
| 2000/- | | | | | |
| 1000/- | | | | | |
| 500/- | | | | | |
| 200/- | | | | | |
| 100/- | | | | | |
| 50/- | | | | | |
| 20/- | | | | | |
| 10/- | | | | | |
| එකතුව | | | | | |

.......................................
බලයලත් අත්සන 1

.......................................
බලයලත් අත්සන 2

චක්‍රලේඛ අංකඃ35/01/005/0010/18 2014 ජනවාරි 02

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත,

## මෝටර් වාහන ආනයනය සඳහා වන ණයවර ලිපි මත ආන්තික තැන්පතු අවශ්‍යතාව

ණයවර ලිපි මත ආන්තික තැන්පතු අවශ්‍යතා සම්බන්ධයෙන් දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2013 අගෝස්තු 30 වන දින නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 35/01/005/0010/15 සහ ඒ යටතේ 2013 සැප්තැම්බර් 24 වන දින සහ 2013 ඔක්තෝබර් 21 වන දින පිළිවෙළින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 35/01/005/0010/16 සහ 35/01/005/0010/17 හා බැඳේ.

2014 ජනවාරි 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි චක්‍රලේඛ අංක 35/01/005/0010/15 හා බැඳුණු "අ" ලේඛනයෙහි සඳහන් කොට ඇති අයිතමයන් ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කරන අවස්ථාවේ දී එම අයිතමයන්වල ආනයන වටිනාකමින් සියයට සියයක් ආවරණය වන මුදල් ආන්තික අවශ්‍යතාව ඉවත් කරන ලද බව සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන් කළේ, ආර්.ඒ.ඒ. ජයලත්
අධ්‍යක්ෂ/දේශීය කටයුතු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙනුවෙන්

චක්‍රලේඛ අංකඃ35/01/005/0006/33 2014 ජනවාරි 02

සියලුම වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් වෙත,

## ශ්‍රී ලංකා මහ බැංකුවේ විවට වෙළෙඳ කටයුතු සඳහා වන මෙහෙයුම් උපදෙස්

i. නිර්ලේඛන රාජ්‍ය සුරැකුම්පත් සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ විවට වෙළෙඳ කටයුතු සම්බන්ධයෙන් 2004 ජනවාරි 27 වන දින නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් සම්බන්ධයෙන් වූ දේශීය කටයුතු දෙපාර්තමේන්තුවෙහි අංක 35/01/005/0006/04 දරන චක්‍රලේඛනයෙහි 2004 මැයි 03 දිනැති සංශෝධිත චක්‍රලේඛ අංක 35/01/005/0006/08 හා බැඳේ.

ii. නිත්‍ය ප්‍රතිමිලදීගැනුම් පහසුකම් සහ නිත්‍ය ප්‍රතිවිකුණුම් පහසුකම් පිළිවෙළින් නිත්‍ය තැන්පතු පහසුකම් සහ නිත්‍ය ණය පහසුකම් ලෙස ඉහත චක්‍රලේඛනයෙහි "ඇ" කාණ්ඩයෙහි සඳහන් පරිදි ප්‍රතිනාමකරණය කළ බව මෙමගින් සියලුම සහභාගිත්ව ආයතන වෙත දැනුම් දෙනු ලැබේ. තවද, අදාළ ප්‍රතිපත්ති පොලී අනුපාතිකයන් ද නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (පෙර පැවති ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (පෙර පැවති ප්‍රතිවිකුණුම් අනුපාතිකය) ලෙස ප්‍රතිනාමකරණය කරන ලදී. නිත්‍ය තැන්පතු පහසුකම සුරැකුම් රහිත පහසුකමක් වේ. නිත්‍ය ණය පහසුකම සැලකූ විට, නිත්‍ය ප්‍රතිවිකුණුම් පහසුකම හා සම්බන්ධ ක්‍රියාපටිපාටීන්හි කිසිදු වෙනසක් සිදු නොවේ.

iii. ඒ අනුව, 2014 පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, ඉහත සඳහන් සංශෝධිත චක්‍රලේඛනයෙහි "ඇ (අ)" කාණ්ඩය (නිත්‍ය ප්‍රතිමිලදීගැනුම් පහසුකම) මෙමගින් අහෝසි කර පහත සඳහන් ලෙස ප්‍රතිස්ථාපනය කරන ලදී.

"(ඇ) නිත්‍ය තැන්පතු පහසුකම

(අ) නිත්‍ය තැන්පතු පහසුකම

1. නිත්‍ය තැන්පතු පහසුකම එක් දින පදනමක් මත සපයයි.
2. නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගැනීමට බලාපොරොත්තු වන සහභාගිත්ව ආයතන දේශීය කටයුතු දෙපාර්තමේන්තුවේ විවෘත වෙළෙඳ මෙහෙයුම් කටයුතු අංශය වෙත දුරකථන හෝ ෆැක්ස් මාර්ගයෙන් මෙම පහසුකම යටතේ තැන්පත් කිරීමට අපේක්ෂා කරනු ලබන මුදල් ප්‍රමාණය දැනුම් දිය යුතු අතර, එදිනම 1500 වන පැයට ප්‍රථම එම ගනුදෙනුව මංගත විද්‍යුත් ලංසු ක්‍රමය තුළින් ඉදිරිපත් කිරීමෙන් තහවුරු කළ යුතුය.
3. ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතන විසින් නිත්‍ය තැන්පතු පහසුකම යටතේ තැන්පතු කිරීමට බලාපොරොත්තු වන අරමුදල් එම ආයතනවල පියවීම් ගිණුම්වලට (තත්කාලීන දළ පියවුම් පද්ධති ගිණුම) එදින 1600 වන පැයට ප්‍රථම සෘජුවම හර කරනු ලැබේ. සහභාගිත්ව ආයතන විසින් මේ සම්බන්ධයෙන් වන ගනුදෙනු සඳහා පියවීම් උපදෙස් කිසිවක් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.
4. අවශ්‍ය මුදල් ප්‍රමාණය සම්පූර්ණයෙන් පියවීම සඳහා ප්‍රමාණවත් අරමුදලක් තම පියවීම් ගිණුමෙහි තබා ගැනීමට සහභාගිත්ව ආයතන වගබලා ගත යුතුය. සහභාගිත්ව ආයතනයක් ගනුදෙනුව සම්පූර්ණයෙන් පියවීමට අසමත් වුවහොත් අදාළ ගනුදෙනුවෙහි පොලිය හා සමාන මුදලක් අලාභ වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවිය යුතු වේ. ඊළඟ රාජකාරි දිනයේ දී සහභාගිත්ව ආයතන විසින් එම අලාභය ශ්‍රී ලංකා මහ බැංකුවේ පියවීම් ගිණුම්වලට හර කරනු ලැබේ.
5. සහභාගිත්ව ආයතන විසින් අදාළ ගනුදෙනුව තහවුරු කිරීමෙන් පසු එදිනම 1600 වන පැයට ප්‍රථම එම සහභාගිත්ව ආයතන වෙත විද්‍යුත් ලංසු ක්‍රමය මගින් විද්‍යුත් තහවුරුවක් නිකුත් කරනු ලැබේ. නිසි ලෙස තහවුරු කර ගැනීමෙන් අනතුරුව තම වාර්තා වෙනුවෙන් මුද්‍රිත පිටපතක් තබා ගන්නා ලෙස සහභාගිත්ව ආයතනවලට මෙයින් උපදෙස් දෙනු ලැබේ. සහභාගිත්ව ආයතනයකට කිසියම් කාර්මික දෝෂයක් හේතුවෙන් විද්‍යුත් ලංසු ක්‍රමය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමෙන් එම තහවුරුව දර්ශනය කිරීමට හෝ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමට හෝ නොහැකි වුවහොත්, සහභාගිත්ව ආයතනයේ ඉල්ලීම මත, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් තහවුරුවෙහි පිටපතක් ෆැක්ස් මාර්ගයෙන්, අදාළ සහභාගත්ව ආයතන වෙත නිකුත් කරනු ලැබේ.
6. කල් පිරෙන දින, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් 0830 පැයට හෝ ඊට ප්‍රථම, මූලික තැන්පතු අගය සහ අදාළ පොලිය සහභාගිත්ව ආයතනයෙහි පියවීම් ගිණුමට බැර කරනු ලැබේ. අදාළ තැන්පතුවෙහි කාලසීමාව තුළ, තැන්පතුවෙහි පොලී වටිනාකම ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතික මත ගණනය වේ."

iv. ඉහත සඳහන් සංශෝධිත චක්‍රලේඛයෙහි ඇ (ආ) කාණ්ඩය (නිත්‍ය ප්‍රතිවිකුණුම් පහසුකම) සඳහන් "ප්‍රතිවිකුණුම් පහසුකම"යන පදය, "නිත්‍ය ණය පහසුකම"ලෙස ආදේශ කොට සංශෝධනය කරනු ලැබේ.

අත්සන් කළේ, ආර්.ඒ.ඒ. ජයලත්
අධ්‍යක්ෂ/දේශීය කටයුතු දෙපාර්තමේන්තුව

**චක්‍රලේඛ අංකඃ35/01/005/0006/34** 2014 සැප්තැම්බර් 23

සියලුම වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් වෙත,

## ශ්‍රී ලංකා මහ බැංකුවේ විවෘත වෙළෙඳ කටයුතු සඳහා වන මෙහෙයුම් උපදෙස්

වෙළෙඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම සඳහා යොදා ගනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් (SDF) කවුළුව මෑතකාලීනව ඇතැම් වාණිජ බැංකු විසින් නිරන්තරයෙන්ම භාවිතා කිරීම පිළිබඳව මුදල් මණ්ඩලය විසින් නිරීක්ෂණය කරන ලදී. මෙවැනි ප්‍රවණතාවක් අඛණ්ඩව පැවතීම වර්ධන අපේක්ෂාවන්ට මෙන්ම මූල්‍ය පද්ධති ස්ථායීතාවට හිතකර නොවන බව මුදල් මණ්ඩලයේ මතය විය. මේ අනුව, 2014 සැප්තැම්බර් 22 වැනි දින පැවති මුදල් මණ්ඩලය රැස්වීමේ දී තීරණය වූයේ:

(අ) කිසියම් සහභාගිත්ව ආයතනයකට, ශ්‍රී ලංකා මහ බැංකුවේ දැනට පවතින නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය යටතේ, එම පහසුකම භාවිතා කිරීම, ලිත් මාසයකට උපරිම වශයෙන් අවස්ථා තුනකට (3) සීමා කෙරේ. එසේම ලිත් මාසය සඳහා මෙම අවස්ථා තුන (2014 සැප්තැම්බර් මාසයේ ඉතිරි කාලසීමාවේ දී අවස්ථා දෙකක් (2) පමණක්) ඉක්මවා යන සහභාගිත්ව ආයතනවලට එම තැන්පතු සඳහා වන අනුපාතිකය වසරකට සියයට 5 ක් වනු ඇත.

(ආ) මෙම සංශෝධනයන් 2014 සැප්තැම්බර් 23 වැනි දින සිට බලපැවැත්වෙන අතර එය නැවත දැනුම් දෙනතුරු ක්‍රියාත්මක වනු ඇත.

ඉහත සංශෝධනයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්ලේඛන රාජ්‍ය සුරැකුම්පත් සඳහා වූ විවෘත වෙළෙඳ කටයුතුවලට අදාළ (2014 ජනවාරි 02 දිනැති 35/01/005/0006/33 දරණ චක්‍රලේඛනය මගින් සංශෝධිත 2004 ජනවාරි 27 දිනැති 35/01/005/0006/04 දරණ චක්‍රලේඛනය) මෙහෙයුම් උපදෙස්වලට අනුගත වන බව සහභාගිත්ව ආයතනවලට මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන් කළේ, ආර්.ඒ.ඒ. ජයලත්
අධ්‍යක්ෂ/දේශීය කටයුතු දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය**

**අති විශෙෂ**

අංක 1854/3 - 2014 මාර්තු මස 17 වැනි සඳුදා - 2014.03.17

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

**I වැනි කොටස : (I) වැනි ජෙදය - සාමාන්‍ය**

**රජයේ නිවේදන**

**(423 වන අධිකාරිය වූ) විනිමය පාලන පනත**

**17 වන වගන්තිය යටතේ නියමය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව සමග කියවිය යුතු, (423 වන අධිකාරිය වූ) විනිමය පාලන පනතේ 17 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති, මහින්ද රාජපක්ෂ වන මම, බලයලත් වෙළෙඳුන් ලෙස පත් කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවලට 2010, 2011 සහ 2012 යන වර්ෂවලදී ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, මා විසින් කලින් කල නිකුත් කරනු ලබන නියමයන්ට යටත්ව, ද්විතීයික වෙළෙඳපොලෙන් අත්කර ගැනීමට, දැරීමට හා පැවරීමට මෙම නියමය මගින් අවසර ලබා දෙමි.

මහින්ද රාජපක්ෂ,
**ජනාධිපති.**

2014 මාර්තු මස 17 වැනි දින,
කොළඹ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

**සම්බන්ධ අංකය : 06/04/01/2014** 2014 මැයි 28

බලයලත් වෙළෙඳුන් වෙත විධානයන්,

හිතවත් මහත්වරුනි,

## විදේශ සංචාරක කාඩ්පත් (FTCs)

නිසි පරීක්ෂාවක් සහ නිගමනයක් කිරීමෙන් පසුව, ශ්‍රී ලංකාවෙන් බැහැරව යන අවස්ථාවේදී විදේශ ගමන් දීමනාව ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන පුද්ගලයන් හට විදේශ ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ දී විදේශ සංචාරක කාඩ්පත් පහත සඳහන් කොන්දේසිවලට හා නියමයන්ට යටත්ව නිකුත් කිරීමට බලයලත් වෙළෙඳුන් හට මෙයින් අවසර ලබා දෙයි.

1. එතෙර ගමන් කරන පුද්ගලයන් හට නිකුත් කරනු ලබන විදේශ ගමන් දීමනාව,
   i. ශ්‍රී ලංකාවේ නේවාසිකයන් හට සංචාරක අරමුණු සඳහා විදේශ විනිමය නිකුත් කිරීම සම්බන්ධයෙන් විනිමය පාලන පනත යටතේ නිකුත් කර ඇති මෙහෙයුම් උපදෙස් හා විධානයන්ට සහ ඒවායේ අන්තර්ගත සීමාවන්ට යටත් විය යුතුය.
   ii. විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු, සංචාරක චෙක්පත් සහ/හෝ විදේශ සංචාරක කාඩ්පත් ස්වරූපයෙන් නිකුත් කළ හැකිය.
2. කාඩ්පත දරන්නා (මින්මතු 'දරන්නා' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ ආගමන හා විගමන පාලක ජනරාල්වරයා විසින් නිකුත් කර ඇති විදේශ ගමන් බලපත්‍රයක් දරනු ලබන ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නම්, ඉහත 1 ඡේදය ප්‍රකාරව නිකුත් කළ ගමන් දීමනාව සම්බන්ධයෙන් දරන්නාගේ විදේශ ගමන් බලපත්‍රයේ නිසි සහතික කිරීමක් සිදු කළ යුතුය.
3. දරන්නා එතෙර සිටී නම්, විදේශ සංචාරක කාඩ්පතකට නැවත මුදල් තැන්පත් නොකළ යුතුය.
4. විදේශ සංචාරක කාඩ්පතක් නිකුත් කරන අවස්ථාවේදී ඇමුණුම I හි ඇති ආදර්ශ ප්‍රකාශය පරිදි අයදුම්කරුගෙන් ප්‍රකාශයක් ලබාගත යුතුය.
5. සංචාරක අරමුණු සඳහා විදේශ මුදල් නිකුත් කිරීමට අවසර ලබාදී ඇති ඕනෑම ගිණුමක් බැර කිරීමෙන් විදේශ සංචාරක කාඩ්පතක් නිකුත් කළ හැකිය.
6. දරන්නා විසින් ඉල්ලීමක් කිරීම හෝ දරන්නා නැවත ශ්‍රී ලංකාවට පැමිණි දින 90 ක් ඉක්මයාම යන දෙකෙන් මුලින් පැමිණෙන දිනය කවරක් වුවද ඒ දිනට විදේශ සංචාරක කාඩ්පතෙහි ඉතිරිව ඇති භාවිතා නොකළ වටිනාකම:
   i. විදේශ සංචාරක කාඩ්පත නිකුත් කර ඇත්තේ දරන්නා විසින් පවත්වාගෙන යනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හර කිරීමෙන් නම් එසේ හර කළ ප්‍රමාණය දක්වා එවැනි ගිණුමකට බැර කළ හැකිය.
   ii. දරන්නා විසින් ශ්‍රී ලංකා රුපියල්වලින් මුදල් ආපසු ගැනීම හෝ දරන්නා විසින් ශ්‍රී ලංකා රුපියල්වලින් පවත්වාගෙන යනු ලබන ගිණුමකට බැර කළ හැකිය.
7. මෙම විධානයන් ප්‍රකාරව සිදු කරනු ලැබූ විදේශ විනිමය විකුණුම් හා මිලදී ගැනුම් පිළිබඳ විස්තර පිළිවෙළින් පෝරම 1 හා පෝරම 2 මගින්, විනිමය පාලකවරයා විසින් නිකුත් කර ඇති මෙහෙයුම් උපදෙස්වල සඳහන් කර ඇති පරිදි බලයලත් වෙළෙඳුන් විසින් විනිමය පාලකවරයාට වාර්තා කළ යුතුය.
8. බලයලත් වෙළෙඳුන් විසින් විදේශ සංචාරක කාඩ්පත් පිළිබඳ විස්තර කාර්තුමය පදනමින්, එළඹෙන කාර්තුවේ 15 වන දිනට පෙර ඇමුණුම II පරිදි විනිමය පාලකවරයා හට ඉදිරිපත් කළ යුතුය.

මෙයට - විශ්වාසී
පී.එච්.ඕ.චන්ද්‍රවංශ
**විනිමය පාලක**

ඇමුණුම I

**ශ්‍රී ලංකා මහ බැංකුව**

**විදේශ සංචාරක කාඩ්පතක් (FTC) සඳහා අයදුම්කරු විසින් කරනු ලබන ප්‍රකාශය**

< බලයලත් වෙළෙන්දාගේ නම> වෙත

විදේශ ගමන් බලපත්‍ර අංක ........................................... දරන ..................................................... (විදේශ සංචාරක කාඩ්පත් අයදුම්කරුගේ නම) වන මම නැවත ලංකාවට පැමිණ දින 90 ක් සම්පූර්ණ වනවිට විදේශ සංචාරක කාඩ්පතේ ඉතිරිව ඇති භාවිතා නොකළ විදේශ මුදල් ...................................... (ගිණුම් අංකය) දරන මාගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට බැර කිරීම සඳහා / ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කර ....................................... (ගිණුම් අංකය) දරන මාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුමට බැර කිරීම සඳහා ................................................... (බලයලත් වෙළෙන්දාගේ නම) මෙමගින් අවසර ලබා දෙමි. (අනවශ්‍ය වචන කපා හරින්න)

.................................................................................. (විදේශ සංචාරක කාඩ්පතේ අයදුම්කරු) වන මම ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශ කර සිටිමි.

............................................ ................................................

දිනය/මාසය/වර්ෂය

විදේශ සංචාරක කාඩ්පත්
අයදුම්කරුගේ අත්සන

ඇමුණුම II

**විදේශ සංචාරක කාඩ්පත් (FTCs)**

බලයලත් වෙළෙන්දාගේ නම : ....................................................................................

............................................... දිනට කාර්තුමය ප්‍රකාශනය

| නිකුත් කළ විදේශ සංචාරක කාඩ්පත් ප්‍රමාණය | නිකුත් කළ විදේශ විනිමය ප්‍රමාණය (ඇ.එ.ජ. ඩොලර්වලින්) | ඇමුණුම I පරිදි නැවත පරිවර්තනය කළ ප්‍රමාණය |
|---|---|---|
| | | |

ඉහත තොරතුරු සත්‍ය නිවැරදි බවට මම මෙමගින් සහතික වෙමි.

................................................ ..............................................................

දිනය

බලයලත් නිලධාරියාගේ නම,
තනතුර හා
නිල මුද්‍රාව මත අත්සන

**සම්බන්ධ අංකය : 06/04/02/2014** 2014 මැයි 28

බලයලත් වෙළෙඳුන් වෙත විධානයන්,

හිතවත් මහත්වරුනි,

## විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම (SFIDA)

විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2008 ජූනි 02 වන දිනැති යොමු අංක: 06/04/05/2008 දරන විධානය, මෙමගින් පහත පරිදි සංශෝධනය කෙරේ.

1. කොන්දේසි v) ඉවත් කිරීම මගින්
2. කොන්දේසි vi), vii) සහ viii) පිළිවෙළින් කොන්දේසි v), vi) සහ vii) ලෙස නැවත අංකනය කිරීම මගින්

මෙයට - විශ්වාසී
පී.එච්.ඕ.චන්ද්‍රවංශ
**විනිමය පාලක**

**සම්බන්ධ අංකය : 06/04/03/2014** 2014 මැයි 28

බලයලත් වෙළෙඳුන් වෙත විධානයන්,

හිතවත් මහත්වරුනි,

## ශිෂ්‍ය වීසා බලපත්‍රය ලබා ගැනීමට පෙර මුදල් ප්‍රේෂණය කිරීම

1. සමහර විදේශීය රාජ්‍යයන්, ශ්‍රී ලංකාවේ වාසය කරන සිසුන් ශිෂ්‍ය වීසා බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම් කිරීමේදී ඔවුන්ගේ ජීවන වියදම් ආවරණය කර ගැනීම සඳහා කලින් මුදල් මාරු කිරීමේ අවශ්‍යතාවයක් පනවා ඇති බව පෙනී ගොස් ඇත. මේ වෙනුවෙන් පහසුකම් සැලසීම සඳහා එවැනි මාරු කිරීම් සම්බන්ධයෙන් පහත ලිඛිත සාක්ෂි ලබා ගැනීමට යටත්ව ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කිරීමට බලයලත් වෙළෙඳුන්ට මෙයින් අවසර ප්‍රදානය කරනු ලැබේ:

   I. ශිෂ්‍යභාවය ප්‍රදානය කිරීම/ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් විදේශීය විශ්වවිද්‍යාලයෙන්/අධ්‍යාපන ආයතනයෙන් නිකුත් කරන ලද ලිපිය.

II. ශිෂ්‍යයාගේ වීසා බලපත්‍රය මූලිකව අනුමත වී ඇති බව හා ජීවන වියදම් වශයෙන් හුවමාරු කළ යුතු මුදල් ප්‍රමාණය දක්වමින් අදාළ රටේ ආගමන අධිකාරිය විසින් නිකුත් කරන ලද ලිපියක්.

III. ශිෂ්‍යයාගේ විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්.

IV. 2014 මැයි 28 දිනැති අංක 1864/38 දරන රජයේ (අතිවිශේෂ) ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමෙන් ප්‍රදානය කරන ලද අවසරය යටතේ ශිෂ්‍යයාගේ නමින් විවෘත කරන ලද ගිණුමේ තොරතුරු සඳහන් කරමින් විදේශ බැංකුවකින් නිකුත් කරන ලද ලිපියක්.

2. මුදල් ප්‍රේෂණය කිරීමෙන් අනතුරුව, බලයලත් වෙළෙන්දා විසින් ප්‍රේෂණය කරන ලද මුදල හා අරමුණ ඇතුළු තොරතුරු සඳහන් කරමින් ශිෂ්‍යයාගේ විදේශ ගමන් බලපත්‍රය පිටසන් කළ යුතුය.

3. ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය කිරීමෙන් හෝ අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් (NRFC) හර කිරීමෙන් මුදල් මාරු කළ හැක.

4. තවද, උක්ත මාරුකිරීම සඳහා ශිෂ්‍යයා සහ/හෝ දෙමව්පියන්/භාරකරුවන්/කලත්‍රයා/අනුග්‍රාහකයා විසින් පවත්වාගෙන යන පහත විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ද හර කළ හැක.

I. නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RFC);

II. විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් (FEEA); සහ

III. අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවකයන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (FCAISPE).

5. මෙම විධානයන් යටතේ මුදල් මාරු කිරීම් සිදු කිරීම සඳහා නේවාසික විජාතිකයන්ගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RNNFC) ද හර කළ හැක. විදේශීය ශිෂ්‍යයෙකු වෙනුවෙන් එවන් හුවමාරුවක් සිදු කිරීමේ දී, උක්ත 2 වන ඡේදයේ සඳහන් පරිදි ප්‍රේෂණයේ තොරතුරු සහිතව ශිෂ්‍යයාගේ විදේශ ගමන් බලපත්‍රය පිටසන් කිරීම අවශ්‍ය නොවේ.

මෙයට - විශ්වාසී
පී.එච්.ඕ.චන්ද්‍රවංශ
**විනිමය පාලක**

**සම්බන්ධ අංකය : 06/04/04/2014** 2014 මැයි 28

බලයලත් වෙළෙඳුන් වෙත විධානයන්,

හිතවත් මහත්වරුනි,

## නේවාසික විදේශ ව්‍යවහාර මුදල් (RFC) ගිණුම්

1991.08.01 දිනැති යොමු අංක:EC/52/91(D) දරන, මෙහෙයුම් උපදෙස්වලට (සංශෝධනය වූ පරිදි), වැඩිමනත්ව, 2014.05.28 දිනැති යොමු අංක 06/04/03/2014 දරන විධානයන් ප්‍රකාරව ශිෂ්‍ය වීසා බලපත්‍ර සඳහා අයදුම් කිරීම හා සම්බන්ධව ජීවන වියදම් සඳහා නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් අරමුදල් මාරු කිරීමට මෙයින් අවසර ප්‍රදානය කරනු ලැබේ.

මෙයට - විශ්වාසී
පී.එච්.ඕ.චන්ද්‍රවංශ
**විනිමය පාලක**

**සම්බන්ධ අංකය : 06/04/05/2014** 2014 මැයි 28

බලයලත් වෙළෙඳුන් වෙත විධානයන්,

හිතවත් මහත්වරුනි,

## නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් (RNNFC) ගිණුම්

1980.05.14 දිනැති යොමු අංක: EC/19/80(D) දරන මෙහෙයුම් උපදෙස්වලට වැඩිමනත්ව (සංශෝධනය වූ පරිදි), එහි (v) වෙනි පරිච්ඡේදය යටතේ ලැයිස්තු ගත කර ඇති හර කිරීම්වල අයිතම (C) ලෙස පහත සඳහන් වන කරුණ ඇතුළත් කළ යුතුය.

"(C) 2014.05.28 දිනැති යොමු අංක 06/04/03/2014 දරන විධානයන් ප්‍රකාරව ශිෂ්‍ය වීසා සඳහා අයදුම් කිරීම හා සම්බන්ධව ජීවන වියදම් සඳහා අරමුදල් මාරු කිරීම"

මෙයට - විශ්වාසී
පී.එච්.ඕ.චන්ද්‍රවංශ
**විනිමය පාලක**

**සම්බන්ධ අංකය : 06/04/06/2014** 2014 මැයි 28

බලයලත් වෙළෙඳුන් වෙත විධානයන්,

හිතවත් මහත්වරුනි,

## අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවකයින් සඳහා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (FCAISPE)

1. 2010 මැයි 07 දිනැති යොමු අංක 06/04/05/2010 දරන විධානයන්ට වැඩිමනත්ව, එහි 4 වන පරිච්ඡේදයෙහි අයිතම IV ලෙස පහත සඳහන් බැර කිරීම ඇතුළත් කෙරේ.

   "IV. 2014 මැයි 28 දිනැති අංක 1864/38 දරන රජයේ ගැසට් පත්‍රයේ (අති විශේෂ) ප්‍රසිද්ධ කරන ලද නිවේදනය මගින් සහ 2014 මැයි 28 දිනැති යොමු අංක 06/04/03/2014 දරන විධානය මගින් අවසර දුන් පරිදි ශ්‍රී ලංකාවෙන් පිටත විවෘත කර පවත්වාගෙන යන ගිණුමකින්, FCAISPE ගිණුමෙන් හර කිරීම් කර ඇති උපරිම මුදල් ප්‍රමාණයට යටත්ව අරමුදල් මව්බිමායනය".

2. 5 වන පරිච්ඡේදයෙහි අයිතම IV ලෙස පහත හර කිරීම ඇතුළත් කෙරේ.

   "IV. 2014 මැයි 28 දිනැති අංක 1864/38 දරන රජයේ ගැසට් පත්‍රයේ (අති විශේෂ) ප්‍රසිද්ධ කරන ලද නිවේදනය මගින් සහ 2014 මැයි 28 දිනැති යොමු අංක 06/04/03/2014 දරන විධානය මගින් අවසර දුන් පරිදි, ශිෂ්‍ය වීසා බලපත්‍ර සඳහා අයදුම් කිරීම හා සම්බන්ධ ජීවන වියදම් සඳහා අරමුදල් මාරු කිරීම."

මෙයට - විශ්වාසී
පී.එච්.ඕ.චන්ද්‍රවංශ
**විනිමය පාලක**

**සම්බන්ධ අංකය : 06/04/07/2014** 2014 මැයි 28

බලයලත් වෙළෙඳුන් වෙත විධානයන්,

හිතවත් මහත්වරුනි,

## විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම (FEEA)

විදේශ විනිමය උපයනු ලබන ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයින්ගේ විදේශ මුදල් ගනුදෙනු සඳහා තවදුරටත් පහසුකම් සැලසීමේ අරමුණින් විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම්වලට අදාළ විධිවිධානයන් සමාලෝචනය කර නැවත නිකුත් කිරීමට තීරණය කර ඇත.

2. **සුදුසුකම් ලත් පුද්ගලයන්**
   i. විදේශ විනිමය උපයනු ලබන පහත සඳහන් ශ්‍රී ලංකාවේ නේවාසිකයන්:
      (අ) තනි පුද්ගලයකු;
      (ආ) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ තනි පුද්ගල ව්‍යාපාරයක් හා හවුල් ව්‍යාපාරයක්;
      (ඇ) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක්;
      (ඈ) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ විදේශ සමාගමක් ලෙස ලියාපදිංචි කළ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමක්.
   ii. 2013.01.01 දිනැති අංක 1791/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබුවා වූ නිවේදනය ප්‍රකාරව ක්‍රියාත්මක කරනු ලබන විදේශීය වාණිජ ණය ගැනීමේ යෝජනා ක්‍රමය (ECBS) යටතේ ණය ලබාගෙන ඇති සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවකු.
   iii. විනිමය පාලකගෙන් ලද අවසරයක් මත ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුගෙන් විදේශ ව්‍යවහාර මුදලින් ණය ලබා ගැනීමට සුදුසුකම් ලබන වෙනත් ඕනෑම පුද්ගලයෙක්.

3. **ගිණුම් වර්ග**

   විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුමක්, ජංගම, ඉතිරිකිරීම් හෝ කාලීන තැන්පතු ආකාරයෙන් ඕනෑම විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් විවෘත කළ හැකිය. කෙසේ වුවත්, ජංගම ගිණුමකට චෙක් පොත් නිකුත් කිරීම සිදු කළ නොහැක.

4. **අවසරලත් බැර කිරීම්**
   i. භාණ්ඩ හා සේවා අපනයන, අන්තරාල වෙළඳාම, ගිණුම් හිමියා විසින් භාර ගන්නා ලද විදේශ ව්‍යාපෘති සහ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකු හට දේශීය වශයෙන් භාණ්ඩ සැපයීම සම්බන්ධයෙන් බැංකු පද්ධතිය හරහා එතෙරින් ලැබෙන ආමුඛ ප්‍රේෂණ සහ ශ්‍රී ලංකාවෙන් පිටත බැංකු විසින් නිකුත් කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් වන අණකර.
   ii. අවශ්‍ය පරිදි ශ්‍රී ලංකා රේගුවට ප්‍රකාශ කොට ගිණුම් හිමියා විසින් මෙරටට රැගෙන ආ විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු.
   iii. සංචාරක චෙක්පත්, බැංකු අණකර හෝ විනිමය පාලක විසින් නිකුත් කරන ලද අවසරපත්‍රය ප්‍රකාරව භාරගනු ලැබූ විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු.
   iv. ගිණුම් හිමියා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකු හට විකුණන ලද භාණ්ඩ හෝ සපයන ලද සේවා වෙනුවෙන්, ශ්‍රී ලංකාවෙන් පිටත දී නිකුත් කරන ලද විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පතක් භාවිතයෙන් ඉලෙක්ට්‍රොනික් දත්ත ග්‍රාහක ටර්මිනලයක් [Electronic Data Capture (EDC) Terminal] හෝ අන්තර්ජාල ගෙවීම් මාධ්‍ය [Internet Payment Gateway

(IPG)] හරහා ලද ගෙවීම්. (කෙසේ වෙතත්, බලයලත් වෙළෙන්ඳා විසින් එවැනි ගෙවීම් විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුමට බැර කළ යුත්තේ ශ්‍රී ලංකාවෙන් පිටතදී නිකුත් කරන ලද විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පතක් භාවිතයෙන් කරන ලද ගෙවීම් එහි අන්තර්ගත බවට EDC/IPG ප්‍රතිපාදකයාගෙන් ලිඛිත තහවුරුවක් ලබා ගැනීමෙන් අනතුරුවය.)

v. භාණ්ඩ හා සේවා සැපයීම සම්බන්ධයෙන් අනෙකුත් විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම්වලින් හා අක්වෙරළ බැංකු ඒකකවල (Off shore Banking Unit) පවත්වාගෙන යන ගිණුම්වලින් කෙරෙන මාරු කිරීම්.

vi. බලයලත් වෙළෙඳුන්ගෙන් විදේශ ව්‍යවහාර මුදලින් ලැබුණු ණය මුදල්.

vii. විනිමය පාලකගේ පූර්ව අනුමැතිය සහිතව විදේශීය ණය ලබාදෙන්නෙකුගෙන් විදේශ ව්‍යවහාර මුදලින් ලබාගත් ණය මුදල්.

viii. විදේශ ආයෝජනවල ප්‍රතිලාභ අන්තර්ගත වන, ගිණුම් හිමියාගේම ප්‍රතිමුඛ ආයෝජන ගිණුම්වලින් සිදු කරන මාරු කිරීම්.

ix. ඛනිජ තෙල් කර්මාන්ත විෂය භාර ඇමතිවරයා විසින් ලබාදෙන ලද බලපත්‍රයක් මත ක්‍රියාත්මක වන ඉන්ධන සැපයුම්කරුවෙකු විසින් ඉන්ධන සැපයීමට අදාළව විදේශ නැව් සේවයක/ගුවන් සේවයක නියෝජිතයෙකු සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් (FCAASA) කරනු ලබන මාරු කිරීම්.

x. 2013 ඔක්තෝබර් 21 දිනැති සම්බන්ධ අංක 06/04/25/01/2013 දරණ විධානයන්ගේ පළමු උපලේඛනයට අනුව වරාය පර්යන්ත මෙහෙයුම්කරුවකුගේ වරාය පර්යන්ත ගාස්තුවලට අදාළව FCAASA ගිණුමකින් කරනු ලබන මාරු කිරීම්.

xi. විදේශ ප්‍රධානියෙකුට සෘජුවම භාණ්ඩ හා සේවා සැපයීම වෙනුවෙන් විදේශ ප්‍රධානියාගෙන් ලද ආමුඛ ප්‍රේෂණ භාවිතා කරමින් FCAASA ගිණුමකින් කරනු ලබන මාරු කිරීම්.

xii. ගිණුම් හිමියාගේ ආමුඛ ප්‍රේෂණ බෙදාහැරීමේ ගිණුමකින් (IRDA) සිදු කරනු ලබන මාරු කිරීම්.

xiii. සුදුසුකම් ලත් ගණුදෙනුකරුවන්ට සහ සම රක්ෂකයින්ට නිකුත් කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් නියම කර ඇති රක්ෂණ ඔප්පු සඳහා ලැබෙන වාරික සහ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම්වලට ප්‍රතිරක්ෂකයින්ගෙන් සහ ජාතික රක්ෂණ භාර අරමුදලෙන් ලැබෙන හිමිකම්.

xiv. මෙහි සඳහන් 5 ඡේදයේ (viii) අයිතමය ප්‍රකාරව සංචාරක අරමුණු සඳහා සහ 5 ඡේදයේ (xiii) අයිතමය යටතේ සඳහන් කර ඇති අරමුණු වෙනුවෙන් ගිණුම් හිමියා විසින් විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම හර කොට ලබා ගන්නා ලද විදේශ මුදල්වලින් භාවිතා නොකළ විදේශ ව්‍යවහාර මුදල්.

xv. 2014 මැයි 28 දිනැති අංක 1864/38 දරන රජයේ (අති විශෙෂ) ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම සහ 2014 මැයි 28 දිනැති සම්බන්ධ අංක 06/04/03/2014 දරන විධානයන් ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වා ගෙන යනු ලබන බැංකු ගිණුමකින් මුදල් මාරු කිරීම. (එනමුදු 5 ඡේදයේ (xiv) අයිතමය යටතේ මූලික ප්‍රතිමුඛ ප්‍රේෂණය සිදු කර ඇත්නම්, එසේ හර කරන ලද උපරිම මුදල දක්වා පමණක් ගිණුම බැර කළ යුතුය.)

5. **අවසර ලත් හර කිරීම්**

i. ගිණුම් හිමියාගේ ජාත්‍යන්තර ජංගම ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ.

ii. 2013 අප්‍රේල් 29 දිනැති අංක 06/04/14/2013 දරන විධානය ප්‍රකාරව අන්තරාළ වෙළඳාම හා සම්බන්ධ ප්‍රතිමුඛ ප්‍රේෂණ.

iii. ගිණුම් හිමියා විසින් භාණ්ඩ මිල දී ගැනීම සහ සේවා ලබා ගැනීම සම්බන්ධයෙන් අනෙකුත් විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම්වලට සහ අක්වෙරළ බැංකු ඒකකවල පවත්වා ගෙන යන ගිණුම්වලට කෙරෙන මාරු කිරීම්.

iv. ගිණුම් හිමියා විසින් කරනු ලබන භාණ්ඩ හා සේවා අපනයනයන්ට අදාළ හිමිකම්, මුදල් ආපසු ගෙවීම් සහ කොමිස් සම්බන්ධයෙන් වන ප්‍රතිමුඛ ප්‍රේෂණ.

v. ගිණුම් හිමියෙකුගේ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමට කෙරෙන මාරු කිරීම්.

vi. විදේශ නැව් සේවයක/ගුවන් සේවයක නියෝජිතයෙකු සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක (FCAASA) බැරට ප්‍රවාහන ගාස්තු වශයෙන් කරනු ලබන ගෙවීම්.

vii. විදේශීය සංචාරක නියෝජිතයන්ගෙන් ලැබෙන මුදල්වලින් විදේශ සංචාරකයන්ට පිරිනමන සංචාරක පැකේජයන්ට අදාළව දේශීය සංචාරක නියෝජිතයන් විසින් පවත්වා ගෙන යනු ලබන විදේශ විනිමය උපයන්නනන්ගේ ගිණුම්වලින් සිදු කරන ප්‍රතිමුඛ ප්‍රේෂණ.

viii. විනිමය පාලකවරයා විසින් කලින් කලට පනවන විධානයන්ට යටත්ව සංචාරක අරමුණු සඳහා විදේශ ව්‍යවහාර මුදලින් සිදු කරන ආපසු ගැනීම්.

ix. ගිණුම් හිමියා විසින් භාරගන්නා ලද විදේශ ව්‍යාපෘති සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් වෙනුවෙන් කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ.

x. විනිමය පාලකවරයාගේ පූර්ව අනුමැතිය සහිතව විදේශීය ණය ලබාදෙන්නෙකුගෙන් විදේශ ව්‍යවහාර මුදලින් ලබාගත් ණය ආපසු ගෙවීම සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ.

xi. ගිණුම්හිමියා විසින් බලයලත් වෙළෙඳුන්ගෙන් විදේශ ව්‍යවහාර මුදලින් ලබාගත් ණය ආපසු ගෙවීම්.

xii. සුදුසුකම් ලත් ගනුදෙනු කරුවන්ට සහ සම රක්ෂකයින්ට විදේශ ව්‍යවහාර මුදලින් නියම කර ඇති රක්ෂණ ඔප්පු සඳහා ගෙවන හිමිකම්, දේශීය/විදේශීය ප්‍රති රක්ෂකයින්ට සහ ජාතික රක්ෂණ භාර අරමුදලට ගෙවන වාරික සහ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම් විසින් ගෙවනු ලබන තැරැව් ගාස්තු.

xiii. මැණික් හා ස්වර්ණාභරණ වෙළඳුන් විසින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියෙන් ලබාගත් තහවුරුවක් ඉදිරිපත් කිරීම මත විදේශයන්හි දී කපා ඔප දැමූ හෝ රළු මැණික් ගල් සහ වෙනත් අමුද්‍රව්‍ය මිලට ගැනුම් සඳහා එක්වරකට ඇ.එ.ජ. ඩොලර් 50,000/- කට නොවැඩි මුදලක් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටුවලින් ආපසු ගැනීම්.

xiv. ජීවන වියදම් සඳහා වන පූර්ව ප්‍රේෂණයක් වශයෙන් 2014 මැයි 28 දිනැති අංක 1864/38 දරණ රජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම සහ 2014 මැයි 28 දිනැති සම්බන්ධ අංක 06/04/03/2014 දරන විධානයන් ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වා ගෙන යනු ලබන ඕනෑම බැංකු ගිණුමකට මුදල් මාරු කිරීම.

xv. කිසිදු අවස්ථාවක දී නැවත විදේශ මුදල් බවට පරිවර්තනය නොකිරීමට සහ ගිණුමට බැර නොකිරීමට යටත්ව ශ්‍රී ලංකා රුපියල්වලින් සිදු කරනු ලබන ආපසු ගැනීම්.

6. කොන්දේසි:

i. විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුමක් විවෘත කර පවත්වාගෙන යෑම පිණිස අයදුම්කරුගේ යෝග්‍යතාවය නිර්ණය කිරීම සඳහා වන ලිඛිත සාක්ෂි අදාළ වන්නේ නම්, එවැනි අයදුම්කරුවකුගේ ව්‍යාපාර කටයුතු කරගෙන යෑම සඳහා අදාළ අධිකාරියේ/අධිකාරීන්ගේ අනුමැතිය විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම විවෘත කරන අවස්ථාවේ දී ලබාගත යුතුය.

ii. 2013 ජුනි 12 දිනැති සම්බන්ධ අංක 06/04/21/2013 දරන විධානය (සංශෝධිත) ප්‍රකාරව ප්‍රදානය කර ඇති අයිරා පහසුකමක් හැරුණු කොට විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුමක් කිසිදු අවස්ථාවක හර ශේෂයක් නොපෙන්විය යුතුය.

iii. එකම ගිණුම් හිමියාගේ විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් අතර මුදල් මාරු කිරීම සඳහා අවසර ඇත.

iv. රාජ්‍ය නොවන සංවිධාන සඳහා විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් විවෘත කිරීමට හා පවත්වාගෙන යෑමට අවසර නැත.

7. වාර්තා කිරීමේ අවශ්‍යතාවය

අමුණා ඇති ආකෘතියට අනුව බලයලත් වෙළඳුන් විසින් සකස් කළ මාසික වාර්තා එළඹෙන මාසයේ 15 දින හෝ එදිනට පෙර විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

8. 2012 ජුලි 11 දිනැති අංක 06/04/05/2012, 2012 දෙසැම්බර් 31 දිනැති අංක 06/04/13/2012, 2013 ජනවාරි 01 දිනැති අංක 06/04/03/2013, 2013 ජනවාරි 24 දිනැති අංක 06/04/10/2013 සහ 2013 පෙබරවාරි 21 දිනැති 06/04/13/2013 දරන විධාන මෙයින් අවලංගු කෙරේ.

මෙයට - විශ්වාසී
පී.එච්.ඕ. චන්ද්‍රවංශ
**විනිමය පාලක**

ඇමුණුම

විනිමය පාලක
විනිමය පාලන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01

## විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් පිළිබඳ මාසික වාර්තාව

බැංකුවේ නම : ...................................................................... වාර්තා කරන මාසය : ..................................................

| ගිණුම් කාණ්ඩය | මුදල් වර්ගය | මාසය ආරම්භයේ දී ශේෂය | බැර | | | හර | | මාසය අවසානයේ දී ශේෂය | මාසය අවසානයේ දී මුළු ගිණුම් ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ආමුඛ ප්‍රේෂණ | බැර කරන ලද මුළු පොලිය | වෙනත් බැර කිරීම් | ප්‍රතිමුඛ ප්‍රේෂණ | වෙනත් හර කිරීම් | | |
| අපනයනකරුවන් | | | | | | | | | |
| වක්‍ර අපනයනකරුවන් | | | | | | | | | |
| වෘත්තිමය සේවා සපයන්නන් | | | | | | | | | |
| සංචාරක නියෝජිතයන් | | | | | | | | | |
| අමුද්‍රව්‍ය යෙදවුම් සපයන්නන් | | | | | | | | | |
| මැණික් හා ස්වර්ණාභරණ වෙළඳුන් | | | | | | | | | |
| රක්ෂණකරුවන් | | | | | | | | | |
| විදේශ රැකියා නියෝජිතයන් | | | | | | | | | |
| 2013.01.01 දිනැති අංක 1791/16 දරණ ගැසට් පත්‍රයේ පොදු අවසරය යටතේ වන ගිණුම් හිමියන් | | | | | | | | | |
| විශේෂ/තාවකාලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන් | | | | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2013.01.01 දිනැති අංක 1791/15 දරණ ගැසට් පත්‍රය ප්‍රකාරව විදේශීය වාණිජ ණය ගැනීමේ යෝජනා ක්‍රමය යටතේ වන ණය ගැනුම්කරුවන් | | | | | | | | | |
| වෙනත් (කරුණාකර කාණ්ඩය සඳහන් කරන්න) | | | | | | | | | |

සටහන: කරුණාකර සියලුම ගිණුම්වලට අදාළ තොරතුරු අදාළ මුදල් වර්ග යටතේ දක්වන්න. (යූරෝ, ඇ.එ.ජ. ඩොලර්, ස්ටර්ලිං පවුම්, වෙනත් (කරුණාකර සඳහන් කරන්න.))

අදාළ ලිපි ලේඛන මා විසින් පරීක්ෂා කරන ලද අතර, ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව තහවුරු කරමි.

දිනය: ..........................................  ........................................................................

දිනය/මාසය/වර්ෂය  බලයලත් වෙළෙන්දාගේ අත්සන සහ මුද්‍රාව

**සම්බන්ධ අංකය : 06/04/09/2014** 2014 මැයි 28

බලයලත් වෙළෙඳුන් වෙත විධානයන්,

හිතවත් මහත්වරුනි,

## අනේවාසික සැපයුම්කරුවන් විසින් නේවාසික ආනයනකරුවන් සඳහා වූ ණය පහසුකම්

අන්තර්ජාතික වෙළඳ කටයුතු සඳහා තවදුරටත් පහසුකම් සැලසීමේ අරමුණින්, අනේවාසික භාණ්ඩ සැපයුම්කරුවන් (මින් මතු 'සැපයුම්කරු' ලෙස හඳුන්වනු ලබන) විසින් නේවාසික භාණ්ඩ ආනයනකරුවන් (මින් මතු 'ආනයනකරු' ලෙස හඳුන්වනු ලබන) වෙත පිරිනමනු ලබන ණය පහසුකම්වලට අදාළ පොලී ගෙවීම්, ප්‍රතිමුඛ ප්‍රේෂණය සඳහා බලයලත් වෙළඳුන් හට මින් අවසරය දෙනු ලැබේ.

1969 අංක 1 දරණ ආනයන සහ අපනයන (පාලන) පනතේ විධි විධානයන් හා ඒ යටතේ නිකුත් කරන ලද නියෝගයන්ට අනුකූලව ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද භාණ්ඩ සඳහා පමණක් පහත සඳහන් කොන්දේසිවලට යටත්ව මෙම අවසරය අදාළ වේ.

i. මෙය අදාළ වනුයේ ශ්‍රී ලංකාවට ආනයනය කළ භාණ්ඩ උදෙසා ආනයනකරු වෙත ණය පහසුකම් සපයා ඇති ගෙවීම් ක්‍රම සඳහා පමණි.

ii. පොලිය, පිරිනමනු ලබන ණය කාලසීමාව හෝ සැබෑ ගෙවීම් පියවීමේ දිනය යන දෙකෙන් පළමුව එළඹෙන දිනය ඉක්මවා නොගෙවිය යුතු අතර, එකී පියවීමේ දිනය හෝ ණය කාලසීමාව නීති හෝ රෙගුලාසි මගින් නියම කරන ලද කිසිදු සීමා කිරීමක් නොඉක්මවිය යුතුය.

iii. ශ්‍රී ලංකාවේ බැංකු පද්ධතිය හරහා නාවික ලේඛනවල මුල් පිටපත් යොමු කිරීම අවශ්‍ය නොවන ගෙවීම් ක්‍රම යටතේ ආනයන කරන අවස්ථාවකදී එම භාණ්ඩ පිළිබඳ විස්තර, බැංකුව විසින්; රේගු ප්‍රකාශනය, ඉන්වොයිස් පත්‍රය සහ ශ්‍රී ලංකා රේගුව විසින් එහි වෙබ් අඩවියට අත්පතනය (upload) කර ඇති තොරතුරු ද ඇතුළත් ශ්‍රී ලංකා රේගුව වෙත ඉදිරිපත් කර ඇති ලියකියවිලි සමඟ සත්‍යාපනය කළ යුතුය.

iv. සපයා ඇති ණය මුදල සඳහා, දැනට පවත්නා අන්තර්ජාතික පොලී අනුපාතිකය ඉක්මවන ඉහළ අනුපාතිකයකට සැපයුම්කරු වෙත ගෙවීමට කටයුතු නොකළ යුතුය.

1992 පෙබරවාරි 24 දිනැති සම්බන්ධ අංක EC/18/92(B) සහ සම්බන්ධ අංක 06/05/02/2003 දරණ මෙහෙයුම් උපදෙස් මින් අවලංගු වේ.

මෙයට - විශ්වාසී
පී.එච්.ඕ.චන්ද්‍රවංශ
**විනිමය පාලක**

**සම්බන්ධ අංකය : 06/04/10/2014** 2014 මැයි 28

බලයලත් වෙළෙඳුන් වෙත විධානයන්,

හිතවත් මහත්වරුනි,

## ණයවර ලිපි (LCs)

1. අන්තර්ජාතික වෙළඳ ගනුදෙනු සඳහා තවදුරටත් පහසුකම් සැලසීමේ අරමුණින්, අන්තර්ජාතික වාණිජ මණ්ඩලය මගින් ණයවර ලිපි සඳහා සම්පාදනය කර ඇති ප්‍රතිපාදනයන්ට (Uniform Customs and Practice for Documentary Credits - "UCP") අදාළව, ණයවර ලිපි නිකුත් කිරීමට, ඒවායේ වලංගු කාලය දීර්ඝ කිරීමට සහ වගන්ති සංශෝධනය කිරීම සඳහා විනිමය පාලක වෙත යොමු කිරීමකින් තොරව, බලයලත් වෙළඳුන් හට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව මින් අවසර දෙනු ලැබේ.

(අ) දැනට ශ්‍රී ලංකාවේ බලපවත්නා වූ එමෙන්ම බලයලත් වෙළඳුන් වෙත අදාළ වන සහ බැඳී පවතින කවර වූ නීති, රෙගුලාසි, උපදේශ, විධානයන් හෝ මෙහෙයුම් උපදෙස්වලට UCP හි යම් වගන්තියක් හෝ එහි කොටසක් හෝ අනුකූල නොවන අවස්ථාවක එකී අසංස්තිථිය (inconsistency) දක්වා එම නීති, රෙගුලාසි, උපදේශ, විධානයන් හෝ මෙහෙයුම් උපදෙස් අදාළ වේ.

(ආ) UCP හි, විධිවිධානයන්ට අනුකූල වන්නා වූ අවශ්‍යතාවය එසේ තිබියදීත්, බලයලත් වෙළෙන්දෙකු හට, අයදුම්කරුගේ අවදානම් අවම කිරීමේ හෝ බැඳියාව සුරක්ෂිත කිරීමේ අරමුණින් අතිරේක කොන්දේසි පැවරීමට හෝ UCP හි යම් වගන්තියක් හෝ එහි කොටසක් බැහැර කිරීමට හැකියාව ඇත.

(ඇ) ඉහත අයිතම (අ) හා (ආ) යටතේ දක්වා ඇති නිදර්ශනයන්ට අනුකූලව කරන ලද යම් විචලනයන්හි තොරතුරු ණයවර ලිපියට අදාළ පාර්ශ්වයන් වෙත, උචිත අවස්ථාවලදී බලයලත් වෙළඳුන් විසින් දැනුම්දීම සිදු කළ යුතුය.

2. විනිමය පාලන පනත යටතේ ණයවර ලිපිවලට අනුකූලව නිකුත් කරන ලද, ඇමුණුම් 1 හි දක්වා ඇති මෙහෙයුම් උපදෙස් මෙමගින් අවලංගු කරනු ලැබේ.

මෙයට - විශ්වාසී<br>
පී.එච්.ඕ.චන්ද්‍රවංශ<br>
**විනිමය පාලක**

ඇමුණුම 1

2014 මැයි 28 දිනැති සම්බන්ධ අංකඃ 06/04/10/2014 දරන ණයවර ලිපි පිළිබඳ විධානයේ 2 ඡේදයට අනුව අවලංගු කරන ලද මෙහෙයුම් උපදෙස් පහත පරිදි වේ.

1) යොමු අංකඃ EC/17/77(G) - 1977.05.25
2) යොමු අංකඃ EC/53/77(B) - 1977.12.07
3) යොමු අංකඃ EC/11/78(B) - 1978.05.17
4) යොමු අංකඃ EC/17/78(G) - 1978.07.14
5) යොමු අංකඃ EC/08/79(B) - 1979.02.15
6) යොමු අංකඃ EC/58/79(B) - 1979.11.30
7) යොමු අංකඃ EC/49/81(B) - 1981.12.09
8) යොමු අංකඃ EC/12/82(B) - 1982.02.23
9) යොමු අංකඃ EC/51/84(B) - 1984.11.21
10) යොමු අංකඃ EC/04/85(B) - 1985.01.22
11) යොමු අංකඃ EC/09/87(B) - 1987.02.23
12) යොමු අංකඃ EC/19/90(B) - 1990.03.13
13) යොමු අංකඃ EC/25/90(BPC) - 1990.04.17
14) යොමු අංකඃ EC/68/90(B) - 1990.11.01
15) යොමු අංකඃ EC/79/90(B) - 1990.12.27
16) යොමු අංකඃ EC/33/91(B) - 1991.05.23
17) යොමු අංකඃ EC/112/91(B) - 1991.12.11
18) යොමු අංකඃ EC/116/91(B) - 1991.12.17
19) යොමු අංකඃ EC/05/92(B) - 1992.01.09
20) යොමු අංකඃ EC/18/92(B) - 1992.02.24
21) යොමු අංකඃ EC/25/92(B) - 1992.03.06
22) යොමු අංකඃ EC/39/92(H) - 1992.05.14
23) යොමු අංකඃ EC/83/92(B) - 1992.08.13
24) යොමු අංකඃ EC/90/92(H) - 1992.09.01
25) යොමු අංකඃ EC/SAA/01/92(H) - 1992.09.01
26) යොමු අංකඃ EC/40/93(B) - 1993.03.17
27) යොමු අංකඃ EC/62/93(B) - 1993.08.10
28) යොමු අංකඃ EC/25/93(B) - 1993.02.26
29) යොමු අංකඃ EC/18/94(B) - 1994.11.18
30) යොමු අංකඃ EC/02/99(B) - 1999.02.24

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 1864/38 - 2014 මැයි මස 28 වැනි බදාදා - 2014.05.28

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

**I වැනි කොටස : (I) වැනි ඡෙදය – සාමාන්‍ය**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන**

විනිමය පාලන පනත යටතේ දැන්වීම

**(ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වැනි අධිකාරිය)**

ශ්‍රී ලංකාවෙන් පිටත බැංකුවල ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගැනීමට අවසරය

විනිමය පාලන පනතේ 48 වැනි වගන්තිය සමඟ කියැවෙන 6AA වගන්තිය සහ 8 වැනි වගන්තියේ (I) උපවගන්තිය යටතේ ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකුට සහ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගම් හෝ ආයතනවලට ශ්‍රී ලංකාවෙන් පිටත බැංකුවක ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීමට හෝ එම ගිණුම් වසා දැමීමට පහත දැක්වෙන පරිදි මෙයින් පොදු අවසරය ප්‍රදානය කරනු ලැබේ.

2. මේ යටතේ ලබා දෙනු ලබන අවසරය පහත තැනැත්තන්ට අදාළ වේ :

(i) ව්‍යාපාර, අධ්‍යයන හෝ වෛද්‍ය ප්‍රතිකාර කටයුතු සඳහා තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් බැහැර වූ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙක්ව සිටින ;

(ii) ශ්‍රී ලංකාවෙන් පිටතට වෘත්තීමය සේවාවන් සපයන තැනැත්තෙක් හෝ ශ්‍රී ලංකාවේ ලියාපදංචි සමාගමක් හෝ ආයතනයක් ;

(iii) ශ්‍රී ලංකාවෙන් පිටත ආයෝජනය කිරීම සඳහා මුදල් අමාත්‍යවරයා විසින් අවසර ලබා දුන් තැනැත්තෙක් හෝ ශ්‍රී ලංකාවේ ලියපදිංචි සමාගමක් හෝ ආයතනයක් ;

(iv) වෙළෙඳ භාණ්ඩ අපනයනකරුවෙක් ;

(v) වෙනත් රටක වලංගු නිත්‍ය නේවාසික බලපත්‍රයක් ලබාගත් තැනැත්තෙක් ;

(vi) ද්විත්ව පුරවැසියෙක් ; සහ

(vii) අධ්‍යාපන කටයුතු සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව වෙනත් රටකට යෑමට බලාපොරොත්තු වන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකුට, එකී රටේ වීසා අනුමත කරන අධිකාරිය විසින් ශිෂ්‍ය වීසා අනුමත කිරීමේදී කොන්දේසියක් ලෙස එම රටේ බැංකුවක ගිණුමක් ආරම්භ කර පවත්වා ගතයුතු යැයි ඉල්ලා ඇති අවස්ථාවකදී එම තැනැත්තන්.

3. විනිමය පාලන පනත ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත දී නීත්‍යානුකූලව ලැබූ හෝ අත්පත් කරගත් විදේශීය මුදල් හෝ අනුමත විදේශ විනිමය ගනුදෙනුවක් වෙනුවෙන් ගිණුම් හිමියා ශ්‍රී ලංකාව තුළ දී බලයලත් වෙළෙඳුන්ගෙන් හෝ අවසරලත් තැනැත්තන්ගෙන් ලබා ගන්නා ලද විදේශීය මුදල් මෙම ගිණුමට බැර කළ හැක.

4. විනිමය පාලන පනත ප්‍රකාරව, ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් වෙත අනුමැතිය ලබා දී ඇති ඕනෑම විදේශ විනිමය ගනුදෙනුවක් වෙනුවෙන් ගිණුම් හිමියාට මෙම ගිණුමේ අරමුදල් ප්‍රයෝජනයට ගත හැක.

5. පහත 6 වන ඡේදයේ සඳහන් කොන්දේසිවලට යටත්ව, මෙම නිවේදනයේ අවසරයට අනුකූලව එතෙර බැංකුවක ආරම්භ කොට පවත්වාගෙන ගිය ගිණුමක් වසා දැමුවේ නම් එම වසා දැමීමේ දින සිට මාසයක් ඇතුළත ගිණුමේ ශේෂය බැංකු ක්‍රමය හරහා ශ්‍රී ලංකාවට මව්හිමායනය කළ යුතුය.

6. මෙහි 2 වන ඡේදයේ (vii) වන අයිතමයෙහි කොන්දේසි ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුමක් ආරම්භ කිරීමට සහ පවත්වා ගැනීමට අවසර ලත් තැනැත්තෙකුගේ ශිෂ්‍ය වීසා අයදුම්පතක් එකී රට විසින් ප්‍රතික්ෂේප වූ විටක හෝ ශිෂ්‍ය වීසා ලබා ගැනීමෙන් පසුව අධ්‍යාපන කටයුතු සඳහා විදේශ ගත නොවීමට තීරණය කළ විටක, එකී තැනැත්තා විසින් මෙම අවසරය යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත විවෘත කරන ලද ගිණුමෙහි බැරට පවතින සියලුම මුදල් එම තීරණය ගත් දින සිට මාසයක් ඇතුළත මව්හිමායනය කළ යුතුය.

7. මෙම නිවේදනයෙහි පෙළ යෙදුම අනුව වෙනත් අදහසක් ගම්‍ය නොවන්නේ නම් -

(අ) ''බලයලත් ගනුදෙනුකරු'' යන්නට විනිමය පාලන පනතේ දී ඇති අර්ථ නිරූපණයම අදාළ වේ ;

(ආ) ''අවසරලත් තැනැත්තා'' යන්නෙන් තත්කාලය තුළ විනිමය පාලන පනතේ 5 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර දෙනු ලැබූ ඕනෑම තැනැත්තෙකු අදහස් කෙරේ ;

(ඇ) ''විදේශීය මුදල්'' යන්නට විනිමය පාලන පනතේ දක්වා ඇති අර්ථයම අදාළ වේ ;

(ඈ) ''ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකු'' හෝ ''ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකු'' යන්නට විනිමය පාලන පනතේ 37(1) වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදුව 1972 අප්‍රේල් මස 21 වැනි දිනැති අංක 15007 දරන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නියමයෙන් දක්වා ඇති අර්ථයම දැක්වේ.

8. විනිමය පාලන පනතේ 48 වැනි වගන්තිය සමග කියැවෙන 6AA වගන්තිය සහ 8 වැනි වගන්තියේ (1) උප වගන්තියේ කොන්දේසි ප්‍රකාරව 2010 මාර්තු 11 දිනැති අංක 1644/26 සහ 2013 ජුනි 12 දිනැති අංක 1814/40 දරන රජයේ ගැසට් පත්‍රයන්හි පළ කරන ලද දැන්වීම් මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

වර්ෂ 2014 ක් වූ මැයි මස 28 වැනි දින,
කොළඹ දී ය.

පී.එච්.ඕ. චන්ද්‍රවංශ
**විනිමය පාලක**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 1864/39 - 2014 මැයි මස 28 වැනි බදාදා - 2014.05.28

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

**I වැනි කොටස : (I) වැනි ජෙදය - සාමාන්‍ය**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන**

විනිමය පාලන පනත යටතේ දැන්වීම (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වැනි අධිකාරිය)

**ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන පුද්ගලයන්ට ශ්‍රී ලංකාවේ සංස්ථාගත සමාගම්වල ණයකර නිකුත් කිරීම හා පැවරීම සඳහා අවසරය ලබාදීම**

ශ්‍රී ලංකාවේ සංස්ථාගත සමාගමක ශ්‍රී ලංකා රුපියල්වලින් නියම කර ඇති ණයකර, දේශීය අරමුදල්, ප්‍රාදේශීය අරමුදල් හෝ අන්‍යෝන්‍ය අරමුදල් ඇතුළු විදේශීය ආයතනික ආයෝජකයන්ට, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත සංස්ථාවලට, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන් වන විදේශීය රාජ්‍යවල පුරවැසියන්ට සහ ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන ශ්‍රී ලාංකිකයන්ට (මින් මතුවට "සුදුසුකම්ලත් ආයෝජකයන්" ලෙස නම් කෙරේ) නිකුත් කිරීම සහ පැවරීම සඳහා විනිමය පාලන පනතේ 10, 11, 15 සහ 30 වැනි වගන්තියේ 5 වැනි උප වගන්තිය යන වගන්ති ප්‍රකාරව පහත නියමයන් හා කොන්දේසිවලට යටත්ව මෙමගින් අවසර ප්‍රදානය කරනු ලැබේ.

1. **ණයකර සඳහා අදාළ වන නියමයන් සහ කොන්දේසි :**

1.1 මෙම දැන්වීම යටතේ නිකුත් කරනු ලබන සියලුම ණයකර කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත කළ හෝ ලැයිස්තුගත නොකළ ඒවා විය හැකිය ;

1.2 ණයකරය නිකුත් කළ දිනයේ සිට වසරක් ඉකුත් වූ පසු පමණක් ප්‍රාග්ධන නිදහස් කිරීම ආරම්භ කළ යුතු අතර, ණයකරයේ කල්පිරීමේ අනුපාතිකව ණයකරය සඳහා වන ප්‍රාග්ධන ගෙවීම් සිදු කළ යුතුය ;

1.3 පරිවර්ත්‍ය ණයකරයක් වන අවස්ථාවකදී, සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කිරීම 2002 අප්‍රේල් 19 දිනැති අංක 1232/14 දරන (සංශෝධිත) රජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද නිවේදනයෙහි නියම කර ඇති බැහැර කිරීම් සහ සීමා කිරීම්වලට යටත්ව සිදු කළ යුතුය.

2. **ණයකර නිකුත් කරන සමාගමට අදාළ වන නියමයන් සහ කොන්දේසි :**

2.1 සුදුසුකම් ලත් ආයෝජකයකු විසින් ණයකරවල සිදු කරන ආයෝජනයන් සහ ණයකරවලට අදාළ ගෙවීම් සිදු කළ හැක්කේ විනිමය පාලක විසින් බලයලත් වෙළෙඳුන්ට දෙන ලද විධානයන්ට අනුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකුවක විවෘත කර පවත්වාගෙන යනු ලබන, එම ආයෝජකයාගේ සුරැකුම්පත් ආයෝජන ගිණුමක බැරට පවතින මුදල්වලින් පමණි.

2.2 මේ යටතේ අවසර දෙනු ලැබූ ඕනෑම ගනුදෙනුවක් සම්බන්ධයෙන් අදාළ ප්‍රාග්ධනය, පොලී සහ කොමිස් ගෙවීම සම්බන්ධයෙන් වගකීම දරන්නා වූ බලයලත් වෙළෙන්දෙක් හෝ වෙනත් ඕනෑම තැනැත්තෙකු විසින් ඉහත 2.1 ඡේදයෙහි සඳහන් සුරැකුම්පත් ආයෝජන ගිණුමට හෝ එම ගිණුමෙන් පමණක් එම ගෙවීම් සිදු කළ යුතුය.

2.3 ණයකර නිකුත් කරන සමාගම විසින් පහත සඳහන් විස්තර අඩංගු වාර්තාවක් ණයකරවල ආයෝජනය සඳහා ප්‍රේෂණ ලැබී දින 30 ක් ඇතුළත විනිමය පාලක වෙත එවිය යුතුය :-

(අ) සුරැකුම්පත් ආයෝජන ගිණුම් හරහා ලද මුළු වටිනාකම,

(ආ) අදාළ ප්‍රේෂණ ලද බලයලත් වෙළෙඳුන්ගේ නම් සහ ලිපිනයන්,

(ඇ) අදාළ ණයකරවල කල් පිරීමේ ව්‍යුහය.

3. මේ යටතේ අවසර දෙනු ලැබූ ගනුදෙනු සම්බන්ධයෙන් සුදුසුකම්ලත් ආයෝජකයා විසින් විවෘත කර පවත්වාගෙන යනු ලබන සුරැකුම්පත් ආයෝජන ගිණුමක බැරට සිදු කරන ගෙවීම් සඳහා මෙම අවසරය යටතේ ණයකර නිකුත් කරන සමාගමකට විනිමය පාලන පනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර ප්‍රදානය කෙරේ.

4. මේ යටතේ අවසර දෙනු ලැබූ ගනුදෙනු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන පුද්ගලයෙකුට ණයකර සහතික අපනයනය කිරීම සඳහා (අදාළ නම්) මෙම අවසරය යටතේ ණයකර නිකුත් කරන සමාගමකට විනිමය පාලන පනතේ 22 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර ප්‍රදානය කෙරේ.

5. (අ) 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ඇතිකරගත් ගිවිසුමක් මගින් විනිමය පාලන පනතේ ප්‍රතිපාදන අදාළ වීමෙන් නිදහස් කරන ලද ව්‍යවසායක්,

(ආ) වෙනත් නීතියක විධිවිධාන කෙරෙහි ද,

මෙම දැන්වීමෙහි ඇතුළත් කිසිවකින් යම් බලපෑමක් හෝ සම්බන්ධයක් ඇත්තේ යැයි වටහා නොගත යුතුය.

6. මෙම දැන්වීමෙහි කාර්යය සඳහා “බලයලත් වෙළෙන්දා” යන්නෙන් විනිමය පාලන පනතේ දී ඇති අර්ථයම අදාළ වනු ඇත.

7. විනිමය පාලන පනතේ 10, 11, 15 සහ 30 වැනි වගන්තියේ 5 වැනි උප වගන්තිය යන වගන්ති ප්‍රකාරව 2010.11.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර අංක 1681/11 සහ 2011.11.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර අංක 1733/19 හි පළ කරන ලද දැන්වීම මෙමගින් අවලංගු කරනු ලැබේ.

වර්ෂ 2014 ක් වූ මැයි මස 28 වැනි දින,
කොළඹ දී ය.

පී.එච්.ඕ. චන්ද්‍රවංශ
**විනිමය පාලක**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

අංක 1864/40 - 2014 මැයි මස 28 වැනි බදාදා - 2014.05.28

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

**I වැනි කොටස : (I) වැනි ජෙදය - සාමාන්‍ය**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන**

විනිමය පාලන පනත යටතේ දැන්වීම (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වැනි අධිකාරය)

**විනිමය පාලන පනතේ 7 වන සහ 8 වන වගන්ති ප්‍රකාරව වූ අවසරය**

1. 2012 දෙසැම්බර් 20 දිනැති අංක : 1789/34 දරන රජයේ (අති විශෙෂ) ගැසට් පත්‍රයේ විනිමය පාලන පනත යටතේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම 2 වන ඡේදයට පසුව පහත සඳහන් නව ඡේද ඇතුළත් කිරීමෙන් සංශෝධනය කෙරේ.

“2 අ. සුදුසුකම් ලත් පුද්ගලයින් තනි පුද්ගලයින් වන්නේ නම්, බලයලත් වෙළෙන්දෙකුගෙන් අයදුම් කර හර පතක් ලබා ගැනීමට පහත සඳහන් පුද්ගලයන් සුදුසුකම් ලබති.

(අ) රැකියාවක්, ව්‍යාපාරයක් හෝ වෘත්තියක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකව සිටින ශ්‍රී ලාංකික පුරවැසියෙකුට එවැනි රැකියාවෙහි, ව්‍යාපාරයෙහි හෝ වෘත්තියෙහි නියැළෙන කාලය තුළදී ;

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථිරව වාසය කරන, අනේවාසික ආවෘත ගිණුමක් හෝ සංක්‍රමණික ආවෘත ගිණුමක් විවෘත කර ඇති ශ්‍රී ලාංකික පුරවැසියෙකු ;

(ඇ) රාජ්‍ය දූත විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ රාජ්‍ය දූත රුපියල් ගිණුම් හිමියෙකු ;

(ඈ) අනේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙකු ;

(ඉ) නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම් හිමියෙකු ;

(ඊ) විදේශීය ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රුපියල් ගිණුම් හිමියෙකු ;

(උ) සුරැකුම්පත් ආයෝජන ගිණුම් හිමියෙකු ;

(ඌ) විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් හිමියෙකු ;

(එ) අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවකයන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, සේවා නියුක්තිකයෙකු ලෙස පවත්වාගෙන යන පුද්ගලයෙකු ;

(ඒ) විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් හිමියෙකු."

2. 2අ ඡේදයට පසුව පහත සඳහන් නව ඡේද ඇතුළත් කිරීමෙන් සංශෝධනය කෙරේ :

"2අඅ. 2අ ඡේදයේ අයිතම (ආ) සිට (ඒ) දක්වා ලැයිස්තුගත කර ඇති තනි පුද්ගලයෙකුට හර කාඩ්පතක් නිකුත් කරනු ලබන අවස්ථාවකදී, එම ගිණුමේ බැරට ඇති මුදල් මත එකී හර කාඩ් පත නිකුත් කළ හැක."

3. 2අඅ. ඡේදයට පසුව පහත සඳහන් නව ඡේද ඇතුළත් කිරීමෙන් සංශෝධනය කෙරේ :

"2අආ. 2අ ඡේදයේ දක්වා ඇති පරිදි තනි පුද්ගලයින්ට නිකුත් කර ඇති හර කාඩ් පතක් පහත දැක්වෙන නියමයන් හා කොන්දේසිවලට යටත්ව භාවිතා කළ යුතුය :

(අ) ශ්‍රී ලංකාව තුළදී ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීමට අවසර ඇත.

(ආ) පහත සඳහන් තැනැත්තන්ට හර කාඩ්පත් නිකුත් කර ඇති අවස්ථාවලදී පමණක් ඕනෑම කාරණයක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුට ගෙවීමක් කිරීමට අවසර ඇත.

i. රාජ්‍ය දූත විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙකු ;
ii. අනේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙකු ;
iii. සුරැකුම්පත් ආයෝජන ගිණුම් හිමියෙකු ;
iv. විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් හිමියෙකු.

(ඇ) පහත සඳහන් තැනැත්තන්ට හර කාඩ්පත් නිකුත් කර ඇති අවස්ථාවලදී ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුට, ජංගම ජාත්‍යන්තර ගනුදෙනුවක් සඳහා ගෙවීමක් කිරීමට අවසර ඇත.

i. සේවා නියුක්තිකයෙකු වශයෙන් පවත්වාගෙන යන අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවකයන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සේවා නියුක්තිකයෙකු ලෙස පවත්වාගෙන යන පුද්ගලයෙකු ;
ii. විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුමක් පවත්වාගෙන යන පුද්ගලයෙකු ;
iii. රැකියාවක්, ව්‍යාපාරයක් හෝ වෘත්තියක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකව සිටින ශ්‍රී ලාංකික පුරවැසියෙකුට,

එවැනි රැකියාවෙහි, ව්‍යාපාරයෙහි හෝ වෘත්තියෙහි නියැළෙන කාලය තුළදී."

4. පහත ඡේදය ඇතුළත් කර 3 වන ඡේදය ඉවත් කිරීමෙන් සංශෝධනය කෙරේ.

"2අ ඡේදයේ අයිතම (අ) යටතේ කාඩ්පතක් නිකුත් කර ඇති අවස්ථාවකදී හැර, කාඩ්පත් හිමියා වෙනත් රටකට විගමනය වන්නේ නම් හෝ විදේශ සේවා නියුක්තියක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව යන්නේ නම්, ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකුට නිකුත් කර ඇති විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පතක්, කාඩ්පත නිකුත් කළ බැංකුවට භාර දිය යුතුය."

5. 3 වන ඡේදයට පසුව පහත සඳහන් නව ඡේදය ඇතුළත් කිරීමෙන් සංශෝධනය කෙරේ.

"3 අ. හර කාඩ්පතක් හෝ ණය කාඩ්පතක් භාවිතා කර විදේශ මුදල් ලබා ගැනීමේ අවස්ථාවකදී කාඩ්පත් හිමියා විසින් එසේ ගත් මුදල් භාවිතා කොට ඇත්තේ (2) වන ඡේදයේ සහ (2අ ආ) ඡේදයේ අයිතම (ඇ) යටතේ අවසරලත් ගනුදෙනු සඳහා පමණක් බවට තහවුරු කළ හැකි සාක්ෂි තබා ගත යුතුය".

6. (5) වන ඡේදය ඉවත් කොට පහත සඳහන් නව ඡේදය ඇතුළත් කිරීමෙන් සංශෝධනය කෙරේ.

"5. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම නිවේදනයේ කාර්යය සඳහා

i. "**බලයලත් වෙළෙන්දා**" යන්නට විනිමය පාලන පනතේ දී ඇති අර්ථයම අදාළ වනු ඇත.
ii. "**විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත (EFTC)**" යන්නෙන් බැර, හර හෝ වෙනත් යම් ආකාරයක වටිනාකමක් මාරු කිරීම සඳහා භාවිතා කරන්නාට හැකියාව ලබා දෙන කාඩ්පතක් හෝ උපකරණයක් අදහස් වන අතර, එයට ණය කාඩ්පත්, හර කාඩ්පත් සහ විනිමය පාලන පනතේ විධි විධානයන්ට අනුකූලවන බවට බලයලත් වෙළෙඳුන් විසින් ගනුදෙනු විස්තර හඳුනාගත හැකි අවස්ථාවලදී වටිනාකම තැන්පත් කළ කාඩ්පත් ද ඇතුලත් වේ.
iii. "**හර කාඩ්පත**" යන්නෙන් මුදල් ලබා ගැනීම සහ/හෝ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා එම කාඩ්පත දරන්නා විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම සෘජුවම හර කළ හැකි කාඩ්පතක් අදහස් වේ.
iv. "**ණය කාඩ්පත**" යන්නෙන් කාඩ්පත් දරන්නා වෙත එය නිකුත් කරන්නා විසින් ප්‍රදානය කරන ලද ණය පහසුකමක් සහිත කාඩ්පත් දරන්නා විසින් භාවිතා කරන ලද ණය මුදල සම්පූර්ණයෙන් හෝ කොටසක් නියමිත දින හෝ ඊට පෙර ගෙවා නිම කළ හැකි කාඩ්පතක් අදහස් වේ. නියමිත දිනට නොපියවන ලද ණය මුදලට නිකුත් කරන්නා විසින් පොලී හෝ වෙනත් ගාස්තු අය කරනු ලැබිය හැකිය.
v. "**පෞද්ගලික**" යන්නෙන් කාඩ්පත් හිමියාගේ, ඔහුගේ/ඇයගේ කලත්‍රයාගේ, ළමයින්ගේ සහ දෙමාපියන්ගේ ප්‍රයෝජනය සඳහා භාවිතා කිරීම අදහස් වන අතර එමගින් කාඩ්පත යම් වාණිජ කාර්යයක් සඳහා භාවිතා කිරීම අදහස් නොවේ".

වර්ෂ 2014 ක් වූ මැයි මස 28 වැනි දින, පී.එච්.ඕ. චන්ද්‍රවංශ
කොළඹ දී ය. **විනිමය පාලක**

**සම්බන්ධ අංකය : 06/04/11/2014** 2014 ජූලි 01

බලයලත් වෙළෙඳුන් වෙත විධානයන්,

හිතවත් මහත්වරුනි,

# ප්‍රතිමුඛ ප්‍රේෂණ ගිණුම සඳහා සංශෝධනයන්

ප්‍රතිමුඛ ප්‍රේෂණ ගිණුම සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2011 ජනවාරි 21 දිනැති සම්බන්ධ අංක 06/04/02/2011 දරන විධානයට අදාළ ඇමුණුම් 1 අවලංගු කර ඒ වෙනුවට මේ සමඟ ඇති ඇමුණුම් අංක 1 ආදේශ කරනු ලැබේ.

මෙයට - විශ්වාසී
ඩී.එම්. රූපසිංහ
**විනිමය පාලක**

ඇමුණුම 1

1. සියලුම නේවාසික ආයෝජකයන්ගෙන් ලබාගත යුතු ලියකියවිලි;

   I. ඇමුණුම් III හි ඇති අයදුම්පත්‍රය සමඟ ඉල්ලීම් ලිපියක්

   II. ඇමුණුම් IV හි ඇති ආකෘතියට අනුව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙක් විසින් ලබාදුන් නිර්දේශය

   III. විනිමය පාලන පනතේ අඩංගු විධිවිධානයන් යටතේ කිසිදු විමර්ශනයක් පැවැත්වෙමින් නොපවතින බවට විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නිෂ්කාශන සහතිකයක්

   IV. ඇමුණුම V යටතේ දක්වා ඇති දිවුරුම් ප්‍රකාශය

2. මීට අමතරව පහත වර්ගීකරණවලට අදාළ විශේෂ ලියවිලි ද ලබාගත යුතුය.

   **1 වන වර්ගීකරණය : 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගම්**

   I. සංස්ථාපන සහතිකය සහ සාංසමික ව්‍යවස්ථාවලිය

   II. යෝජිත ආයෝජනය පිළිබඳ අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය

   **2 වන වර්ගීකරණය : ශ්‍රී ලංකාවේ ලියාපදිංචි හවුල් ව්‍යාපාර**

   I. හවුල් ගිවිසුමෙහි සහතික කරන ලද පිටපතක්

   II. දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ යටතේ අවශ්‍ය වන්නේ නම්, එක් එක් හවුල්කරුගේ ආයෝජන ප්‍රමාණය ආවරණය කරන්නා වූ බදු නිෂ්කාශන සහතිකපත්

   **3 වන වර්ගීකරණය : ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන්**

   දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ යටතේ අවශ්‍ය වන්නේ නම්, ආයෝජන වටිනාකම ආවරණය කරන්නා වූ බදු නිෂ්කාශන සහතිකපතක්

**සම්බන්ධ අංකය : 06/04/12/2014** 2014 සැප්තැම්බර් 29

බලයලත් වෙළෙඳුන් වෙත විධානයන්,

හිතවත් මහත්වරුනි,

# විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් (FEEA) හිමියන් සඳහා වූ ණය පහසුකම්

බලයලත් වෙළඳුන් විසින් ඔවුන්ගේ දෛනික ව්‍යාපාරික ක්‍රියාකාරකම්වලදී ගනු ලබන තීරණයන්හි කොටසක් ලෙස නිර්ණය කරනු ලබන්නා වූ ඕනෑම අරමුණක් වෙනුවෙන් විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් හිමියන් හට සිය දේශීය බැංකු ඒකකවලින් විදේශ ව්‍යවහාර මුදලින් ණය පහසුකම් ප්‍රදානය කිරීමට පහත සඳහන් කොන්දේසි සහ නියමයන්ට යටත්ව, මෙමගින් අවසර ලබාදේ.

1. ණය පහසුකම් ප්‍රදානය කිරීම, සාධාරණ අතීත සහ පුරෝකතනය කරන ලද අනාගත කාලපරිච්ඡේදයක් පුරාවට ඇගයීමට ලක් කර, විදේශ විනිමය මුදල් ප්‍රවාහයන් භාවිතයෙන් ණය පහසුකම ආපසු ගෙවීමට විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් හිමියාට ඇති හැකියාව පිළිබඳව බලයලත් වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන විශේෂ තක්සේරුවක් මත පදනම් විය යුතුය.

2. ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ආපසු අය කර ගැනීම සිදු කළ හැකි වන්නේ, 2008 අංක 3 දරන බැංකු පනත (සංශෝධිත) ප්‍රකාරව අක්‍රීය ණය; අව ප්‍රාමාණික, අඩමාන හෝ බොල් ණය ලෙස වර්ග කළ අවස්ථාවකදී පමණි.

3. මෙම විධානය යටතේ ප්‍රදානය කරන ලද ණය පහසුකම් පිළිබඳව කාර්තුමය වාර්තා සෑම කාර්තුවක් අවසානයේ එළඹෙන මාසයේ 15 වැනි දින හෝ ඊට පෙර බලයලත් වෙළෙඳුන් විසින් ඇමුණුම 1 පරිදි විනිමය පාලක වෙත ඉදිරිපත් කළ යුතුය.

4. 2013.06.12 දිනැති සම්බන්ධ අංකः 06/04/21/2013 සහ 2014.05.28 දිනැති සම්බන්ධ අංක 06/04/08/2014 දරන විධානයන් මෙයින් අවලංගු වන අතර, එබැවින් එම විධානයන් යටතේ ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීම සහ කොන්දේසි හා නියමයන් මෙම විධානය පරිදි විය යුතුය.

මෙයට - විශ්වාසී
ඩී. එම්. රූපසිංහ
**විනිමය පාලක**

ඇමුණුම 1

විනිමය පාලක වෙත

**විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් හිමියන් සඳහා වූ ණය පහසුකම් පිළිබඳ කාර්තුමය වාර්තාව**

බලයලත් වෙළෙන්දාගේ නම :

වාර්තා කරන කාල පරිච්ඡේදය : ........................ දිනෙන් අවසන් කාර්තුව

| අයිතමය | ණය පහසුකම් ගණන | වටිනාකම (එ.ජ. ඩොලර්වලින්) |
|---|---|---|
| කාර්තුව තුළ ප්‍රදානය කරන ලද ණය පහසුකම් | | |
| කාර්තුව අවසානයේ ගෙවීමට ඇති මුළු ණය ප්‍රමාණය | | |
| කාර්තුව අවසානයේ අක්‍රීය ණය කාණ්ඩයේ ඇති මුළු ණය ප්‍රමාණය | | |
| කාර්තුව අවසානයේ රුපියල්වලින් අය කරගෙන ඇති අක්‍රීය ණය ප්‍රමාණය | | |

ඉහත විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි.

දිනය .........................................

..................................................................................
බලයලත් නිලධාරියාගේ අත්සන

..................................................................................
බලයලත් නිලධාරියාගේ තනතුර

ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය :

1. සෑම කාර්තුවක් අවසානයේ දී දින 15 ක් ඇතුළත
2. වෙත : විනිමය පාලක තුමා
   විනිමය පාලන දෙපාර්තමේන්තුව
   ශ්‍රී ලංකා මහ බැංකුව
   කොළඹ 01
   ෆැක්ස්: 0112477716

**සම්බන්ධ අංකය : 06/04/13/2014** 2014 ඔක්තෝබර් 27

බලයලත් වෙළෙඳුන් වෙත විධානයන්,

හිතවත් මහත්වරුනි,

## චීන රෙන්මින්බිවලින් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම

2011 ජූලි 25 දිනැති සම්බන්ධ අංක 06/04/04/2011 දරන විධානයන්ට වැඩිමනත්ව, විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමේ හා පවත්වාගෙන යාමේ දී චීන රෙන්මින්බි (RMB) යොදා ගත හැකි බව බලයලත් වෙළෙඳුන් හට මෙමගින් දැනුම් දෙනු ලැබේ.

මෙයට - විශ්වාසී
ඩී. එම්. රූපසිංහ
**විනිමය පාලක**

**සම්බන්ධ අංකය : 06/04/15/2014** 2014 දෙසැම්බර් 31

බලයලත් වෙළෙඳුන් වෙත විධානයන්,

හිතවත් මහත්වරුනි,

## එතෙර ගමන් සඳහා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීම

1. එතෙර ගමන් කරන ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් සඳහා ගමන් දීමනාවෙහි කොටසක් ලෙස ඇ.එ.ජ. ඩොලර් දස දහසක් (USD 10,000) හෝ වෙනත් ඕනෑම පරිවර්ත්‍ය විදේශ ව්‍යවහාර මුදලකින් ඊට තුල්‍ය වන ප්‍රමාණයක් දක්වා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කිරීමට බලයලත් වෙළෙඳුන් හට මෙමගින් අවසර ලබාදේ. විදේශ මුදල් නිකුත් කිරීමේ දී අදාළ ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම්වල සද්භාවය පිළිබඳ නිසි තක්සේරුවක් කිරීම මගින් සෑහීමකට පත් විය යුතු බවට බලයලත් වෙළෙඳුන් හට උපදෙස් දෙනු ලැබේ.

2. ඉහත සඳහන් කළ ශ්‍රී ලංකාවේ නේවාසික අයෙකු, ශ්‍රී ලංකා ආගමන විගමන පාලක ජෙනරාල් විසින් නිකුත් කරන ලද ගමන් බලපත්‍රයක් හිමි ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන විට, නිකුත් කරන ලද ගමන් දීමනාව සම්බන්ධයෙන් ගමන් බලපත්‍රයේ යෝග්‍ය පිටසන් කිරීමක් කළ යුතුය.

3. ඉහත විෂය සම්බන්ධයෙන් 2013.06.12 දිනැති අංක 06/04/19/2013 දරන විධානය මෙයින් අවලංගු කෙරේ.

මෙයට - විශ්වාසී
ආර්.ආර්. ජයරත්න
**අතිරේක විනිමය පාලක**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 1895/15 - 2014 දෙසැම්බර් මස 31 වැනි බදාදා - 2014.12.31

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

**I වැනි කොටස : (I) වැනි ඡෙදය – සාමාන්‍ය**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන**

විනිමය පාලන පනත යටතේ දැන්වීම

**(ලංකා නීති ප්‍රඥප්තිවල 423 වන අධිකාරිය)**

විනිමය පාලන පනතෙහි 29B සහ 3 වන වගන්ති යටතේ 1990 දෙසැම්බර් 20 වැනි දින පළ කරන ලද අංක 641/15 දරන රජයේ ගැසට් පත්‍රය (අති විශේෂ) මගින් කළ දැන්වීමට අනුව ශ්‍රී ලංකාව තුළ සිටින හෝ නේවාසික නැව් බඩු ප්‍රවාහන සේවාවන්හි නිරත වන අය සඳහා පනවන ලද කොන්දේසි සහ අවශ්‍යතාවයන් මෙයින් අවලංගු කරනු ලැබේ.

වර්ෂ 2014 ක් වූ දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

ආර්.ආර්. ජයරත්න
**අතිරේක විනිමය පාලක**

**චක්‍රලේඛ අංකය : 01/14** 2014 ජනවාරි 30

වෙත: සියලුම බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන්

ප්‍රිය මහත්මයාණෙනි/මහත්මියනි,

## ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සහ මැඩපැවැත්වීම වාර්තා කරන ආයතයන්හි වගකීම්

විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද 2012 මැයි 31 දිනැති අංක.1760/40 දරන අති විශේෂ ගැසට් නිවේදනය වෙත සියලුම බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන්ගේ අවධානය මෙයින් යොමු කෙරේ.

ඒ අනුව, සිය පාරිභෝගිකයන් සමග ගනුදෙනු කිරීමේ දී පහත සඳහන් ක්‍රියාපටිපාටිය අනුගමනය කරන ලෙස සියලුම බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන් හට දැනුම් දෙනු ලැබේ.

1) නම් කරන ලද තැනැත්තන්ගේ සහ ආයතනවල ලැයිස්තුවට (උක්ත ගැසට් නිවේදනයෙහි ඒකාබද්ධ ලැයිස්තු ලෙස දක්වා ඇති) සිදු කරන සංශෝධනයන්, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය මගින් ප්‍රකාශයට පත් කළ පසු, අදාළ සංශෝධනයන් මූල්‍ය බුද්ධි ඒකකය (FIU) විසින් විද්‍යුත් තැපැල (e-mail) මගින් සියලුම බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන් වෙත දැනුම් දෙනු ලැබේ. එසේම, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල වෙබ් අඩවි වන http://www.un.org/sc/committees/1267/consolist.shtml සහ http://www.un.org/sc/committees/1988/list.shtml මගින් යාවත්කාලීන කරන ලද නම් කරන ලද තැනැත්තන්ගේ සහ ආයතනවල ලැයිස්තුව ලබා ගන්නා ලෙස ද බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන් හට දැනුම් දෙනු ලැබේ.

2) නම් කරන ලද තැනැත්තන්ගේ ලැයිස්තුවේ සිටින පුද්ගලයන්ගේ/ආයතනවල නම් සහ විස්තර ඇතුළත් දත්ත ගබඩාවක් බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන් විසින් පවත්වාගෙන යා යුතු වේ.

3) එම දත්ත ගබඩාවේ අන්තර්ගත තොරතුරු යාවත්කාලීන බවට, අදාළ බවට සහ සේවකයින්ට පහසුවෙන් ලබාගත හැකි බවට තහවුරු කළ යුතු වේ.

4) ගනුදෙනුකරුවන් සමග ගනුදෙනු කිරීමට ප්‍රථම ඉහත සඳහන් කළ නම් කරන ලද තැනැත්තන්ගේ සහ ආයතනවල ලැයිස්තුවෙහි සඳහන් තොරතුරු සමග ගනුදෙනුකරුගේ තොරතුරු ගැලපෙන්නේ දැයි පරීක්ෂා කළ යුතු වේ.

5) යම් අවස්ථාවක දී නම් කරන ලද තැනැත්තන්ගේ සහ ආයතනවල ලැයිස්තුවෙහි සඳහන් තොරතුරු සමග ගනුදෙනුකරුගේ තොරතුරු ගැලපුනහොත්,

   අ) 2012 අංක 2 දරන එක්සත් ජාතීන්ගේ නියෝගයන්හි 5 හා 6 වන පරිච්ඡේදයන්හි සඳහන් පරිදි එවැනි තැනැත්තෙකු සමග හෝ එවැනි තැනැත්තෙකුට ප්‍රතිලාභ ලබාදෙන කිසිදු ගනුදෙනුවක් නොකළ යුතුය.

   ආ) එවැනි ගනුදෙනුකරුවෙක් හඳුනා ගෙන හැකි ඉක්මනින් එනම් පැය 24 ක් ඉක්ම යාමට මත්තෙන් අදාළ සම්පූර්ණ විස්තර ෆැක්ස් අංක 011-2477692 හෝ 011-2477722 මගින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත දැනුම් දිය යුතුය. තැපැල මගින් හෝ ෆැක්ස් මගින් එවනු ලැබූ තොරතුරුවලට අමතරව විද්‍යුත් තැපැල මගින් fiu@cbsl.lk වෙත ලබා දිය යුතුය.

ඇ) ඉහත 5 (ආ) හි සඳහන් සන්නිවේදනයන් නිසි බලධරයා (ජාතික බුද්ධි ප්‍රධානී, නිසි බලධර කාර්යාලය, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය, නො. 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03) වෙතට ද දැනුම් දිය යුතුය. තැපැල මගින් එවනු ලැබූ තොරතුරුවලට අමතරව විද්‍යුත් තැපැල මගින් cniofficemod@gmail.com වෙත ද ලබා දිය යුතුය.

මෙම චක්‍රලේඛයේ සහ 2012 අංක 2 දරන එක්සත් ජාතීන්ගේ නියෝගයන්හි ඇතුළත් ප්‍රතිපාදන අදාළ සියලුම සේවකයින් වෙත දැන ගැනීමට සලස්වන ලෙස ද මෙම ප්‍රතිපාදන වෙත විධිමත් ලෙස අනුකූලතාවය දක්වන ලෙස ද බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන් හට දැනුම් දෙනු ලැබේ.

මෙයට විශ්වාසී,
අධ්‍යක්ෂ
මූල්‍ය බුද්ධි ඒකකය

පිටපත්: විනිමය පාලක

**චක්‍රලේඛ අංකය : 02/14** 2014 ජූනි 25

වෙත: සියලුම බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් හි ප්‍රධාන විධායක නිලධාරීන්

ප්‍රිය මහත්මයාණෙනි/මහත්මියනි,

## ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සහ මැඩපැවැත්වීම වාර්තා කරන ආයතයන්හි වගකීම්

මූල්‍ය කටයුතු කාර්ය සාධන බලකායේ (FATF) 2012 පෙබරවාරි මස සිට බලපවත්නා පරිදි සංශෝධිත 6 වෙනි නිර්දේශය, විදේශ කටයුතු අමාත්‍යවරයා නිකුත් කරන ලද 2012 මැයි 15 දිනැති අංක. 1758/19 දරන අති විශේෂ ගැසට් නිවේදනය සහ ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා (එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුතිය 1373 සඳහා නිසි බලධරයා) විසින් නිකුත් කරන ලද 2014 මාර්තු 21 දිනැති අංක. 1854/41 දරන අති විශේෂ ගැසට් නිවේදනය සහ 2014 මැයි 22 දිනැති අංක. 1863/25 දරන අති විශේෂ ගැසට් නිවේදනය වෙත සියලුම බලපත්‍රලාභී බැංකු/බලපත්‍රලාභී මුදල් සමාගම්හි අවධානය මෙයින් යොමු කෙරේ.

1) ඒ අනුව, නම් කරන ලද තැනැත්තන්ගේ සහ ආයතනවල අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් වහාම ක්‍රියාවිරහිත කිරීමේ සහ, එවැනි අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් නම් කරන ලද තැනැත්තන් හෝ ආයතන හෝ ඔවුන්ගේ /ඒවායේ ප්‍රතිලාභීන් වෙත හෝ ප්‍රයෝජනය සඳහා හෝ ලබා නොදීමේ අවශ්‍යතා රාජ්‍යයන් වෙත පැවරෙන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුතිය (UNSCR) 1373 (2001) සහ පසුව කරන ලද යෝජනා සම්මුතිවලට අනුකූල වන සේ අංක 1758/19 දරන ගැසට් නිවේදනයෙහි සඳහන් ඉලක්කගත මූල්‍ය සම්බාධක ක්‍රියාවට නැංවීමට ශ්‍රී ලංකාව බැඳී සිටී. ඒ අනුව, මූලික වශයෙන් අති විශේෂ ගැසට් නිවේදන අංක.1854/41 සහ පසුව වෙනත් ගැසට් නිවේදන මගින් නිසි බලධරයා විසින් සංශෝධනය කරන ලද එවැනි නම් කරන ලද තැනැත්තන්ගේ සහ ආයතනයන්හි අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් වහාම ක්‍රියාවිරහිත කිරීමට අවශ්‍ය ක්‍රියාවලීන් පවත්වා ගෙන යාමට සියලුම බලපත්‍රලාභී බැංකු/බලපත්‍රලාභී මුදල් සමාගම් බැඳී සිටී.

2) 2014 මැයි 22 දිනැති අංක.1863/25 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගය අනුව, 2014 මාර්තු 21 දිනැති අංක.1854/41 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් නම් කරන ලද සහ ප්‍රකාශයට පත් කරන ලද ඕනෑම ස්වභාවික හෝ නෛතික පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් හෝ ආයතනයක් සතු සියලු අරමුදල් වෙනත් මූල්‍යමය වත්කම් සහ ආර්ථික සම්පත් අත්හිටුවීම නිසි බලධරයා විසින් සිදුකර ඇත.

3) ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට අදාළ ඉලක්කගත මූල්‍ය සම්බාධකවලට අනුකූල වීමේ බලපත්‍රලාභී බැංකු හෝ බලපත්‍රලාභී මුදල් සමාගම්හි වගකීම් සම්බන්ධ වැඩි විස්තර සඳහා කරුණාකර මේ සමග අමුණා ඇති FIU/UNSCR-1373/විධාන අංක.01 බලන්න. මෙම විධාන බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්හි පවත්නා මුදල් විශුද්ධිකරණය වැලැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතා රාමුවේ කොටසක් ලෙස සැලකිය යුතු වේ.

මෙයට විශ්වාසී,
අධ්‍යක්ෂ
මූල්‍ය බුද්ධි ඒකකය

පිටපත්: සියලුම බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්හි අනුකූලතා නිලධාරීන්
අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ
අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ

**FIU/UNSCR-1373/විධාන අංක.01**

## ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සහ මැඩපැවැත්වීම වාර්තා කරන ආයතනයන්හි වගකීම්

1373 (2001) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුතිවල 1 වැනි ඡේදයෙහි (ඇ) සහ (ඈ) පරිච්ඡේදයන් ශ්‍රී ලංකාව ඇතුළත ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලැස්වීම ද, ඉහත කී එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුතිවලට අනුකූලව ක්‍රියා කිරීමේ ක්‍රමවේදයක් නිශ්චිතව දැක්වීම ද අරමුණු කරගත්, 2012 මැයි 15 දිනැති අංක.1758/19 දරන අති විශේෂ ගැසට් නිවේදනයෙහි පළ වූ, 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝගවලට වැඩිමනක් ලෙස:

1. 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝගයන්හි (පිටපතක් අමුණා ඇත) සඳහන් ක්‍රියාවලීන් දැඩිව අනුගමනය කිරීමටත්, අනුකූලතාවය තහවුරු කිරීමටත් බැංකු/මුදල් සමාගම්වලට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

2. නම් කරන ලද තැනැත්තන් සහ ආයතනයන්හි ලැයිස්තුව (ඉහත කී නියෝගයන්හි 4(2) පරිච්ඡේදයේ ලැයිස්තුව ලෙස සඳහන්), 2014 මාර්තු 21 දිනැති අංක.1854/41 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇත. ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට අදාළ සැක සහිත අවස්ථා විධිමත්ව හඳුනා ගැනීම සඳහා, නම් කරන ලද ලැයිස්තුවේ සඳහන් තැනැත්තන්/ආයතනවල නම් සහ වෙනත් විස්තර ඇතුළත් දත්ත ගබඩාවක්, බැංකු/මුදල් සමාගම් විසින් පවත්වාගෙන යා යුතු වේ.

3. ඉහත කී දත්ත ගබඩාවේ සඳහන් තොරතුරු යාවත්කාලීනව සහ අදාළව පවත්වාගෙන යා යුතු අතර නම් කරන ලද තැනැත්තන් සහ ආයතනවල අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් පහසුවෙන් හඳුනා ගත හැකි වන පරිදි ප්‍රධාන කාර්යාලයේ, ශාඛාවල සහ පරිපාලිත සමාගම්වල සේවක මණ්ඩලයට පහසුවෙන් පරිශීලනය කළ හැකි වන සේ පවත්වාගෙන යා යුතු වේ.

4. නම් කරන ලද තැනැත්තන් සහ ආයතනයන්හි ලැයිස්තුවට සිදු කරන යම් කිසි සංශෝධනයක් නිසි බලධරයා විසින් ගැසට් පත්‍රයේ පල කළ සැනින්, එම සංශෝධන මූල්‍ය බුද්ධි ඒකකය විසින් බැංකු/මුදල් සමාගම්වල සියලුම අනුකූලතා නිලධාරීන් වෙත විද්‍යුත් තැපැල ඔස්සේ බෙදා හරිනු ඇත.

5. එවැනි දැනුම්දීමක් මූල්‍ය බුද්ධි ඒකකයෙන් ලද වහාම බැංකු/මුදල් සමාගම් විසින්, ඉහත 2 වන ඡේදයේ සඳහන් පරිදි පවත්වාගෙන යන නම් කරන ලද තැනැත්තන්ගේ/ආයතනවල තොරතුරු ඇතුළත් දත්ත ගබඩාව යාවත්කාලීන කිරීමට පියවර ගත යුතුය.

6. නව ව්‍යාපාරික සබඳතා ඇරඹීමට පෙර යෝජිත ගනුදෙනුකරුවන්ගේ නම් ඉහත කී ලැයිස්තුවේ සඳහන්ව නොමැති බවට බැංකු/මුදල් සමාගම් තහවුරු කර ගත යුතු බවට මෙයින් උපදෙස් දෙනු ලැබේ. තවද ලැයිස්තුවේ සඳහන් නම් කරන ලද ආයතන හෝ තැනැත්තන් සමග ව්‍යාපාරික සබඳතා නොපවත්වන බවට තහවුරු කර ගැනීම සඳහා බැංකු/මුදල් සමාගම් විසින් දැනටමත් පවත්නා සියලුම ව්‍යාපාරික සබඳතා නැවත වරක් පරීක්ෂා කර බැලිය යුතු වේ.

7. නම් කරන ලද තැනැත්තන්ගේ/ආයතනයන්හි විස්තර සමග යම් ගනුදෙනුකරුවෙකුගේ විස්තර සැසඳුන අවස්ථාවක බැංකු/මුදල් සමාගම් විසින් වහාම, 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝගයන්හි 5 වන පරිච්ඡේදය ප්‍රකාරව සහ නිසි බලධරයා මගින් 2014 මැයි 22 දින ප්‍රකාශයට පත් කරන ලද අංක.1863/25 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව, නම් කරන ලද තැනැත්තන්ගේ සියලුම ගනුදෙනු වැලැක්විය යුතු අතර සියලුම අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් ක්‍රියාවිරහිත කළ යුතු වේ.

8. යම් අවස්ථාවක පුද්ගලයෙකුගේ හෝ ආයතනයක නමක් ලැයිස්තුවෙන් ඉවත් කළ විට බැංකු/මුදල් සමාගම් විසින් ඉහත 7 වන පරිච්ඡේදය ප්‍රකාරව සිදු කරනු ලැබූ ක්‍රියාවිරහිතවීම් ඉවත් කළ යුතු අතර සාමාන්‍ය පරිදි ගනුදෙනු කරගෙන යාමට අවස්ථාව ලබාදිය යුතුය.

9. නම් කරන ලද තැනැත්තන් සහ ආයතනවල අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් ක්‍රියාවිරහිත කළ විට හෝ ක්‍රියාවිරහිතවීම් ඉවත් කළ විට හෝ නම් කරන ලද තැනැත්තන් හෝ ආයතන විසින් හෝ වෙනුවෙන් ගනුදෙනු කිරීමට තැත් කළ අවස්ථාවක, බැංකු/මුදල් සමාගම් විසින් අදාළ ගනුදෙනුකරු අදාළ බැංකුවේ/මුදල් සමාගමේ පොත්පත්වල පවත්වාගෙන යනු ලබන සියලුම අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත්වල සම්පූර්ණ විස්තර, අදාළ ගනුදෙනුකරු හඳුනාගත් අවස්ථාවේ සිට පැය 24 ක් ඇතුළත, හැකි ඉක්මනින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත ෆැක්ස් අංක 011-2477692 හෝ 011-2477722 ඔස්සේ සහ දුරකථන අංක 011-2477125 ඔස්සේ දැන්විය යුතු වේ. මෙම විස්තර තැපැල්/ෆැක්ස් මාර්ගවලට අමතරව විද්‍යුත් තැපැල ඔස්සේ fiu@cbsl.lk වෙත දැනුම් දිය යුතු වේ.

10. ඉහත සඳහන් තොරතුරු, බැංකු/මුදල් සමාගම් විසින් නිසි බලධරයා වෙත ද (නිසි බලධාරී කාර්යාලය, ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය, අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03) දැන්විය යුතු වේ. මෙම විස්තර තැපැල් මාර්ගයට අමතරව අනිවාර්යයෙන්ම විද්‍යුත් තැපැල ඔස්සේ camod@defence.lk වෙත ද දැනුම් දිය යුතු වේ.

11. බැංකු/මුදල් සමාගම් 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝගයන්හි විධිවිධාන අදාළ සේවක මණ්ඩලයන්හි අවධානයට යොමු කළ යුතු බවට සහ දැඩි අනුකූලතාවය සහතික කළ යුතු බවට මෙයින් උපදෙස් දෙනු ලැබේ. 1373 (2001) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුතිය සහ පසුව සිදු කරන ලද හෝ අනාගතයේ දී සිදු කෙරෙන සියලුම යෝජනා සම්මුති ක්‍රියාවට නැංවීමට අදාළ ලිඛිත අභ්‍යන්තර ක්‍රියාපටිපාටීන් සහ පද්ධතීන් ස්ථාපනය කර පවත්වාගෙන යාමට අනුකූලතා නිලධාරීන් වගබලාගත යුතු වේ.

**චක්‍රලේඛ අංකය : 03/14** 2014 ජූලි 07

වෙත: සියලුම රක්ෂණ සමාගම් හි ප්‍රධාන විධායක නිලධාරීන්

ප්‍රිය මහත්මයාණෙනි/මහත්මියනි,

## ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සහ මැඩපැවැත්වීම රක්ෂණ සමාගම් හි වගකීම්

මූල්‍ය කටයුතු කාර්ය සාධන බලකායේ (FATF) 2012 පෙබරවාරි මස සිට බලපවත්නා පරිදි සංශෝධිත 6 වෙනි නිර්දේශය, විදේශ කටයුතු අමාත්‍යවරයා නිකුත් කරන ලද 2012 මැයි 15 දිනැති අංක.1758/19 දරන අති විශේෂ ගැසට් නිවේදනය සහ ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා (එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුතිය 1373 සඳහා නිසි බලධරයා) විසින් නිකුත් කරන ලද 2014 මාර්තු 21 දිනැති අංක. 1854/41 දරන අති විශේෂ ගැසට් නිවේදනය සහ 2014 මැයි 22 දිනැති අංක. 1863/25 දරන අති විශේෂ ගැසට් නිවේදනය වෙත සියලුම රක්ෂණ සමාගම් හි අවධානය මෙයින් යොමු කෙරේ.

1) ඒ අනුව, නම් කරන ලද තැනැත්තන්ගේ සහ ආයතනවල අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් වහාම ක්‍රියාවිරහිත කිරීමේ සහ, එවැනි අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් නම් කරන ලද තැනැත්තන් හෝ ආයතන හෝ ඔවුන්ගේ /ඒවායේ ප්‍රතිලාභීන්

වෙත හෝ ප්‍රයෝජනය සඳහා හෝ ලබා නොදීමේ අවශ්‍යතා රාජ්‍යයන් වෙත පැවරෙන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුතිය (UNSCR) 1373 (2001) සහ පසුව කරන ලද යෝජනා සම්මුතිවලට අනුකූල වන සේ අංක 1758/19 දරන ගැසට් නිවේදනයෙහි සඳහන් ඉලක්කගත මූල්‍ය සම්බාධක ක්‍රියාවට නැංවීමට ශ්‍රී ලංකාව බැඳී සිටී. ඒ අනුව, මූලික වශයෙන් අති විශේෂ ගැසට් නිවේදන අංක. 1854/41 සහ පසුව වෙනත් ගැසට් නිවේදන මගින් නිසි බලධරයා විසින් සංශෝධනය කරන ලද එවැනි නම් කරන ලද තැනැත්තන්ගේ සහ ආයතනයන්හි අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් වහාම ක්‍රියාවිරහිත කිරීමට අවශ්‍ය ක්‍රියාවලීන් පවත්වා ගෙන යාමට සියලුම රක්ෂණ සමාගම් බැඳී සිටී.

2) 2014 මැයි 22 දිනැති අංක.1863/25 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගය අනුව, 2014 මාර්තු 21 දිනැති අංක.1854/41 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් නම් කරන ලද සහ ප්‍රකාශයට පත් කරන ලද ඕනෑම ස්වභාවික හෝ නෛතික පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් හෝ ආයතනයක් සතු සියලු අරමුදල් වෙනත් මූල්‍යමය වත්කම් සහ ආර්ථික සම්පත් අත්හිටුවීම නිසි බලධරයා විසින් සිදුකර ඇත.

3) ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට අදාළ ඉලක්කගත මූල්‍ය සම්බාධකවලට අනුකූල වීමේ සියලුම රක්ෂණ සමාගම් හි වගකීම් සම්බන්ධ වැඩි විස්තර සඳහා කරුණාකර මේ සමග අමුණා ඇති FIU/UNSCR-1373/විධාන අංක.02 බලන්න. මෙම විධාන රක්ෂණ සමාගම්හි පවත්නා මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතා රාමුවේ කොටසක් ලෙස සැලකිය යුතු වේ.

මෙයට විශ්වාසී,
අධ්‍යක්ෂ
මූල්‍ය බුද්ධි ඒකකය

පිටපත්: සියලුම රක්ෂණ සමාගම්හි අනුකූලතා නිලධාරීන්
අධ්‍යක්ෂ ජෙනරාල්, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

**FIU/UNSCR-1373/විධාන අංක.02**

## ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සහ මැඩපැවැත්වීම රක්ෂණ සමාගම් හි වගකීම්

1373 (2001) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුතිවල 1 වැනි ඡේදයෙහි (ඇ) සහ (ඈ) පරිච්ඡේදයන් ශ්‍රී ලංකාව ඇතුළත ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලැස්වීම ද, ඉහත කී එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුතිවලට අනුකූලව ක්‍රියා කිරීමේ ක්‍රමවේදයක් නිශ්චිතව දැක්වීම ද අරමුණු කරගත්, 2012 මැයි 15 දිනැති අංක.1758/19 දරන අති විශේෂ ගැසට් නිවේදනයෙහි පළ වූ, 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝගවලට වැඩිමනක් ලෙස:

1. 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝගයන්හි (පිටපතක් අමුණා ඇත) සඳහන් ක්‍රියාවලීන් දැඩිව අනුගමනය කිරීමටත්, අනුකූලතාවය තහවුරු කිරීමටත් රක්ෂණ සමාගම්වලට මෙයින් උපදෙස් දෙනු ලැබේ.
2. නම් කරන ලද තැනැත්තන් සහ ආයතනයන්හි ලැයිස්තුව (ඉහත කී නියෝගයන්හි 4(2) පරිච්ඡේදයේ ලැයිස්තුව ලෙස සඳහන්), 2014 මාර්තු 21 දිනැති අංක.1854/41 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇත. ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට අදාළ සැක සහිත අවස්ථා විධිමත්ව හඳුනා ගැනීම සඳහා, නම් කරන ලද ලැයිස්තුවේ සඳහන් තැනැත්තන්/ආයතනවල නම් සහ වෙනත් විස්තර ඇතුළත් දත්ත ගබඩාවක්, රක්ෂණ සමාගම් විසින් පවත්වාගෙන යා යුතු වේ.
3. රක්ෂණ සමාගම් විසින් ඉහත කී දත්ත ගබඩාවේ සඳහන් තොරතුරු යාවත්කාලීනව සහ අදාළව පවත්වාගෙන යා යුතු අතර නම් කරන ලද තැනැත්තන් සහ ආයතනවල අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් පහසුවෙන් හඳුනා ගත හැකි වන පරිදි ප්‍රධාන කාර්යාලයේ, ශාඛාවල සහ පරිපාලිත සමාගම්වල සේවක මණ්ඩලයට පහසුවෙන් පරිශීලනය කළ හැකි වන සේ පවත්වාගෙන යා යුතු වේ.
4. නම් කරන ලද තැනැත්තන් සහ ආයතනයන්හි ලැයිස්තුවට සිදු කරන යම් කිසි සංශෝධනයක් නිසි බලධරයා විසින් ගැසට් පත්‍රයේ පල කළ සැනින්, එම සංශෝධන මූල්‍ය බුද්ධි ඒකකය විසින් රක්ෂණ සමාගම්වල සියලුම අනුකූලතා නිලධාරීන් වෙත විද්‍යුත් තැපැල ඔස්සේ බෙදා හරිනු ඇත.
5. එවැනි දැනුම්දීමක් මූල්‍ය බුද්ධි ඒකකයෙන් ලද වහාම රක්ෂණ සමාගම් විසින්, ඉහත 2 වන ඡේදයේ සඳහන් පරිදි පවත්වාගෙන යන නම් කරන ලද තැනැත්තන්ගේ/ආයතනවල තොරතුරු ඇතුළත් දත්ත ගබඩාව යාවත්කාලීන කිරීමට පියවර ගත යුතුය.
6. නව ව්‍යාපාරික සබඳතා ඇරඹීමට පෙර යෝජිත ගනුදෙනුකරුවන්ගේ නම් ඉහත කී ලැයිස්තුවේ සඳහන්ව නොමැති බවට රක්ෂණ සමාගම් තහවුරු කර ගත යුතු බවට මෙයින් උපදෙස් දෙනු ලැබේ. තවද ලැයිස්තුවේ සඳහන් නම් කරන ලද ආයතන හෝ තැනැත්තන් සමග ව්‍යාපාරික සබඳතා නොපවත්වන බවට තහවුරු කර ගැනීම සඳහා බැංකු/මුදල් සමාගම් විසින් දැනටමත් පවත්නා සියලුම ව්‍යාපාරික සබඳතා නැවත වරක් පරීක්ෂා කර බැලිය යුතු වේ.
7. නම් කරන ලද තැනැත්තන්ගේ/ආයතනයන්හි විස්තර සමග යම් ගනුදෙනුකරුවෙකුගේ විස්තර සැසඳුන අවස්ථාවක රක්ෂණ සමාගම් විසින් වහාම, 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝගයන්හි 5 වන පරිච්ඡේදය ප්‍රකාරව සහ නිසි බලධරයා මගින් 2014 මැයි 22 දින ප්‍රකාශයට පත් කරන ලද අංක.1863/25 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව, නම් කරන ලද තැනැත්තන්ගේ සියලුම ගනුදෙනු වැළැක්විය යුතු අතර සියලුම අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් ක්‍රියාවිරහිත කළ යුතු වේ.
8. යම් අවස්ථාවක පුද්ගලයෙකුගේ හෝ ආයතනයක නමක් ලැයිස්තුවෙන් ඉවත් කළ විට රක්ෂණ සමාගම් විසින් ඉහත 7 වන පරිච්ඡේදය ප්‍රකාරව සිදු කරනු ලැබූ ක්‍රියාවිරහිතවීම් ඉවත් කළ යුතු අතර සාමාන්‍ය පරිදි ගනුදෙනු කරගෙන යාමට අවස්ථාව ලබාදිය යුතුය.

9. නම් කරන ලද තැනැත්තන් සහ ආයතනවල අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් ක්‍රියාවිරහිත කළ විට හෝ ක්‍රියාවිරහිතවීම් ඉවත් කළ විට හෝ නම් කරන ලද තැනැත්තන් හෝ ආයතන විසින් හෝ වෙනුවෙන් ගනුදෙනු කිරීමට තැත් කළ අවස්ථාවක, රක්ෂණ සමාගම් විසින් අදාළ ගනුදෙනුකරු අදාළ රක්ෂණ සමාගමේ පොත්පත්වල පවත්වාගෙන යනු ලබන සියලුම අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත්වල සම්පූර්ණ විස්තර, අදාළ ගනුදෙනුකරු හඳුනාගත් අවස්ථාවේ සිට පැය 24 ක් ඇතුළත, හැකි ඉක්මනින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත ෆැක්ස් අංක 011-2477692 හෝ 011-2477722 ඔස්සේ සහ දුරකථන අංක 011-2477125 ඔස්සේ දැන්විය යුතු වේ. මෙම විස්තර තැපැල්/ෆැක්ස් මාර්ගවලට අමතරව විද්‍යුත් තැපැල ඔස්සේ fiu@cbsl.lk වෙත ද දැනුම් දිය යුතු වේ.

10. ඉහත සඳහන් තොරතුරු, රක්ෂණ සමාගම් විසින් නිසි බලධරයා වෙත ද (නිසි බලධාරී කාර්යාලය, ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය, අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03) දැන්විය යුතු වේ. මෙම විස්තර තැපැල් මාර්ගයට අමතරව අනිවාර්යයෙන්ම විද්‍යුත් තැපැල ඔස්සේ camod@defence.lk වෙත ද දැනුම් දිය යුතු වේ.

11. රක්ෂණ සමාගම් 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝගයන්හි විධිවිධාන අදාළ සේවක මණ්ඩලයන්හි අවධානයට යොමු කළ යුතු බවට සහ දැඩි අනුකූලතාවය සහතික කළ යුතු බවට මෙයින් උපදෙස් දෙනු ලැබේ. 1373 (2001) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුතිය සහ පසුව සිදු කරන ලද හෝ අනාගතයේ දී සිදු කෙරෙන සියලුම යෝජනා සම්මුති ක්‍රියාවට නැංවීමට අදාළ ලිඛිත අභ්‍යන්තර ක්‍රියාපටිපාටීන් සහ පද්ධතීන් ස්ථාපනය කර පවත්වාගෙන යාමට අනුකූලතා නිලධාරීන් වගබලාගත යුතු වේ.

**චක්‍රලේඛ අංකය : 04/14** 2014 ජූලි 07

වෙත: සියලුම කොටස් තැරැව්කාර ආයතනයන්හි ප්‍රධාන විධායක නිලධාරීන්

ප්‍රිය මහත්මයාණෙනි/මහත්මියනි,

## ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සහ මැඩපැවැත්වීම කොටස් තැරැව්කාර ආයතනයන්හි වගකීම්

මූල්‍ය කටයුතු කාර්ය සාධන බලකායේ (FATF) 2012 පෙබරවාරි මස සිට බලපවත්නා පරිදි සංශෝධිත 6 වෙනි නිර්දේශය, විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද 2012 මැයි 15 දිනැති අංක.1758/19 දරන අති විශේෂ ගැසට් නිවේදනය සහ ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා (එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුතිය 1373 සඳහා නිසි බලධරයා) විසින් නිකුත් කරන ලද 2014 මාර්තු 21 දිනැති අංක 1854/41 දරන අති විශේෂ ගැසට් නිවේදනය සහ 2014 මැයි 22 දිනැති අංක.1863/25 දරන අති විශේෂ ගැසට් නිවේදනය වෙත සියලුම කොටස් තැරැව්කාර ආයතනයන්හි අවධානය මෙයින් යොමු කෙරේ.

1) ඒ අනුව, නම් කරන ලද තැනැත්තන්ගේ සහ ආයතනවල අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් වහාම ක්‍රියාවිරහිත කිරීමේ, සහ එවැනි අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් නම් කරන ලද තැනැත්තන් හෝ ආයතන හෝ ඔවුන්ගේ/ඒවායේ ප්‍රතිලාභීන් වෙත හෝ ප්‍රයෝජනය සඳහා හෝ ලබා නොදීමේ අවශ්‍යතා රාජ්‍යයන් වෙත පැවරෙන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුතිය (UNSCR) 1373(2001) සහ පසුව කරන ලද යෝජනා සම්මුතිවලට අනුකූල වන සේ අංක.1758/19 ගැසට් නිවේදනයෙහි සඳහන් ඉලක්කගත මූල්‍ය සම්බාධක ක්‍රියාවට නැංවීමට ශ්‍රී ලංකාව බැඳී සිටී. ඒ අනුව, මූලික වශයෙන් අති විශේෂ ගැසට් නිවේදන අංක. 1854/41 සහ පසුව වෙනත් ගැසට් නිවේදන මගින් නිසි බලධරයා විසින් සංශෝධනය කරන ලද එවැනි නම් කරන ලද තැනැත්තන්ගේ සහ ආයතනයන්හි අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් වහාම ක්‍රියාවිරහිත කිරීමට අවශ්‍ය ක්‍රියාවලීන් පවත්වාගෙන යාමට සියලුම කොටස් තැරැව්කාර ආයතනයන් බැඳී සිටී.

2) 2014 මැයි 22 දිනැති අංක.1863/25 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගය අනුව, 2014 මාර්තු 21 දිනැති අංක. 1854/41 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් නම් කරන ලද සහ ප්‍රකාශයට පත් කරන ලද ඕනෑම ස්වභාවික හෝ නෛතික පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් හෝ ආයතනයක් සතු සියලු අරමුදල් වෙනත් මූල්‍යමය වත්කම් සහ ආර්ථික සම්පත් අත්හිටුවීම නිසි බලධරයා විසින් සිදු කර ඇත.

3) ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට අදාළ ඉලක්කගත මූල්‍ය සම්බාධකවලට අනුකූල වීමේ සියලුම කොටස් තැරැව්කාර ආයතනයන් හි වගකීම් සම්බන්ධ වැඩි විස්තර සඳහා කරුණාකර මේ සමග අමුණා ඇති FIU/UNSCR-1373/විධාන අංක.03 බලන්න. මෙම විධාන කොටස් තැරැව්කාර ආයතනයන්හි පවත්නා මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතා රාමුවේ කොටසක් ලෙස සැලකිය යුතු වේ.

මෙයට - විශ්වාසී,
**අධ්‍යක්ෂ**
**මූල්‍ය බුද්ධි ඒකකය**

පිටපත්: සියලුම කොටස් තැරැව්කාර ආයතනයන්හි අනුකූලතා නිලධාරීන්
අධ්‍යක්ෂ ජෙනරාල්, ශ්‍රී ලංකා විනිමයපත් හා සුරැකුම් කොමිෂන් සභාව
අධ්‍යක්ෂ ජෙනරාල්, කොළඹ කොටස් හුවමාරුව

**FIU/UNSCR-1373/විධාන අංක.03**

## ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සහ මැඩපැවැත්වීම කොටස් තැරැව්කාර ආයතනයන්හි වගකීම්

1373 (2001) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුතිවල 1 වැනි ඡේදයෙහි (ඇ) සහ (ඈ) පරිච්ඡේදයන් ශ්‍රී ලංකාව ඇතුළත ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලැස්වීම ද ඉහත කී එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුතිවලට අනුකූලව ක්‍රියා කිරීමේ ක්‍රමවේදයක් නිශ්චිතව දැක්වීම ද අරමුණු කරගත්, 2012 මැයි 15 දිනැති අංක. 1758/19 දරන අති විශේෂ ගැසට් නිවේදනයෙහි පළ වූ, 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝගවලට වැඩිමනක් ලෙස;

1. 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝගයන්හි (පිටපතක් අමුණා ඇත) සඳහන් ක්‍රියාවලීන් දැඩිව අනුගමනය කිරීමටත්, අනුකූලතාවය තහවුරු කිරීමටත් කොටස් තැරැව්කාර ආයතනයන්වලට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

2. නම් කරන ලද තැනැත්තන් සහ ආයතනයන්හි ලැයිස්තුව (ඉහත කී නියෝගයන්හි 4(2) පරිච්ඡේදයේ ලැයිස්තුව ලෙස සඳහන්), 2014 මාර්තු 21 දිනැති අංක. 1854/41 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇත. ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට අදාළ සැක සහිත අවස්ථා විධිමත්ව හඳුනා ගැනීම සඳහා, නම් කරන ලද ලැයිස්තුවේ සඳහන් තැනැත්තන්/ආයතනවල නම් සහ වෙනත් විස්තර ඇතුළත් දත්ත ගබඩාවක්, කොටස් තැරැව්කාර ආයතන විසින් පවත්වා ගෙන යා යුතු වේ.

3. කොටස් තැරැව්කාර ආයතන විසින් ඉහත කී දත්ත ගබඩාවේ සඳහන් තොරතුරු යාවත්කාලීනව සහ අදාළව පවත්වාගෙන යා යුතු අතර, නම් කරන ලද තැනැත්තන් සහ ආයතනවල අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් පහසුවෙන් හඳුනා ගත හැකි වන පරිදි ප්‍රධාන කාර්යාලයේ, ශාඛාවල සහ පරිපාලිත සමාගම්වල සේවක මණ්ඩලයට පහසුවෙන් පරිශීලනය කළ හැකි වන සේ පවත්වාගෙන යා යුතු වේ.

4. නම් කරන ලද තැනැත්තන් සහ ආයතනයන්හි ලැයිස්තුවට සිදු කරන යම්කිසි සංශෝධනයක් නිසි බලධරයා විසින් ගැසට් පත්‍රයේ පළ කළ සැනින්, එම සංශෝධන මූල්‍ය බුද්ධි ඒකකය විසින් කොටස් තැරැව්කාර ආයතනවල සියලුම අනුකූලතා නිලධාරීන් වෙත විද්‍යුත් තැපැල ඔස්සේ බෙදාහරිනු ඇත.

5. එවැනි දැනුම් දීමක් මූල්‍ය බුද්ධි ඒකකයෙන් ලද වහාම කොටස් තැරැව්කාර ආයතනයන් විසින්, ඉහත 2 වන ඡේදයේ සඳහන් පරිදි, පවත්වාගෙන යන නම් කරන ලද තැනැත්තන්ගේ/ආයතනවල තොරතුරු ඇතුළත් දත්ත ගබඩාව යාවත්කාලීන කිරීමට පියවර ගත යුතුය.

6. නව ව්‍යාපාරික සබඳතා ඇරඹීමට පෙර යෝජිත ගනුදෙනුකරුවන්ගේ නම් ඉහත කී ලැයිස්තුවේ සඳහන්ව නොමැති බවට කොටස් තැරැව්කාර ආයතන තහවුරු කර ගත යුතු බවට මෙයින් උපදෙස් දෙනු ලැබේ. තවද, ලැයිස්තුවේ සඳහන් නම් කරන ලද ආයතන හෝ තැනැත්තන් සමග ව්‍යාපාරික සබඳතා නොපවත්වන බවට තහවුරු කර ගැනීම සඳහා කොටස් තැරැව්කාර ආයතන විසින් දැනටමත් පවත්නා සියලුම ව්‍යාපාරික සබඳතා නැවත වරක් පරීක්ෂා කර බැලිය යුතු වේ.

7. නම් කරන ලද තැනැත්තන්ගේ සහ ආයතනයන්හි විස්තර සමග යම් ගනුදෙනුකරුවෙකුගේ විස්තර සැසඳුන අවස්ථාවක කොටස් තැරැව්කාර ආයතනයන් විසින් වහාම, 2012 අංක 1 කරන එක්සත් ජාතීන්ගේ නියෝගයන්හි 5 වන පරිච්ඡේදය ප්‍රකාරව සහ නිසි බලධරයා මගින් 2014 මැයි 22 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 1863/25 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව, නම් කරන ලද තැනැත්තන්ගේ සියලුම ගනුදෙනු වැළැක්විය යුතු අතර සියලුම අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් ක්‍රියාවිරහිත කළ යුතු වේ.

8. යම් අවස්ථාවක පුද්ගලයෙකුගේ හෝ ආයතනයක නමක් ලැයිස්තුවෙන් ඉවත් කළ විට කොටස් තැරැව්කාර ආයතන විසින් ඉහත 7 වන පරිච්ඡේදය ප්‍රකාරව සිදු කරනු ලැබූ ක්‍රියාවිරහිතවීම් ඉවත් කළ යුතු අතර සාමාන්‍ය පරිදි ගනුදෙනු කරගෙන යාමට අවස්ථාව ලබා දිය යුතුය.

9. නම් කරන ලද තැනැත්තන් සහ ආයතනවල අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් ක්‍රියාවිරහිත කළවිට හෝ ක්‍රියාවිරහිතවීම් ඉවත් කළ විට හෝ නම් කරන ලද තැනැත්තන් හෝ ආයතන විසින් හෝ වෙනුවෙන් ගනුදෙනු කිරීමට තැත් කළ අවස්ථාවක, කොටස් තැරැව්කාර ආයතන විසින් අදාළ ගනුදෙනුකරු අදාළ කොටස් තැරැව්කාර ආයතනයේ පොත්පත්වල පවත්වාගෙන යනු ලබන සියලුම අරමුදල්, මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත්වල සම්පූර්ණ විස්තර, අදාළ ගනුදෙනුකරු හඳුනාගත් අවස්ථාවේ සිට පැය 24 ක් ඇතුළත, හැකි ඉක්මනින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත ෆැක්ස් අංක 011-2477692 හෝ 011-2477722 ඔස්සේ සහ දුරකථන අංක 011-2477125 ඔස්සේ දැන්විය යුතු වේ. මෙම විස්තර තැපැල්/ෆැක්ස් මාර්ගවලට අමතරව විද්‍යුත් තැපැල ඔස්සේ fiu@cbsl.lk වෙත ද දැනුම් දිය යුතු වේ.

10. ඉහත සඳහන් තොරතුරු, කොටස් තැරැව්කාර ආයතන විසින් නිසි බලධරයා වෙත ද (නිසි බලධාරී කාර්යාලය, ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය, අංක 15/5, බාලදක්ෂ මාවත, කොළඹ 03) දැන්විය යුතු වේ. මෙම විස්තර තැපැල් මාර්ගයට අමතරව අනිවාර්යයෙන්ම විද්‍යුත් තැපැල ඔස්සේ camod@defence.lk වෙත ද දැනුම් දිය යුතු වේ.

11. කොටස් තැරැව්කාර ආයතන 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝගයන්හි විධිවිධාන අදාළ අදාළ සේවක මණ්ඩලයන්හි අවධානයට යොමු කළ යුතු බවට සහ දැඩි අනුකූලතාවය සහතික කළ යුතු බවට මෙයින් උපදෙස් දෙනු ලැබේ. 1373 (2001) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා සම්මුතිය සහ පසුව සිදු කරන ලද හෝ අනාගතයේ දී සිදු කෙරෙන සියලුම යෝජනා සම්මුති ක්‍රියාවට නැංවීමට අදාළ ලිඛිත අභ්‍යන්තර ක්‍රියාපටිපාටීන් සහ පද්ධතීන් ස්ථාපනය කර පවත්වාගෙන යාමට අනුකූලතා නිලධාරීන් වගබලා ගත යුතු වේ.

**චක්‍රලේඛ අංකය : 05/14** 2014 නොවැම්බර් 27

වෙත: සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්

ප්‍රිය මහත්මයාණෙනි/මහත්මියනි,

## විදේශ ආමුඛ ප්‍රේෂණ වාර්තා කිරීම

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15 වන ඡේදය අනුව, එ.ජ.ඩොලර් 25,000 ට වඩා වැඩි හෝ ඊට සමාන හෝ වෙනත් විදේශ මුදල් වර්ගයකින් එම වටිනාකමට සමාන (එක් ගනුදෙනුවක් හෝ සතියක කාලයක් තුළ දී සිදු කරන ලද ගනුදෙනුවල එකතුව) වටිනාකමක් සහිත, තනි පුද්ගලයන් වෙත හෝ රාජ්‍ය නොවන සංවිධාන වෙත ලැබෙන සියලුම විදේශ ආමුඛ ප්‍රේෂණ, 2014 නොවැම්බර් 24 දින සිට මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කළ යුතු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම වාර්තාව අවම වශයෙන් පහත සඳහන් විස්තරවලින් සමන්විත විය යුතු අතර ඇමුණුම 1 හි දක්වා ඇති උපදෙස් අනුව ලංකාෆින් (LankaFIN) මාර්ගගත පද්ධතිය (online system) වෙත ඇතුළත් කළ යුතුය.

1. ගනුදෙනුව සිදු කළ දිනය
2. විදේශ මුදල් ප්‍රමාණය
3. එවනු ලැබූ රට
4. එවන්නාගේ විස්තර
5. ප්‍රතිලාභියාගේ විස්තර

යම්කිසි සතියක් සඳහා වන වාර්තාව ඊළඟ එළඹෙන සඳුදා දින මූල්‍ය බුද්ධි ඒකකය වෙත එවිය යුතු අතර ඒ අනුව පළමු වාර්තාව 2014 දෙසැම්බර් 01 දින එවිය යුතුය.

මෙයට - විශ්වාසී,<br>
**අතිරේක අධ්‍යක්ෂ**<br>
**මූල්‍ය බුද්ධි ඒකකය**

පිටපත්: අනුකූලතා නිලධාරීන්

ඇමුණුම I

**විදේශ ආමුඛ ප්‍රේෂණ සම්බන්ධ විද්‍යුත් මුදල් ප්‍රේෂණ (EFT) ආමුඛ වාර්තා ඉදිරිපත් කිරීම සඳහා උපදෙස්**

- එ.ජ.ඩොලර් 25,000 ට වඩා වැඩි හෝ ඊට සමාන හෝ වෙනත් ඕනෑම විදේශ මුදලකින් එම වටිනාකමට සමාන වටිනාකමක් සහිත විදේශ ආමුඛ ප්‍රේෂණ ගනුදෙනු, ලංකාෆින් හරහා වෙනමම විද්‍යුත් මුල් ප්‍රේෂණ ආමුඛ වාර්තාවක් (EFT Incoming Report) ලෙස පහත දැක්වෙන ආකෘතිය භාවිතා කරමින් වාර්තා කළ යුතුය.
  - වාර්තා කිරීමේ පටිපාටිය - විද්‍යුත් මුදල් ප්‍රේෂණ ආමුඛ වාර්තා (EFT IN) (විදේශ ආමුඛ ප්‍රේෂණයන් පමණි)
  - වාර්තා කිරීමේ වාර ගණන - සතියකට වරක් (ඊළඟට එළඹෙන සඳුදා දින)
  - ලිපිගොනු ඉදිරිපත් කිරීමේ අංකය - 10
  - ලිපිගොනු වර්ගය - Xml (එකම ලිපිගොනු පරිවර්තනය කිරීමේ ආකෘතිය අනුගමනය කරන්න)

**යොමු අංකය : 34/07/029/0001/001** 2014 පෙබරවාරි 03<br>
**චක්‍රලේඛ අංකය : RTGS/01/2014**

**ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිත්ව ආයතන වෙත,**

## ලංකාසෙට්ල් පද්ධතියේ සහභාගිකරුවකු ලෙස පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් පත් කිරීම

අංක 10, ඇල්ෆ්‍රඩ් හවුස් ගාර්ඩ්න්ස්, කොළඹ 3 දරන ස්ථානයේ පිහිටි පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් රජයේ සුරැකුම්පත් ගනුදෙනු සඳහා ප්‍රාථමික අලෙවිකරුවකු ලෙස 1923 අංක 08 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත සහ 1937 අංක 07 දරන ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥා පනත යටතේ පත්කර ඇත. එමෙන්ම 2014 පෙබරවාරි මස 05 වන දින සිට බලපැවැත්වෙන පරිදි ලංකාසෙට්ල් පද්ධතියෙහි තත්කාලීන දළ පියවීම් පද්ධතිය, නිර්ලේඛන සුරැකුම්පත් පියවීම් ක්‍රමය සහ නිර්ලේඛන සුරැකුම්පත් තැන්පතු ක්‍රමයෙහි සහභාගිකරුවෙකු ලෙස ද පත්කර ඇත.

ස්විෆ්ට් භාවිතාකරුවන් හඳුනා ගැනීමේ කේතය (BIC), තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි පියවීම් ගිණුම් අංකය සහ පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් හි විමසුම් විස්තර පහත දැක්වේ.

| | |
|---|---|
| ස්විෆ්ට් භාවිතාකරුවන් හඳුනා ගැනීමේ කේතය (BIC) | : PPTLLKLXXXX |
| තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි පියවීම් ගිණුම | : PPTLLKLXXXX0100053010 |
| **විමසුම් විස්තර** | |
| ප්‍රධාන විධායක නිලධාරි | : අර්ජුන් ඇලෝසියස් මයා |
| දුරකථන අංක | : 94-11-4523600 |
| ෆැක්ස් අංක | : 94-11-4523620 |
| ඊ මේල් | : arjun@perpetualtreasuries.com |

PPTLLKLXXXX යන ප්‍රාථමික සහභාගිකරුවන්ගේ බාහිර හඳුනාගැනීමේ අංකය භාවිතා කරමින් පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ්, 2014 පෙබරවාරි මස 05 වන දා සිට ලංකාසෙට්ල් පද්ධතියෙහි සහභාගිකරුවකු ලෙස කටයුතු කරනු ඇත.

| | |
|---|---|
| රංජනී වීරසිංහ | එන්.ඩබ්ලිව්.ජී.ආර්.ඩී.නානායක්කාර |
| **අධ්‍යක්ෂ, ගෙවීම් හා පියවීම්** | **රාජ්‍ය ණය අධිකාරී** |

යොමු අංකය : 34/07/029/0001/001 2014 පෙබරවාරි 18

චක්‍රලේඛ අංකය : **RTGS/02/2014**

ලංකාසෙටල් පද්ධතියේ සියලුම සහභාගිත්ව ආයතන වෙත,

## 2014 පෙබරවාරි මස 23 දින සජීවී පරීක්ෂණයක් පැවැත්වීම සඳහා ලංකාසෙට්ල් පද්ධතිය විවෘත කිරීම

ලංකාසෙට්ල් පද්ධතියේ (තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පද්ධතිය) මෘදුකාංගවල සිදුකරන ලද නව සංස්කරණයේ පරීක්ෂණ සජීවීව අත්හදා බැලීම සඳහා **2014 පෙබරවාරි මස 23 වන ඉරිදා** දින සීමිත කාර්යයන් වෙනුවෙන් විවෘතව තබනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ වුවද, ලංකාසෙට්ල් පද්ධතියට සම්බන්ධ අතුරු මුහුණත් (විවට වෙළඳ කටයුතු ආදී) සම්බන්ධ ගනුදෙනු පියවීම් පූර්වෝක්ත දිනයේ දී සිදුකරනු නොලැබේ.

එබැවින් ලංකාසෙට්ල් පද්ධතිය පූර්වෝක්ත දිනයේ විවෘතව තබනු ලබනුයේ මෘදුකාංගවල සිදුකරන ලද නව සංස්කරණයේ පරීක්ෂණ කටයුතු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විශේෂයෙන් නම් කරන ලද ගනුදෙනු පරීක්ෂා කිරීම සඳහා පමණක් වනු ඇත.

ඒ අනුව, පහත සඳහන් උපදෙස් අනුව කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

(1) නව සංස්කරණය සජීවී මෙහෙයුම් කටයුතු සඳහා 2014 පෙබරවාරි මස 24 දින විවෘත වනතුරු 2014 පෙබරවාරි 21 දිනට පසු දිනයක් වලංගු දිනය ලෙස යොදා <u>ඉදිරි දින සහිත</u> ස්විෆ්ට් (SWIFT) පණිවුඩ නොයැවීමට වගබලා ගත යුතුය. (2014 පෙබරවාරි මස 14 දින ගනුදෙනු සඳහා අදාළ ස්විෆ්ට් පිණිවුඩ එදිනට සාමාන්‍ය පරිදි යැවිය හැකි වේ).

(2) 2014 පෙබරවාරි 21 දිනට පසු දිනයක් වලංගු දිනය ලෙස යොදා යවන ලද ගනුදෙනු ඇත්නම් ඒවා අවලංගු කිරීමට වගබලා ගත යුතුය.

(3) 2014 පෙබරවාරි මස 23 දින සජීවී පරීක්ෂණය අවසානයේ දී ඉදිරි දාතම සහිත ගනුදෙනු පද්ධතියෙන් ඉවත් කරන හෙයින් එදින (සජීවී පරීක්ෂණ දිනය) තුළ කිසිදු ඉදිරි දාතම සහිත ගනුදෙනුවක් පද්ධතියට ඇතුළත් නොකළ යුතුය.

(4) 2014 පෙබරවාරි මස 23 දින, CBCELKLAXXX, CBCELKLSXXX සහ CBCELKLXXXX යන කේත අංක මගින් ජනනය කරනු ලබන ස්විෆ්ට් (SWIFT) පණිවුඩ සියල්ල නොසලකා හැරිය යුතුය.

ලංකාසෙට්ල් සහභාගිත්ව ආයතන සමග පැවැත්වෙන මෙම සජීවී පරීක්ෂණය <u>2014 පෙබරවාරි මස 23 වන දින පෙරවරු 9.00 සිට පෙරවරු 11.30 දක්වා</u> පැවැත්වේ.

අවශ්‍ය පරීක්ෂණ සැලැස්ම, 2014 පෙබරවාරි 21 දිනට හෝ ඊට පෙර තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතන වෙත විද්‍යුත් තැපෑලෙන් එවනු ලැබේ.

රංජනී වීරසිංහ
**අධ්‍යක්ෂ, ගෙවීම් හා පියවීම්**

යූ.එල්.මුතුගල
**අතිරේක රාජ්‍ය ණය අධිකාරි**

## 2014 අංක 01 දරන පොදු විධිවිධාන - ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් සිදු කරන ගනුදෙනු සඳහා අය කළ හැකි ගාස්තු

## 2005 අංක 28 දරන ගෙවීම් හා බේරුම් කිරීමේ පද්ධති පනත

2005 අංක 28 දරන ගෙවීම් හා බේරුම් කිරීමේ පද්ධති පනතේ 44 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු විධිවිධාන

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

2014 පෙබරවාරි මස 25 වැනි දින,
කොළඹ දී ය.

## ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් සිදු කරන ගනුදෙනු සඳහා අය කළ හැකි ගාස්තු පිළිබඳ පොදු විධිවිධාන

මෙම විධිවිධාන, 2014 අංක 01 දරන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් සිදුකරන ගනුදෙනු සඳහා අය කළ හැකි ගාස්තු පිළිබඳ පොදු විධිවිධාන ලෙස හඳුන්වනු ලබන අතර මේ මගින් 2013 අංක 02 දරන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් සිදුකරන ගනුදෙනු සඳහා අය කළ හැකි ගාස්තු පිළිබඳ පොදු විධිවිධාන ප්‍රතිස්ථාපනය කරනු ලැබේ. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ට මෙම විධිවිධාන ආදළ වන අතර 2014 පෙබරවාරි 25 වැනි දින සිට බලාත්මක වේ.

2. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් සිදුකරන ගනුදෙනු සඳහා අයකරන ගාස්තු පහත දැක්වෙන සීමාවන්වලට අනුකූල විය යුතුය.

2.1 කාඩ්පත් නිකුත් කරන්නා විසින් ගනුදෙනුකරුගෙන් අය කළ හැකි ගාස්තුව:

2.1.1 ගනුදෙනුකරුවකු, වෙනත් බැංකුවක ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් භාවිතා කර මුදල් ආපසු ගැනීමේ දී කාඩ්පත් නිකුත් කරන්නා විසින් ගනුදෙනුකරුගෙන් අයකරනු ලබන ගාස්තුව, මුදල් ආපසු ගැනීමේ එක් වාරයක් සඳහා රු. 30.00 (බදු ඇතුළුව) නොඉක්මවිය යුතුය.

2.1.2 ගනුදෙනුකරුවකු වෙනත් බැංකුවක ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් භාවිතා කර සිදු කරන ශේෂ පිරික්සුමක් සඳහා කාඩ්පත් නිකුත් කරන්නා විසින් ගනුදෙනුකරුගෙන් අය කළ හැකි ගාස්තුව රු. 7.50 (බදු ඇතුළුව) නොඉක්මවිය යුතුය.

2.2 මූල්‍ය අත්පත්කරුවකු විසින් කාඩ්පත් නිකුත් කරන්නාගෙන් අය කරනු ලබන අන්තර් හුවමාරු ගාස්තුව:

2.2.1 ගනුදෙනුකරුවකු විසින් මුදල් ආපසු ගැනීමක් සඳහා මූල්‍ය අත්පත්කරුවකු විසින් කාඩ්පත් නිකුත් කරන්නාගෙන් අයකරනු ලබන අන්තර් හුවමාරු ගාස්තුව, මුදල් ආපසු ගැනීමේ එක් වාරයක් සඳහා රු. 35.00 (බදු ඇතුළුව) නොඉක්මවිය යුතුය.

2.2.2 ගනුදෙනුකරුවකු විසින් සිදුකරනු ලබන ශේෂ පිරික්සුමක් සඳහා මූල්‍ය අත්පත්කරුවකු කාඩ්පත් නිකුත් කරන්නාගෙන් අය කරනු ලබන අන්තර් හුවමාරු ගාස්තුව රු. 10.00 (බදු ඇතුළුව) නොඉක්මවිය යුතුය.

**යොමු අංකය : 34/07/029/0001/002** 2014 මාර්තු 11

**චක්‍රලේඛ අංකය : RTGS/03/2014**

**ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිත්ව ආයතන වෙත,**

## 2014 මාර්තු මස 14 වැනි සිකුරාදා දින ලංකාසෙට්ල් පද්ධතියෙහි සජීවී මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් පරීක්ෂාවට ලක්කිරීමේ අරමුණ ඇතිව **2014 මාර්තු මස 14 වන සිකුරාදා** දින ලංකාසෙට්ල් පද්ධතියෙහි (තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ ලංකාසෙකියු පද්ධතිය) සහ අනෙකුත් අදාළ පද්ධතීන් හි මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සීබීඑස්එල් නෙට් (CBSL Net) සමග සම්බන්ධ කර ඇති ඔබ ආයතනයෙහි පෞද්ගලික පරිගණකයන් ප්‍රතිප්‍රාප්ති වැඩබිම වෙත පිවිසිය හැකි වන පරිදි සකසා ඇත. කෙසේ වෙතත්, 2014 මාර්තු මස 14 වන දිනට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මගින් එම සම්බන්ධතාවයන් පරීක්ෂා කර ගන්නා මෙන් ඉල්ලා සිටිමු. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ පහත සඳහන් නිලධාරීන් අමතා අවශ්‍ය සහාය ලබාගත හැකි වේ.

- ලසිත් ප්‍රනාන්දු මයා - 2477124 (lasith@cbsl.lk)
- රුසිරු බොරලුගොඩ මයා - 2398617 (rusiru@cbsl.lk)

රංජනී වීරසිංහ එන්.ඩබ්ලිව්.ජී.ආර්.ඩී.නානායක්කාර
**අධ්‍යක්ෂ, ගෙවීම් හා පියවීම්** **රාජ්‍ය ණය අධිකාරි**

**යොමු අංකය : 34/01/002/0044/001** 2014 අප්‍රේල් 02

**චක්‍රලේඛ අංකය : RTGS/04/2014**

**ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිත්ව ආයතන වෙත,**

## ලංකාසෙට්ල් පද්ධතියෙහි සහභාගිකරුවකු ලෙස කාගිල්ස් බෑන්ක් ලිමිටඩ් පත් කිරීම

අංක 696, ගාලු පාර, කොළඹ 3 දරන ස්ථානයේ පිහිටි **කාගිල්ස් බෑන්ක් ලිමිටඩ්** වෙත දේශීය බැංකු කටයුතු සහ අක්වෙරළ බැංකු කටයුතු පවත්වාගෙන යැම සඳහා 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත. එමෙන්ම, 1923 අංක 8 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත සහ 1937 අංක 7 දරන ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥා පනත යටතේ සෘජු සහභාගිකරුවකු සහ සෘජු අලෙවිකාර සහභාගිකරුවකු ලෙස සහ ලංකාසෙට්ල් පද්ධතියෙහි තත්කාලීන දළ පියවීම් පද්ධතිය, නිර්ලේඛන සුරැකුම්පත් පියවීම් ක්‍රමය සහ නිර්ලේඛන සුරැකුම්පත් තැන්පතු ක්‍රමයෙහි සහභාගිකරුවකු ලෙස ද කටයුතු කිරීමට එම ආයතනය පත්කර ඇත.

ස්විෆ්ට් භාවිතාකරුවන් හඳුනා ගැනීමේ කේතය (BIC), තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි පියවීම් ගිණුමේ අංකය සහ කාගිල්ස් බැන්ක් ලිමිටඩ්හි විමසුම් විස්තර පහත දක්වා ඇත.

| | |
|---|---|
| තත්කාලීන දළ පියවීම් පද්ධතියේ පියවීම් ගිණුම | : CGRBLKLXXXX0100052026 |
| ස්විෆ්ට් භාවිතාකරුවන් හඳුනාගැනීමේ කේතය (BIC) | : CGRBLKLXXXX |
| **විමසුම් විස්තර** | |
| ප්‍රධාන විධායක නිලධාරි | : ජී.එල්.එච්.ප්‍රේමරත්න මයා |
| දුරකථන අංක | : 94-11-3288116 |
| ෆැක්ස් අංක | : 94-11-2055575 |
| ඊ මේල් | : harris.p@cargillsceylon.com |

CGRBLKLXXXX යන ප්‍රාථමික සහභාගිකරුවන්ගේ බාහිර හඳුනාගැනීමේ අංකය භාවිතා කරමින් කාගිල්ස් බෑන්ක් ලිමිටඩ්, 2014 අප්‍රේල් මස 7 වන දා සිට ලංකාසෙට්ල් පද්ධතියෙහි සහභාගිකරුවකු ලෙස කටයුතු කරනු ඇත.

රංජනී වීරසිංහ එන්.ඩබ්ලිව්.ජී.ආර්.ඩී.නානායක්කාර
**අධ්‍යක්ෂ, ගෙවීම් හා පියවීම්** **රාජ්‍ය ණය අධිකාරි**

# 2014 අංක 02 දරන පොදු විධිවිධාන - විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු

# 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත

2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතේ 44 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු විධිවිධාන.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

2014 සැප්තැම්බර් මස 1 වැනි දින,
කොළඹ දී ය.

## 2014 අංක 02 දරන පොදු විධිවිධාන - විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු

2014 අංක 02 දරන විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු ලෙස හඳුන්වනු ලබන මෙම විධිවිධාන, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට සහ විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සාමාජිකයින්ට අදාළ වන අතර, 2014 සැප්තැම්බර් 1 වැනි දින සිට මෙය බලාත්මක වේ.

2. **නිර්වචන**

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම පොදු විධිවිධානයෙහි:

2.1 "විද්‍යුත් අරමුදල් පැවරීමේ පොදු යාන්ත්‍රණය" හෝ "සෙෆ්ට්ස්" යන්නෙන් රට තුළ ඇති මූල්‍ය ආයතන අතර තත්කාලීනව අරමුදල් පැවරීම සඳහා පහසුකම් සපයන සහ විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින් අතර අරමුදල් පැවරීම සහ අදාළ සාමාජිකයින් වෙත එම අරමුදල් යොමු කිරීම හා නිෂ්කාශනය කිරීම සඳහා වූ පද්ධති, ක්‍රියාවලීන් හා ක්‍රියා පටිපාටීන් ඇතුළත් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම මගින් මෙහෙයවනු ලබන විද්‍යුත් පද්ධතියක් අදහස් කරනු ලබයි.

2.2 "විද්‍යුත් අරමුදල් පැවරීමේ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්" යන්නෙන් විද්‍යුත් අරමුදල් පැවරීමේ පොදු යාන්ත්‍රණයේ ප්‍රාථමික සහ ද්විතීයික සාමාජිකයින් අදහස් වේ.

2.3 "විද්‍යුත් අරමුදල් පැවරීමේ පොදු යාන්ත්‍රණ පද්ධතිය" යන්නෙන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් විද්‍යුත් අරමුදල් පැවරීමේ පොදු යාන්ත්‍රණයේ දත්ත කිසිදු සීමා කිරීමකින් තොරව බෙදාහැරීම්, ලැබීම්, සකස් කිරීම් සහ ලේඛනාගාර ගත කිරීම් ඇතුළුව විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය සම්බන්ධයෙන් මෙහෙයවනු ලබන සහ පවත්වාගෙන යනු ලබන පද්ධති සහ ක්‍රියාවලීන් අදහස් වේ.

2.4 "නිෂ්කාශන චක්‍රය" යන්නෙන් 14:00:01 සිට පසුදා 07:00:00 දක්වා කාලය (නිෂ්කාශන චක්‍රය 1) හෝ එම දිනයේ 07:00:01 සිට 14:00:00 දක්වා කාලය (නිෂ්කාශන චක්‍රය 2) යනුවෙන් අදහස් වේ.

2.5 "ගනුදෙනුකරු" යන්නෙන් විද්‍යුත් අරමුදල් පැවරීමේ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ට ගෙවීම් නියෝග නිකුත් කිරීම හෝ ඒ සඳහා අවසර ලබාදීම සහ විද්‍යුත් අරමුදල් පැවරීමේ යාන්ත්‍රණයේ සාමාජිකයින්ට අදාළ ගිණුම් හර කිරීමට හෝ අදාළ ගෙවීම් නියෝගයෙහි මූල්‍ය වටිනාකමට සමාන වටිනාකමක් මුදලින් එම පොදු යාන්ත්‍රණයේ අදාළ සාමාජිකයින්ට ලබාදීම සිදු කරන ඕනෑම නෛතික හෝ ස්වභාවික පුද්ගලයෙකු අදහස් කරනු ලබයි.

2.6 "මෙහෙයුම් ක්‍රියාවලි අත්පොත" යන්නෙන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට සහ විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ට මඟ පෙන්වීම සඳහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව සැකසූ ක්‍රියාවලි ඇතුළත් ලේඛනය අදහස් වේ.

2.7 "ප්‍රාථමික සාමාජික" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සාමාජිකයකු වීමට අනුමැතිය දෙන ලද තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගිත්ව ආයතනයක් වන ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් අදහස් වේ.

2.8 "තත්කාලීන දළ පියවීම් පද්ධතිය" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට අයත් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙහෙයවනු ලබන පූර්ණ ස්වයංක්‍රීය ගෙවීම් පද්ධතිය අදහස් වේ.

2.9 "ද්විතීයික සාමාජික" යන්නෙන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයකු ලෙස කටයුතු කිරීමට අවසර ලබා දෙන්නා වූ සහ ප්‍රාථමික සාමාජිකයකු විසින් විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් ගනුදෙනු සිදු කිරීමටත් එම ගනුදෙනුවල ශුද්ධ ශේෂය, එම ප්‍රාථමික සාමාජිකයාගේ තත්කාලීන දළ පියවීම් ගිණුම හරහා පියවීමටත්, අනුමැතිය ලබාදෙන ඕනෑම නෛතික ඒකකයක් අදහස් වේ.

2.10 "සාමාජිකත්ව ගිවිසුම" යන්නෙන් විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ කටයුතු සම්බන්ධයෙන් එම යාන්ත්‍රණයේ සාමාජිකයකු ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සමග එළඹෙනු ලබන ගිවිසුමක් අදහස් වේ.

3. **ලංකාක්ලියර් (පුද්ගලික) සමගමේ සහ විද්‍යුත් අරමුදල් පැවරීමේ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයකුගේ වගකීම්:**

3.1 විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙක්ම සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම, විද්‍යුත් අරමුදල් පැවරීමේ පොදු යාන්ත්‍රණයේ සහභාගිත්ව හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් සාමාජිකත්ව ගිවිසුමකට එළඹිය යුතුය.

3.2 විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් නියමයන්, ක්‍රියාදාමයන් සහ වෙනත් එබඳු එකඟතාවන් ඇතුළුව කලින් කලට පනවනු ලබන විධිවිධානවලට අනුකූලව, විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙක්ම සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම ඔවුන් අතර ඇතිකරගත් අන්‍යෝන්‍ය එකඟතාවන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය.

3.3 විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙක්ම සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් ක්‍රියාවලි අත්පොතෙහි නියමයන් හා මාර්ගෝපදේශ අනුගමනය කිරීමට එකඟ විය යුතුය.

3.4 විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙක්ම සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවලට අදාළව යම් ගාස්තු අයකිරීමක් සිදු කරන්නේ නම් එකී අයකිරීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවනු ලබන සීමාවන් ඇත්නම් ඊට අනුකූලව සිදු කළ යුතුය.

4. **ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමෙහි වගකීම්:**

4.1 ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තනි ක්‍රියාකරු වේ.

4.2 ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම;

4.2.1 විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සේවා මෙහෙයුම් කටයුතු සෑම දිනකම දවස පුරාම සිදුකිරීම;

4.2.2 ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ අනුමැතිය සහිතව සුදුසුකම්ලත් ආයතන සඳහා විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ප්‍රාථමික හා ද්විතීයික සාමාජිකත්වය ලබාදීම;

4.2.3 ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ අනුමැතිය සහිතව, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් පද්ධති රීති මාලාවන් නිකුත් කළ යුතු අතර, එය ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමේ සහ විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ගේ බලතල, අයිතිවාසිකම්, යුතුකම් හා බැඳීම් මෙන්ම සාමාජිකත්වය ලබාගැනීම්, ඉවත්වීම්, අවසන් කිරීම් හා අත්හිටුවීම්, මෙහෙයුම් අවශ්‍යතාවන්, ආරවුල් විසඳීමේ ක්‍රමවේදයන්, තොරතුරුවල රහස්‍යභාවය පවත්වාගෙන යාම සඳහා වන කොන්දේසි ආදී කරුණු ද ඇතුළත් පැහැදිලි හා විස්තරාත්මක රීති මාලාවක් විය යුතුවේ. පද්ධති රීතීන්ට සංශෝධනයක් අවශ්‍ය වූ විට එම සංශෝධනයන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ අනුමැතිය සහිතව සිදුකළ යුතුය;

4.2.4 විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් සඳහා අදාළ වන විශේෂ නියමයන්, ප්‍රමිතීන්, ආරක්ෂිත ලක්ෂණ සහ විගණන අනුකූලතා යනාදිය නිර්වචනය කිරීම;

4.2.5 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද කඩඉම් වේලාවන්හි දී හෝ ඊට පෙර, සෑම සාමාජිකයකුගේම ශුද්ධ ශේෂ දක්වමින් විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් කාණ්ඩ, මහ බැංකුවට ලැබීමට සැලැස්වීම;

4.2.6 විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම්වලට අදාළ ඕනෑම සේවා සපයන්නකු සමඟ නිසි පරිදි ගිවිසුම්වලට සහ කොන්ත්‍රාත්වලට එළඹීම;

4.2.7 මෙහි 3.4 වගන්තියට යටත්ව, කලින් කලට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට සංශෝධනය කළ හැකි ඒකීය ගාස්තු සහ දඩ අය කිරීමේ ව්‍යුහයක් සකස් කිරීම;

යන කාර්යයන් සඳහා වගකිව යුතු වේ.

4.3. විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සහ අදාල කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද වාර්තා කිරීමේ අවශ්‍යතාවන්ට අනුගතව ක්‍රියා කළ යුතුය.

4.4. විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවලදී එහි සාමාජිකයින්ට හා පොදු මහජනතාවට පුහුණු කිරීමේ වැඩසටහන්, දැනුවත් කිරීම් හා අධ්‍යාපනික වැඩසටහන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් කළ යුතු ය.

5. **විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයන්ගේ වගකීම්:**

5.1 විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සමාජිකයෙක් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් මෙහෙයවනු ලබන නිෂ්කාශන පද්ධතීන්හි හැරුණු විට, ජාතික මට්ටමේ කිසිදු අන්තර්-බැංකු නිෂ්කාශන සහ පියවීම් පද්ධතියකට සම්බන්ධ වී කටයුතු නොකළ යුතුය.

5.2 විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සියළුම සාමාජිකයින්;

5.2.1 ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් සකස් කරන ලද විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පද්ධති රීතීන්වලට අනුකූල වීම;

5.2.2 ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සුමටව පවත්වාගෙන යෑමට කලින් කලට නියම කරනු ලබන තාක්ෂණික, පරිපාලනමය සහ අනෙකුත් අවශ්‍යතාවන්ට අනුකූල වීම;

5.2.3 විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් ගනුදෙනුකරුවන්ට තත්කාලීනව සිදු කරන ගනුදෙනු සම්පූර්ණ කරන ලද බව හෝ අසම්පූර්ණ බව දැන්වීම සඳහා ක්‍රියාපටිපාටියක් සහ/හෝ ක්‍රමවේදයක් ඇති කිරීම.

5.2.4 ශ්‍රී ලංකා මහ බැංකුව නියම කර ඇති පරිදි කඩඉම් වෙලාවන්හි දී විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ බහු පාර්ශවීය ශුද්ධ පියවීම් ගොනුව පියවීම සඳහා තත්කාලීන දළ පියවීම් ගිණුමෙහි ප්‍රමාණවත් අරමුදල් පවත්වාගෙන යන බවට සහතික වීම;

5.2.5 විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දත්ත ගබඩාවෙහි මෙහෙයුම් කටයුතුවලට අදාළ දත්තයන්හි උපස්ථ පිටපත් නිතිපතා සැකසීම සහ ප්‍රාථමික වැඩබිමක පද්ධති බිඳවැටීමක් හෝ දත්ත විනාශ වීමක් හෝ නැතිවීමක් හෝ සිදුවූ අවස්ථාවක දී එම දත්ත නැවත ලබාගෙන යථා තත්ත්වයට පත්විය හැකි ක්‍රමවේදයක් ස්ථාපනය කර පවත්වාගෙන යෑම;

5.2.6 දෛනික ගනුදෙනු වාර්තා සැසඳීම සහ යම් විෂමතාවක් ඇතොත් පියවීම් වාර්තාව ලැබී පැය 24 ක් ඇතුළත ඒ පිළිබඳව ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට ලිඛිතව දැන්වීම;

5.2.7 ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය සහිතව ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් නියම කරන ලද විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනු සීමාවන්වලට අනුකූලව කටයුතු කිරීම.

5.2.8 විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සහ ඊට අදාළ කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දක්වා ඇති වාර්තාමය අවශ්‍යතා සපුරාලීම.

5.2.9 විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා සිදුවන ගනුදෙනු 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත යටතේ නිකුත් කරන ලද නියෝග සහ මූල්‍ය බුද්ධි ඒකකයේ උපදෙස් ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයට වාර්තා කිරීම.

6. ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම:

6.1 විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සේවාවන් දවස පුරාම පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ එම පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින් විසින්, එම යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ඔවුන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලවල අනුමැතිය ලත් මනා ලෙස සැකසූ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමක් තබා ගත යුතුය.

6.2 මෙහෙයුම් කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ යාන්ත්‍රණයේ සාමාජිකයින් විසින් සියලු පහසුකම් සහිත ප්‍රතිප්‍රාප්ති වැඩබිමක් සහ ආපදා කළමනාකරණය හා ආපදාවන්ට ලක් වූ ව්‍යාපාර යථා තත්ත්වයට පත්කිරීම සඳහා මනාව පුහුණු වූ කණ්ඩායම් පවත්වාගත යුතුය.

6.3 විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු, හදිසි අවස්ථාවන්හි දී කිසිදු අඩාල වීමකින් තොරව පවත්වාගෙන යාම සහතික වීම සඳහා එම පද්ධතියේ ප්‍රධාන කාර්යයන් පිළිබඳව පුහුණුවක් ලද මනා නිපුණත්වයකින් යුතු විකල්ප කාර්ය මණ්ඩලයක් පවත්වාගත යුතුය.

6.4 විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ කටයුතු පවත්වාගෙන යෑමට බාධා වන සේ කිසියම් තාක්ෂණික හෝ මෙහෙයුම් දෝෂයකට මුහුණ පෑමට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට සිදු වුවහොත්, ඒ පිළිබඳව දැනුවත් වූ වහාම ඒ බව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැනුම් දිය යුතුය. නැවත යථා තත්ත්වයට පත්කිරීමට අපහසු බිඳ වැටීමක් ප්‍රාථමික වැඩබිමෙහි සිදුවුවහොත්, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් වහාම ඒ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැන්විය යුතු අතර විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට ආරම්භ කර බහු පාර්ශවීය ශුද්ධ පියවීම් දත්ත ගොනුව, එම වැඩබිමෙහි සිට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කළ යුතුය. ප්‍රාථමික හා ප්‍රතිප්‍රාප්ති යන වැඩබිම් දෙකෙහිම දිගුකාලීනව යථා තත්ත්වයට පත් කළ නොහැකි බිඳ වැටීමක් සිදු වූ අවස්ථාවක දී ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් වහාම ඒ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැන්විය යුතුය. එමෙන්ම අවසාන නිෂ්කාශන චක්‍රයේ සිට පද්ධතියෙහි බිඳ වැටීම සිදු වූ වේලාව වන තෙක් වන කාල පරිච්ඡේදයට අදාළ විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් ශේෂයන් ලබාගැනීම සඳහා විකල්ප ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු අතර එම ශේෂ වාර්තා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබාදීමට කටයුතු කළ යුතුය.

7. රහස්‍යභාවය

ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින් සියලු දත්ත, තොරතුරු සහ වාර්තාවල රහස්‍යභාවය පවත්වා ගෙන යා යුතු අතර, සෑම අවස්ථාවකදීම එම ආයතනවල නිලධාරීන්, සේවකයින්, නියෝජිතයින් සහ/හෝ ඕනෑම තනතුරක සේවයෙහි යොදවා ඇති සේවකයකු රහස්‍යභාවය ආරක්ෂා කරන බවට සහතික විය යුතුය.

8. පොදු කරුණු

8.1 ඉහත සඳහන් වගන්තියේ කරුණුවලට අමතරව සහ එකී කරුණුවල අගති විරහිතව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම්වලට අදාළ තොරතුරු ලබාදෙන ලෙස කලින් කලට සහ ඕනෑම වේලාවක ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ට නියෝග කළ හැකි අතර, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්, එවැනි තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දිය යුතුය.

8.2 මෙම විධිවිධානය ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ට අදාළ වන සහ කලින් කලට අදාළ විය හැකි ඕනෑම වෙනත් ලිඛිත නීති සහ රීති, රෙගුලාසි, නියමයන් හා කොන්දේසිවලට අතිරේක වන අතර අගතියක් වන අයුරින් නොයෙදේ.

8.3 ඉහත වගන්තියෙහි සාකල්‍යතාවයට හානි නොවන පරිදි 2005 අංක 28 දරන ගෙවීම් හා බේරුම් කිරීමේ පද්ධති පනත මගින් පනවා ඇති ඕනෑම බැඳීමක් හෝ වගකීමක් හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ නිකුත් කරන ලද හෝ දෙන ලද ඕනෑම රීතියක්, රෙගුලාසියක්, උපදෙස්, නියමයක්, නියෝගයක් මෙම විධිවිධාන මගින් සීමා කෙරෙන අයුරින් අර්ථ නිරූපනය නොකළ යුතුය.

යොමු අංකය : 34/07/029/0001/002 2014 ඔක්තෝබර් 02

චක්‍රලේඛ අංකය : **RTGS/05/2014**

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිත්ව ආයතන වෙත,

## 2014 ඔක්තෝබර් මස 06 වන දින රජයේ බැංකු නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම

ඊදුල් අල්හා (2014 ඔක්තෝබර් මස 05 දිනට යෙදී ඇති හජ්ජි උත්සවය) දිනය වෙනුවෙන්, රජය විසින් 2014 ඔක්තෝබර් මස 6 වන සඳුදා දින රජයේ සහ බැංකු නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති බැවින්, එදින ලංකාසෙට්ල් පද්ධතියේ මෙහෙයුම් කටයුතු සිදු නොකරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. 2014 ඔක්තෝබර් මස 6 වන දිනට වලංගු වනසේ කිසිම ගනුදෙනුවක්

සිදු නොකරන ලෙස සියලු සහභාගිකරුවන් වෙත දැනුම් දෙනු ලැබේ. 2014 ඔක්තෝබර් මස 6 දිනට වලංගු වනසේ දැනටමත් පද්ධතියට ඇතුළත් කරන ලද ගනුදෙනු ඇත්නම් එවන් ගනුදෙනු 2014 ඔක්තෝබර් මස 7 දිනට වලංගු වනසේ නැවතත් පද්ධතියට ඇතුළත් කළ යුතුය.

රංජනී වීරසිංහ
**අධ්‍යක්ෂ, ගෙවීම් හා පියවීම්**

යූ.එල්.මුතුගල
**වැඩ බලන රාජ්‍ය ණය අධිකාරි**

**යොමු අංකය :** 34/07/029/0001/002 — 2014 ඔක්තෝබර් 13

**චක්‍රලේඛ අංකය : RTGS/06/2014**

**ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිත්ව ආයතන වෙත,**

## අමානා බෑන්ක් ලිමිටඩ් හි නම වෙනස් කිරීම

2007 අංක 07 දරන සමාගම් ආඥා පනත යටතේ අමානා බෑන්ක් ලිමිටඩ් විසින් අමානා බෑන්ක් පීඑල්සී යනුවෙන් එහි නාමය වෙනස් කර ඇත.

ඒ අනුව, 2014 ඔක්තෝබර් මස 14 වන දින සිට ලංකාසෙට්ල් පද්ධතියෙහි ස්ථිතික දත්තවල පහත සඳහන් වෙනස්වීම් සිදු කරනු ලැබේ.

<u>සහභාගිත්ව ආයතනයේ නම</u> : අමානා බෑන්ක් පීඑල්සී

අමානා බෑන්ක් පීඑල්සී බැංකුවෙහි හිණුම් නාමය සහ ස්විෆ්ට් කේතය (SWIFT BIC) නොවෙනස්ව පවතිනු ඇත.

රංජනී වීරසිංහ
**අධ්‍යක්ෂ, ගෙවීම් හා පියවීම්**

එන්.ඩබ්ලිව්.ජී.ආර්.ඩී.නානායක්කාර
**රාජ්‍ය ණය අධිකාරි**

**යොමු අංකය :** 34/07/029/0001/002 — 2014 ඔක්තෝබර් 29

**චක්‍රලේඛ අංකය : RTGS/07/2014**

**ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිත්ව ආයතන වෙත,**

## 2014 නොවැම්බර් මස 07 වැනි සිකුරාදා දින ලංකාසෙට්ල් පද්ධතියෙහි සජීවී මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් පරීක්ෂාවට ලක්කිරීමේ අරමුණ ඇතිව **2014 නොවැම්බර් මස 07 වන සිකුරාදා** දින ලංකාසෙට්ල් පද්ධතියෙහි (තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ ලංකාසෙක්‍යු පද්ධතිය) සහ අනෙකුත් අදාළ පද්ධතීන්හි මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සීබීඑස්එල් නෙට් (CBSL Net) සමග සම්බන්ධ කර ඇති ඔබ ආයතනයෙහි පරිගණකයන් ප්‍රතිප්‍රාප්ති වැඩබිම වෙත පිවිසිය හැකි වන පරිදි සකසා ඇත. කෙසේ වෙතත්, **2014 නොවැම්බර් මස 07** වන දිනට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවෙන් එම සම්බන්ධතාවයන් පරීක්ෂා කර ගන්නා මෙන් ඉල්ලා සිටිමු. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ පහත සඳහන් නිලධාරීන් අමතා අවශ්‍ය සහාය ලබාගත හැකි වේ.

- ලසිත් ප්‍රනාන්දු මයා - 2477124 (lasith@cbsl.lk)
- රුසිරු බොරලුගොඩ මයා - 2398617 (rusiru@cbsl.lk)

රංජනී වීරසිංහ
**අධ්‍යක්ෂ, ගෙවීම් හා පියවීම්**

යූ.එල්.මුතුගල
**වැඩ බලන රාජ්‍ය ණය අධිකාරි**

මෙහෙයුම් උපදෙස් අංක : **RDD/SEPI/2009/07 / (A-02)**

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01.
2014 අප්‍රේල් 10 වැනි දින

සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත

මහත්මයාණෙනි/මහත්මියනි

## ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් සංශෝධනය

2009 සැප්තැම්බර් මස 15 වැනි දින නිකුත් කරන ලද ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් අංක: RDD/SEPI/2009/07 පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

1.2 ණය සංරචකය

1.2.2 යන ඡේදය වෙනුවට "යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය (MYASD) විසින් කෙටි කාලීන, මධ්‍ය හා දිගු කාලීන ව්‍යාපෘතිවල නියුතු හඳුනාගත් ණයකරුවන් සඳහා සහභාගිත්ව මූල්‍ය ආයතන (ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, කොමර්ෂල් බැංකුව, සෙලාන් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව සහ ඩීඑෆ්සීසී බැංකුව) මගින් ලබා දෙනු ලබන ණය මුදල් ප්‍රතිමූල්‍ය කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රුපියල් මිලියන දෙසිය පනහක රජයේ අරමුදල් භාවිතා කරනු ඇත." යන්න ආදේශ කරනු ලැබේ.

10. ණය කොන්දේසි

- ණය සඳහා වන පොලී අනුපාතිකය

සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණයකරුවන් වෙත ලබා දෙන ණය සඳහා වන වාර්ෂික පොලී අනුපාතිකය සියයට 10 සිට සියයට 9 දක්වා අඩු කිරීම

- ණයකරුවන් සඳහා වන ණය සීමාව

එක් ණය මුදලක් සඳහා වන උපරිම ණය ප්‍රමාණය රු.250,000 සිට රු.500,000 දක්වා වැඩි කිරීම

ඉහත සඳහන් සංශෝධන 2014.10.04 වැනි දින සිට ක්‍රියාත්මක වන අතර, ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමේ මූලාරම්භක ණය යෝජනා ක්‍රමයේ අනෙකුත් සියලු නියමයන් හා කොන්දේසි නොවෙනස්ව පවතී.

මෙයට - විශ්වාසී,
ඒ.එම්.ආර්.කේ. අත්තනායක
**වැඩබලන අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

2014 ජූනි 06 වැනි දින

ලංකා බැංකුව
මහජන බැංකුව
කොමර්ෂල් බැංකුව
හැටන් නැෂනල් බැංකුව
සෙලාන් බැංකුව
සම්පත් බැංකුව
ඩීඑෆ්සීසී බැංකුව
යුනියන් බැංකුව
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
ජාතික සංවර්ධන බැංකුව
සණස සංවර්ධන බැංකුව
ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව

## නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය සඳහා අදාළ මූල්‍ය පරිමාණය, පොලී අනුපාතික සහ රජයේ පොලී සහනාධාර අනුපාතිකය සංශෝධනය කිරීම

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය සඳහා අදාළ වන මූල්‍ය පරිමාණය, පොලී අනුපාතික සහ රජයේ පොලී සහනාධාර අනුපාතිකය පහත පරිදි සංශෝධනය කර ඇත.

1. **මූල්‍ය පරිමාණය**
   සංශෝධිත මූල්‍ය පරිමාණය ඇමුණුමෙහි දක්වා ඇත. 2011 සැප්තැම්බර් 23 දිනැති මෙහෙයුම් උපදෙස් අංකः RDD/NCRCS/2011 හි ඇමුණුම II, සංශෝධිත මූල්‍ය පරිමාණය අනුව වෙනස් කර ඇත.

2. **පොලී අනුපාතික**

| රජය විසින් ලබාදෙන පොලී සහනාධාරය | ණයකරුවන් වෙත පැවරෙන පොලී අනුපාතිකය | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා සඵල පොලී අනුපාතිකය |
|---|---|---|
| වාර්ෂිකව 5% | වාර්ෂිකව 7% | වාර්ෂිකව 12% |

2014 ජූනි 01 දින සිට බලපැවැත්වෙන පරිදි නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දෙන ණය සඳහා ඉහත සංශෝධන ක්‍රියාත්මක කරන ලෙස සියලු සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත දැනුම් දෙනු ලැබේ.

මෙයට - විශ්වාසී,
**අධ්‍යක්ෂ**
**ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව**

ඇමුණුම II

## නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS)
## සුදුසුකම් ලබන බෝග සඳහා සංශෝධිත මූල්‍ය පරිමාණය

| බෝගය | | | බිම් සකස් කිරීම | බීජ/පැල තවාන් හා සිටුවීම | පොහොර | රසායනික (කෘමි/ වල්/ දිලීර) | වෙනත් | මුළු පිරිවැය | උපරිම ණය සීමාව (අක්කරයට) | ඉඩම් ඒකක ප්‍රමාණය (අක්කර) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | අවම | උපරිම |
| 1 | වී | | | | | | | | | | |
| | | වාරි ජලය | 12,274 | 4,796 | 1,870 | 3,677 | 17,348 | 39,965 | 30,000 | 0.25 | 10.0 |
| | | වැසි ජලය | 13,241 | 6,844 | 2,336 | 5,290 | 15,066 | 42,777 | 32,000 | 0.25 | |
| 2 | මිරිස් | | 24,002 | 17,959 | 17,468 | 31,832 | 25,680 | 116,941 | 88,000 | 0.125 | 2.0 |
| 3 | ළූණු | | 14,089 | 74,589 | 34,727 | 15,895 | 48,010 | 187,310 | 140,000 | 0.125 | 2.0 |
| 4 | ධාන්‍ය | | | | | | | | | | |
| | | කව්පි | 4,147 | 4,838 | - | 8,262 | 11,215 | 28,462 | 21,000 | 0.125 | |
| | | මුංඇට | 10,108 | 4,269 | - | 6,715 | 14,726 | 35,818 | 27,000 | 0.125 | |
| | | උඳු | 12,509 | 2,830 | - | 1,645 | 11,317 | 28,301 | 21,000 | 0.125 | 5.0 |
| | | සෝයා බෝංචි | 5,612 | 3,904 | 4,963 | 6,710 | 8,113 | 29,302 | 22,000 | 0.125 | |
| | | කුරක්කන් | 11,367 | 5,969 | - | - | 7,537 | 24,873 | 19,000 | 0.125 | |
| | | බඩ ඉරිඟු | 13,617 | 9,572 | 7,268 | 7,704 | 7,421 | 45,582 | 34,000 | 0.125 | 10.0 |
| 5 | තෙල් ලබාගත හැකි බෝග | | | | | | | | | | |
| | | රටකජු | 5,085 | 16,077 | - | 8,897 | 11,799 | 41,858 | 31,000 | 0.125 | |
| | | තල | 9,329 | 4,979 | - | - | 10,694 | 25,002 | 19,000 | 0.125 | 5.0 |
| | | සූරියකාන්ත | 5,160 | 3,870 | 3,225 | 1,290 | 5,160 | 18,705 | 14,000 | 0.125 | |
| 6 | අල වර්ග | | | | | | | | | | |
| | | අර්තාපල් | 31,291 | 176,812 | 70,804 | 29,640 | 27,069 | 335,616 | 252,000 | 0.125 | 2.0 |
| | | බතල | 10,449 | 5,515 | 7,013 | 6,192 | 16,254 | 45,423 | 34,000 | 0.125 | |
| | | මඤ්ඤොක්කා | 3,225 | 7,869 | 8,483 | 8,514 | 14,964 | 43,055 | 32,000 | 0.125 | 5.0 |
| | | කිරි අල | 25,800 | 15,480 | 6,450 | - | 10,320 | 58,050 | 44,000 | 0.125 | |
| 7 | එළවළු | | | | | | | | | | |
| | | වම්බටු | 7,920 | 6,336 | 14,494 | 27,324 | 24,288 | 80,362 | 60,000 | 0.125 | |
| | | බණ්ඩක්කා | 5,720 | 7,260 | 9,479 | 7,480 | 11,220 | 41,159 | 31,000 | 0.125 | |
| | | බීට්රූට් | 32,844 | 21,349 | 11,885 | 10,532 | 16,065 | 92,674 | 70,000 | 0.125 | |
| | | බෝංචි | 12,180 | 33,640 | 17,400 | 15,776 | 12,760 | 91,756 | 69,000 | 0.125 | |
| | | ගෝවා | 37,513 | 30,246 | 29,389 | 30,236 | 31,492 | 158,876 | 119,000 | 0.125 | |
| | | කැරට් | 36,740 | 16,636 | 34,618 | 27,052 | 27,858 | 142,904 | 107,000 | 0.125 | |
| | | මාළු මිරිස් | 27,086 | 18,503 | 23,108 | 43,305 | 37,888 | 149,890 | 112,000 | 0.125 | |
| | | තක්කාලි | 23,457 | 9,343 | 22,050 | 42,430 | 55,234 | 152,514 | 114,000 | 0.125 | 2.0 |
| | | ලීක්ස් | 34,748 | 19,100 | 15,148 | 13,328 | 28,917 | 111,240 | 83,000 | 0.125 | |
| | | රාබු | 18,088 | 9,282 | 5,614 | 5,593 | 10,829 | 49,406 | 37,000 | 0.125 | |
| | | නෝකෝල් | 18,088 | 14,923 | 5,614 | 6,188 | 9,996 | 54,809 | 41,000 | 0.125 | |
| | | වැටකොලු | 6,050 | 11,220 | 8,847 | 12,100 | 33,220 | 71,437 | 54,000 | 0.125 | |
| | | කරවිල | 6,380 | 14,410 | 8,472 | 10,450 | 35,970 | 75,682 | 57,000 | 0.125 | |
| | | පතෝල | 6,050 | 12,760 | 9,750 | 11,770 | 34,210 | 74,540 | 56,000 | 0.125 | |
| | | වට්ටක්කා | 19,986 | 8,313 | 7,498 | 8,686 | 6,256 | 50,739 | 38,000 | 0.125 | |
| 8 | වෙනත් | | | | | | | | | | |
| | | ඉඟුරු | 4,640 | 75,400 | 6,960 | - | 5,800 | 92,800 | 70,000 | 0.250 | 2.0 |
| 9 | ඉහත සඳහන් බෝගවල පැල තවාන් සඳහා උපරිම ණය සීමාව රු. 500,000.00 | | | | | | | | | | |

**සටහන:**

ණයකරුගේ අවශ්‍යතාවන්ට අනුව, බිම් සැකසීම, බීජ/පැල තවාන් සිටුවීම, පොහොර, දිලීර නාශක, කෘමි නාශක සඳහා පළමු වාරිකය වශයෙන් මුළු ණය මුදලෙන් 60% ක උපරිමයක් දක්වා වගා ණය මුදල් නිදහස් කිරීමට සහභාගීත්ව මූල්‍ය ආයතනවලට බලය පවතින අතර, ඉතිරි ණය මුදල ක්ෂේත්‍ර නිලධාරියාගේ නිර්දේශය මත පොහොර මිලදී ගැනීමට හෝ අස්වනු නෙලීම සඳහා වාරික එකක් හෝ වාරික දෙකක් ලෙස මුදාහල හැකිය.

ඉහත වගුවේ දී ඇති පිරිවැය සංරචක දැරීමට ඔහු සතු හැකියාව මත පදනම්ව පමණක් එක් එක් ගොවියාට ණය මුදල් නිදහස් කිරීමට ශාඛා කළමනාකරුවන් ක්‍රියා කළ යුතුය. ඉහත සඳහන් අක්කරයක් සඳහා උපරිම ණය මුදල් ප්‍රමාණය තුළ එක් එක් ගොවියා වගා කරනු ලබන ආකාරය, වාරි ජලය හෝ වැසි ජලය, යල හෝ මහ වගා කන්නය, බෝග සංකලනය සහ ගොවියාගේ නැවත ගෙවීමේ හැකියාව යනාදිය මත පදනම්ව මුදා හරිනු ලබන ණය මුදල් ප්‍රමාණය තීරණය කිරීමට ශාඛා කළමනාකරුවන්ට හිමිකම ඇත.

**මෙහෙයුම් උපදෙස් අංක : RDD/CGSPA/14/01**

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01.
දුරකථන: 2477447, 2477528
ෆැක්ස්: 2477734, 2477733
2014 ජූනි 17 වැනි දින

සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත

මහත්මයාණෙනි/මහත්මියනි

# රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය
# ශ්‍රී ලංකා මහ බැංකුව

1. **හැඳින්වීම**

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය 2014.05.19 වැනි දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේ දී, බලපත්‍රලාභී බැංකු විසින් ලබා දෙන උකස් අත්තිකාරම් සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් රජය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම අනුමත කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම යෝජනා ක්‍රමය 2014 ජූනි 17 වැනි දින ආරම්භ කරනු ඇත.

2. **යෝජනා ක්‍රමයෙහි අරමුණු**

රන් භාණ්ඩ උකස් අත්තිකාරම් ආර්ථිකයෙහි විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ගොවියන්, කුඩා ව්‍යාපාර හිමිකරුවන් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් උකස් අත්තිකාරම් තමන්ගේ ආර්ථික සහ ව්‍යාපාර කටයුතු සඳහා යොදා ගනු ලැබේ. ඊට අමතරව, උකස් අත්තිකාරම්වලින් කුඩා ප්‍රමාණයක් පරිභෝජන අවශ්‍යතා සඳහා ද යොදා ගනු ලබයි. එම නිසා, උකස් අත්තිකාරම් මගින් මුදාහරින ණය ප්‍රමාණය ආර්ථිකයෙහි විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි රන් මිල පහළ යැමත් සමඟ උකස් අත්තිකාරම් ප්‍රමාණය ද සැලකිය යුතු ලෙස පහත වැටී තිබේ. ප්‍රධාන බලපත්‍රලාභී බැංකුවල රන් භාණ්ඩයේ වටිනාකම් මත ණය ලබාදීමේ අනුපාතය, සාමාන්‍යයෙන් 65% ක් පමණ වීමෙන් මුදා හරින ණය ප්‍රමාණය සැලකිය යුතු මට්ටමකින් අඩු වී ඇත. ඊට අමතරව, බලපත්‍රලාභී බැංකු විසින් අය කරනු ලබන පොලී අනුපාතිකය ද වාර්ෂිකව 16% සිට 20% දක්වා පරාසයක පවතී. මෙම ඉහළ පොලී අනුපාතිකයන් ද උකස් අත්තිකාරම් ලබා ගැනීම අධෛර්යමත් කිරීමට හේතු වී ඇත.

වර්තමානයේ, බොහෝ බලපත්‍රලාභී බැංකු වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතයෙන් සියයට 65 ක් දක්වා උකස් අත්තිකාරම් ලබා දෙනු ලැබේ. මින් පෙන්නුම් කරනුයේ, බලපත්‍රලාභී බැංකු රන් භාණ්ඩ මත අත්තිකාරම් ලබා දීමේදී අවදානම් දැරීමට ඇති කැමැත්ත සියයට 65 දක්වා අඩු වී ඇති බවයි. වෙනත් ආකාරයකට සඳහන් කරන්නේ නම්, රත්‍රන් මිල අඩු වීම නිසා උකස් අත්තිකාරම් නොගෙවා පැහැර හැරීමෙන් ඇති වන අලාභය සියයට 65 ක් දක්වා සහ අදාල උපචිත පොලී ප්‍රමාණය භාර ගැනීමට බලපත්‍රලාභී බැංකු සූදානම් බවයි.

උකස් අත්තිකාරම් මගින් ලබා දෙන ණය මුදලේ ප්‍රමාණය වැඩි කිරීම සඳහා අදාල බලපත්‍රලාභී බැංකුවේ දැනට පවත්නා වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතය සියයට 15 කින් වැඩි කිරීමට මින් යෝජනා කෙරේ. වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතය හා උපචිත පොලිය මගින් බලපත්‍රලාභී බැංකුවේ අවදානම් දැරීමට ඇති රුචිකත්වය පෙන්නුම් කෙරේ. ඒ අනුව, වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතය වැඩි කිරීමෙන් රන් මිල පහත වැටීම හේතු කොට ගෙන ණය ගෙවීම පැහැර හැරීමේ අවදානම ද වැඩි කරනු ඇත. එබැවින්, ණය දෙන බලපත්‍රලාභී බැංකුවලට වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතය වැඩි කළ මුදල් ප්‍රමාණය සඳහා මේ යෝජනා ක්‍රමය ආවරණය ලෙසයි.

3. **යෝජනා ක්‍රමයේ මෙහෙයුම් ක්‍රියාවලිය**

රන් මිල පහත වැටීම හේතු කොට ගෙන උකස් ණය අත්තිකාරම් ගෙවීම පැහැර හැරීම නිසා බලපත්‍රලාභී බැංකුවලට සිදුවන පාඩුව පියවා ගැනීම සඳහා මේ යෝජනා ක්‍රමය මගින් ණය ඇප ආවරණයක් සලසනු ලබයි.

ණය ඇප ආවරණය ලබා දීම සඳහා පවත්නා රන් මිල සහ දැනට පවත්නා වටිනාකමට ලබා දෙන ණය අනුපාතයට වඩා සියයට 15 ක වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතය මත බලපත්‍රලාභී බැංකු මගින් ලබා දුන් උකස් අත්තිකාරම් ප්‍රමාණය සහ අදාළ උපචිත පොලී ප්‍රමාණය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට 15 නොඉක්මවා) සලකා බලනු ඇත. රන් මිල අඩු වීම නිසා උකස් අත්තිකාරම් නොගෙවා පැහැර හැරීමෙන් පාඩු ලැබූ අවස්ථාවක දී අදාළ බලපත්‍රලාභී බැංකුව මෙම ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබීමට අපේක්ෂා කරන්නේ නම්, එම බැංකුව උකස් අත්තිකාරම්වල අගයෙන් සියයට 1 ක වාර්ෂික ඇප ආවරණ වාරිකයක් ගෙවීමෙන් මෙම ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය යටතේ ආවරණයක් ලබා ගැනීමට හැකියාව ඇත.

වසර 1 ක කාලයකට ලබා දුන් ඕනෑම උකස් අත්තිකාරමක් නොගෙවා පැහැර හැරි බවට සලකන්නේ උකස් අත්තිකාරම දුන් දිනයේ සිට මාස 15 කට පසුවය. මාස 15 අවසානයේ බලපත්‍රලාභී බැංකුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙහි ප්‍රකාශයට පත් කර ඇති රන් මිල අනුව, රන් මිල අඩු වීම හේතුවෙන් ණය නොගෙවා පැහැර හැරීම සාධාරණීකරණය කළ හැකි ද යන්න තීරණය කළ යුතුය. එසේ තීරණය කරනු ලැබුවහොත් බලපත්‍රලාභී බැංකුව විසින් ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයට අනුව හිමිකම් පෑ හැකි මුදල් ප්‍රමාණය ගණනය කර ශ්‍රී ලංකා මහ බැංකුවට යොමු කළ යුතුය. එම ඉල්ලීම් සලකා බැලීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇමුණුම 1 හා වගුව 1 හි විස්තර කර ඇති පරිදි උකස් කරන ලද අවස්ථාවේ රන් භාණ්ඩයේ වටිනාකමෙන් සියයට 17.81 ක උපරිම සීමාවකට යටත්ව ගෙවීම් කරනු ලබයි.

4. **සුදුසුකම් ලැබීම සඳහා අවශ්‍යතා**

4.1 මෙහි සඳහන් කළ උපදෙස්වලට අදාළව, "උකස් කිරීම" යන්නෙන් අදහස් කරන්නේ රන්වලින් සාදන ලද පුද්ගලික ප්‍රයෝජනයට ගන්නා භාණ්ඩ සුරැකුම් ලෙස තබා ගනිමින් බලපත්‍රලාභී බැංකුවක් විසින් මාස 12 කට නොවැඩි කාලසීමාවක් සඳහා ණය මුදල් ප්‍රදානය කරනු ලැබීමයි.

4.2 මේ යෝජනා ක්‍රමය යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන ලෙස අර්ථ දක්වන්නේ බලපත්‍රලාභී බැංකු, එනම් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු යි.

4.3 මෙම උපදෙස් ලබා දුන් දිනයේ සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා හෝ මුදල් මණ්ඩලය මගින් දීර්ඝ කරනු ලැබිය හැකි ඉදිරි වෙනත් දිනයක් දක්වා සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ප්‍රදානය කරනු ලබන උකස් අත්තිකාරම්වලට මෙම ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා පහත දක්වා ඇති නියමයන් සහ කොන්දේසි සම්පූර්ණ කළ යුතුය.

(අ) වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතය අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතනයේ දැනට පවතින අගයට වඩා සියයට 15 ක් විය යුතු අතර එය සියයට 80 නොඉක්මවිය යුතුය. එහි සමස්ත බලපෑම (exposure) පහත දැක්වෙන ආකාරයට ගණනය කරනු ලැබේ.

උදාහරණය:

| වගකීම් ගණනය කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| විස්තරය | උකස් කරන ලද අවස්ථාවේ භාණ්ඩයේ වෙළෙඳපොළ වටිනාකම (රුපියල්) | උකස් අත්තිකාරම (රුපියල්) | වාර්ෂික පොලී අනුපාතිකය 15% දී පොලිය (රුපියල්) | උකස් කර මාස 12 ට පසු සහභාගිත්ව මූල්‍ය ආයතනයට ලැබිය යුතු මුළු මුදල (රුපියල්) | උකස් කර මාස 15 ට පසු සහභාගිත්ව මූල්‍ය ආයතනයට ලැබිය යුතු මුළු මුදල (රුපියල්) |
| රන් භාණ්ඩයේ වටිනාකමට දෙනු ලබන ණය ප්‍රමාණයේ අනුපාතය සියයට 80 වන විට | 100.0 | 80.0 | 12.0 | 92.0 | 95.0 |

(ආ) සියලු ගාස්තු හා අයකිරීම් ද ඇතුළත්ව රන් භාණ්ඩ උකස් අත්තිකාරම් මත අය කරන වාර්ෂික පොලී අනුපාතිකය සියයට 15 නොඉක්මවිය යුතුය.

(ඇ) මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලැබීම සඳහා උකස් අත්තිකාරම් මත සියයට 1 ක ණය ඇප ආවරණ වාරිකයක් සහභාගිත්ව මූල්‍ය ආයතනය විසින් ගෙවිය යුතුය.

(ඈ) උපරිම ණය සීමාව එක් පුද්ගලයෙකුට රුපියල් 500,000 විය යුතුය.

4.4 රන් භාණ්ඩ උකස් අත්තිකාරම් ලබා දිය යුත්තේ පුද්ගලික රන් භාණ්ඩවල රන් වටිනාකමට මිස වාණිජ පරිමාණයේ උකස් සඳහා නොවේ.

5. **රන් භාණ්ඩ තක්සේරු කිරීමේ ක්‍රමවේදය**

5.1 රන් භාණ්ඩ තක්සේරු කිරීම පහත සඳහන් පරිදි වේ.

(අ) රන් භාණ්ඩයේ ගුණාත්මකභාවය නිර්ණය කිරීමේ සම්මත මිණුම් "කැරට්" වේ.

(ආ) රන් භාණ්ඩයේ බර නිර්ණය කිරීමේ සම්මත මිණුම "ග්‍රෑම්" වේ.

(ඇ) ගුණාත්මකභාවය කැරට් 9 ට අඩු භාණ්ඩයක් උකස් කළ හැකි භාණ්ඩයක් ලෙස පිළිගනු නොලැබේ.

(ඈ) භාණ්ඩයේ වටිනාකම නිර්ණය කිරීමේ දී එහි ඇති රන් වටිනාකම පමණක් සැලකීමට සහභාගීත්ව මූල්‍ය ආයතන වගබලා ගත යුතුය.

(ඉ) ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ප්‍රකාශයට පත් කරනු ලබන රන් මිලට වඩා වැඩි අගයකට රන් භාණ්ඩයේ මිල නියම නොකිරීමට සහභාගීත්ව මූල්‍ය ආයතන වගබලා ගත යුතුය.

5.2 රන් භාණ්ඩයේ වටිනාකම නිර්ණය කිරීමේ දී සහභාගීත්ව මූල්‍ය ආයතනවලට මග පෙන්වීම.

(අ) ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ පළවෙන විනිමය අනුපාත සහ රන් මිල යොදා ගැනීම.

(ආ) තක්සේරුකරණය කිරීමේ අරමුණින් පහත උදාහරණයේ දැක්වෙන ආකාරයට රන් මිල ගණනය කෙරේ.

උදාහරණය:

| රන් මිල ශ්‍රී ලංකා රුපියල්වලින් ගණනය කිරීම | | |
|---|---|---|
| 2014.05.23 දිනට රන් මිල | එ.ජ.ඩො. | ශ්‍රී ලංකා රුපියල් |
| රන් ට්‍රොයි අවුන්සය (ග්‍රෑම් 31.1034768) | 1294.00 | 168,676.14 |
| රන් පවුමක මිල (ග්‍රෑම් 8) | 332.82 | 43,384.51 |

සටහන: 2014.05.23 දිනට එ.ජ.ඩො./ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතය - රු.130.3525

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ: http://www.cbsl.lk සඳහන් මිල අනුව

(ඇ) මෙම යෝජනා ක්‍රමයේ අරමුණු සඳහා සියලුම වටිනාකම් ශ්‍රී ලංකා රුපියල්වලින් සඳහන් වේ.

**6. ණය ඇප ආවරණ සඳහා අයදුම් කිරීම**

6.1 මෙම ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයට සහභාගිවීමට RDD/CGSPA (I) නිර්දේශිත ආකෘති පත්‍රයේ (ඇමුණුම 2) ආකාරයට පිළියෙල කරන ලද අයදුම්පතක් අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, නොː30, ජනාධිපති මාවත, කොළඹ 01 යන ලිපිනයට යොමු කළ යුතුය. නියමිත ආකෘති පත්‍රය සහභාගිත්ව මූල්‍ය ආයතනයේ ශාඛාව මගින් පිළියෙල කර එහි ප්‍රධාන කාර්යාලය හරහා විද්‍යුත් මාර්ගයෙන් එවිය යුතුය.

6.2 පසුගිය මස (මාසයේ පළමු දිනයේ සිට අවසාන දිනය දක්වා) දෙන ලද ණය අත්තිකාරම් සඳහා බලයලත් නිලධාරීන් අත්සන් තබන ලද RDD/CGSPA (I) ආකෘති පත්‍රය, පවත්නා මාසයේ 15 වැනි දිනට පෙර යොමු කළ යුතුය.

**7. ඇප ආවරණ සහතිකය**

ණය ඇප ආවරණ ඉල්ලුම්පත විධිමත්ව පිළිගත්විට, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙත අදාළ කාලපරිච්ඡේදයේ උකස් ණය අත්තිකාරම් ආවරණය කිරීම සඳහා ඇප ආවරණ සහතිකයක් (ඇමුණුම 3 හි) නිකුත් කරනු ලබයි.

**8. වාරික ගෙවීම**

8.1 RDD/CGSPA (I) (ඇමුණුම 2) ඉදිරිපත් කරන විට ඒ සමග ණය ඇප ආවරණ වාරිකය ගෙවිය යුතුය.

8.2 වාරික ගෙවීම උකස් ණය අත්තිකාරම් ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයේ ගිණුම (ගිණුම් අංක 54526) ට බැර වන සේ ආදායකයාගේ ගිණුමට පමණක් වන චෙක්පතක් අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, නොː30, ජනාධිපති මාවත, කොළඹ 01 වෙත එවීමෙන් හෝ තත්කාලීන දළ පියවුම් ක්‍රමය (RTGS) හෝ ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS) තුළින් එම ගිණුමට ම බැර වන සේ සිදු කළ හැකිය.

**9. හිමිකම් පෑම**

9.1 මෙම යෝජනා ක්‍රමය යටතේ වන හිමිකම්පෑම් රන් මිල මත පදනම්ව පමණක් විය යුතුය. රන් ණය අත්තිකාරම ගෙවීම පැහැර හරිනු ලැබුව ද, රන් ණය අත්තිකාරම සහ එය නිකුත් කළ දින සිට මාස 15 දක්වා එකතු වූ පොලිය, පවතින රන් මිල මගින් ආවරණය වන්නේ නම් මේ යෝජනා ක්‍රමය මගින් ණය ඇප ආවරණ ගෙවීමක් සිදු නොවනු ඇත.

9.2 රන් ණය අත්කිකාරම නොගෙවා පැහැර හැරි විට, එම අත්තිකාරම ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය යටතේ හිමිකම් පෑම සඳහා සුදුසුකම් ලබා ඇත්නම් සහ මෙම ණය පැහැර හැරීම හේතුකොටගෙන සහභාගිත්ව මූල්‍ය ආයතනය අලාභයක් ලබා ඇත්නම් පමණක් ණය ඇප ආවරණය සඳහා හිමිකම් පෑමට එම සහභාගිත්ව මූල්‍ය ආයතනය සුදුසුකම් ලබනු ඇත.

9.3 නියමිත කාලසීමාව අවසානයේ දී හෝ ගෙවිය යුතු දිනයේ දී එකවර ගෙවීමක් වශයෙන් එක වාරිකයකින් ගෙවිය යුතු ණය පහසුකම පොරොන්දු වූ කාලසීමාව තුළ දී හෝ ගෙවිය යුතු අවසාන දිනයේ සිට දින 90 ක් තුළ නොගෙවා ඇත්නම් මෙම යෝජනා ක්‍රමයේ කාර්යයන් සඳහා එම උකස් ණය අත්තිකාරම ගෙවීම පැහැර හැර ඇති සේ සැලකේ.

9.4 අලාභය ගණනය කිරීමේ කාර්යය සඳහා අදාළ රන් මිල වන්නේ, ගෙවීම පැහැර හැරි දිනයේ (එනම්, උකස් ණය අත්තිකාරම් ගත් දිනයේ සිට මාස 15 කින්) රන් මිල වේ. රන් මිල පහත වැටීම නිසා සහභාගිත්ව මූල්‍ය ආයතනවලට සිදුවන අලාභ ප්‍රතිශතයක් ලෙස සටහන 2 මගින් පැහැදිලි කෙරේ.

9.5 මෙම යෝජනා ක්‍රමය යටතේ උකස් ණය අත්තිකාරම් ගෙවීම පැහැර හැරීමෙන් සිදුවන අලාභය පහත 9.6 වගන්තියේ සඳහන් කර ඇති ආකාරයට සීමා කෙරේ.

9.6 උපරිම ඇප ආවරණය සහභාගිත්ව මූල්‍ය ආයතන මගින් දැනට පවතින මට්ටමට වඩා සියයට 15 ක් වැඩි රන් වටිනාකමට ගෙවනු ලබන ණය අනුපාතිකයකින් (LTV Ratio) ගණනය කරනු ලබන ණය අත්තිකාරම හා එයට අදාළ පොලිය එකතු කිරීමෙන් ලැබෙන අගය සහ දැනට පවතින රන් වටිනාකම මත ගෙවනු ලබන අත්තිකාරම හා එයට අදාළ පොලිය එකතු කිරීමෙන් ලැබෙන අගය අතර වෙනසට සීමා වේ.

9.7 මෙම ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයේ කාර්යය සඳහා අලාභයක් වශයෙන් අර්ථ දක්වන ඕනෑම ප්‍රමාණයක හිමිකම්පෑමක්, පැහැර හැරි දින සිට දින 30 ක් ඇතුළත සහභාගිත්ව මූල්‍ය ආයතනය විසින් RDD/CGSPA (2) (ඇමුණුම 4) ආකෘතිය මගින් අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කළ යුතුය. RDD/CGSPA (2) ආකෘතිය අදාළ සහභාගිත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය හරහා විද්‍යුත් මාර්ගයෙන් යොමු කළ යුතුය.

**10. පරීක්ෂාව**

මෙම යෝජනා ක්‍රමයේ අවශ්‍යතාවය අනුව සහභාගිත්ව මූල්‍ය ආයතන මගින් මෙම යෝජනා ක්‍රමය යටතේ නිකුත් කළ ණය පිළිබඳව සටහන් තබා ඇති ගිණුම් පොත් සහ වෙනත් ලියකියවිලි පරීක්ෂා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට අයිතිය ඇත.

**11. තොරතුරු සැපයීම**

මෙම යෝජනා ක්‍රමය යටතේ දෙන ලද ඕනෑම උකස් අත්තිකාරමක් සම්බන්ධයෙන් වූ විස්තර ශ්‍රී ලංකා මහ බැංකුව නියම කළ විට සහභාගිත්ව මූල්‍ය ආයතනය විසින් සැපයිය යුතුය.

**12. සංශෝධන සහ පරිපූරක ප්‍රතිපාදන**

12.1 සංශෝධනය කරන දිනට හෝ ඉවත් කර ගන්නා දිනට පෙර නිකුත් කළ ඇප ආවරණවලට බලපෑමක් නොවන ලෙස මෙම යෝජනා ක්‍රමය සංශෝධනය කිරීමට හෝ ඉවත් කර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හිමිකම් ඇත.

12.2 මෙම යෝජනා ක්‍රමයේ විශේෂයෙන් සපයා නොමැති කාරණයක් සම්බන්ධයෙන් යෝජනා ක්‍රමයේ අරමුණු සඳහා අවශ්‍ය පරිපූරක හෝ අතිරේක ප්‍රතිපාදන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ඇත.

13. අර්ථකථනය

සහභාගිත්ව මූල්‍ය ආයතන මෙම මෙහෙයුම් උපදෙස්වල ඇති ප්‍රතිපාදන හෝ ඊට ආනුශාංගික හෝ අනුයාත යම් දෙයක් අපැහැදිලි නම්, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ තීරණය මේ සම්බන්ධයෙන් අවසාන හා තීරණාත්මක වන අතර ඒ සඳහා අධ්‍යක්ෂතුමා මගින් පැහැදිලි කිරීමක් ලබාගත යුතුය.

අධ්‍යක්ෂ
ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

ඇමුණුම 1

වගුව 1 හි විදහා දක්වන ලද උදාහරණය පහත දැක්වෙන ආකාරයට පැහැදිලි කළ හැක.

2014 ජනවාරි මස 01 වන දින රන් භාණ්ඩයක අගය ඇ.එ.ජ.ඩොලර් 1,000 ක් සහ විනිමය අනුපාතය ඇ.එ.ජ. ඩොලරයකට රුපියල් 130 ක් ලෙස උපකල්පනය කළවිට මෙම රන් භාණ්ඩයේ වටිනාකම රුපියල් 130,000 වනු ඇත. එම අවස්ථාවේ වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතය සියයට 80 ක් නම්, ලබා දුන් උකස් අත්තිකාරම් අගය රුපියල් 104,000 කි. මෙම උකස් අත්තිකාරම මාස 15 ක් අවසානයේ දී පැහැර හැර ඇත්නම්, වාර්ෂික පොලී අනුපාතිකය සියයට 15 ක් යටතේ උකස මත එකතු වූ පොලිය රු.19,500 ක් වනු ඇත. එම නිසා මෙම උකස් අත්තිකාරම මත සහභාගීත්ව මූල්‍ය ආයතනයට ලැබිය යුතු මුළු මුදල රුපියල් 123,500 වනු ඇත. එසේම වටිනාකම මත ණය ලබාදීමේ අනුපාතය සියයට 65 දී සහභාගීත්ව මූල්‍ය ආයතනයට ලැබිය යුතු මුළු මුදල රුපියල් 100,344 කි. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙවනු ලබන උපරිම ඇප ආවරණ ගෙවීම අවසාන වශයෙන් රුපියල් 23,156/- ක් වනු ඇත. (රුපියල් 123,500 හා රුපියල් 100,344 අතර වෙනස)

උකස් අත්තිකාරම සිදු කළ දිනයේ සිට මාස 15 ක් අවසානයේ දී රත්‍රන් මිල සලකා බලමු. සංඛ්‍යා සටහන 1 හි දක්වා ඇති ලෙස රත්‍රන් මිල සියයට 1 කින් පහත වැටෙන බව සිතන්න. රත්‍රන් මිල සියයට 1 කින් පමණක් පහත වැටෙන විට සලකනු ලබන රන් භාණ්ඩයේ අගය රුපියල් 128,700 වනු ඇත. මෙහිදී උකස් අත්තිකාරම පැහැර හැර ඇතත් සහභාගීත්ව මූල්‍ය ආයතනයට කිසිදු අලාභයක් සිදු නොවේ. ඒ වෙනුවට සහභාගීත්ව මූල්‍ය ආයතනය රුපියල් 5,200 ක ලාභයක් උපයනු ලැබේ. රත්‍රන් මිල සියයට 5 කින් පහත වැටේ නම් මාස 15 ක් අවසානයේ දී රන් භාණ්ඩයේ අගය රුපියල් 123,500 ක් වන අතර, මේ අවස්ථාවේ දී සහභාගීත්ව මූල්‍ය ආයතනය ලාභ හෝ අලාභ නොලබන අවස්ථාවට පත් වේ. සංඛ්‍යා සටහන 1 හි විදහා දක්වන ආකාරයට රත්‍රන් මිල සියයට 5 කට වැඩියෙන් පහළ ගියහොත් සහභාගීත්ව මූල්‍ය ආයතනය පාඩු ලබනු ඇත. උදාහරණයක් ලෙස රත්‍රන් මිල සියයට 6 කින් පහත බසී නම්, සහභාගීත්ව මූල්‍ය ආයතනයට වන අලාභය රුපියල් 1,300 ක් වන අතර රන් භාණ්ඩ උකස් ණය සඳහා වන ඇප ආවරණ ණය යෝජනා ක්‍රමය යටතේ අනෙකුත් සියලු කොන්දේසි සපුරා ඇත්නම් සහභාගීත්ව මූල්‍ය ආයතනයට මෙම අලාභය අයකර ගැනීමට හිමිකම ලැබෙනු ඇත.

සංඛ්‍යා සටහන 1 හි විදහා දක්වන පරිදි මිල සියයට 22.812 කින් අඩු වුවහොත් රන් භාණ්ඩයේ මිල රුපියල් 100,344 ක් වන අතර සහභාගීත්ව මූල්‍ය ආයතනය රුපියල් 23,156 ක පාඩුවක් ලබයි. වාර්ෂික පොලී අනුපාතය සියයට 15 ක් සහ වටිනාකම මත ණය දීමේ අනුපාතිකය සියයට 65 වනවිට සහභාගීත්ව මූල්‍ය ආයතනය මුහුණ දිය හැකි අවදානම මෙය වේ. එම නිසා ශ්‍රී ලංකා මහ බැංකුව ඇප ආවරණය රුපියල් 23,156 කට සීමා වන අතර, මිල පහළ යාමේ මෙම සීමාවෙන් ඔබ්බට සිදුවන අලාභ ලැබීම් සහභාගීත්ව මූලය ආයතනය විසින් දැරිය යුතුය. උදාහරණයක් වශයෙන්, මිල සියයට 25 කින් පහළ ගියහොත්, රන් භාණ්ඩයේ මිල රුපියල් 97,500 කි. එයට සමගාමීව සිදුවන අලාභය රුපියල් 26,000 කි. ඒ අනුව, සහභාගීත්ව මූල්‍ය ආයතනයට මෙම ණය ඇප ආවරණය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඉල්ලා සිටිය හැකි උපරිම මුදල රුපියල් 23,156 කි. ඉතිරි රුපියල් 2,844 ක අලාභය සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් දරාගත යුතු වේ.

**සංඛ්‍යා සටහන 1**
**සංඛ්‍යාත්මක නිරූපනයක්**

| | උකස් කරන අවස්ථාවේ රන් භාණ්ඩයේ වෙළෙඳපොළ අගය රු. | උකස් අත්තිකාරම රු. | වාර්ෂික පොලී අනුපාතිකය 15% දී මාස 15 ක් සඳහා පොලිය රු. | උකස් කිරීමෙන් මාස 15 ට පසු මුළු අගය රු. |
|---|---|---|---|---|
| වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතය 80% වන විට | 130,000 | 104,000 | 19,500 | 123,500 |
| වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතය 65% වන විට | 130,000 | 85,500 | 15,844 | 100,344 |
| ඇප ආවරණ හිමිකම මත උපරිම ගෙවීම | | | | 23,156 |
| භාණ්ඩයේ රත්‍රන් වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස උපරිම වගකීම | | | | 17.81 |
| වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතය 80% වන විට මුළු ගණනය කිරීමේ ප්‍රතිශතයක් ලෙස උපරිම වගකීම | | | | 18.75 |

| උකස් කළ දිනය | රන් භාණ්ඩයේ අගය එ.ජ. ඩොලර් | විනිමය අනුපාතිකය එ.ජ. ඩොලර්/ ශ්‍රී ලංකා රුපියල් | රන් භාණ්ඩයේ වටිනාකම රු. | ණය පැහැර හැරි දිනය | 2015.03.31 ට රත්රන් අගයෙහි පහත වැටීම | | වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතය 80% දී මුළු ලාභය/ අලාභය රු. | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙවිය යුතු ඇප ආවරණ හිමිකම රු. | සහභාගීත්ව මූල්‍ය ආයතනයට සිදු වූ පාඩුව රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | % | රු. | | | |
| 01.01.2014 | 1,000.00 | 130 | 130,000 | 31.03.2015 | 1 | 128,700 | 5,200 | | |
| | | | | රන් මිලෙහි | 2 | 127,400 | 3,900 | | |
| | | | | උපකල්පිත | 3 | 126,100 | 2,600 | | |
| | | | | පහත | 4 | 124,800 | 1,300 | | |
| | | | | වැටීම | 5 | 123,500 | - | | |
| | | | | | 6 | 122,200 | (1,300) | 1,300 | |
| | | | | | 7 | 120,900 | (2,600) | 2,600 | |
| | | | | | 10 | 117,000 | (6,500) | 6,500 | |
| | | | | | 15 | 110,500 | (13,000) | 13,000 | |
| | | | | | 20 | 104,000 | (19,500) | 19,500 | |
| | | | | | 21 | 102,700 | (20,800) | 20,800 | |
| | | | | | 22 | 101,400 | (22,100) | 22,100 | |
| | | | | | 22.812 | 100,344 | (23,156) | 23,156 | |
| | | | | | 25 | 97,500 | (26,000) | 23,156 | 2,844 |
| | | | | | 30 | 91,000 | (32,500) | 23,156 | 9,344 |
| | | | | | 35 | 84,500 | (39,000) | 23,156 | 15,844 |
| | | | | | 40 | 78,000 | (45,500) | 23,156 | 22,344 |
| | | | | | 45 | 71,500 | (52,000) | 23,156 | 28,844 |
| | | | | | 50 | 65,000 | (58,500) | 23,156 | 35,344 |

ඇමුණුම 2

ආකෘතිය: **RDD/CGSPA/(1)**

අධ්‍යක්ෂ
ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
30, ජනාධිපති මාවත
කොළඹ 01.

## රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය යටතේ වන අයදුම්පත

ණය මුදාහල මාසය: ............................................... වර්ෂය: ...............................................

| දිනය | වාර්ෂික පොලී අනුපාතය | උකස් භාණ්ඩයේ මුළු වටිනාකම රු. | මුදාහල මුළු මුදල රු. | ගෙවිය යුතු මුළු වාරිකය රු. |
|---|---|---|---|---|
| | 15% | | | |
| | 14% | | | |
| | 13% | | | |
| | 12% | | | |
| | 11% | | | |
| | මුළු එකතුව | | | |

සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම: ...............................................
ශාඛාව: ...............................................
කළමනාකරුගේ අත්සන ............................................... දිනය: ......................
නිල මුද්‍රාව

ප්‍රධාන කාර්යාලයේ බලයලත් නිලධාරියාගේ අත්සන .......................... දිනය: .........................
නිල මුද්‍රාව

ඇමුණුම 3

## රන් භාණ්ඩ උකස් ණය සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය

ශ්‍රී ලංකා මහ බැංකුව

### ණය ඇප ආවරණ සහතිකය

යොමු අංකය .............

2014 ජූනි 17 වන දින නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් අංක: RDD/CGSPA/14/1 හි කොන්දේසි හා නියමයන්ට අනුව ................... ................................................ (සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම) ..................................................... (ශාඛාවේ නම) විසින් ලබා දුන් රුපියල් ................................................ (මුදල අකුරින්) (රු.........................................) (මුදල ඉලක්කමෙන්) රන් භාණ්ඩ උකස් ණය සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය යටතේ ඇප ආවරණ කළ බව සහතික කිරීම සඳහා මෙම ඇප ආවරණ සහතිකය නිකුත් කෙරේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ උපරිම ණය ඇප ආවරණ වගකීම වනුයේ උකස් අත්තිකාරම් දුන් දිනයේ දී, එම උකස් කළ භාණ්ඩයේ පැවති රන් අගයෙන් 17.81 ප්‍රතිශතයකි.

.......................................... ....................................................

දිනය

අධ්‍යක්ෂ
ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

**සංඛ්‍යා සටහන 2**

**ප්‍රතිශත අගයන් වගුව (ක්ෂණ ගනකය) රන් වටිනාකමට ගෙවනු ලබන සියයට 80 ක ණය අනුපාතය සඳහා**

| | උකස් කරන අවස්ථාවේ රන් භාණ්ඩයේ වෙළෙඳපොළ අගය රු. | උකස් අත්තිකාරම රු. | වාර්ෂික පොලී අනුපාතිකය 15% දී මාස 15 ක් සඳහා පොලිය රු. | උකස් කිරීමෙන් මාස 15 ට පසු මුළු අගය රු. |
|---|---|---|---|---|
| වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතය 80% දී | 100.00 | 80.00 | 15.00 | 95.00 |
| වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතය 65% දී | 100.00 | 65.00 | 12.19 | 77.19 |
| ඇප ආවරණ හිමිකම මත උපරිම ගෙවීම | | | | 17.81 |
| උකස් භාණ්ඩයේ රත්රන් අගයේ ප්‍රතිශතයක් ලෙස උපරිම වගකීම | | | | 17.81 |
| වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතය 80% දී මුළු ගණනය කිරීමේ ප්‍රතිශතයක් ලෙස උපරිම වගකීම | | | | 18.75 |

| උකස් කළ දිනය | රන් භාණ්ඩයේ අගය එ.ජ. ඩොලර් | විනිමය අනුපාතිකය ඇ.එ.ජ. ඩොලර්/ ශ්‍රී ලංකා රුපියල් | රන් භාණ්ඩයේ වටිනාකම රු. | ණය පැහැර හැරි දිනය | 2015.03.31 ට රත්රන් අගයෙහි පහත වැටීම | | වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතය 80% දී මුළු ලාභය/ අලාභය | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙවිය යුතු ඇප ආවරණ හිමිකම රු. | සහභාගීත්ව මූල්‍ය ආයතනයට වූ පාඩුව රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | % | රු. | | | |
| 01.01.2014 | 0.77 | 130 | 100 | 31.03.2015 රන් මිල පහත වැටීම මෙසේ වේ යැයි උපකල්පනය කරන ලදී. | 1 | 99.00 | 4.00 | | |
| | | | | | 2 | 98.00 | 3.00 | | |
| | | | | | 3 | 97.00 | 2.00 | | |
| | | | | | 4 | 96.00 | 1.00 | | |
| | | | | | 5 | 95.00 | (0.00) | 0.00 | |
| | | | | | 6 | 94.00 | (1.00) | 1.00 | |
| | | | | | 10 | 90.00 | (5.00) | 5.00 | |
| | | | | | 15 | 85.00 | (10.00) | 10.00 | |
| | | | | | 20 | 80.00 | (15.00) | 15.00 | |
| | | | | | 21 | 79.00 | (16.00) | 16.00 | |
| | | | | | 22 | 78.00 | (17.00) | 17.00 | |
| | | | | | 22.81 | 77.19 | (17.81) | 17.81 | 0.00 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 23 | 77.00 | (18.00) | 17.81 | 0.19 |
| | | | | | 25 | 75.00 | (20.00) | 17.81 | 2.19 |
| | | | | | 30 | 70.00 | (25.00) | 17.81 | 7.19 |
| | | | | | 35 | 65.00 | (30.00) | 17.81 | 12.19 |
| | | | | | 40 | 60.00 | (35.00) | 17.81 | 17.19 |
| | | | | | 45 | 55.00 | (40.00) | 17.81 | 22.19 |
| | | | | | 50 | 50.00 | (45.00) | 17.81 | 27.19 |

ඇමුණුම 4

ආකෘතිය: **RDD/CGSPA/(2)**

අධ්‍යක්ෂ
ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
30, ජනාධිපති මාවත
කොළඹ 01.

**රන් භාණ්ඩ උකස් ණය සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයට හිමිකම් පෑමේ ආකෘති පත්‍රය**

ණය ඇප ආවරණ සහතිකපතේ යොමු අංකය: ..........................................................

රන් භාණ්ඩ උකස් ණය සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය යටතේ ණය ඇප ආවරණ සහතිකය මගින් ආවරණය කළ පහත විස්තර දක්වා ඇති උකස් අත්තිකාරම් 20....... වර්ෂයේ ........... මාසයේ නොගෙවා පැහැර හැර ඇති බව අපි මෙයින් ප්‍රකාශ කරමු.

සියයට .............. පොලී අනුපාතය යටතේ,

| ගෙවීම | | නොගෙවා පැහැර හැරි මුදල් ප්‍රමාණය | | | | හිමිකම්පාන මුළු මුදල රු. |
|---|---|---|---|---|---|---|
| දිනය | මුදල් ප්‍රමාණය රු. | දිනය | ප්‍රාග්ධනය රු. | පොලිය රු. | එකතුව රු. | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

| | |
|---|---|
| සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම: ...............................................<br>ශාඛාව: .............................................................................................<br>කළමනාකරුගේ අත්සන ....................................... දිනය: ......................<br>නිල මුද්‍රාව | ප්‍රධාන කාර්යාලයේ<br>බලයලත් නිලධාරියාගේ අත්සන ........................... දිනය: ........................<br>නිල මුද්‍රාව |

මෙහෙයුම් උපදෙස් අංක: **RDD/CSDDLS/2013/01/ (A-01)**

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01.
දුරකථන: 2477447, 2477472, 2398748
ෆැක්ස්: 2477734, 2477724
2014 ජූලි 17 වැනි දින

සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත

මහත්මයාණෙනි/මහත්මියනි

## මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම

මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට නිකුත් කරනු ලැබූ 2013 මැයි මස 10 වන දිනැති මෙහෙයුම් උපදෙස් අංක: RDD/CSDDLS/2013/01 හි 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

5. අවම ක්‍රියාකාරකම : අවම වශයෙන් කිරි දෙනුන් 07 කින් යුත් කිරි ගොවිපොළක්

මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් හි අනෙකුත් සියලු නියමයන් හා කොන්දේසි නොවෙනස්ව පවතිනු ලබන අතර, ඉහත සඳහන් සංශෝධනය 2014 ජූලි මස 17 වැනිදා සිට බලපවත්වනු ලැබේ.

එම්.ජේ.එස්. අබේසිංහ
අධ්‍යක්ෂ
ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**මෙහෙයුම් උපදෙස් අංකː RDD/CGSPA/14/1 (A-01)**

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01.
2014 ඔක්තෝබර් 09 වැනි දින

සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත

මහත්මයාණෙනි/මහත්මියනි

## රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් අංකː RDD/CGSPA/14/1 සංශෝධනය කිරීම

2014 ඔක්තෝබර් මස 09 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි 2014 ජුනි 17 දිනැති මෙහෙයුම් උපදෙස් අංකː RDD/CGSPA/14/1 හි 4.3 (ආ) වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කර ඇති බව දැනුම්දීම.

**4.3 (ආ)** සියලු ගාස්තු හා අයකිරීම් ඇතුළුව, රන් භාණ්ඩ උකස් අත්තිකාරම් මත අය කරන වාර්ෂික පොලී අනුපාතිකය සියයට 12 නොඉක්මවිය යුතුය.

රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයේ අනෙක් සියලු නියමයන් හා කොන්දේසි නොවෙනස්ව පවතී.

මෙයට - විශ්වාසී
**අධ්‍යක්ෂ**
**ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව**

**මෙහෙයුම් උපදෙස් අංක ː RDD/PR/2010/03 (A-03)**

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ.පෙ. 590
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01.
2014 නොවැම්බර් 05 වැනි දින

දුරකථන ː 2477447/ 2477437/ 2477472/ 2477448
ෆැක්ස් ː 2477733/ 2477734
සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත

මහත්මයාණෙනි/මහත්මියනි

## සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය - පොලී අනුපාතිකය සංශෝධනය කිරීම

ඉහත ණය යෝජනා ක්‍රමයෙහි 2011 අප්‍රේල් 01 දිනැති මෙහෙයුම් උපදෙස් අංකː RDD/PR/2010/03 (සංශෝධනය) මගින් 2010 මාර්තු 22 දිනැති මෙහෙයුම් උපදෙස් අංකː RDD/PR/2010/03 හි සංශෝධනය කරන ලද 3.6 සහ 3.7 යන වගන්ති 2014 නොවැම්බර් 05 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කර ඇති බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

3.6 සහභාගීත්ව මූල්‍ය ආයතනවලට ලබා දෙන
ප්‍රතිමූල්‍ය ණය මත පොලී අනුපාතිකය ː වාර්ෂිකව 3%

3.7 ණය සඳහා වන පොලී අනුපාතිකය ː වාර්ෂිකව 8%

මෙයට - විශ්වාසී,
එම්.ජේ.එස්. අබේසිංහ
**අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව**

**මෙහෙයුම් උපදෙස් අංක ː RDD/CSDDLS/2013/01 (A-02)**

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01.
දුරකථනː 2477447, 2477472, 2398748
ෆැක්ස්ː 2477734, 2477724
2014 දෙසැම්බර් 03 වැනි දින

සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත

## මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම

මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා නිකුත් කරන ලද 2013 මැයි මස 10 වන දිනැති මෙහෙයුම් උපදෙස් අංකː RDD/CSDDLS/2013/01 හි 7.2 වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ.

7.2 ණය අයදුම්කරු සඳහා වන පොලී අනුපාතිකය : ණය අයදුම්කරුවන් සඳහා වන වාර්ෂික පොලී අනුපාතිකය සියයට 6 ක් වනු ඇත.

මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් හි අනෙකුත් සියලු නියමයන් හා කොන්දේසි නොවෙනස්ව පවතිනු ලබන අතර, ඉහත සඳහන් සංශෝධනය 2014 දෙසැම්බර් මස 03 වැනි දින සිට බලපවත්වනු ලැබේ.

මෙයට - විශ්වාසී,
එම්.ජේ.එස්. අබේසිංහ
**අධ්‍යක්ෂ**
**ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

පිටපත්:

1. ප්‍රධාන ගණකාධිකාරී, ශ්‍රී ලංකා මහ බැංකුව
2. අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
3. පළාත් කළමනාකරුවන්, පළාත් කාර්යාල, ශ්‍රී ලංකා මහ බැංකුව
4. විගණකාධිපති
5. ලේකම්, පශු සම්පත් හා ග්‍රාමීය ජනතාව නගා සිටුවීමේ අමාත්‍යාංශය
6. ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
7. ලේකම්, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

**මෙහෙයුම් උපදෙස් අංකः RDD/CGSPA/14/1 (A-02)**

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01.
2014 දෙසැම්බර් 30 වැනි දින

සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත

මහත්මයාණෙනි/මහත්මියනි

## රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් අංකः RDD/CGSPA/14/1 සංශෝධනය කිරීම

ඉහත රන් භාණ්ඩ උකස් අත්තිකාකරම් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සඳහා පහත සංශෝධනයන් කර ඇති බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

1. 2015 ජනවාරි මස 01 දා සිට ක්‍රියාත්මක වන පරිදි සහභාගීත්ව මූල්‍ය ආයතනයන් අර්ථ දැක්වීම වෙනස් කරනු ලැබ ඇත. ඒ අනුව, මෙහෙයුම් උපදෙස් RDD/CGSPA/14/1 හි 4.2 වගන්තිය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කෙරේ.

   "4.2 මෙම යෝජනා ක්‍රමය යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන බලපත්‍රලාභී බැංකු (එනම්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු) සහ බලපත්‍රලාභී මුදල් සමාගම් ලෙස අර්ථ දක්වනු ලැබේ."

2. තවද, රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයේ මෙහෙයුම් කටයුතු 2015 ජුනි මස 30 වැනි දින තෙක් දීර්ඝ කර ඇත. ඒ අනුව, 4.3 වගන්තිය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය වේ.

   "4.3 පහත දක්වා ඇති නියමයන් හා කොන්දේසි සම්පූර්ණ කර ඇත්නම්, මෙම උපදෙස් ලබා දුන් දිනයේ සිට 2015 ජුනි මස 30 වනදා තෙක් හෝ මුදල් මණ්ඩලය මගින් දීර්ඝ කරනු ලැබිය හැකි වෙනත් දිනයක් දක්වා සහභාගීත්ව මූල්‍ය ආයතන මගින් මුදාහැර ඇති උකස් අත්තිකාරම් මෙම ඇප ආවරණ යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ ලැබීම සඳහා සුදුසුකම් ලබයි.

   (අ) අදාල සහභාගීත්ව මූල්‍ය ආයතනයක රන් භාණ්ඩයක වටිනාකමට දෙනු ලබන ණය ප්‍රමාණයේ අනුපාතය පවතින මට්ටමට වඩා 15% ඉක්මවිය යුතු අතර, එය 80% නොඉක්මවිය යුතුය. එහි සමස්ත බලපෑම පහත දැක්වෙන ආකාරයට ගණනය කරනු ලැබේ.

   උදාහරණය:

**වගකීම් ගණනය කිරීම**

| විස්තරය | උසස් කරන අවස්ථාවේ රන් භාණ්ඩයේ වෙළෙඳපොළ වටිනාකම | උකස් අත්තිකාරම | වාර්ෂික පොලී අනුපාතිකය 12% දී පොලිය | උකස් කිරීමෙන් මාස 12 කට පසුව සහභාගීත්ව මූල්‍ය ආයතනයේ සමස්ත වගකීම | උකස් කිරීමෙන් මාස 15 කට පසුව සහභාගීත්ව මූල්‍ය ආයතනයේ සමස්ත වගකීම |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| රන් භාණ්ඩයේ වටිනාකමට දෙනු ලබන ණය ප්‍රමාණයේ අනුපාතය 80% වනවිට | 100.00 | 80.00 | 9.60 | 89.60 | 92.00 |

   (ආ) සියලු ගාස්තු හා අයකිරීම් ද ඇතුළත්ව, රන් භාණ්ඩ උකස් අත්තිකාරම් මත අය කරනු ලබන වාර්ෂික පොලී අනුපාතිකය සියයට 12 නොඉක්මවිය යුතුය.

(ඈ) මෙම යෝජනා ක්‍රමයට සුදුසුකම් ලැබීමට සහභාගීත්ව මූල්‍ය ආයතන උකස් අත්තිකාරම් මත 1% ක ණය ඇප ආවරණ වාරිකයක් ගෙවිය යුතුය.

(ඇ) එක් පුද්ගලයෙකු සඳහා උපරිම ණය සීමාව රුපියල් 500,000 විය යුතුය.

3. රන් භාණ්ඩ උකස් අත්තිකාරම් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයේ අනෙකුත් සියලුම නියමයන් හා කොන්දේසි නොවෙනස්ව පවතිනු ඇත.

මෙයට - විශ්වාසී,<br>
අධ්‍යක්ෂ<br>
ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

## 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත

2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 4(1) සහ 6 වන වගන්ති සමග කියවිය යුතු, එකී පනතේ 35 වන වගන්තිය යටතේ ජනාධිපති සහ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය විසින් සාදන ලද රෙගුලාසිය වේ.

මහින්ද රාජපක්ෂ<br>
ජනාධිපති සහ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය<br>
කොළඹ.

වර්ෂ 2014 ක් වූ පෙබරවාරි මස 11 වැනි දින

## 2014 අංක 1 දරන කල්බදු මූල්‍යකරණ (ලියාපදිංචි කිරීම සහ වාර්ෂික බලපත්‍ර ගාස්තු) රෙගුලාසි

හැඳින්වීම

1. මෙම රෙගුලාසි 2014 අංක 01 දරන කල්බදු මූල්‍යකරණ (ලියාපදිංචි කිරීම සහ වාර්ෂික බලපත්‍ර ගාස්තු) රෙගුලාසි යනුවෙන් හඳුන්වන අතර, මෙම රෙගුලාසි වහාම බලපවත්වන පරිදි ක්‍රියාත්මක විය යුතුය.

බලපත්‍රය ලබා ගැනීම සඳහා අයදුම් කරන පොදු සමාගමක තිබිය යුතු අවම නිකුත් කළ හා ගෙවා නිමි ප්‍රාග්ධනය

2. 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ (පනත) 3(ඇ) වගන්තිය යටතේ බලපත්‍රය ලබා ගැනීම සඳහා අයදුම් කරන පොදු සමාගමක පැවතිය යුතු අවම නිකුත් කළ හා ගෙවා නිමි ප්‍රාග්ධනය පහත පරිදි විය යුතුය.

| අවම නිකුත් කළ හා ගෙවා නිමි ප්‍රාග්ධනය (රු.මිලියන) | බලපවත්වන දිනය |
|---|---|
| 250 | 2014.01.01 දින සිට |
| 300 | 2015.01.01 දින සිට |

කෙසේ වුවද, නිකුත් කළ සාමාන්‍ය කොටස් සහ නිකුත් කළ අසම්මුච්ත, ගෙවා නිදහස් කළ නොහැකි වරණීය කොටස් ගෙවා නිමි කොටස් ලෙස සැලකිය යුතු වනුයේ එම කොටස් මුදල් ප්‍රතිශ්‍යාවන් මත නිකුත් කර ඇත්නම් පමණි.

ලියාපදිංචි වීමේ අයදුම්පත් ගාස්තු

3. පනතේ 4(1) (ඊ) වගන්තිය සඳහා, ලියාපදිංචි කිරීමේ අයදුම්පත් ගාස්තුව රු.100,000/- විය යුතුය.

ලියාපදිංචි වීමේ අයදුම්පත් ගාස්තු

4. පනතේ 3 වන වගන්තිය යටතේ ලියාපදිංචි වීම සඳහා අදාළ වන ලියාපදිංචි ගාස්තුව (ලියාපදිංචි කරන ලිත් වර්ෂය සඳහා) රු. 500,000/- විය යුතුය. මෙම ගාස්තුව ලියාපදිංචි කරන දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවිය යුතුය.

වාර්ෂික බලපත්‍ර ගාස්තු

5. පනතේ 6 වන වගන්තියෙහි දැක්වෙන අරමුණ සඳහා, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 3 වන වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති සෑම කල්බදු මූල්‍යකරණ ආයතනයක්ම 2014 වර්ෂය සහ ඊට පසු එළඹෙන සෑම වර්ෂයක් සඳහාම අදාළ වන වාර්ෂික බලපත්‍ර ගාස්තුව, ආයතනයේ මුළු වත්කම් ප්‍රමාණය පදනම් කරගෙන පහත සඳහන් පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවිය යුතුය.

| ලිත් වර්ෂය අවසානයට ආයතනයේ මුළු වත්කම් ප්‍රමාණය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව (රු.) |
|---|---|
| රුපියල් බිලියන 1 ක් හෝ ඊට අඩු | 250,000/- |
| රුපියල් බිලියන 1 ට වැඩි නමුත් රුපියල් බිලියන 10 කට අඩු හෝ සමාන | 500,000/- |
| රුපියල් බිලියන 10 ට වැඩි | 1,000,000/- |

2010 අංක 1 දරන රෙගුලාසි අවලංගු කිරීම

6. 2010 අංක 1 දරන කල්බදු මූල්‍යකරණ (ලියාපදිංචි කිරීම හා වාර්ෂික බලපත්‍ර ගාස්තු) රෙගුලාසි මෙයින් අවලංගු වේ.

## 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දෙන ලද විධානය.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

වර්ෂ 2014 ක් වූ මාර්තු මස 31 වැනි දින
කොළඹ දී ය.

## 2014 අංක 1 දරන මුදල් සමාගම් (පොලී අනුපාත) විධානය

හැඳින්වීම

1. 1.1 මෙම විධානය 2014 අංක 1 දරන මුදල් සමාගම් (පොලී අනුපාත) විධානය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී සෑම මුදල් සමාගමකටම අදාල විය යුතුය.

1.2 මෙම විධානයෙහි සඳහන් නියෝග, ඕනෑම ඉතිරිකිරීමේ තැන්පතු, කාලීන තැන්පතු, පැවරිය නොහැකි තැන්පතු සහතික සහ මෙම විධානයෙහි දිනයේ සිට භාරගනු ලබන හෝ අලුත් කරනු ලබන සහ නිකුත් කරනු ලබන ණය සාධන පත්‍ර සඳහා අදාළ විය යුතුය.

කාලීන තැන්පතුවක් සඳහා උපරිම පොලී අනුපාතය

2. 2.1 කාලීන තැන්පතුවක් සඳහා මුදල් සමාගමක් විසින් ගෙවිය හැකි වාර්ෂික පොලී අනුපාතය පහත සඳහන් උපරිම පොලී අනුපාත සීමාවන් නොඉක්මවිය යුතුය.

| කාලීන තැන්පතුවක කල්පිරීමේ කාලසීමාව | උපරිම පොලී අනුපාත සීමාව | |
|---|---|---|
| වසරක් හෝ ඊට අඩු | අධ්‍යක්ෂවරයා විසින් මුදල් සමාගම් වෙත දැනුම් දෙනු ලබන, තැන්පතු භාර ගැනීමට පෙර කාර්තුවේ දී නිකුත් කරන ලද දින 364 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා බර තබන ලද සාමාන්‍ය ඵලදායී අගයට | ප්‍රතිශත අංක 3.00 ක් එකතු කිරීමෙන් ලැබෙන අගය |
| වසරකට වැඩි - වසර 3 ට අඩු | | ප්‍රතිශත අංක 4.00 ක් එකතු කිරීමෙන් ලැබෙන අගය |
| වසර 3 ට වැඩි | | ප්‍රතිශත අංක 5.50 ක් එකතු කිරීමෙන් ලැබෙන අගය |

2.2 වයස අවුරුදු 55 ට වැඩි පුද්ගලයෙකුගේ (මෙහි මින් මතු "ජ්‍යෙෂ්ඨ පුරවැසියා" ලෙස හැඳින්වෙන) කාලීන තැන්පතුවක් භාර ගැනීමේ දී හෝ නැවත අලුත් කිරීමේ දී, මුල් සමාගම විසින් ඉහත (2.1) ඡේදයෙහි සඳහන් උපරිම පොලී අනුපාත සීමාවට වඩා ප්‍රතිශත අංක එකකට නොවැඩි අතිරේක පොලියක් ගෙවිය හැකිය.

ඉතිරි කිරීමේ තැන්පතු සඳහා උපරිම පොලී අනුපාතය

3. 3.1 කාලීන තැන්පතුවක් සඳහා මුදල් සමාගමක් විසින් ගෙවිය හැකි වාර්ෂික පොලී අනුපාතය පහත සඳහන් උපරිම පොලී අනුපාත සීමාවන් නොඉක්මවිය යුතුය.

3.2 ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක් විසින් ඉතිරිකිරීමේ තැන්පතුවක් පවත්වාගෙන යාමේ දී, (3.1) ඡේදයෙහි සඳහන් උපරිම පොලී අනුපාත සීමාවට වඩා ප්‍රතිශත අංක එකක් නොඉක්මවන අතිරේක පොලියක් මුදල් සමාගමක් විසින් ගෙවිය හැකිය.

පැවරිය නොහැකි තැන්පතු සහතික සඳහා උපරිම වට්ටම් අනුපාතය

4. කල් පිරීමේ දී නිදහස් කරවා ගත හැකි අගයට වඩා අඩු මිලකින් යුත් පැවරිය නොහැකි තැන්පතු සහතික නිකුත් කිරීමේ දී මුදල් සමාගම විසින් අනුමත කළ හැකි වට්ටම් අනුපාතය ඒ ඒ තැන්පතුව සම්බන්ධව පහත දක්වා ඇති උපරිම ඵලදායී අගය නොඉක්මවිය යුතුය.

| පැවරිය නොහැකි තැන්පතු සහතික සඳහා කල් පිරීමේ කාලය | ඵලදායී අගයෙහි උපරිම ඉහළ සීමාව | |
|---|---|---|
| වසරක් හෝ ඊට අඩු | අධ්‍යක්ෂවරයා විසින් මුදල් සමාගම් වෙත දැනුම් දෙනු ලබන, තැන්පතු භාර ගැනීමට පෙර කාර්තුවේ දී නිකුත් කරන ලද දින 364 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා බර තබන ලද සාමාන්‍ය ඵලදායී අගයට | ප්‍රතිශත අංක 3.00 ක එකතුව |
| වසරකට වැඩි - වසර 3 ට අඩු | | ප්‍රතිශත අංක 4.00 ක එකතුව |
| වසර 3 ට වැඩි | | ප්‍රතිශත අංක 5.50 ක එකතුව |

**ණය සාධන පත්‍රයක් සඳහා උපරිම වාර්ෂික පොලී/වට්ටම්/කූපන අනුපාතය**

5. 5.1 මුදල් සමාගමක් විසින් ණය සාධන පත්‍රයක් සඳහා ගෙවිය හැකි උපරිම වාර්ෂික පොලී/වට්ටම්/කූපන අනුපාතය අදාළ කල් පිරීමේ කාලයක් සඳහා පහත දක්වා ඇති පොලී/වට්ටම්/කූපන අනුපාතයන්හි උපරිම ඉහළ සීමාව නොඉක්මවිය යුතුය.

| ණය සාදන සඳහා කල් පිරීමේ කාලය | උපරිම වාර්ෂික පොලී/වට්ටම්/කූපන අනුපාතය | |
|---|---|---|
| වසරක් හෝ ඊට අඩු | අධ්‍යක්ෂවරයා විසින් මුදල් සමාගම් වෙත දැනුම් දෙනු ලබන, පෙර කාර්තුවේ දී නිකුත් කරන ලද දින 364 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා බර තබන ලද සාමාන්‍ය ඵලදායී අගයට | ප්‍රතිශත අංක 3.00 ක එකතුව |
| වසරකට වැඩි - වසර 3 ට අඩු | | ප්‍රතිශත අංක 4.00 ක එකතුව |
| වසර 3 ට වැඩි | | ප්‍රතිශත අංක 6.50 ක එකතුව |

5.2 මුදල් සමාගමක් විසින් ණය සාධන පත්‍රයක් සඳහා ගෙවිය හැකි වාර්ෂික පොලී/වට්ටම්/කූපන අනුපාතය පාවෙන අනුපාත ක්‍රමය අනුව ක්‍රියාත්මක වනවිට, උපරිම වාර්ෂික පොලී/වට්ටම්/කූපන අනුපාතය අධ්‍යක්ෂවරයා විසින් මුදල් සමාගම් වෙත දැනුම් දෙනු ලබන අදාළ පොලී/කූපන/කාලසීමාව ඇරඹීමට පෙර කාර්තුවේ දී නිකුත් කරන ලද දින 364 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා බර තබන ලද සාමාන්‍ය ඵලදායී අගය මත පදනම් විය යුතුය.

5.3 මුදල් සමාගමක් විසින් ණය සාධන පත්‍රයක් සඳහා ගෙවිය හැකි වාර්ෂික පොලී/වට්ටම්/කූපන අනුපාතය ස්ථාවර අනුපාත ක්‍රමය අනුව ක්‍රියාත්මක වනවිට, උපරිම වාර්ෂික පොලී/වට්ටම්/කූපන අනුපාතය අධ්‍යක්ෂවරයා විසින් මුදල් සමාගම් වෙත දැනුම් දෙනු ලබන ණය සාධන පත්‍රය මහජනතාවට දැනුම් දීමට පෙර දිනයට හෝ වට්ටම් දිනයට පෙර කාර්තුවේ දී නිකුත් කරන ලද දින 364 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා බර තබන ලද සාමාන්‍ය ඵලදායී අගය මත පදනම් විය යුතුය.

**කාර්තුවකට බර තබන ලද සාමාන්‍ය ඵලදායී අගය**

6. 6.1 අධ්‍යක්ෂවරයා විසින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 න් අවසන් වන කාර්තු සඳහා අදාළ වන දින 91 ක සහ දින 364 ක භාණ්ඩාගාර බිල්පත් සඳහා කාර්තුවකට බර තබන ලද සාමාන්‍ය ඵලදායී අගය දැනුම් දිය යුතුය.

6.2 පොලී/වට්ටම්/කූපන ගෙවීමේ කාලසීමාවට පෙර ඒ ඒ කාලසීමාව සඳහා අදාළ වන කාර්තුවකට බර තබන ලද සාමාන්‍ය ඵලදායී අගය මුදල් සමාගම විසින් කොළඹ කොටස් හුවමාරුව වෙත සහ භාරකරුට දැනුම් දිය යුතුය.

**වාර්තා කිරීම**

7. සෑම මුදල් සමාගමක් විසින්ම කිසියම් මාසයක දී, එම මුදල් සමාගම් විසින් කාලීන තැන්පතු, ඉතිරිකිරීමේ තැන්පතු, පැවරිය නොහැකි තැන්පතු සහතික සහ ණය සාධන පත්‍ර සඳහා ගෙවන ලද පොලී/වට්ටම්/කූපන අනුපාත පිළිබඳ විස්තර එම මාසයට පසුව එළඹෙන මාසයේ 07 වැනි දින හෝ එදිනට ප්‍රථම, අධ්‍යක්ෂවරයා විසින් දෙන ලද උපදෙස් පරිදි එවිය යුතුය.

**අර්ථ දැක්වීම**

8. මෙම විධානයෙහි,

8.1 "කාලීන තැන්පතු" යන්නෙන් නිශ්චිත කාලසීමාවක් තුළ ආපසු ගෙවීමේ එකඟතාවක් මත මුදල් සමාගමක් විසින් භාරගනු ලබන ඕනෑම තැන්පතුවක් අදහස් වේ.

8.2 "ණය සාධන පත්‍ර" යන්නෙන් නිශ්චිත බැඳුම්කරයක්, ණයකරයක්, වාණිජ පත්‍රිකාවක්, පොරොන්දු නෝට්ටුවක් හෝ අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම ණය සාධන පත්‍රයක් අදහස් වේ.

8.3 "අධ්‍යක්ෂවරයා" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා අදහස් වේ.

**අහෝසි කිරීම**

9. 2013 අංක 5 දරන මුදල් සමාගම් (පොලී අනුපාත) විධානය මෙයින් අහෝසි කරනු ලැබේ.